# FORCED MIGRATION review

විශේෂ කලාපය
අගෝස්තු 2005



# සුනාමි: මානවදයාවාදී ප්‍රතිචාරවලින් ඉගෙනගැනීම

Refugee Studies Centre

FMR Migration Review: සරණාගතවීම සහ අභ්‍යන්තරිකව අවතැන්වීම සම්බන්ධයෙන් පළවන ලෝකයේ වැඩිම පාඨක සංඛ්‍යාවක් කියවන සඟරාව

**Forced Migration Review**

සඟරාව පර්යේෂකයින්, සරණාගතයින්, අභ්‍යන්තරිකව අවතැන්වූවන් සහ ඔවුන් සමග එකට වැඩ කරන්නන් එකිනෙකා අතරේ ප්‍රායෝගික අත්දැකීම්, තොරතුරු සහ සංකල්ප විධිමත් ලෙස හුවමාරු කරගැනීම සඳහා සාකච්ඡා මණ්ඩපයක් සපයා දෙයි. ස්පාඤ්ඤ, අරාබි, ඉංග්‍රීසි, ප්‍රංශ යන භාෂා හතරෙන්ම මුද්‍රණය කෙරෙන මෙම සඟරාව ප්‍රකාශයට පත් කරන්නේ නෝර්වීජියානු සරණාගත මණ්ඩලයේ ආධාර ඇතුව සරණාගත අධ්‍යයන කේන්ද්‍රය/ඔක්ස්ෆඩ් විශ්ව විද්‍යාලයයි. Revista de Migraciones Forzadas නම් ස්පාඤ්ඤ සංස්කරණය සම්පාදනය කරන්නේ ගෝතමාලාවේ IDEL ආයතනයයි.

*සංස්කාරකවරු*
Marion Couldrey & Dr Tim Morris

*දයකත්ව කටයුතු පිළිබඳ සහයක*
Sharon Ellis

**Forced Migration Review**
Refugee Studies Centre, Queen Elizabeth House, 21 St Giles, Oxford, OX1 3LA, UK
**Email: fmr@qeh.ox.ac.uk**
Tel: +44 (0)1865 280700 Fax: +44 (0)1865 270721

*වෙබ් අඩවිය*
**www.fmreview.org**

*මෙම විශේෂ කලාපය සඳහා අරමුදල් සපයා දුන්නේ පහත නම් සඳහන් සංවිධානයන්ය:*

AUSTCARE

Concern

Brookings-Bern Project on Internal Displacement

Christian Aid

Consortium of Humanitarian Agencies, Sri Lanka

Department for International Development (UK)

UN Office for the Coordination of Humanitarian Affairs (OCHA)

World Vision Australia

World Vision Canada

World Vision USA

UNICEF

UNHCR Sri Lanka

Designed by Colophon Media.
Printed by Lazergraphic (pvt) Ltd
Sri Lanka

ISSN 1460-9819

# සංස්කාරකවරුන්ගෙන්



Corinne Owen

*ඉන්දියානු සාගරය හරහා 26 දෙසැම්බර් 2004 වැනි දින ගලා ගිය සුනාමි රැල්ල මින් පෙර නොවූ විරූ පරිමාණයකින් මානවදයාවාදී ප්‍රතිචාර ඇති කළේය. සුනාමියේ අවසාන ප්‍රතිඵලය වශයෙන් 300,000 වැනි ඇඟකිළිපොළා යන ප්‍රමාණයක ජනතාවක් මිය ගොස් ඇතැ'යි ඇස්තමේන්තු කොට තිබේ. කෙසේවෙතත් මේ ගණන වූකලි ගත වූ වසරවල දී රුවන්ඩාවේ කොන්ගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ සූඩානයේ මිය ගිය සංඛ්‍යාවෙන් කොටසක් පමණි. සුනාමිය ලෝකයේ ප්‍රබල අවධානය ලබාගෙන මින් පෙර නොවූ විරූ අනුකම්පාවක් හා සහයෝගයක් ගෝලීය වශයෙන් අත්පත් කර ගත්තේය. එහෙත් ලෝකයේ සැඟවුණු තැන්වල ජීවත්වන, වචනයෙන් විස්තර කළ නොහැකි තරමේ අවශ්‍යතාවලින් පෙළෙන, අවතැන් වූ ජනතාවගේ ප්‍රශ්න මෙතෙක් ආමන්ත්‍රණය කොට නැත.*

*සඟරාවේ මෙම විශේෂ කලාපය පළ කරන්නට අප ගත් තීරණය කාරණා තුනක් විසින් මෙහෙයවන ලද්දකි. ඒවා නම් සහනාධාර කටයුතුවල අතිදැවැන්තභාවයත් සුනාමිය විසින් සුන්බුන් කොට දැමූ රටවල් ගැටුම් නිසා අවතැන් වූ ජනයාගේ ප්‍රශ්නවලට ඒ වනවිට මුහුණ දෙමින් සිටීමත් මානවදයාවාදී ප්‍රජාව සෑමවිටම පාහේ අතීතයේ පාඩම් ඉගෙන නොගෙන එක්වරම ක්‍රියාවට බැසීමේ කණගාටුදායක යථාර්ථයත් ය. පළකිරීම සඳහා අප වෙත ලැබුණු මෙම අද්විතීය ලිපි එකතුව ගැන අපි අතිශයින්ම සතුටු වන්නෙමු. සුනාමි ආපදාවට ලක් වූ රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වන දේශීය රාජ්‍ය නොවන සංවිධාන දරන අදහස් උදහස් මෙන්ම පශ්චාත්-සුනාමි සහනසේවා සහ ප්‍රතිකාරක මෙහෙයුම්වලට නායකත්වය දුන් උදවිය අතරින් කීපදෙනෙකුගේ ආවර්ජනාද ඒවා අතර තිබේ. මේ ප්‍රකාශනය යථාර්ථයක් බවට පත් කළ අපගේ අරමුදල් දයක කණ්ඩායමටද මේ අවස්ථාවේදී අතිශයින් ස්තුති වන්නෙමු. ඒ වාගේම සංස්කරණ උපදේශකත්වය සැපයූ අප හිතවත් ඊවා-ලොටා හෙඩ්මන්ටද සම්බන්ධීකරණය/මුද්‍රණය/කොළඹ බෙදහැරීම බාරගත් සයිමන් හැරිස්ටද අපගේ නොවක් තුතිය පිරිනැමේ.*

*FMR සඟරාව මෙවර මුද්‍රණය කොට බෙද හරින ලද්දේ ශ්‍රී ලංකාවේදීය. මෙවර කලාපය ඉංග්‍රීසි භාෂාවෙන් ද ඊට අමතරව ඉන්දුනීසියානු බහාසා, සිංහල, දෙමල යන භාෂා තුනෙන් ද පළ වෙයි.*

*පළමුවෙනි වතාවට FMR සඟරාව කියවන ඔබට මින් ඉදිරියට ඉංග්‍රීසි, අරාබි, ස්පාඤ්ඤ, ප්‍රංශ යන භාෂා හතරෙන්ම නොකඩවා පළවන කලාප ලබාගැනීමේ කැමැත්තක් ඇතිවන්නට පුළුවන. FMR සඟරාව ප්‍රකාශයට පත් කරන්නේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ සරණාගත කේන්ද්‍රයයි. එය රටවල් 165 කට බෙදහරින අතර සරණාගතවීම සහ අභ්‍යන්තරිකව අවතැන්වීම යන විෂයන් සම්බන්ධයෙන් පළ කෙරෙන ප්‍රකාශන අතුරෙන් ලෝකයේ පාඨකයන් වැඩිම සංඛ්‍යාවක් කියවන සඟරාවද වන්නේය.*

*FMR සඟරාවේ මීළඟ කලාපයේ තේමාව නම් කොට ඇත්තේ සූඩානයේ සාම අපේක්ෂාව වශයෙනි. එය ඔක්තෝබර් මාසයේදී බෙද හැරෙන අතර ඊට එක්සත් ජාතීන්ගේ මානවදයාවාදී කටයුතු පිලිබඳ සම්බන්ධීකරණ කාර්යාලය (OCHA) ට අනුබද්ධ අභ්‍යන්තරික අවතැන් අංශයේ උදව් ඇතුව සකස් කරන ලද අතිරේකයක් ද ඇතුලත්ය. එම අතිරේකයෙන් සලකා බැලෙන්නේ අභ්‍යන්තරිකව අවතැන්වූ ජනයා (IDP) ආරක්ෂා කරන්නටත් ඔවුනට උපකාර කරන්නටත් ජාත්‍යන්තර ප්‍රජාව සතු හැකියාවයි.*

*FMR සඟරාවේ මෙම විශේෂ කලාපය සුනාමියට බිලිවූවන් වෙනුවෙන් කැප කෙරෙනු ඇත. එමෙන්ම එය යහපත් අනාගතයක් පිලිබඳ බලාපොරොත්තුද දල්වා ගනු ඇත. සඟරාවේ පළ වන ලිපි ඔබේ වැඩ කටයුතුවලට අදළ වනු ඇතැ'යි ප්‍රයෝජනවත් වනු ඇතැ'යි අපි බලාපොරොත්තු වන්නෙමු. ඒ වාගේම, ආපදවලට ගොදුරු වී අවතැන්වන ජනයාට වඩා සාධනීය ලෙස ප්‍රතිචාර දක්වන්නට ඔබේ නිර්දේශ මානවදයාවාදී ප්‍රජාවට උදව් වනු ඇත.*

*සියළුම ලිපි සම්පූර්ණයෙන්ම භාෂා හතරෙන්ම www.fmreview.org.tsunami.htm යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකිය. වැඩිදුර තොරතුරු සඳහාත් අපගේ තැපැල් නාමලේඛනයට ඇතුලත්වනු පිණිසත් කරුණාකර අප හා සම්බන්ධවන්න (වම් පසින් තිබෙන විස්තර බලන්න).*

*සුබපැතුම් සමග*
*මැරියන් කෝල්ඩ්‍රෙ සහ ටිම් මොරිස්*

**හිමිකම් කියාපෑම සහ අත්හැරීම**
FMR සඟරාවේ පළ වී තිබෙන අදහස් උදහස් එහි කතුවරුන් හෝ සරණාගත අධ්‍යයන කේන්ද්‍රය හෝ දරණ මත අවශ්‍යයෙන්ම පිලිබිඹු නොකරයි. මෙම ප්‍රකාශනයේ අඩංගු ඕනෑම ලිපියක් තොරතුරක් පූර්ව අවසරයකින් තොරව නැවත උපුටා දැක්විය හැකිය. එසේ කළ යුත්තේ ඒවායේ මූලාශ්‍ර සඳහන් කරමින්ය. සඟරාවේ අඩංගුව සහ නිමාව සම්බන්ධයෙන් ඔබ දක්වන අදහස් ද තොරතුරු මෙවලමක් හැටියට සඟරාව වර්ධනය කළ යුතු ආකාරය ගැන ඔබ කරන යෝජනා ද අපි අගය කරමු.

**ඉදිරිපස කවරය: ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ වාසය කරන ළමයෙකුගේ චිත්‍රයක් (පසුපස කවරය බලන්න)**

# සුනාමියෙන් ඉගෙන ගැනීම




**සුනාමි ප්‍රතිචාරයේ දේශපාලනය**
ඊවා-ලොටා හෙඩ්මන්....................................................4

**එක්සත් ජාතීන්ගේ සංවිධානය සුනාමි ප්‍රතිචාරය තක්සේරු කරයි**
මැරියන් කෝල්ඩ්‍රෙ සහ ටිම් මොරිස්....................................6

**ස්වභාවික ආපද සහ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ අයිතිවාසිකම්**
වොල්ටර් කලින්....................................................10

**සුනාමිය සඳහා දැක්වුණු මහජන සෞඛ්‍ය ප්‍රතිචාරය**
මැනුවෙල් කර්බල්ලෝ සහ බ්‍රයන් හිල්....................................12

**මහා ඉඩම් කොල්ලය**
ස්කොට් ලෙකී....................................................15

**සුනාමිය නිසා වෙනත් අර්බුද සඳහා වෙන්කරන ලද අරමුදල් වලට බලපෑමක් ඇතිවූයේද?**
ටෝබි ලැන්සර්....................................................17

**DFID සංවිධානය සුනාමි ප්‍රතිචාර සමාලෝචනය කරයි**
ඩේවිඩ් හොරොබින්....................................................18


## ඉන්දුනීසියාව


**සුනාමියෙන් පසු අචේ ප්‍රාන්තයේ අභ්‍යන්තරිකව අවතැන්වූවන් වෙත පිවිසීම**
ක්ලෝඩියා හඩිස්පෙත්....................................................19

**බැරැක්ක තුලට සීමා වූ අචේ ප්‍රාන්තයේ අභ්‍යන්තරිකව අවතැන්වූවෝ**
ලූක්මන් අගේ....................................................22

**ප්‍රජනන සෞඛ්‍ය ආරක්‍ෂණය තුල අවම ප්‍රමිතීන් සහතික කිරීම**
සැන්ඩ්‍රා ක්‍රවුස්....................................................24

**ඉන්දුනීසියාවේ මානවදයාවාදී සම්බන්ධීකරණය: රාජ්‍ය නොවන සංවිධානයක මතය**
කාස්ටන් වෝල්ස්....................................................26

**අචේ ප්‍රාන්තයේ පශ්චාත්-සුනාමි ආරක්‍ෂණ විධිවිධාන**
FMR කතුවරු....................................................28

**බලරහිත ගොදුරැද බලවන්ත දිවි ගලවාගත් අයද?**
ඉන්ග්විල්ඩ් සොල්වැන්ග්....................................................29


## ශ්‍රී ලංකාව


**ජනවාර්ගික ගැටුම, ශ්‍රී ලංකාවේ රාජ්‍යය සහ සුනාමිය**
ජයදේව උයන්ගොඩ....................................................30

**පශ්චාත් සුනාමි මනෝ සමාජීය ක්‍රියාකාරකම් වල ආවර්ජනය**
ආනන්ද ගලප්පත්ති....................................................32

**සුනාමියෙන් පසු ශ්‍රී ලංකාවේ ජීවනෝපායයන්**
සයිමන් හැරිස්....................................................34

**සයමසකින් පසු: බියගැන්වීම්වලට මුහුණදෙමින්**
ලින්ඩන් ජෙෆල්ස්....................................................36

**භාණ්ඩ ප්‍රවාහණයේදී මුහුණ දුන් අභියෝග**
ස්ටීව් මැතිව්ස්....................................................38

**පශ්චාත් - සුනාමි කලබැගැනියේදී පැගුණු පුංචි මාළු**
අයිරින් ෆ්‍රේසර්....................................................39


## තායිලන්තය


**බුරුමයේ සංක්‍රමණික ශ්‍රමිකයන් වෙත මානවදයාවාදී ප්‍රතිචාරය**
පියා ඔබරෝයි....................................................40


## ඉන්දියාව


**ඉන්දියානු සාකච්ඡා මණ්ඩපයක් සුනාමි ප්‍රතිචාර සමාලෝචනය කරයි**
පෝලා බැනර්ජි සහ සබ්‍යසචි බාසු රේ චෞධරි..........................42

**තමිල්නාඩුවේ ආපදගිලි ජන කණ්ඩායම් වෙනුවෙන් හඬක්**
මැක්ස් මාටින්....................................................44

**ප්‍රතිචාරවල කාර්යසාධනීයත්වය: ආපදවට පත් වූ ජනතාවගේ අදහස්**
අනිස්යා තෝමස් සහ විමලා රාමලිංගම්....................................46


## මාලදිවයින


**අහිමි වූ අහිංසකත්වය: මාලදිවයිනට ගැලූ සුනාමිය**
හෙයිඩි බ්‍රවුන්....................................................48


## අප්‍රිකාව


**සුනාමිය පිලිබඳ අප්‍රිකානු පර්යාලෝකයක්**
බහමේ ටොම් න්යන්ඩුගා....................................................50

**සෝමාලියාවේ ආපදගිලි ජන කොටස්**
OCHA සෝමාලි කාර්යාලය....................................................51

# සුනාමි ප්‍රතිචාරයේ දේශපාලනය

ඊවා-ලොටා හෙඩ්මන්

2004 අවුරුද්දේ දෙසැම්බර් 26 ද ගැලූ ආසියානු සුනාමිය මුළුමහත් ඉන්දීය සාගර කලාපයේ වෙරළබඩ ජීවත්වූ ප්‍රජාවන්ගේ ජීවිත හා දේපොල විනාශ කර දැමුවේය. රිෂ්ටර් මාපකයේ 9.0ක් ලෙස සටහන් වූ භූමිකම්පාවෙන් මිනිත්තු කීපයක් ඇතුලත ඉන්දුනීසියාවේ පිහිටි උතුරු සුමාත්‍රා දූපතේ බටහිර වෙරළ පළමුවෙනි ප්‍රහාරයට ගොදුරු විය. පළමු දැවැන්ත සුනාමි ප්‍රහාරය එල්ල වුයේ දූපතේ බන්ඩා අචේ සිට මියුලබෝ අචේ දක්වා මහා විනාශයක් ඇති කරමිනි. මුහුදු පතුලේ ඇති වූ යෝධ සිරස් කැළඹීමක් විසින් ඇති කළ මේ සුනාමිය බටහිර තායිලන්තයේ, බුරුමයේ, මලාසියාවේ, ශ්‍රී ලංකාවේ, නැගෙනහිර ඉන්දියාවේ ප්‍රදේශවලට දරුණු ප්‍රහාර එල්ල කරමින් අප්‍රිකාවේ වෙරළට ළඟාවූයේ ජීවිතවලට හා දේපොළවලට තදබල හානි පමුණුවමිනි. මේ යෝධ ස්වාභාවික ආපදාවෙන් පසුව හෙළිදරව් වුයේ ආපදාවට ලක්වූ රටවල් 12ක ජිවත් වූ 290,000ක තරම් ජනතාවක් මිය ගොස් හෝ අතුරුදහන් වී හෝ ඇති බවත් මිලියනයකට අධික ජනකායක් අවවතැන් වී සිටින බවත්ය.

මේ ස්වාභාවික ආපදාව පිළිබඳ ප්‍රවෘත්තිය දැනගත් විගසම පුරවැසියෝ, ව්‍යාපාරික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ආණ්ඩු මානවදයාවාදී සහනාධාර ද සම්පත් උපකාර ද මින් පෙර නොවූ විරූ අසාමාන්‍ය ප්‍රමාණයකින් යුතුව පෙළ ගස්වන්නට පටන් ගත්තේය. සංකීර්ණ මානවදයාවාදී හදිසි අවස්ථා පැන නැගුණුවිට සහනාධාර සහ උපකාර ලබා දීමේ ප්‍රවීණ ජාත්‍යන්තර යාන්ත්‍රණයට පණ දෙනු ලැබූ අතර එය ආපදාවට පත් වූ ප්‍රදේශ තුල ක්‍රියාත්මක වන්නටත් සම්බන්ධීකරණණය කරන්නටත් පටන් ගනිති. ඇතිවූ විනාශය මොනතරම් බලවත්ද කියනවානම් මූලික මානවදයාවාදී සහනාධාර අදල ස්ථානනවලට ප්‍රවාහණය කිරීම පවා බලවත් අභියෝගයක් විය. ආපදාවට පත්වූ ජනතාව කොටු වී හිර වී සිටි තැන්වලට ලගාවීමේ අභියෝගය ජය ගන්නට දේශීය හා විදේශීය හමුදාවල සහයෝගය අවශ්‍ය විණ. හදිසි අවස්ථා සහනාධාර ලබාදීමේ ක්‍රියාවලිය මුහුණ දුන් අනෙක් ප්‍රධාන අභියෝගය වූයේ අතිවිශාල මට්ටමින් අවතැන් වී සිටින ජනයාය. අචේ ප්‍රාන්තයේ මේ තත්ත්වය ඉතා දරුණු විය. ගොඩනැගිලිවලට, සත්කාරක පවුල් වෙතට, කූඩාරම් හා වෙනත් තාවකාලික ලැගුම්පොලවල් වෙතට ජීවිතය ගලවාගත් උදවිය ගාල් වී සිටියහ.

ජීවිතය ගලවාගත් උදවියගේ තත්ත්වය සහ ඔවුන් සිටින තැන් සිතියම්ගත කිරීම ලෙහෙසි පහසු කාරණයක් නොවීය. සුනාමියෙන් ඇතිවූ බලපෑමේ ස්වභාවය සහ එහි තරම මැනගැනීම සඳහා ඒ ඒ රටවල ආණ්ඩු ජාත්‍යන්තර දයකයෝ සහ මානවදයාවාදී ආයතන ඉමහත් වෙහෙසක් දැරුවෝය. මෙවන් දරුණු ව්‍යවසනයකින් පසු විනාශ වූ ගේදෙර ප්‍රමාණය, පශු සම්පත් ප්‍රමාණය, ජීවනෝපායන් ප්‍රමාණය, ඉඩ කඩම් දේපොල ප්‍රමාණය, ඉඩම් ඔප්පු සහ වෙනත් වැදගත් ලියකියවිලි ප්‍රමාණයල මහජන යටිතල පහසුකම්වල ප්‍රමාණය මැනගැනීම තක්සේරු කිරීම කිසිසේත් පහසු කාර්යයක් නම් නොවීය. සිදු වූ හානිය තක්සේරු කිරීමටත් මිනුම්ගත කිරීමටත් සිතියම්ගත කිරීමටත් විශේෂ දැනුම විශාල වශයෙන් යොද ගැණුනු අතර එයින් ඒ ඒ ආණ්ඩු සහ දයක ආයතන ආරම්භ කළ පුනරුත්ථාපන සහ ප්‍රතිසංවර්ධන කටයුතු සැලසුම් කිරීම පිණිස අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සපයා දෙනු ලැබීය.

සංකීර්ණ මානවදයාවාදී හදිසි තත්ත්වයන් ගැන නැගුණු විට එහි දක්නට ලැබෙන සම්බන්ධීකරණයට හා ප්‍රවීණත්වයට අදල වාදවිෂයන්ට ඔබ්බෙන් පවතින සුවිශේෂ කාරණා ගැන නැවත අවධානය යොමුකිරීම වැදගත්ය. ඇත්තේන්ම ආපදාවට ලක්වූ ප්‍රදේශවලට සහනාධාර ලබාදීම සහ එම ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීම නම් ක්‍රියාදමයේ ස්වාභාවයල දිසාව සහ වේගය වැනි කාරණා ආපදාවලට ලක්වූ ප්‍රදේශවල ප්‍රාදේශීය හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන දේශපාලනය සමග අත්‍යන්තයෙන්ම බැඳී පවතින ඒවාය. මින් පෙර නොවූ විරූ මෙම දැවැන්ත ආපදාව එකිනෙකට වෙනස් රටවල් දෙළසකට කෙළින්ම බලපෑවේය. එම රටවල්වල තිබෙන දේශපාලනල ආර්ථික සමාජ ගතිකයන් එකිනෙකට වෙනස්යග එහෙත් ආධුනික වේවා වෘත්තිමය වේවා දේශීය වේවා ජාත්‍යන්තර වේවා ඕනෑම මානවදයාවාදී ප්‍රයත්නයකට ඒ ඒ රටවල බලපවත්වන බලගතු දෛනික දේශපාලන ඕනෑඑපාකම්වලට යටපත්වන්නට සිද්ධ වන්නේයග ඒ කෙසේවෙතත් සුනාමි ආපදාවට ලක්වූ ප්‍රදේශවලට දියත්වන මානවදයාවාදී සහනාධාර සහ ප්‍රතිසංවර්ධන කටයුතුවලට බලපාන සුවිශේෂ දේශපාලන ගතිකයන් හා රටාවන් රඟන භූමිකාව අධ්‍යයනය කිරීමට මේ වනතෙක් දරා ඇත්තේ මඳ උත්සාහයක් පමණීග

ස්භාවික ආපදාව සහ සංකීර්ණ මානවදයාවාදී හදිසි අවස්ථාව අතර සිරවී සිටි බොහෝ ජිවිත ගලවාගත්තවුනට සිද්ධ වූයේ සීමිත බාධක බොහෝ ගණනාවකට මුහුණ දෙන්නටය. 1999 වර්ෂයේ සිටම අචේ ප්‍රාන්තය තුල බෙදුම්වාදී කැරලිකරුවන්ට එරෙහිව දැඩි මර්දන ව්‍යාපාරයක් ගෙන ගිය හෙයින් ප්‍රාන්තය පුරා විහිරුණු ගැටුම් සහ ප්‍රචණ්ඩක්‍රියා හේතුකොටගෙන ඒ වනවිට 300,000ට වඩා ජනකායක් අවතැන් වී සිටියහ. ඉදින් සුනාමියෙන් දිවි ගලවාගත්තවුන් අභ්‍යන්තරිකව අවතැන්වූ යන අනන්‍යතාවය දේශපාලන වශයෙන් සංවේදී මෙන්ම විරෝධයටද පාත්‍ර විය. අභ්‍යන්තරිකව අවතැන්වූ යන පදයේ නිර්වචනය හැටියට සැලකෙන්නේ ස්වාභාවික ආපදාවන් හේතුකොටගෙන ස්වකීය ගෙවල් දෙරවල් අතහැර දමා යන්නට සිදුවූ ජනයා යන්න වුවද ඉන්දුනීසියානු ආණ්ඩුවේ සහ මානවදයාවාදී සංවිධානවල නිලධාරීන් සමහර අවස්ථාවලදී ඔවුන් හඳුන්වන ලද්දේ “ඉන්නට හිටින්නට තැනක් නැති අය” ලෙසය. පදවල තිබෙන එවැනි වෙනස්කම් නිසා ආපදාවට ලක්වූ ජනකොටස් සතු අයිතිවාසිකම් හඳුනාගැනීමේදීත් එකී ජනකොටස් ආරක්‍ෂා කිරීම සහ ඔවුනට උදවු උපකාර කිරීම සහතික කිරීමේදීත් බරපතල උපකල්පනවලට මුහුණ දෙන්නට සිදුවන්නේය. ඒවාගේම අභ්‍යන්තරිකව අවතැන්වූවන් සම්බන්ධයෙන් අනුමත කොට ඇති එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමෙහිලා ජාතික හා ප්‍රාදේශීය ආණ්ඩු ඉටු කරන භූමිකාව හා ඔවුන්ගේ යුතුකම් සම්බන්ධයෙන් දරුණු උපකල්පනවලට මුහුණ දෙන්නට සිදුවන්නේය.

අසල්වැසි බුරුමයෙන් සංක්‍රමණය වී සිටින දැවැන්ත ශ්‍රම හමුදාව සරණාගතයින් බවට පත් වූ විට ඔවුන්ට දඬුවම් කිරීමේ ආකල්පයෙන් තායි ආණ්ඩුව ක්‍රියා කළ අන්දමද මෙහිලා සඳහන් කළ යුතුය. දකුණු තායිලන්තයේ නැවතී සිටි, සුනාමියට හසුව දිවිගලවාගත්, බුරුම ජාතිකයන්ට එරෙහිව තායි බලධරයනුත් තායි පුරවැසියනුත් නිල වශයෙන් අසාධාරණ සැලකිලිවලට භාජනය කළ අන්දම දැක්වෙන සාක්‍ෂි ඕනෑතරම් ඉදිරිපත් කල හැකිය. පශ්චාත් සුනාමි සහන සේවා බෙදහැරීමත් ඒවා සම්බන්ධීකරණය කිරීමත් යන කාර්යයන්වලදී ස්වශක්තිය කෙරෙහි විශ්වාසය තැබිය යුතුය යන තායි ආණ්ඩුවේ ආකල්පය අගමැති තක්සින් ෂිනවත්‍රටත් තායිවරුන් තායිකමට ආදරෙයි (තායි රක් තායි) නම් ඔහුගේ දේශපාලන පක්‍ෂයටත් 2005 පෙබරවාරි 6 ද පැවැත්වූ මැතිවරණයේ ප්‍රචාරක ව්‍යාපාරයටත් ගැලපුනා විය හැකිය. එහෙත් ඒ ප්‍රචාරක ව්‍යාපාරය හේතුකොටගෙන ස්වකීය මිලිටරි ආණ්ඩුවෙන් පවා කිසිදු පිළිසරණක් නොලැබ සිටි ආපදාවට පත් බුරුම ජාතිකයින්ට විකල්ප සහනාධාරයක් ලබාගැනීම පවා අසීරු විය. තායි ආණ්ඩුවේ නිලධරයෝ ක්‍රියාත්මක කළ වැඩසටහන්වලින් බුරුම ජාතිකයන් ඈත්කර තැබුවා පමණක් නොව සුනාමියෙන් පසුව “නීති විරෝධි සංක්‍රමණිකයා” යන ලේබලය යටතේ ප්‍රාදේශීය පොලිසි විසින් ඔවුන් අත්අඩංගුවට ගනු ලැබ බුරුමයට නැවත පිටත්කොට යවන්නටත් පටන් ගත්හ.

ආන්ඩුවේ නිලධාරීන් ජාත්‍යන්තර මානවදයාවාදී හදිසි සහනාධාර බෙදදීම් සම්බන්දීකරණය කිරීම ප්‍රතික්‍ෂේප කළ අවස්ථා ඉන්දියාවෙනුත් වාර්තා විය. සුනාමි ආපදාවට ලක්වූ ප්‍රදේශවල සිටි කුලහීන යැයි සැලකෙන දලිත් ජනයාට ප්‍රාන්තීය නිලධාරීන් සහ සමහර පිරිස් අරියාදු කළ අවස්ථා එමට තිබිණ. කුල ක්‍රමය මත සමාජ ධූරාවලියත් ආධිපත්‍යයත් අතර උගුලේ පැටලී සිටි, සුනාමි ආපදාවෙන් ජීවිත ගලවාගත් දලිත් ජන කොටස්වලට වාර්තාවූ අන්දමට උසස් කුලයට අයත් යැයි සැලකෙන, එහෙත් අභ්‍යන්තරිකව අවතැන්වූ වෙරළබඩ ජීවත්වන අනෙකුත් ප්‍රජාවන්ගෙන් තාවකාලික නිවාස හා කඳවුරු සඳහා අවස්ථාව ලැබුනේ ස්වල්ප වශයෙනි. සරණ සොයා පැමිණි අවශේෂ දලිත් ජනයා එලවා ගන්නා ලද බවත් වාර්තා විය. ඒවාගේම අවතැන්වූ දලිත් ජනයාට ආණ්ඩුවේ නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධානවල කාර්ය මණ්ඩල සහ වෙනත් සිවිල් සමාජ සංවිධාන විසින් හදිසි සහනාධාර බෙදදීම වෙනත් අභ්‍යන්තරිකව අවතැන්වූ ජනකොටස් වලක්වා ලූ අන්දමත් වාර්තා විය.

සුනාමි හදිසි සහනාධාර ප්‍රතිචාරයට බාධා පැමිණවූ තවත් අසීරු කඩුල්ලක් හැටියට දරුණු ලෙස ආපදාවට පත්වූ සමහර ප්‍රදේශවල බලපැවැත්වූ හමුදාමය උපායික කරුණු දැක්විය හැකිය. එම ප්‍රදේශ අතරින්

ඉන්දුනීසියාවේ අචේ ප්‍රාන්තය, ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පලාත්, ඉන්දියාවේ නිකෝබාර් දූපත් දැක්විය හැකිය. 2003 මැයි මාසයේ සිට අචේ ප්‍රාන්තය පුරා හදිසි නීතිය ප්‍රකාශයට පත්කර තිබූ අතර සෙබළුන් 40,000 ක් එහි වාඩි ලාගෙන සිටියාහ. මෑතකාලයේදී දියත් කොට තිබූ කැරළි මර්දන ක්‍රියාන්විතවල අත්‍යවශ්‍ය කොටසක් හැටියට කඳවුරු නැවත නැවත පිහිටුවීම, සුනාමි ආපදාවෙන් පසු සහනාධාර බෙදීමේදී ඉන්දුනීසියානු හමුදාව ඉටු කළ වැඩ කොටස, විවාදයට තුඩු දී තිබෙන බැරැක්ක තුළට ගාල් කර තිබූ අභ්‍යන්තරිකව අවතැන්වූ ජනකොටස් සම්බන්ධීකරණය කිරීම, වැනි කාරණාවලදී මානවදයාවාදී ආධාර සැපයීමේ ප්‍රතිපත්ති සමඟ බරපතල අතරමැදි සමාදානයකට පැමිණෙන්නට එම සංවිධානවලට සිදුවිය. ශ්‍රී ලංකාවේ "මුදා නොගත් ප්‍රදේශවල," එනම් එල්ටීටීඊ සංවිධානයේ පාලනය යටතේ පැවති, සුනාමි ආපදාවෙන් හානියට පත් වෙරළබඩ ප්‍රදේශවලට ආධාර යැවීම සම්බන්ධයෙන්ද ඒ හා සමාන ගැටළු ඇති විය. එම ප්‍රදේශවල සහන කටයුතු ඉතා හෙම්හිට සිද්ධවූයේ කොළඹ පිහිටි ආණ්ඩුව ස්වකීය මධ්‍යගත අධිකාරී බලය ඉක්මවා යන ඕනෑම යාන්ත්‍රණයකට තදින්ම විරුද්ධවූ නිසාය. සෝමාලියාව තුල මධ්‍යම ආණ්ඩුවක් නොපැවතීමද සහනාධාර බෙදීමේදී ප්‍රශ්න ඇති කළේය. ඉන්දියාවේ උපායික නාවික කඳවුරු පිහිටා තිබෙන නිකෝබාර් දූපත්වල සුනාමි සහනසේවා හමුදා නායකත්වය යටතේ සිදුවූ බවට වාර්තා වූ අතර ඔවුන් ආදිවාසී ප්‍රජාවන් සහ සිවිල් පලාත්පාලන පරිපාලන යන්ත්‍රයද නොතකා අත්තනෝමතිකව ක්‍රියා කළ බවත් වාර්තා විය.

අනතුරුව සුනාමි සහන සහ ප්‍රතිසංවර්ධන කටයුතුවල නිරතව සිටි මානවදයවාවාදී කාර්යමණ්ඩල තමන් ලද ප්‍රතිචාර ඇගැයුම් කරන්නට පටන්ගත්හ. ආපදාවට පත් එක් ප්‍රදේශයක් තුල පමණක් නොව ප්‍රදේශ දෙක තුනකම සේවයේ යෙදුණු සමහර ඒජන්සි විවිධ දේශපාලන අත්දැකීම්වලට මුහුණදෙමින් තමන් ලද විවිධ ප්‍රතිචාර තුලනාත්මක පර්යාලෝකවල තබා ඇගැයුම් කරනු ඇතැ'යි බලාපොරොත්තු වනු ලැබේ. සුනාමියට පෙරාතුව සිටම ශ්‍රී ලංකාව තුල දිගුකාලයක් තිස්සේ ක්‍රියාත්මක වෙමින් සිටි UNHCR සහ වෙනත් එක්සත් ජාතීන්ගේ සංවිධාන සහනාධාර ප්‍රයත්නයන් සම්බන්ධයෙන් අචේ ප්‍රාන්තයට වඩා හාත්පසින්ම වෙනස් වූ යහපත් තත්තවයකට ශ්‍රී ලංකාවේදී මුහුණදුන් බැව් වාර්තා කලහ.

ආපදාව නිසා අභ්‍යන්තරිකව අවතැන් වූ ජනකොටස්වල අයිතිවාසිකම් රැකගැනීම සම්බන්ධයෙන් පැවති දුර්වලතාවන් එකී ජනකොටස් එක්රොක්වී සිටි ප්‍රදේශවල පරිපාලන හා දේශපාලන බලධාරීන්ගේ අවධානයට දැඩි ලෙස යොමු කරවන ලද්දේය. මෙලෙස විශේෂ කලාපයක් පළ කරන FMR සඟරාවේ කතුවරු සුනාමියෙන් පසු එම ප්‍රදේශවල නැවත පදිංචිවන ජනයා වෙනුවෙන් යම් යම් කරුණු සම්බන්ධයෙන් ලබා දිය යුතු ආරක්ෂණ පියවර ගැන අපගේ අවධානය යොමු කොට තිබේ. ඒවා අතර සහනාධාර පහසුවෙන් ලබැගැනීම, බලහත්කාරයෙන් වෙනත් තැන්වල පදිංචි කරවීම, ලිංගිකත්වය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩක්‍රියා, ස්වේච්ඡාවෙන්ම ආරක්ෂිත ප්‍රදේශ කරා නැවත පැමිණීම, නැතිවූ ලිපිලේඛන හා දේපොල නැවත ලබාදීම, යනාදි කාරණා ඒ අතර වෙයි. මේ ආරක්ෂණ වැඩ පිලිවෙල මුල් අවධිය තුලම ක්‍රියාවට තැබිය යුතුය. මන්දයත් කාලය ගතවීමත් සමගම ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතියද පරිහානියට පත්වන බැවිනි. ජනමාධ්‍යය වෙනත් කාරණා ගැන අවධානය යොමු කළත් ගැටුම් පවතින ප්‍රදේශ තුල සුනාමියෙන් ආපදාවට පත්වූ මහ ජනකොටසක් වෙසෙන්නාහ. රාජ්‍ය ආරක්ෂාවේ හා දෛනික දේශපාලනයේ ගතිකත්වය ගැන ක්‍රමානුකූල තුලනාත්මක විග්‍රහයක් කිරීම සඳහා කාලය එලැඹ ඇත්තේය. එම ගතිකත්වය හදිසියේ පහලවූ තත්ත්වයන් අභ්‍යන්තරිකව අවතැන්වූ ජනයාට ආරක්ෂාව ලබාදීමෙහිලා ඔවුනට උදව් කිරීමෙහිලා කෙතරම් බලපාන්නේද යන්න විග්‍රහ කිරීම සඳහා කාලය එලැඹ ඇත්තේය.

*ඊවා-ලොටා හෙඩ්මන් ඔක්ස්ෆඩ් විශ්ව විද්‍යාලයේ සරණාගත අධ්‍යයන කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකි. ඈ දකුණු ආසියාවේ ගැටුම් ගතිකයන්, ප්‍රචණ්ඩත්වය සහ අභ්‍යන්තරිකව අවතැන් වීම පිළිබඳ කාරණා ගැන විශේෂ අධ්‍යයනයක නිරත ව සිටී.* ***විද්‍යුත් තැපැල: eva-lotta.hedman@qeh.ox.ac.uk***

*ඉන්දුනීසියාවේ බන්ඩා අචේ ප්‍රදේශයේ වෙරළබඩ පහිටි නිවාසවල සුන්බුන්*



Mike Dubose/UMNS/ACT International

# එක්සත් ජාතීන්ගේ සංවිධානය සුනාමි ප්‍රතිචාරය තක්සේරු කරයි

මැරියන් කෝල්ඩ්‍රෙ හා ටිම් මොරිස්

*එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලය වෙත ඉදිරිපත් කර ඇති මේ වාර්තාව මානවදයාවාදී ප්‍රතිචාරවලින් ඉගෙන ගන්නා ලද පාඩම් පෙන්වා දෙයි. ආපදාවට ප්‍රතිචාර දැක්වීම සහ යළි ගොඩනැගීම සඳහා ජාතික උරුමයක හා නායකත්වයක අවශ්‍යතාව, වඩාත් හොඳ සම්බන්ධීකරණය, සම්පත් විනිවිදභාවයෙන් යුතුව යොදා ගැනීම, සිවිල් සමාජයේ සම්බන්ධය සහ අවදානම් අඩු කිරීම පිළිබඳ වැඩි සැලකිල්ල යන කරුණු නිර්දේශයන් මඟින් අවධාරණය කෙරේ.*

සුනාමියට ගොදුරුවූ රටවල් 12හේ දළ වශයෙන් 2,40,000ක් ජනතාව මිය ගොස් 50,000කට අධික පිරිසක් අතුරුදහන්ව හෝ මරණයට පත්ව හෝ ඇති අතර දස ලක්ෂයකට අධික පිරිසක් අවතැන්ව ඇත. වැඩි වශයෙන්ම පීඩාවට ලක් වූයේ දුප්පත් වෙරළබඩ ප්‍රජාවය. සුනාමිය බලපෑ බොහෝ ප්‍රදේශවල මිය ගිය කාන්තාවන්ගේ සංඛ්‍යා පිරිමින්ගේ සංඛ්‍යාව මෙන් තුන් ගුණයකි. විපතටපත් වූවන්ගෙන් තුනෙන් එකක්ම නියෝජනය වන්නේ ළමුන්ගෙනි. ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව හා සෝමාලියාව යන රටවලට සුනාමි ප්‍රහාරය එල්ල වූයේ සංකීර්ණ හා දිගුකාලීන යුද්ධයක පසුබිම මත වන අතර ඒ නිසාම මානුෂික ආධාර සංවිධානය කිරීම හා බෙදා හැරීම පිළිබඳව බරපතල අවුල්ද ඇති විය.

සුනාමිය බලපෑ රටවලින් කරුණු ආයාචනාවලට ප්‍රතිචාර වශයෙන් එක්සත් ජාතීන්ගේ ආපදා තක්සේරු හා සම්බන්ධීකරණ කණ්ඩායම් රටවල් 18ක් නියෝජනය කරමින් සුනාමියට ලක්වූ රටවල් 5කට වහාම යවනු ලැබිණ. එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන 16ක්, අන්තර්ජාතික රතු කුරුස / රතු අඬ සඳ සංගම් සම්මේලනයේ ප්‍රතිචාර කණ්ඩායම්, 160කට අධික අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සහ  ගණනය කළ නොහැකි තරම් පුද්ගලික සමාගම් හා දේශීය සිවිල් සමාජ කණ්ඩායම් අධාර අවශ්‍ය බවට ඇස්තමේන්තු කළ මිලියන 5කට අධික ජනතාවකට ක්ෂණික ආධාර, ජලය හා වෛද්‍ය සේවා සපයා දුන්හ. සහන සේවා කටයුතු සඳහා රටවල් 35ක හමුදා සිය සහාය දුන්නේ, භාණ්ඩ හා සේවා ආධාර සැපැයීම වෙනුවෙන් හා හමුදා සම්පත් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධීකරණය සඳහා එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ භාණ්ඩ හා සේවා මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ හා ඉන්දුනීසියාවේ සම්බන්දීකරණ මධ්‍යස්ථාන පිහිටු විය.

නිසි වේලාවට දැක්වුණු මේ ප්‍රතිචාර හේතුකොට ගෙන රෝග හා වසංගත තත්තවයන් උදානොවු අතර මිලියන දෙකක පමණ ජනතාවකට ආහාර ආධාර හා හදිසි වෛද්‍යධාර ලැබිණි. ව්‍යසනයෙන් 6 මසක් ඉක්මවන විට හදිසි අවශ්‍යතා ඉටු කර තිබිණ. බොහෝ කඳවුරුවල සනීපාරක්ෂක පහසුකම් අන්තර්ජාතිකව පිළිගත් අවම ප්‍රමිතීන්ට ද පහළ මට්ටමක පවතින හමුදා සුනාමියෙන් විපතට පත් හැම දෙනාටම පාහේ අවශ්‍ය හා ප්‍රමාණවත් තරම් ලැබේ. ශ්‍රී ලංකාවේ තාවකාලික නිවාස 30,000ක් පමණ ඉදි කර ඇති අතර ඉන්දුනීසියාවේ භූ චලනවලට ඔරොත්තු දෙන නිවාස 11,000ක් ඉදි වෙමින් පවති. කෙසේවුවද යළි ගොඩනැගීමේ ක්‍රියාවලිය ඉදිරියට යමින් තිබියදී වුව ද සැලැකිය යුතු මානවදයාවාදී අවශ්‍යතාවන් - විශේෂයෙන් කාන්තාවන්, ළමයින්, සුළු ජාතීන් හා සංක්‍රමණික සේවකයන් හා අවතැන්වූවන් අතර - තව මාස කිහිපයක් යන තුරු පවතිනු ඇත. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ පවුල් 9000කට වැඩි ප්‍රමාණයක් තවම වාසය කරන්නේ කූඩාරම්වලය.

සෝමාලියාව හැරුණු විට ව්‍යසනය බලපෑවේ ශක්තිමත් ජාතික ආණ්ඩු, හොඳින් සංවර්ධනය වූ ජාතික ආයතන හා ක්‍රියාත්මක නීති පද්ධතීන් ඇති රටවලය. සහන කටයුතු සාර්ථකත්වයට මේ තත්ත්වය බෙහෙවින් දායක විය. මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යාංශවල, සන්නද්ධ හමුදාවල - තවමත් හොඳින් ක්‍රියාත්මකව පවතින තැන්වල - පළාත්පාලන ආයතනවල කැපවීමෙන් යුතු දායකත්වය බොහෝ ප්‍රදේශවල මානවදයාවාදී මෙහෙයුම් සඳහා වාසිදායක විය. අන්තර්ජාතික හා දේශීය සහනසේවා ක්‍රියාකාරීන් හා ආණ්ඩු අතර සම්බන්ධතාව සහනාධාර බෙදා හැරීම සඳහා පහසුවක් වූ අතර මානවදයාවාදී හා මූලික යළි ගොඩනැගීම් කටයුතු රාජ්‍ය ආයතනවලට භාරදීමේ කටයුතු ද සරල කළේය.

## සම්බන්ධීකරණය

සුනාමියත් සමඟ එක්සත් ජාතීන්ගේ සංවිධානය කවර ද හෝ මුහුණ දුන් විශාලම අභියෝගයට මුහුණ දුන්නේය. සිද්ධියේ කාල නියමය හා පරිමාණය විසින් මග සලසනු ලැබුවේ ඉහළ මට්ටමේ රාජ්‍ය, පුද්ගලික හා ආණ්ඩුවල සහාය ද සහන ක්‍රියාකාරකම් හා ක්‍රියාකාරීන්ද ප්‍රමාණාත්මකව වැඩි කිරීමටය. උතුරා යන සහයෝගය අන්තර්ජාතික ප්‍රජාවේ ත්‍යාගශීලීත්වයට සහතිකයක් විය. එහෙත් ඒ සමඟම මානවදයාවාදී ක්‍රියාකාරීන් වෙත ඇස් යොමු වී තිබුණේ ඔවුන් කෙසේ ක්‍රියාකරනු ඇද්ද යන්න ගැන මෙන්ම ඔවුන් වියදම් කරන අරමුදල් ගැන කෙසේ ගිණුම් තබනු ඇද්ද යන්න ගැන බලාපොරොත්තු ද පැහැදිළි ලෙස ඉහළ ගිය හෙයිනි.

පොදුවේ සම්බන්ධීකරණය මැනවින් සිදු විණි. කාර්ය මණ්ඩල, උපකරණ, ප්‍රවාහන හා වෙනත් සහාය ලබා ගැනීමට පුද්ගලික අංශය සමඟ සහ ආධාර සපයන්නන් සමඟ පැවති පූර්ව සුනාමි විධිවිධාන නිසි වේලාවට ප්‍රතිචාර දැක්වීම සඳහා බෙහෙවින් ඉවහල් විය. කෙසේවුවද සම්බන්ධීකරණයෙහි යම් අඩු පාඩු තිබිණ. සමහර ජනතාවට සහනාධාර මෙන්ම තමනට අවශ්‍ය සහායයන් ලබා දීමට හොඳින් හැකියාව ඇති සහන සේවකයන් වුවමනාවටත් වැඩියෙන් ලැබී තිබිණ. ලැබුණු ආධාර හැමවිටම අවශ්‍යතාවලට ගැලැපෙන ලෙසම වූයේ නැත. මානවදයාවාදී ආධාර සපයන්නන්ගේ තදබදය ඇතැම් විට වැරදි සන්නිවේදනයට, සහනාධාර පමාවට මෙන්ම කාර්යය දෙපිරිසක් විසින් කරනු ලැබීමටද හේතු විය.

පරිපාලන අවශ්‍යතා ලිහිල් කිරීමට ආණ්ඩු දැක්වූ කැමැත්ත මූලික සහනාධාර හා ආධාර කණ්ඩායම් ඉක්මණින් පැමිණීමට ආධාර විය. කෙසේවුවද පසුව බොහෝ අවස්ථාවල රටවලට ඇතුළුවීමේ ක්‍රියාවලින් සංකීර්ණ විය. මේ නිසා සහනාධාර මෙහෙයුම් සඳහා ආධාර වන (පරිඝණක, විද්‍යුත් සන්නිවේදන උපකරණ හා වාහන ආදී) අයිතමයන් යොදා ගැනීමේ ප්‍රමාදයක් ඇති විය. සමහර ආණ්ඩු චන්ද්‍රිකා තාක්ෂණ භාවිතයට තහංචි පැනැවිය. මේ පරිපාලනමය අවහිරතා නිසා බෙහෙවින් අවශ්‍ය ආධාර බෙදාහැරීම හා සහන කටයුතු මෙහෙයැවීම මන්දගාමී විය.

අර්බුදයේ හුදු විශාලත්වය නිසා මෙන්ම පුහුණු පළපුරුදු කාර්ය මණ්ඩල වහා ස්ථානගත කොට පවත්වා ගෙන යාමට මානවදයාවාදී ප්‍රජාව අසමත් වීම ද හේතු කොට ගෙන වාසස්ථාන, ජලය හා සනීපාරක්ෂාව සැපැයීමේ අඩුලුහුඩු ඇති විය. එක්සත් ජාතීන්ගේ කාර්යමණ්ඩල නිලධාරීන් විශාල සංඛ්‍යාවක් පැමිණෙද්දි සිවිල්-හමුදා සම්බන්දීකරණය, සන්නිවේදනය හා තොරතුරු කළමණාකරණය යන අංශවල විශේෂ දැනුමක් ඇති කාර්ය මණ්ඩල යෙදවීමේ ප්‍රමාදයන් ඇති වීමද ප්‍රතිචාර පීඩාවට පත් කළ කරුණුය. මානවදයාවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයෙන් හා මානවදයාවාදී තොරතුරු මධ්‍යස්ථානවලින් සිවිල්මිලිටරි සම්බන්ධීකරණ නිලධාරීන් සාමාන්‍ය පරිපාලන ක්‍රියාදමය ඔස්සේම යැවුණු හෙයින් ඒ සඳහා කල් ගත විය. මේ අනුව දුරකතන සන්නිවේදන පද්ධතීන් යොදා ගැනීම දුෂ්කර වූ අතර පිළිගත් ප්‍රමිතීන් නොමැති වීමේ හේතුව නිසා දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම පීඩාවට පත් විය. අනාගත අර්බුදවලට සූදානම් වීමේ දී භාව්‍ය මානවදයාවාදී ප්‍රතිචාර හැකියාව වැඩි කිරීම සඳහා කටයුතු කළ යුතුය. ඒ සඳහා වෘත්තීය කාර්ය මණ්ඩලය හා පරිපාලනය ශක්තිමත් කිරීම හා පුළුල් කිරීමද දේශියව ඇති විශේෂඥ දැනුම හා රාජ්‍ය නොවන සංවිධානවල ශක්තිය උපයෝගී කර ගත හැකි සබඳතා සඳහා සහාය දැක්වීමද අවශ්‍ය වේ. පවතින ප්‍රාදේශීය හා කලාපීය පහසුකම් මත ආරම්භක ප්‍රතිචාර දියත් කළ හැකි සම්පූර්ණ බලය සහිත ස්ථාවර ගෝලීය ප්‍රතිචාර යාන්ත්‍රණයක් එක්සත් ජාතීන් යටතේ ඇති කිරීමෙන් සහනාධාර හා ආධාර කණ්ඩායම් අප්‍රමාදව පිටත් කර යැවීමේ හැකියාව ඇති වේ.

අවශ්‍යතා සහ ගුවන් යානා, නැව්, වාහන, මිනිස් බලය හා අනෙකුත් හමුදා දේපළ යොදා ගැනීමත් අතර වඩා හොඳ ගැලැපීමක් සඳහා




ශ්‍රී ලංකාවේ හම්බන්තොටදී සුනාමිය විසින් රැගෙන ආ බෝට්ටුවක් වහළය මත පතිතවීම නිසා කැඩී බිඳී ගිය නිවසක් පසුකරමින් සහනාධාර බඩු මල්ලක් රැගෙන යන ගෙහිමියෙකි

ඉහළ මට්ටමේ සිවිල්-මිලිටරි සම්බන්ධතාවක් අවශ්‍ය වේ. ක්ෂණික හා නිර්ලෝභී හමුද ප්‍රතිචාර, ළඟාවීමට අපහසු බොහෝ ජනතාවන් වෙත යාමට හැකියාව ලබා දුන් නමුත් සමහර අවස්ථාවල හමුද හා සිවිල් ක්‍රියාකාරිකයන් යන දෙපාර්ශවයේ කටයුතුද එකට පටලැවිණි. සහනාධාර බඩු භාණ්ඩ ඒවා අත්‍යවශ්‍යම ස්ථාන වෙත යෝග්‍ය පිළිවෙලට හා නිසි ප්‍රමාණයෙන් හැම විටම බෙදී නොගිය අතර සහනාධාර ලබා දෙන තවත් අංශයන්ද වර්ධනය විය. මේ අර්බුද ඇවිස්සුනේ හමුද අණදීම් ව්‍යුහය පිළිබඳ ප්‍රමාණවත් වැටහීමක් නොවීමත් හමුද අංශ හා මානවදයාවාදී ප්‍රජාව අතර තොරතුරු බෙදහද ගැනීමේ දුර්වලතාන් නිසාය. සුනාමිය පූර්වාදර්ශයක් ඇති කළ අතර අනාගත මානවදයාවාදී මෙහෙයුම්වල දී හමුදව සැලකිය යුතු මෙහෙවරක් ඉටු කරනු ලැබීමට බෙහෙවින් ඉඩකඩ තිබේ. ඒ නිසාම හමුදව හා මානවදයාවාදී හවුල්කරුවන් අතර වඩා හොඳ සන්නිවේදන මාර්ග හා සම්බන්ධීකරණ වැඩ පිළිවෙල ඇති කර ගැනීම අතිශයින් වැදගත්ය.

බොහෝ අවස්ථාවල එක්සත් ජාතීන්ගේ නේවාසික මානවදයාවාදී සම්බන්ධීකරණ නිලධාරියාට නායකත්වය සැපැයීමට අවශ්‍ය කාර්යමණ්ඩල සම්පත් ගිඟ විය. ආරම්භයේ සිටම යළි ගොඩනැගීමේ කටයුතු පටන් ගැනීමේ හැකියාවක් මෙන්ම වැදගත් සම්බන්ධීකරන කටයුතු සම්පාදනය කිරීමේ හැකියාවක් වෙනුවෙන් ආධාරක කාර්යමණ්ඩලයක් වහාම ඔවු වෙත ලබාදීම වැදගත්ය.

ව්‍යසනයෙන් ගොඩ ඒමේ කටයුතු සම්බන්ධීකරණය කළ යුත්තේ කවුරුන්ද යන්න පැහැදිලි කර ගැනීමට ජාත්‍යන්තර ප්‍රජාවට අවශ්‍යය. ව්‍යසනයට ප්‍රතිචාර දැක්වීම මේවන විට ජාත්‍යන්තරව පිළිගැනුණු ප්‍රමිතීන්ට අනුව හැඩ ගැසී ඇති අතර පුළුල් පරාසයක ක්‍රියාකාරීන් සම්බන්ධ වන ව්‍යසනයෙන් පසු යළි ගොඩනැගීමේ කටයුතු සඳහා සම්මත සම්බන්ධීකරණ ව්‍යුහයක් නැත. මෙය රටවල් මට්ටමේ ජාත්‍යන්තර සම්බන්ධීකරණයේ දී විශේෂයෙන් සත්‍ය වන අතර නේවාසික සම්බන්දීකාරකයනට ප්‍රමාණවත් සහායක් නැති හේතුව මත මෙය තවත් තීව්‍ර වේ.

## අවතැන්වීම හා ආරක්‍ෂාව පිළිබඳ අභියෝග

සුනාමිය සිදු වූ මොහොතේම අවතැන්වූ ජන සංඛ්‍යාව දශ ලක්ෂයක් බව ඇස්තමේන්තු කර ඇත. සති කිහිපයකට පසු තත්ත්වය ස්ථාවර වීම හා ජනතාව නැවතත් තම මේ ප්‍රදේශ වෙත ආපසු එන්නට පටන් ගැනීම නිසා තාවකාලිකව අවතැන්වූ පිරිස අඩු වන්නට විය. අවතැන්වූ ජනතාව විසිරීයාමත් (විශේෂයෙන් අචේ ප්‍රාන්තයේ), සත්කාරක සුනාමියෙන් පීඩාවට පත් විවිධ තරාතිරම්වල ජනතාවගේ විවිධ අවශ්‍යතාවලට ගැළැපෙන පරිදි සහන කටයුතු සැලැසුම් කිරීමේදී අන්තර්ජාතික ප්‍රජාවට මෙන්ම දේශීය බලධාරීන්ටද අභියෝගයක් විය. ජනතාව තාවකාලිකව නැවත පදිංචි කරවීමේ මූලික කටයුතු ශ්‍රී ලංකාවේ හා ඉන්දුනීසියාවේ දේශපාලන තත්ත්වයන් මත ද මාලදිවයිනේ කලින් සිදු කළ නැවත පදිංචි කිරීම් මත ද තවදුරටත් සංකීර්ණ විය.
අවතැන්වූ ජනතාවගේ විශේෂ අවශ්‍යතාවන් ක්ෂණිකව ඉටු කර දීම අත්‍යාවශ්‍යය. මානවදයාවාදී පිළිවෙත වන්නේ හැකිතාක් දෙනාගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය දෑ ලබා දීමට උත්සාහ ගැනීම නිසා අවතැන්වූ අයට අවශ්‍ය විශේෂ ආරක්ෂාව හා සහනාධාර සඳහා අවධානය යොමු කළ යුතුය. කලින් පැවැති අසමානතා යළි ඇති නොවන ආකාරයෙන් හා සහනාධාර සාධාරණ ලෙස බෙදී යාම සහතික කරනු වස් ආරම්භයේ සිටම සහනාධාර සැලැසුම් කිරීමේ දී ඔවුන් සම්බන්ධ කර ගැනීම අවශ්‍යය. අවතැන්වූවන්ගේ හා සත්කාරක පවුල්වල ආරක්ෂාව සැලැසීමේදී හා ඔවුනට සහාය දීමේදී විශේෂ පියවර ගැනීමට ප්‍රමුඛත්වය ඒ නිසා දිය යුතුය. අභ්‍යන්තරිකව අවතැන්වූවන් සඳහා වන එක්සත් ජාතීන්ගේ නියමු ප්‍රතිපත්ති[1] ස්වාභාවික ආපදවන් වෙත ව්‍යාප්ත කළ යුතුය.

## පරිත්‍යාගිලින්ගේ නිර්ලෝභීත්වය නිසා අරමුදල් යොද ගැනිමේ අභියෝග ජනනය වීම

සුනාමි ව්‍යසනය රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම පෙර නුවූ විරූ අනුකම්පාවක් හා සම්පත් ගලා ඒමක් ජනිත කළේය. එ.ජා. ඇස්තමේන්තු අනුව ඩොලර් බිලියන 6.8ක ආධාර මුදල් සඳහා ප්‍රතිඥ ලැබී ඇත: රාජ්‍ය අංශවලින් ඩොලර් බිලියන 5.8 ක්ද, සමාගම් හා පුද්ගලික පරිත්‍යාගවලින් ඩොලර් බිලියන 1 ක්ද වශයෙනි. මානවදයාවාදී හා යළි ගොඩනැගීමේ කටයුතු වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය කළ හදිසි ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් දින 15ක් ඇතුළත අවශ්‍ය මුදල වූ ඩොලර් බිලියන 977න් 60% ක්ම එක්කෝ එකතු විය, නැතිනම් ලබා දෙන බවට ප්‍රතිඥා ලැබී ඇත. මානවදයාවාදී

කටයුතු පිලිබඳ සම්බනධීකරණ කාර්යාලයේ (OCHA) මූල්‍ය අධීක්‍ෂණ සේවා අංශය (FTS) ඇස්තමේන්තු කළ අන්දමට 2005 ජුනි මාසය වන විට අභියාචනය වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 880 ක් එකතු වී තිබිණ. තවත් එක්සත් ජනපද ඩොලර් මිලියන 162 ක් ලබා දෙන්නට පොරොන්දු වී තිබිණ. සුනාමි ආධාර බොහොමයක් ලැබී ඇත්තේ IFRC (ඩොලර් බිලියන 2.2ක් ඔවුන් වෙත ලැබී ඇත) හා විශාල රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව එක්සත් ජාතීන්ගේ නොවන මාර්ග ඔස්සේය.

බහුල වශයෙන් මූල්‍ය සම්පත් තිබීම නිසා අරමුදල් සොයා ගැනීම ගැන නො වෙහෙසී කටයුතු කිරීමට මානුෂීය ප්‍රජාවට ඉඩ සැලැසුණු අතර පෙර කී ආකාරයේ පරිත්‍යාග විසින් ඇති කරනු ලැබූ ශකක්තිමත් මුල්‍ය වතාවරණය විසින් මානවදයාවාදී සංවිධාන වෙත පීඩන එල්ලවූයේ ඒ මුදල් වහා වැය කරන ලෙසටය. සුවිශාල මූල්‍ය සම්පත් ද ආධාර දුන් ආයතන විසින් ඉක්මණින් ප්‍රතිඵල අපේක්ෂා කිරීමද නිසා බොහෝ සංවිධාන සමාගම් ව්‍යාපෘති ආරම්භ කරමින් ඒවා ක්‍රියාවට නැංවූයේ සුවිශාල කාර්ය මණ්ඩල ද යොද ගනිමිනි. ක්ෂණික ක්‍රියාකාරිත්වය සඳහා තිබුණු උනන්දුව හමුවේ බොහෝ අන්තර්ජාතික ක්‍රියාකාරිනට හැඟී ගියේ ඔවුන්ගේ ජාතික හා දේශීය හවුල්කරුන්ද නොතකා හරින බවකි.

සමහර අවස්ථාවල සහන කටයුතුවල යෙදීමට හැකි ප්‍රමාණයට අවශ්‍ය මුදල් ප්‍රමාණය බෙහෙවින් ඉක්මවා යන මුදල් සමහර සංවිධානවලට ලැබී තිබිණ. තමන්ගේ කලින් සැලැසුම් වහා වෙනස් කොට ලැබී තිබුණු ආධාර මුදල් ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳව සන්නිවේදනය කිරීමට හා වාර්තා කිරීමට නව ක්‍රමෝපායන් සකස් කිරීමටද ඇතැම් සංවිධානවලට සිදුවිය. මහජන විශ්වාසය පවත්වා ගෙන යාම සඳහා මානවදයාවාදී සංවිධාන ඉතිරි වන මුදල් යොදවන්නේ කුමකටද යන්න පසෙක තිබියදී - තම අපේක්ෂිත ව්‍යාපෘති පිළිබඳ ආධාර සැපයුවන් වෙත නිසි පරිදි දැනුම් දෙන බව සහතින කළ යුතුය.

සුනාමි ප්‍රතිචාර සඳහා ආධාර ලබා දීමට අළුතින් එක් වු පරිත්‍යාගශීලීන් තවදුරටත් අනාගත ආපදාවන්හීදිත් එලෙසම ආධාර කිරීමට පොළඹවනු වස් පැහැදිලිව ප්‍රදර්ශනය කළ හැකි ගිණුම් වාර්තා තබා ගැනීම හා වගකීම අවශ්‍යය. මානවදයාවාදී ප්‍රජාව සතුව මානව ස්ථාපිත ගිණුම්කරණ යාන්ත්‍රණයක් පැවැතියද විශේෂයෙන් පුද්ගලික අංශයෙන් සුනාමි ආධාර ලෙස ලැබුණු හෝ ප්‍රතිඥා දුන් හෝ දැවැන්ත මුදල් ප්‍රමාණය හේතු කොට ගෙන ඒවා වියදම් කරන්නේ කුමන අයුරින්ද යන්න ගැන දැඩි නිරීක්ෂණයක අවශ්‍යතාව දැඩි වී තිබේ. ප්‍රයිස් වෝටර්හවුස් කූපර්ස් නම් අන්තර්ජාතික ගිණුම්කරණ ආයතනය වහාම ගිණුම් කටයුතු කිරීමටත්, එක්සත් ජාතීන්ගේ ක්ෂණික ආයාචනයට අනුව ලබා දීමට පරිත්‍යාගශීලීන් විසින් පොරොන්දු වෙන ලද මුදල් එකතු කර ගැනීමටත්, හදිසි ආයාචන සඳහා පොරොන්දු වු මුදල් එකතු කර ගැනීමේ වත්මන් එක්සත් ජාතීන්ගේ ක්‍රියා පිළිවෙත වැඩි දියුණු කිරීමටත් නොමිලේ සහාය දීමට ඉදිරිපත්ව සිටී.

පෙර අත්දැකීම් - 1998 මිච් සුළි සුළං හා 2003 දෙසැම්බරයේ ඉරානයේ භූමිකම්පාව - පෙන්වා දෙන්නේ ව්‍යසනයන් පිළිබඳ ප්‍රවෘත්ති පළ වූ වහාම පහසුවෙන් ආධාර ගලා එන නමුත් අවධානය කෙමෙන් වියැකී යාමත් සමගම ලැබෙන ආධාර ද වියලී යන බවයි. ව්‍යසනය සඳහා ආධාර ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා ඇති කවුළුව පටු මෙන්ම කෙටිකාලීන බව හඳුනාගැනීමේන් පසු ආධාර ලබා ගැනීම සඳහා කළ ආයාචනය සුනාමියෙන් පසු යළි ගොඩනැගීමේ කටයුතු දක්වා ව්‍යාප්ත කැරිණි. මේ නම්‍යතාව නිසා වාසස්ථාන, ජීවනෝපාය සංවර්ධනය, ක්ෂුද්‍ර යටිතල පහසුකම් යන පරිසරය සඳහා අරමුදල් නංවා ගැනීමටද යළි ගොඩනැගීමේ සැලසුම් හා වැඩ සටහන් ඉක්මනින් ආරම්භ කිරීමට ද හැකියාව ලැබී ඇත. යළි ගොඩනැගීමේ කාර්යයන් දක්වා ආධාර ඉල්ලා සිටීමේ ආයාචනා ව්‍යාප්ත කිරීම හැම ව්‍යසනයකට පසු සිදු කැරෙන සේ ස්ථාවර වැඩ පිළිවෙලක් බවට පත් කළ යුතුය. එක් සවිස්තරාත්මක වැඩ පිළිවෙලකට ගොනු කළ පොදු මූල්‍ය මාර්ග දත්ත පදනමක් ඇති කර ගැනීමෙන් - නිල වශයෙන් ලැබෙන ආධාර, රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලික අංශයේ පරිත්‍යාග - යලි ගොඩනැගීමේ සැලැසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට පහසුවක් සැලැසෙනු ඇත.

## සහනාධාර හා සංවර්ධනය අතර හිඩැස පියවීම

යළි ගොඩනැගීම් සැලැසුම් කිරීමේ හා ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියේදී මුල සිටම ජාතික හිමිකමක් හා සහභාගීත්වයක් ඇති කර ගැනීම අත්‍යාවශ්‍යය. යළි ගොඩනැගීම් වැඩසටහන් විපතටපත් ජනතාවගේ හැකියාවන් හා අවශ්‍යතාවන් යළි ගොඩනැගීමේ වැඩසටහන්වලදී සැලැකිල්ලට ගන්නා බව සහතික කරනු වස් දේශීය ආපද කලමනාකරණ ප්‍රවීණයන්ගේ හා කාර්මිකයන්ගේ සහභාගීත්වය වැදගත්ය.

හදිසි සහනාධාර සැපැයීමේ පළමු අදියරේදීම කල් ඇතිව යළි ගොඩනැගීමේ සැලැසුම් වෙතද අවධානය යොමු කිරීම ජනතාවට යලි සිය දෙපයින් නැඟී සිටීමට ආධාර විය. ඉන්දුනීසියාවේ සුන්බුන් ඉවත් කිරීම සඳහා “වැඩ සඳහා මුදල්” තේමාව යටතේ ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙලින් ගමේ ආර්ථිකයට මුදල් ගලා ආවේ ඒ වැඩවල නිරත වූ 11,000ක් දෙනා මානසික ප්‍රබෝධයකට ද පත් කරමිනි. කෙසේවෙතත් ඇතැම් බොහෝ ප්‍රදේශවල කල් ඇතිව යම් ගොඩනැගීම් කිරීම පහසු නොවූවේ පාරවල්වලට සිදුව තිබූ හානිය කල් ඇති ඉදිකිරීම් සඳහා අවශ්‍ය බඩු භාණ්ඩ ප්‍රවාහණය පිළිබඳ ගැටළු ඇති කළ හෙයිනි. යන්ත්‍රෝපකරණ ඇති පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගේ මෙන්ම පොරොන්දුව සිටින කොටස්කරු- වන්ගේ හැකියාවන් යොද ගැනීමෙන් හා ගුවන් ප්‍රවාහනය භාවිතා කිරීමේන් මේ ගැටළු නිරාකරණයට සහාය විය හැකිය.

අවදනම් අඩු කිරීමේ පියවර ව්‍යසනයෙන් පසු යළි ගොඩනැගීමේ මෙහෙවර බවට පත් කිරිම සඳහා පුළුල්ව විහිදුණු යාන්ත්‍රණයක් එක්සත් ජාතීනට නැත. යළි ගොඩනැගීමේ වැඩපිළිවෙලට සහායදීම සඳහා තාක්ෂණ විශෛෂඥයන් යැවීමේ පිළිවෙල වැඩිදියුණු කිරීමටත් යළි ගොඩනැගීමේ හා පීඩා අවම කිරීමේලැ මැදිහත් වීම සඳහා


UNICEF/HQ050129/Jim Holmes

*ඉන්දුනීසියාවේ බන්ඩා අචේ වෙරළෙන් කිලෝමීටර 4ක් පමණ ඈතින් පිහිටා තිබෙන වීදියකි*




තාවකාලික නිවාස, ශ්‍රී ලංකාව

අරමුදල් යොදන බවට සහතික වීමටත් සුදුසු අගැයිම් ක්‍රමවේදයක් හඳුනා ගැනීමේ අවශ්‍යතාව පවති.

## සිවිල් සමාජය හා දේශීය බැඳීම

සහනාධාර හා යළි ගොඩනැගීමේ මෙහෙවර සඳහා සිවිල් සමාජය අප්‍රමාණ දයකත්වයක් ලබා දී ඇත. පලාත් ආණ්ඩු හා ජාතික බලධාරීන් සමග සහයෝගයෙන් යළි ගොඩනැගීමේ මෙහෙයුම් සංවිධානය කිරීම සඳහා දේශීය තායි නියෝජිතායතනවල සහාය අත්‍යවශ්‍ය වූ අතර ඔවුන් නිසා නොවේ නම් අමතකව ගිය හැකිව තිබුණු බුරුම සංක්‍රමණික සේවකයන් සහ මුහුදු ගෝත්‍රිකකකයන්ගෙන් ශේෂව සාම්ප්‍රදායික පැවැත්මක් ඇති එකම සුළු ජන කොට්ඨාශය වන මෙකෙන් ජාතිකයන් වෙත ඔවුහු අවධානය යෙදවූහ. ඉන්දුනීසියාවේ අචේ යළි ගොඩනැගීමේ මණ්ඩලය රජයේ ප්‍රධාන ප්‍රතිනිර්මාණ සැලැස්ම වැඩි දියුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ට සහ අන්තර්ජාතික මූල්‍ය ආයතනවලට ද එක්සත් ජාතීනටද උපදෙස් හා සහාය ලබා දුන්නේය. අචේ ප්‍රාන්තයේ සිවිල් සමාජය සමඟ පුළුල් ලෙස කළ සාකච්ජා සැලැසුම් ක්‍රියාදමය පිළිබඳ විශ්වාසය තවදුරටත් ඉහළ නැංවීය.

යළි ගොඩනැගීමේ වැඩසටහන් විපතට පත් ජනතාවගේ හැකියාවන් හා අවශ්‍යතාවන් පිළිබඳව ඔවුන්ගේද සහභාගීත්වයෙන් සිදු කෙරෙන මනා ඇස්තමේන්තුවක් පදනම්ව සිදු කළ යුතු බව පුළුල්ව වටහා ගෙන ඇති අතරම ප්‍රායෝගිකව මෙය හැම විටම එසේ වී නැත. බොහෝ රටවල විපතටපත් ජනතාව යළි ගොඩනැගීමේ වැටසටහන්වලට සිය දයකත්වය ලබා නොගැනීමේ කාරණය මතු කර ඇත.

ආරම්භයේ සිටම අන්තර්ජාතික ක්‍රියාකාරීන් ඒ ඒ රටවල රාජ්‍ය නිලධාරීන් සමග සබඳතා ගොඩනගා ගෙන තිබිණ. විපතට පත් රටවල ආණ්ඩු සහන කටයුතු කැරෙන කාලයේ දී සිය බලය කේන්ද්‍ර කර ගැනීමට උත්සාහ නොකළ නමුත් සහන සැලසීමේ කටයුතු සඳහා උප-ජාතික මට්ටමින් සබඳතා ඇති කර ගැනීම හා සම්බන්ධීකරණය පිළිග්තේය. කෙසේවුවද සුනාමිය ප්‍රදර්ශනය කළේ පලාත් ආයතන ව්‍යුහය සතුව සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීමට තරම් සම්පත් නොමැති බවයි. බාහිර නියෝජිතයාතන හා පලාත් පාලන ආයතන පූර්ව ව්‍යසන සැලැසුම් සකස් කිරීමටත් ප්‍රාදේශීය සංවිධානවල ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ගොඩැනැංවීමටත් එකට එක්ව කටයුතු කිරීම අවශ්‍යය.

ආපදවල බලපෑමෙන් තම දේපල මෙන්ම තම ජිවිත ආරක්ෂාව සලසා ගැනීම සඳහා දැඩි අවදනම් සහිත ජනතාවට බලය පැවැරීමේ අවශ්‍යතාව සුනාමිය විසින් මතුකර පෙන්වා දෙනු ලැබ ඇත. ආපදවට මුහුණ දීමේ ප්‍රජා මූලික සූදනමක සැලැසුම් වැඩිදියුණු කිරීම - ආහාර හා බෙහෙත් රැස්කර තබා ගැනීමේ සිට ගංවතුර තර්ජනය පවතින ප්‍රදේශවල බැම් ඉදිකිරීම දක්වාත්, පාසල් විෂය මාලාවේ සහ ගුරු පුහුණු පාඨමාලාවල ව්‍යසනවලට සූදනම් වීම කොටසක් කිරීම - යම් පමණකට ආපදවලින් හානි අඩු වීමට හේතු වනු ඇත. අනතුරු අඟවීමක් කළ විට නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රාදේශියව කල් ඇතිව අනතුරු ඇඟවීම් කිරීමේ පද්ධති, භූමිකම්පාවලට ඔරොත්තු දෙන ගොඩනැගිලි ඉදි කිරීම, පලා යා හැකි මාර්ග හඳුනාග ැනීම සහ එකඟවුණු සන්නිවේදන හා තොරතුරු ක්‍රමෝපායන් අත්‍යාවශ්‍යය. ශක්තිමත් යටිතල පහසුකම් මෙන්ම ශක්ති සම්පන්න සිවිල් සමාජ ප්‍රතිඵල ලෙස ඇති වන ඵලදයි ආර්ථික වර්ධනයන් සඳහා දිගුකාලීන සහයෝගය ලබා දීම ස්වාභාවික විපත්තිවලින් ගැලැවීමේ සූදනමින් සිටිම සහතික කිරීමට ජාතීනට උදව් වනු ඇත. අන්තර්ජාතික ප්‍රජාව ජනතා මූලික කල් තබා අනතුරු ඇඟවීමේ පද්දතියක් වෙනුවෙන් ආයෝජනය කළ යුතුය. ආපද තක්සේරුව, අවබෝධතා නැංවීම හා සූදනම් වීමේ පියවර ඊට ඇතුළත් විය යුතු අතර එවිට කළ යුත්තේ කුමක් දැයි ජනතාව දන්නා නිසා අනතුරු ඇඟවීම්වලට අනුව ක්‍රියා කිරීමට ඔවුනට පුළුවන.

ප්‍රතිචාර දැක්විමේ හා යළි ගොඩනැගිමේ සැලැසුම් විපතට පත් ජනතාවගේ හැකියාවන් හා අව්‍යශ්‍යතාවන් ඔවුන් සමග සහභාගීත්වයෙන් කැරෙන විශ්වාසවන්ත තක්සේරු මත පදනම් විය යුතු වන අතර ඒ අනුව ප්‍රාදේශීය මුලපිරීම්, සම්පත් හා හැකියාවන් සම්පූර්ණයෙන් තේරුම් ගැනීම හා උපයෝගි කර ගැනීම සිදු වන්නේය. උපදේශන යාන්ත්‍රණ හා ප්‍රමුඛත්ව සැලැසීම් ක්‍රියාකාරකම් යළි ගොඩනැගීමේ පිළිබඳ ප්‍රමුඛතාව, වැඩකොටස් හා වගකීම් සහ සම්පත් පිළිබඳ ඒකමතිකත්වයක් ගොඩනැගීමට දයක වන්නේය. මීළඟ ව්‍යසනය පහර එල්ල කිරීමට පෙර ප්‍රතිචාර දක්වන ප්‍රජාව සුනාමියෙන් ඉගෙන ගත් පාඩම් සටහන් කර පතුරුවා හැරීමේ ඉඩකඩ මඟ නොහැරිය යුතුය.

*ECOSOC වාර්තාවේ පළවූ කරණු තෝරා නැවත සකස් කොට මෙම ලිපිය සූදානම් කරන ලද්දේ FMR කතුවරුන් විසිනි. "ඉන්දීය සාගරය ඇතිවූ සුනාමි ආපදවෙන් පසු හදිසි සහනාධාර, පුනරුත්ථාපනය, ප්‍රතිසංවිධානය, ප්‍රතිකාරය සහ වැලැක්වීම යනාදිය ශක්තිමත් කිරීම: එක්සත් ජාතීන්ගේ ලේකම්වරයාගේ වාර්තාව" 2005 ජුලි.* ***www.un.org/docs/ecosoc*** *අඩවියෙන් ලබා ගත හැකිය. වාර්තාවට සපයන ලද අර්ථ නිරූපණ සහ අවධාරණ FMR කතුවරුන්ගේ ඒවා මිස එක්සත් ජාතීන්ගේ නොවේ.*

1.www.brook.edu/fp/projects/idp/gp_page.htm

# ස්වභාවික ආපදා සහ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ අයිතිවාසිකම්

වෝල්ටර් කලින්

*සුනාමියට ගොදුරු වී දිවි ගලවාගත් පුද්ගලයින්ට ආධාර සැපයීම සඳහා තේරුම්ගත හැකි අවතැන්වූවන් හදිසි ක්‍රියාවලිය තුල එකී බේදවාචකය නිසා බලයෙන් අවතැන්වූවන් සතු මානව අයිතීන් සුරැකීම නම් කාරණය සඳහා ලබාදී තිබුණු අවධානය නම් ප්‍රමාණවත් නොවේ.*

ආරක්‍ෂාව පිළිබඳ වැදගත් තේමා ලෙස පහත සඳහන් කරුණු දැක්විය හැකිය: ආධාර ලබා ගැනීමට ඇති හැකියාව, ආධාර ලබාදීමේදී ඇතිවිය හැකි පක්‍ෂග්‍රාහීත්වය, බලයෙන් වෙනත් ප්‍රදේශවල පදිංචිකරවීම, ලිංගික හා ස්ත්‍රීපුරුෂ සමාජභාවී ප්‍රචණ්ඩත්වය, දරුවන් සටන්කාමී කණ්ඩායම්වලට බඳවා ගැනීම, ලිපි ලේඛන නැතිවීම, ආරක්‍ෂිත හා ස්වෙච්ඡාවෙන් නැවත පැමිණීමට ඇති හැකියාව හෝ නැවත පදිංචිය සහ දේපල වන්දි පිළිබඳ වාද විෂයන්ද සුනාමියට ගොදුරු වූ රටවල් වඩ වඩාත් ආධාර සැපයීමේ සිට ප්‍රතිසංස්කරණ කටයුතු වෙතට පරිවර්තනය වත්ම මානව අයිතීන් පිළිබඳ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීමට ඇති අවශ්‍යතාව ප්‍රධාන වේ.

වෙනත් ස්වභාවික ආපදා පිළිබඳ අත්දැකීම්වලින් අපට පෙන්වා දී ඇති කරුණ නම් සති හෝ මාස හෝ කීපයක් තුලදී අවතැන්වූවන්ට තම නිවෙස්වලට නැවත පැමිණිය නොහැකි වන අවස්ථාවලදී නව වාසස්ථාන ලබා ගත නොහැකි වන අවස්ථා වලදී මානව අයිතීන් උල්ලංඝනයවීමේ අවකාශ වැඩි වන බවය. ස්වභාවික ආපදා සන්දර්භය තුලදී, අවතැන් වූ කාල සීමාව වැඩිවත්ම පක්‍ෂග්‍රාහී සැලකීම් සහ ආර්ථික / සමාජ / සංස්කෘතික අයිතීන් උල්ලංඝනය කිරීම් වඩාත් තීව්‍ර විය හැකිය. බොහෝ විට මෙවන් උල්ලංඝණයන් සිතා මතා සැලසුම්කල හෝ ක්‍රියාත්මක කල හෝ ඒවා නොව, නුසුදුසු ප්‍රතිපත්තිවල ප්‍රතිඵල වේ. මේ නිසා අදාල මානව අයිතීන් ආරක්‍ෂණයන් පිළිබඳ මුල සිටම සැලකිල්ලක් දැක්වුවහොත්, මේ තත්ත්වයෙන් පහසුවෙන්ම මගහරවා ගත හැකිය.

අභ්‍යන්තරික අවතැන්වීම පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති[1] මගින් ආපදා මගින් ඇති කරන ලද අවතැන්වීමේ තත්ත්වලදී මානව අයිතීන් පිළිබඳ අභියෝග ආමන්ත්‍රණය කිරීමට ප්‍රතිමාණක ව්‍යුහයන් සපයා දෙයි. මේ ප්‍රතිපත්ති හේතුකොටගෙන තම නිවෙස් හැරයන්නට සිදුවෙන පුද්ගලයින් බොහෝදෙනෙකු අවතැන්වීමට හේතු කුමක් වුවද එක හා සමාන ගැටළු සමුදායකට මුහුණපෑමට සිදුවෙන බව නම් පිලිගැනීමට සිදුවේ. මේ නිසා යම් ප්‍රතිපත්ති මගින්, අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් යන පදය සඳහා පුළුල් නිර්වචනයක් යොදා ගනී. එනම්, අභ්‍යන්තරිකව අවතැන්වූවන් යනු තම නිවෙස් හෝ තමන් සම්ප්‍රදායිකව වාසය කල ප්‍රදේශවලින් ගැටුම් හා සිවිල් කොලහාලවලට අමතරව ස්වභාවික ආපදා නිසාද පැන යන්නට සිදු වූ පුද්ගලයින් වශයෙනි.

### පශ්චාත් ස්වභාවික ආපදාවලදී පැහැදිලිව දැකගත හැකි මානව අයිතීන් පිළිබඳ අභියෝග

**ආධාර ලබා ගැනීමට ඇති ප්‍රවේශය:** අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට ජාතික බලධාරීන්ගෙන් ආරක්‍ෂාව සහ ආධාර ඉල්ලා සිටීමට හා ලබා ගැනීමට අයිතියක් තිබේ. සාමාන්‍යයෙන්, සුනාමි තත්ත්වයන්ට මුහුණ පෑ යන කොටස්වලට සීග්‍රයෙන් ආධාර සැපයීමට බොහෝ රාජ්‍යයන් උනන්දුවන් පෙන්නුම් කර ඇත. එමෙන්ම විදේශ ආධාර අවශ්‍ය වූ රාජ්‍ය ඒවා ලබා ගන්නේ ජාත්‍යන්තර ප්‍රජාවේ සහභාගීත්වය ඇතිවය. තමන්ට එවන් ආධාර සැපයීමේ හැකියාවන් නොමැති අවස්ථාවලදී  වුවද, ආධාර අවශ්‍ය ප්‍රජාවන් වෙත යාමට ඇති මාර්ග අසුරා නොදැමිය යුතුය. ආපදාවන්ට ලක් වූ පුද්ගලයින් වෙත ආධාර ගෙනයාම සඳහා අවශ්‍ය බලපත්‍ර ලබා ගැනීමේදී ඇති විය හැකි අනවශ්‍ය ප්‍රමාදවීම් වැනි ආධාර සීමා කිරීම් මතු නොවීමට රජයන් වග බලා ගත යුතුය.

**පක්‍ෂග්‍රාහී නොවීම:** ස්වභාවික ආපදාවලින් පසුව මානුෂික ආධාර සහ නැවත ස්ථානගතකිරීම සඳහා අවශ්‍යවන ආධාර බෙදාහැරීමේදී සහ නැවත පදිංචිකරවීම පිළිබඳ තීරණ ගැනීමේදී පක්‍ෂග්‍රාහී තත්ත්වයන් මතු විය හැකිය. මාර්ගෝපදේශක ප්‍රතිපත්තිවලින් ස්ථිර කර තිබෙන ආකාරයට ආධාර ලබා දිය යුත්තේ දීර්ඝකාලීනව පිලිගෙන ඇති මාර්ගෝපදේශක මධ්‍යස්ථභාවය සහ පක්‍ෂග්‍රාහී නොවීම යන ප්‍රතිපත්තිවලට අනුකූලවය. එනම් ජනවර්ගය, ජාතිය, ආගම හෝ කුලය මත පක්‍ෂග්‍රාහී නොවිය යුතු අතර ස්වභාවික ව්‍යසනයන්ගෙන් අවතැන්වූවන්ට වඩා වැඩි සැලකිල්ලක් ගැටුම්වලින් අවතැන්වූවන්ට නොදැක්විය යුතුය. ආධාර බෙදා හැරීමේදී සිදුවන අසමානතා නිසා මානව අයිතීන් පිළිබඳ ප්‍රතිපත්ති උල්ලංඝනය වීමට අමතරව, එමගින් ඇතිවන ආතතීන් නිසා අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ ආරක්‍ෂාවටද තර්ජන එල්ල වේ. මේ හේතුවෙන් ඔවුන් නැවත සමාජයට අනුකලනය කිරීමේ ක්‍රියාවලිය වඩාත් සංකීර්ණ වන අතරම, ජාතික සමාදාන කටයුතු අඩාල කිරීමද සිදුවිය හැකිය.

**කාන්තාවන් සහ දරුවන් ආරක්‍ෂා කිරීම:** මාර්ගෝපදේශක ප්‍රතිපත්ති මගින් කාන්තාවන්ගේ සහ දරුවන්ගේ අවශ්‍යතා වෙත විශේෂ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටී. විශේෂයෙන් කඳවුරු තුල ඔවුන්ට ලිංගික අතවර සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවී ප්‍රචණ්ඩ කටයුතුවලට වඩ වඩාත් මුහුණදීමට සිදුවීම නිසා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට මුහුණදීමේ වැඩි අවදානමක් පවතී. ආහාර පරිපාලනයට ඔවුන්ව සහභාගී කර නොගන්නා විට කාන්තාවන්ට ලිංගික අතරවලට මුහුණ පෑමට සිදුවීමේ ප්‍රවනතාව සීග්‍රයෙන් වැඩි වේ. එමෙන්ම, සෞඛ්‍ය සේවා ලබා ගැනීම සහ ප්‍රජනන සෞඛ්‍ය යන කරුණු සම්බන්ධයෙන් කාන්තාවන්ට විශේෂ අවශ්‍යතා පවතී. තම දෙමාපියන් හා නිවාස අහිමි වූ දරුවන් හමුදාවලට බඳවාගැනීමේ වැඩි අවදානමද පවතී.

**මානව සම්පත් ජාවාරම:** පුද්ගලයින් අවතැන් වූ විට, පවුල් එකිනෙකාගෙන් වෙන් වූ විට, දරුවන්ට තම දෙමාපියන් නැතිවූ විට සහ ජීවනෝපායන් විනාශ වූ විට මානව සම්පත් ජාවාරම මතුවීමේ වැඩි අවදානමක් පවතී.

**අධ්‍යාපනය ලබා ගැනීමට ඇති හැකියාව:** අවතැන් වූ දරුවන් ස්වභාවික ව්‍යසනයකින් පසුව සැනෙකින් නැවත පාසැල් වෙත යොමු කිරීම් වැදගත් වන්නේ අධ්‍යාපනය ලබා ගැනීමට ඔවුන් සතු අයිතිය සම්බන්ධයෙන් මතුවිය හැකි බාධා අවම කර ගැනීම සඳහාය. එමෙන්ම, එය ඔවුන්ගේ මනෝවිද්‍යාත්මක ශුභසාධනයටද අත්‍යවශ්‍ය වේ. පාසැල් යාම තුලින් දරුවන් හමුදාවලට බඳවා ගැනීම සහ මානව සම්පත් ජාවාරම ඇතුළු අනෙකුත් අවදානම් තත්ත්වයන්ට මුහුණ පෑමට තිබෙන අවකාශ අඩුවේ. අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට පාසැල් ගොඩනැගිලිවල ආවරණය සපයා දී ඇත්නම්, අවතැන් නොවූ සහ අවතැන් වූ දරුවන්ගේ අධ්‍යාපනයට බාදා ඇතිවිය හැක. වඩාත් සුදුසු තාවකාලික වාසස්ථාන වෙත අභ්‍යන්තරිකව අවතැන්වූවන් යොමු කිරීමෙන් අභ්‍යනතරිකව අවතැන්වූ දරුවන්ගේ මෙන්ම පුළුල් ප්‍රජාවට අයත් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා වඩාත් විවෘත වනු ඇත.

**ලිපි ලේඛන නැති වීම:** ලිපි ලේඛන නොමැතිවීම නිසා සෞඛ්‍ය සේවා ලබාගැනීමට අවසර නොදීම, අධ්‍යාපනය නොලැබීම හා වෙනත් අත්‍යවශ්‍ය සේවා නොලැබීම මෙන්ම නැතිවූ දේපොල සඳහා වන්දි ලබා ගැනීමට අපහසු වීම, යන තත්ත්වවලට මුහුණ පෑමට සිදු වේ. මෙවන් නැති වූ ලිපි ලේඛන නැවත ලබා ගැනීම විශාල කාලයක් ගත වන අපහසු කටයුත්තක් වූවද ඒ සඳහා අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට අයිතියක් තිබේ.

**අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ සහභාගීත්වය:** තීරණ ගැනීමේදී ඒ ක්‍රියාවලියට තමන් සහභාගී කර නොගන්නා බව අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට පෙනී යා හැක. උදාහරණයක් ලෙස කඳවුරු සැලසුම් හා ඒවා ඉදිකරනුයේ කොහේද, ආධාර බෙදා හරින්නේ කෙසේද, ආහාර සහ වෙනත් ද්‍රව්‍ය වර්ග සහ ඔවුන්ගේ ජීවිතවලට කේන්ද්‍රීය වන වෙනත් කරුණු සම්බන්ධයෙන් සහභාගී කරගන්නවාද යනුවෙන් ප්‍රශ්නය මතු විය හැකිය. මෙතුලින් ස්වභාවික ආපදාව මතුකල තමන් අසරණය යන හැඟීම වඩාත් තීව්‍ර විය හැකි අතර, එනිසාම මානවහිතවාදී ආධාර ලබාදීමේ කාර්‍යසාධනීයත්වයට බාධා

පැමිණිය හැක. තවද මේ හේතුකොටගෙන අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට විශේෂයෙන් කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවන ශාරීරික අනාරක්ෂිත තත්ත්වය තවත් වැඩි විය හැකිය.

**ස්වේච්ඡාවෙන් නැවත පැමිණීම සහ නැවත පදිංචිය:** ආපදාවේ හදිසි තත්ත්වය හමාර වූ පසු, තමන්ගේ ජීවිත නැවත ගොඩනගා ගැනීම සඳහා අවතැන්වූවන්ට සාමාන්‍යයෙන් උදව් අවශ්‍ය වේ. මේ කටයුත්ත පහසුකරලීමේ ප්‍රධාන වගකීම අයත්වන්නේ ජාතික බලධාරීන්ටය. ඒ සඳහා ඊට සුදුසු තත්ත්වයන් සැකසීම, අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට ස්වේච්ඡාවෙන් ආරක්ෂකාරීව සහ ගෞරවනීය ලෙස නැවත පදිංචි කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම, නැත්නම් රටේ වෙනත් ස්ථානයනට යාමට අවශ්‍ය විධිවිධාන සැලසීම, සමාජයට නැවත අනුගත වීමට අවශ්‍ය ආධාර සැපයීම ආදී කරුණු සාක්ෂාත් කිරීම අවශ්‍ය වේ. විනාශ වූ නිවාස හා වෙනත් යටිතල පහසුකම් නැවත ගොඩනැගීමට අමතරව අවතැන්වූවන්ට තම මුල් ජීවනෝපායන් නැවත ඇරඹීමට (උදා: විනාශ වූ කෘෂි බිම් නැවත සැකසීම, ව්‍යාපාර සඳහා මුදල්, ධීවර යාත්‍රා) අවශ්‍ය උපකාරද ඇතුලත් විය හැක. නොඑසේනම්, අවතැන්වූවන්ට නව මුදල් උපයන මාර්ග සංවර්ධනය කරගැනීමට අවශ්‍ය සුදුසුකම් හා උපකාර ද ඇතුලත් විය හැක.

*සුනාමියෙන් ආපදවට පත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන ප්‍රතිකාර හා ප්‍රතිසංවර්ධන ප්‍රයත්නයන් මානව අයිතීන් හා බද්ධ වූ එළැඹුමක් මගින් දැනුවත් විය යුතුය.*

ව්‍යසනයකින් පසුව, රජයන් විසින් ඇතැම් ප්‍රදේශ බාධක කලාප හෝ බැහැර කිරීමේ කලාප හෝ වශයෙන් ප්‍රකාශ කිරීමට අවකාශ තිබේ. එසේනම්, ඒ කලාප තුල ප්‍රතිසංස්කරන කටයුතු තහනම් වනු ඇත. මෙවන් තීරණ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ ගමන් අයිතිය, ඇතැම් විට දේපොල අයිතිය, ජීවනෝපායන් සකසා ගැනීමේ අයිතිය යනාදියට බලපෑම් කල හැකිය. බැහැර කිරීමේ කලාප නිත්‍යානුකූලව ක්‍රියාත්මක කල යුතු යැයි බලධාරීන් තීරණය කල විට, එකී තීරණ ගත යුත්තේ අවතැන්වූවන්ගේ සම්පූ සහභාගීත්වයද ඇතිවය. ඔවුන්ට මෙතුලින් නැතිවී යන දේපොල සඳහා වන්දි ලැබිය යුතු අතර, වෙනත් ස්ථානයක පදිංචි වීමට, නිවාස ඉදිකර ගැනීමට, ජීවනෝපායන් ඇරඹීමට අවශ්‍ය උපකාර ද ලබා දිය යුතුය. මේ තීරණ යම් යම් ජනවාර්ගික හෝ ආගමික හෝ වෙනත් කණ්ඩායම්වලට හානිවන ලෙස ක්‍රියාත්මක නොවිය යුතුය. (උදා: සන්නද්ධ අරගල නිසා අවතැන්වූ පුද්ගලයින් සිටින ප්‍රදේශවලට ස්වභාවික ආපදාවන්ගෙන් හානි පැමිණි විට)

අනෙක් අතට, අභ්‍යන්තරිකව අවතැන්වූවන් තම මුල් නිවෙස් වෙත නොයාමට තීරණය කළ හැකිය. එය විශේෂයෙන් සිදුවන්නේ ඔවුන්ගේ අවතැන්වීම දීර්ඝකාලීනව සිදු වී ඇත්නම් සහ ඔවුන් වෙනත් ප්‍රදේශවල තම ජීවිත නැවත ගොඩනැගීමේ ක්‍රියාවලිය නැවත අරඹා ඇත්නම් පමණි. ඇතැම් විට විනාශයෙන් පසුව සාමාන්‍ය තත්ත්වයක් උදාවී ඇතැයි නිර්ණය කිරීම සඳහා බලධාරීන් නැවත පැමිණ සුපුරුදු ක්‍රියාවලින් දිරිගැන්වීමට ඉඩ තිබේ. එනමුත් ඔවුන් අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට නැවත පැමිණීමට හෝ වෙනත් තැනක පදිංචි වීම සඳහා හෝ තීරණ ගැනීමට ඇති අයිතියට ගරු කල යුතුය. ඒ තීරණය කුමක් වුවද, ඔවුන්ට සමාජයට නැවත අනුකලනය වීමට අවශ්‍ය උපකාර බලධාරීන් විසින් ලබා දිය යුතුය.

**දේපොල පිළිබඳ අර්බුද:** විශේෂයෙන් ස්වභාවික ව්‍යසන මගින් මායිම් සලකුණු විනාශ කල දේපල අයිතිය පිළිබඳ විධිමත් වාර්තා නොතිබුණු හෝ එවන් වාර්තා විනාශවී හෝ ගිය අවස්ථාවලදී දේපොල පිළිබඳ අර්බුද අතිශයින් සංකීර්ණ ප්‍රශ්න මතු කළ හැකිය. ලියාපදිංචිය හා උරුමය පිළිබඳ රෙගුලාසි කාන්තාවන්ට එරෙහිව ක්‍රියාත්මක වන අවස්ථාවලදී ඔවුන්ට තම දේපොල නැවත ලබාගැනීම බෙහෙවින් අසීරු වේ. මෙය වඩාත් තීව්‍ර වන්නේ ඔවුන්ගේ සැමියන් මිය ගොස් සිටින විටදීය. අත්දැකීම් මගින් පෙන්වා දී තිබෙන්නේ සමාදානයට, තීරණ ගැනීමට, නම්‍ය පිලියම් යෙදීමට බලය තිබෙන කැප වූ පරිපාලන ආයතනයක් දේපොල අර්බුද පිළිබඳ ප්‍රශ්න නිරවුල් කිරීම් සඳහා ස්ථාපනය කලහොත් එය මහා පරිමාන දේපොල ප්‍රශ්න විසඳීමේ වඩාත් යෝග්‍ය ක්‍රමය වන බවයි. අවතැන්වීම පිළිබඳ ගැටළු තුලින් මතුවන දේපොල පිළිබඳ වාදවිෂයන් ආමන්ත්‍රණය කිරීමේදී දීර්ඝකාලීනව පවතින දේපොල ලියාපදිංචිය හා කැඩාස්තර සැලසුම් පිළිබඳ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීමටද අවස්ථා උදාකර දිය හැකිය. එමෙන්ම, මෙතුලින් සම්ප්‍රදායික අයිතීන් සහ සාම්ප්‍රදායික නොවන දේපොල අයිති ක්‍රම පිලිගැනීමට හැකිවන පරිද්දෙන් පවතින නීති නවීකරණය කිරීමටද අවස්ථා ලැබේ.

## නිගමන

ආණ්ඩු, ජාත්‍යන්තර ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන අභ්‍යන්තරිකව අවතැනවූවන් සඳහා ප්‍රතිසංස්කරණ හා ප්‍රති-අනුකලන වැඩසටහන් සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී අදාල මානව අයිතිවාසිකම්, අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි සමානාත්මතාවයෙන් යුක්ත පිලියම් ඔවුන් විසින් සම්පාදනය කල යුතුය. ස්වභාවික ආපදා මගින් මෙන්ම ගැටුම් මගින්ද අවතැන්වූවන් පිළිබඳව සලකා බැලීමේදී ආරක්ෂක කාචයක් තුලින් බැලීම වැදගත් වේ. සුනාමියෙන් පීඩා විඳි රාජ්‍ය කිහිපයක් වෙත මා නිල සංචාරයන් කළ විටදී පෙනී ගියේ ස්වභාවික ආපදා සඳහා ප්‍රතිචාර ගොඩනැගීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී මානව අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශයන් පිළිබඳව ප්‍රතිශේධනාත්මක උනන්දුවක් තිබූ බවය.

මෙහිදී පහත සඳහන් කරුණු ද වැදගත් වේ:

- සුනාමි ආපදාවේ බලපෑමට ලක්වූ කලාපවල සහ ආපදාවලට ගොදුරුවූ ලොව අන් ප්‍රදේශවල දියත් කෙරෙන ප්‍රතිකාරක සහ ප්‍රතිසංස්කරණ උත්සාහයන් මානව අයිතීන් මත පදනම් වූ ප්‍රවේශයක ආලෝකය ලබාගත යුතුය.
- ආණ්ඩු විසින් ජාතික ප්‍රතිසංස්කරණ සහ ප්‍රති-අනුකලන වැඩ සටහන් සම්පාදනය කිරීමේදී මාර්ගෝපදේශක ප්‍රතිපත්ති සැලකිල්ලට ගත යුතුය. ඒවා විසින් සපයන උපදේශන සන්නද්ධ අරගල හා ස්වභාවික ආපදා යන තත්ත්ව දෙකටම එකසේ අදාලය.
- ආධාර සැපයීමේදී පෙර පැවති ගැටුම්වලින් අවතැන්වූවන්ට හෝ වෙනත් ජනවාර්ගික වේවා ආගමික වේවා කණ්ඩායම්වලට හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම් වූ නිෂේධාත්මක සැලකිලි නොදැක්වීමට තමන්ට ඇති වගකීම පිළිබඳ දායකයන් සංවේදී විය යුතුය.
- නැවත පදිංචිකිරීමේ කටයුතු සැලසුම් කිරීම හා කලමණාකරනය කිරීම පිළිබඳ තීරණ ගැනීමේදීද, මානවහිතවාදී ආධාර බෙදාහැරීම පිළිබඳ තීරණවලදීද සහ අවතැන්වීම සම්බන්ධයෙන් දීර්ඝකාලීනව පවතින ප්‍රශ්නවලට පිලියම් සෙවීමේදීද අවතැන්වූවන්, විශේෂයෙන් කාන්තාවන්, සහභාගී කරවා ගත යුතුය.
- අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ තත්ත්වයන් පිළිබඳ සොයා බැලීමටත් ඒ සඳහා සාමූහික විධික්‍රමයන් සකසා ගැනීමටත් ජාතික මානව හිමිකම් කොමිසම් දිරිමත් කල යුතු අතර ඒ සඳහා ආධාර සැපයිය යුතුය.
- මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා සහ මානවදයාවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය (OCHA) එක්ව ස්වභාවික ව්‍යසන තත්ත්ව තුලදී බලපවත්වන පරිද්දෙන් මානව අයිතීන් පිළිබඳ උපදෙස් මාලාවන් සකසා ගත යුතුය. එමගින් ක්ෂේත්‍ර මට්ටමේ සිටින අන්තර්-ආයතනික ස්ථාවර කමිටු සාමාජිකයින්ට ප්‍රායෝගික මෙහෙයුම් උපදේශන ලබාගත හැකිවෙනු ඇත.

*වෝල්ටර් කලින් එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ මානව හිමිකම් සඳහා වූ මහලේකම්ගේ නියෝජිතයා ද අභ්‍යන්තරික අවතැන්වීම පිළිබඳ බෲකින්ස්-බර්න් ව්‍යාපෘතියේ සම-අධ්‍යක්ෂකවරයා ද ස්විට්සර්ලන්තයේ බර්න් සරසවියේ ව්‍යවස්ථාදායක හා ජාත්‍යන්තර නීතිය පිළිබඳ මහාචාර්යවරයා ද වේ. ඔහුගේ විද්‍යුත් ලිපිනය නම්: walter.kaelin@oefre.unibe.ch*

*2005 මාර්තුවේදී ඔහු ආසියාවේ වැඩ කටයුතු සොයාබැලීම සඳහා එහි ලඟා විය. ඒ පිළිබඳ වාර්තාවක් ලබාගැනීම සඳහා බලන්න: www.brookings.edu/dybdocroot/fp/projects/idp/20050227_tsunami.pdf ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු සඳහා බලන්න: www.brook.edu/fp/projects/idp/idp.htm විද්‍යුත් තැපැල: brookings-bern@brookings.edu*

1. මෙය ඉංග්‍රීසි, සිංහල, දෙමළ හා අන් භාෂාවලින් පහත සඳහන් වෙබ් අඩවියෙන් ලබාගත හැකිය: www.unhchr.ch/html/menu2/7/b/principles_lang.htm සහ ඉන්දුනීසියානු බසින් මෙය පහත සඳහන් වෙබ් අඩවියෙන් ලබාගත හැකිය: www.reliefweb.int/ocha_ol/pub/idp_gp/idp_Indonesia

# සුනාමිය සඳහා දැක්වුණු මහජන සෞඛ්‍ය ප්‍රතිචාරය

මැනුවෙල් කර්බල්ලෝ සහ බ්‍රයන් හිල්

*සංක්‍රමණය සහ සෞඛ්‍යය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය අප්‍රේල් මාසයේදී මාලදිවයිනේ පවත්වන ලද රැස්වීමකදී සුනාමි ආපදාවට ලක්වූ රටවලින් පැමිණි මහජන සෞඛ්‍ය විශෙෂඥයෝ මානවදයාවාදි ප්‍රතිචාර කෙරෙන් තමන් ඉගෙනගත් දෑ තක්සේරු කරති.*

සුනාමිය වනාහි සමහර ජනකොටස් අනෙකුත් අයට වඩා ආපදාවට ගොදුරුවීමේ ඉඩකඩ වැඩි බැව් අපට සිහිපත් කරවන එක්තරා දුක්ඛදායක මතකයකි. ජීවිත අහිමිවූවන්ගෙන් බහුතරය දුප්පත්කමේ ගිලී ජීවත්වන උදවියයි. වෙරළ දිගේ ඉදිකරන ලද ප්‍රමාණවත් නොවන පැල්පත්වල වාසය කරන්නට දුප්පත්කම විසින් ඔවුනට බල කර තිබිණ. මාලදිවයින් වාසින්ගෙන් වැඩිපුරම හානියට පත් වූයේද මෙකී දුප්පත් ජනයාය. ඔවුනට බැංකු ගිණුම් තිබුනේ නැති හෙයින් හරි හම්බ කරගත් මුදල ඔවුන් ළඟම තබාගෙන තිබූ අතර වතුරට ගසා ගෙන ගියේද එවැනි මුදල්ය. මාලදිවයින ජනරජයේ දළ ජාතික නිෂ්පාදනයට සිදුව තිබෙන හානිය 62% වශයෙන් ගණන් බලා ඇති අතර සුනාමියට පෙරාතුව 7.5% වශයෙන් ඉලක්ක කරන ලද රටේ වාර්ෂික ආර්ථික වෘද්ධියේ අනුපාතය සුනාමියෙන් පසු 1% කින් පහත වැටේ යැයි බලාපොරොත්තු වනු ලැබේ.

සුනාමියෙන් ආපදාවට පත්වූ සියළුම රාජ්‍යයන්ගේ ආරම්භක ප්‍රතිචාරය හැඩගස්වනු ලැබුවේ ගොඩගැහුණු මළකඳන් නිසා මහජන සෞඛ්‍යයට දරුණු තර්ජනයක් එල්ල වනු ඇතැයි යන බියය. මිනිස් දේහයන් ඇත්තෙන්ම චිත්තවේගී පීඩාවට ප්‍රභවයක් මෙන්ම මනෝසමාජමය පර්යාලෝකයක් තුලින් බලන කල මළකඳන් ගොඩගැසීම වැදගත්ය. කෙසේවෙතත්, මළකඳන්වලින් ක්ෂණික සෞඛ්‍ය ගැටළු මතුවන්නේ නැතැයි ජනයාට තේරුම් කරදීමත් එතරම් පහසු කාර්යක් නොවේ. කලබල අවස්ථාවේදි කිසිදු චාරිත්‍ර වාරිත්‍රවලින් තොරව මළකඳන් වළළදැමීම සිදුවුවත් එයින් උද්ගතවන වරදකාරී හැඟීම ආමන්ත්‍රණය කළ යුත්තේ උපදේශන සේවා මගිනි. උපදේශන අවශ්‍ය වන්නේ වරදකාරී හැඟීම සඳහා නොව ඊට මුහුණ දුන් ජනයා සඳහාය.

සුනාමියෙන් පීඩාවට පත් ප්‍රදේශවල ජනතාව පෙළෙන දුප්පත්කම ආහාරපාන ලබාගැනීමට ඔවුනට තිබෙන දුෂ්කරතා සමග දැනටමත් බද්ධ කොට තිබේ. මන්දපෝෂණය නිසා ඇතිවන රක්තහීන රෝගය මාලදිවයිනේ, ලංකාවේ සහ ඉන්දියාවේ සමහර ප්‍රදේශවලින් වාර්තාවී තිබේ. ආහාර ආධාර හැමවිටම බෙදාහැර ඇත්තේ එතරම් සාර්ථක ආකාරයකින් නොවේ. ඉන්දුනීසියාවේ සහ තායිලන්තයේ බත් කන ජන කොටස්වලට තිරිඟු පිටි පරිත්‍යාග කිරීම, ක්ෂණික ආහාර ආධාර පැකේජවල කොටස් වන පෝෂ්‍යජනක විස්කෝතු මහළු උදවියට සපන්නට නොහැකිවීම, පිටි කිරි ඕනෑ තරම් සුලබ නිසා මවුකිරි භාවිතය වේගයෙන් අඩු වී යෑම යනාදි කාරණාවලින් පෙන්වා දෙන්නේ මීට කලින් වතාවල ඇතිවූ ආපදාවලින් ඉගෙනගත් පාඩම් මතක නැති කර දමා ඇති බවයි.

තවත් තදබල පහරක් වැදී තිබුණේ සෞඛ්‍ය අංශවලටය. අචේ පලාතේ සිටි වින්නඹු අම්මලාගෙන් 30% ක් සුනාමියට හසු වී මියගොස් සිටින අතර පලාතේ තිබූ සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන හයෙන් එකක්ද විනාශ වී ඇත. මුළු පලාතේම ඖෂධ හා උපකරණ සැපයුම අඩාල වී තිබෙන අතර හොඳටම කැඩී බිඳී ගිය උපකරණ පිරිසිදු කොට අළුත්වැඩියා කොට සේවා සපයන්නටත් වළවල් කපා මළකඳන් විශාල ප්‍රමාණයක් වළ දමන්නටත් සිදුවිය.

උතුරු අචේ පලාතේ සහ ශ්‍රී ලංකාවේ ජීවත්වන ප්‍රජාවන් අතරේ ස්ත්‍රී මරණ අනුපාතිකය පිරිමින්ට වඩා හතර ගුණයකින් වැඩිය. ඉන්දියාවේ ස්ත්‍රී මරණ අනුපාතිකය පිරිමි අනුපාතිකයට වඩා තුන් ගුණයකින් වැඩිය. මේ අසමතුලනය මගින් පෙන්නුම් වන්නේ සමාජ හා සෞඛ්‍ය ප්‍රශ්න හමුවේ ස්ත්‍රිය පසුවන අවදානම් තත්ත්වයයි. එමෙන්ම එකී තත්ත්වය සම්බන්ධයෙන් හදිසි සූදානම්වීමේ සැලසුම් සකස් කරගැනීමෙහිලා පවතින දැඩි අවශ්‍යතාවයයි. ඒවාගේම සුනාමි ප්‍රතිචාරවලින් ඔප්පු වූයේ මෙතුවක් කාලයක් තිස්සේ ප්‍රජනන සෞඛ්‍යය සහ ආපදා අවස්ථාවලට මුහුණ දෙන ගැබිණි ස්ත්‍රීන්ගේ අවශ්‍යතාවලට දැක්වූ සැලකිල්ල කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බවයි. ගැබිණි ස්ත්‍රීන් විශේෂ අවශ්‍යතාවලින් පෙළෙන බවත් එම අවශ්‍යතාවල තීව්‍රතාවය අර්බුදය මතුවූ අවස්ථාවලදී තව තවත් වැඩිවන බවත් මොනතරම් දැන සිටියත් ඒ කාරණා සිහියේ තබාගන්නට සහනසේවා මෙහෙයුම්වලට පුළුවන්වී නැත. ස්වාභාවිකව ඇතිකලද මිනිසුන් විසින් ඇතිකලද හදිසි ආපදාවලින් පසුව බොහොමයක් ආයතන උපත් පාලන උපකරණ සැපයීම කෙරෙහි උනන්දු නැත. ඒවා ඉල්ලාගෙන පස්සෙන් නොඑන්නට තරම් ගැහැණුන් සහ පිරිමින් අතර තිබෙන චකිතය ආයතන තේරුම් ගත යුතුය.

පාවිච්චියට පහසු ප්‍රජනන සෞඛ්‍ය ආම්පන්න කට්ටල සහ වෙනත් හදිසි අවස්ථා ආම්පන්න කට්ටල සෑමතැනකදීම පහසුවෙන් ලබා ගන්නට කටයුතු සැලැස්වීම වැදගත්ය. ඒවා නොමැතිව හදිසි සෞඛ්‍ය අවස්ථා මතුවූ අවස්ථාවලදී තැනට ඔබින ලෙස කටයුතු කරන්නට නොහැකිවනු ඇත. මේ කට්ටල පුථුල් ලෙස තෝරාගත් තැන්වලට කලින්ම බෙදාහැර තිබීම අවශ්‍යවන අතර ඒ හා සමගම ඒවා පාවිච්චි කරන අන්දම දන්නා කණ්ඩායම් ජාතික මට්ටමෙන් පුහුණු කිරීමත් වැදගත්ය. සුනාමිය ඇතිවීමත් සමගම තහවුරු වූ තවත් වැදගත් කාරණයක් නම් කල් ඇතිව සූදානම් කරන ලද මාතෘ දාරක ආම්පන්න කට්ටල ජනයා අතර බෙදා හැර තිබීමය. මේවා බොහෝවිට දේශීය වශයෙන් ලබාගන්නා අමුද්‍රව්‍යවලින් තනාගත හැකි අතර එමගින් ස්ත්‍රීන්ට නම්බුකාර ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කෙරෙන උපකරණ පහසුවෙන්ම සපයාගන්නට පුලුවන්කමක් ලැබෙනවා ඇත.

බොහෝ අවස්ථාවලදී ජනයාගේ ජල අවශ්‍යතාවලට ආමන්ත්‍රණය කිරීම සඳහා කරන ලද මැදිහත්වීම් කල්පවත්නාසුළු ඒවා නොවීය. රාජ්‍ය නොවන සංවිධාන විසින් ජලයෙන් ලවණ ඉවත් කිරීමේ යන්ත්‍ර ස්ථානගත කොට ජලය පිරිසිදු කිරීමේ ව්‍යාපාර පටන් ගත්තද මේ වනවිට ඒවා කාර්මික දෝෂ නිසා ක්‍රියාත්මක නොවේ. ලිංවල තිබෙන අධික ලවණ ස්වාභාවය ප්‍රධාන දිගුකාලීන ප්‍රශ්නයක් බවට පත්වී තිබෙන බැවින් එය ඉක්මණින්ම ආමන්ත්‍රණය කළයුතුව තිබේ. ශ්‍රී ලංකාවේ පමණක් ලිං 12,000 ට වඩා ප්‍රමාණයක් අධික ලවණ ගතිය හේතුවෙන් පාවිච්චියට ගත නොහැකි තත්ත්වයක් උදා වී තිබෙන අතර ජල ප්‍රභවයක් වශයෙන් සමහර ප්‍රදේශවල ලිං තුල වගා කර තිබෙන ජලජ ශාක ලුණු වතුර නිසා සදහටම විනාශ වී ගොස්ය. මිරිදිය කරදිය වෙනස් වී ඒවා අතර තුලනයක් පවත්වා ගැනීම කලක් ගතවන කාර්යයකි. ඒ සඳහා වැහි කාල කීපයක්ම ගත කළ යුතුය. බාහිර ආයතන විසින් හඳුන්වා දෙන සුපිරි ආසුැති ක්‍රම පද්ධති බොහෝවිට ප්‍රායෝගික නොවන්නේ ඒ සඳහා අධික වියදමක් යන නිසාත් එම ක්‍රම පද්ධති නඩත්තු කිරීමේ වගකීම ප්‍රජාවන්ට බාරගත නොහැකි නිසාත්ය.

ඒවාගේම නෛතික වාදවිෂයන්වල පවතින සංකීර්ණතා ගැන ප්‍රමාණවත් පරිද්දෙන් අවබෝධ නොකළ බවක්ද පෙනීයයි. සුනාමියෙන් බැට කෑ රටවලදී සහතික වශයෙන්ම මියගොස් හෝ අතුරුදහන් වී හෝ සිටිතැ'යි වාර්තා වී තිබෙන පුද්ගලයින්ගේ නෛතික පදනම් සැමියන් අතුරුදහන් වූ වැන්දඹුවන් මත්තේ අහිතකර බලපෑම් ඇති කරන්නේය. රටවල් ගණනාවකටම සිදුවී තිබෙන හානිය මොනතරම් බරපතලද කිවහොත් ජනයා විසූ ගෙවල්වල අත්තිවාරම් කෙසේවෙතත් නිවැසියන්ගේ පැවැත්ම තහවුරු කරන කිසිම ලේඛණයක්වත් සොයාගන්නට බැරිය. මාලදිවයින දූපත්වල වාසය කරන තරුණ ජනයා පෙළෙන පීඩනයට ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ මෙලෙස අතුරුදහන්වූ අධ්‍යාපනික සහතික ලියකියවිලිය.

## සත්කාරකයින් අමතරක කරන්න එපා

සුනාමියෙන් පසු එලැඹුණු කාලපරිච්ඡේදය තුල සහනසේවා සහ ප්‍රතිසංවර්ධන ප්‍රයත්නයන්වලට, අවතැන්වූ ජනයාගේ සෞඛ්‍ය සහ සමාජ අවශ්‍යතාවලට, මුල් තැන දීම නිවැරදිය. කෙසේ වෙතත්, අභ්‍යන්තරික අවතැන්වූ දසදහස් ගණන් පවුල්වලට ලැගුම්ගත්විට ඉඩකඩ සපයා දී ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉටුකළ ජනකොටස් ගැන ප්‍රමාණවත් පරිදි සඳහන් කෙරෙන්නේ නැත. විශේෂයෙන් මාලදිවයිනේ, ශ්‍රී ලංකාවේ, අචේ පලාතේ විනාශයට පත් නොවූ ප්‍රදේශවල වාසය කළ ජනයා අවතැන්වූ ජනයාගේ හිසට වහලක් හිතට සැනසීමක් ලබාදීම මහත්



UNICEF/HQ050046/Jim Holmes

*ඉන්දුනීසියාවි බන්ඩා අචේ අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ කඳවුරක සිටින 15 හැවිරිදි ෆතියාට සරම්පවලට එරෙහිව එන්නතක් ලබා දීම.*

නම්බුකාරකමක් සේ සලකා අපරිමිතව ඔවුනට පිහිටවන්නට පටන්ත ගත්හ. මෙවැනි උදව් උපකාර නොලැබුනානම් අවතැන්වූවන්ගේ තත්ත්වය මීට වඩා බොහෝසෙයින් දුක්ඛිත වන්නට ඉඩ තිබිණ. ඉක්බිත්තෙන්, සත්කාරක පවුල්වලට විඳින්නට වූ හිරිහැර කරදර ඉමහත් වුවද සත්කාරක පවුල්වල ඉවසීමේ ශක්තිය නම් පුදුම එළවන සුළුය. ඔවුහු තම ගෙවල්වල තිබෙන ප්‍රමාණවත් නොවන ඉඩකඩ ප්‍රමාණය, ආහාරපාන සහ අනෙකුත් සම්පත් තිබෙන හැටියට අවතැන්වූවන් සමග බෙද හද ගත්හ. එපමණක් නොව සත්කාරක පවුල්වල පුද්ගලිකත්වය නැති වී ගිය අතර පවුල් සාමාජිකයන්ගේ පුද්ගලික ජීවිත ඉතා දරුණු ලෙස අඩාල විය. අවතැන්වූ ජනයා නැවත පදිංචි කරවීම කල්ගතවන තරම්ම එකදිගටම ඔවුනට උපකාර කිරීමට සත්කාරක ජනයාට සිද්ධ වනු ඇත. ඒවාගේම සත්කාරක ජනයාගෙන් ලබන ආදර සැලකිල්ල අවතැන්වූ ජනයා මුහුණ දුන් මානසික පීඩනයෙන් ගොඩඒමට තිබෙන අත්‍යවශ්‍ය පාලමද වන්නේය.

සත්කාරක පවුල්වලට අයත් ගෙවල්වල සහ තාවකාලික මඩුකුඩාරම්වල එකට ඇලී ගැලී වාසය කිරීම නිසා සෞඛ්‍ය හා සමාජ ප්‍රශ්න ගණනාවක්ම මතුවීම නොවැලැක්විය හැකි කාරණාවකි. කෙසේවෙතත් මේ දක්වාම එවන් ගැටළු හැකිතාක් දුරට වලක්වාගෙන ඇතත් ජීවන රටාව දිගින් දිගටම මෙයාකාරයෙන්ම පවත්වාගෙන යන්නේ නම් අපේක්ෂිත ගැටළු මතුවීම වලක්වනු බැරිය. සුළු ඉඩ ප්‍රමාණවල ඕනෑවටත් වඩා පිරිසක් ජීවත්වීමේ ගැටළුව විසඳිය හැක්කේ තාවකාලික නිවාස විශාල ප්‍රමාණයක් ඉතා වේගයෙන් සාද නිම කිරීමෙන් පමණි. ඒවාගේම ඒවාට ජල සහ සනීපාරක්ෂක පහසුකම් සපයාදීමෙන් පමණි.

ස්වාභාවික ආපදාවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණය නම් දිවිපැවැත්ම කෙරෙහි එය ඇති කරන මනෝසමාජමය බලපෑමය. එය ගැඹුරින් විහිදී යන එහෙත් සැණෙකින් මතුපිටට නොඑන අන්දමේ එකකි. සුනාමියෙන් ආපදාවට ජනයාගේ කෙටිකාලීන හා දිගුකාලීන මනෝසමාජමය අවශ්‍යතා තේරුම් ගැනීමත් ඒවාට ප්‍රතිචාර දැක්වීමත් අත්‍යවශ්‍ය වන්නේ සමාජ ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය දියත්වද්දී තම තමන්ගේ ධාරිතාවය එයින් නිර්මාණය වන බැවිනි. මහජන සෞඛ්‍යයේ මෙම අංශයට සාම්ප්‍රදායික වශයෙන් ලැබෙන්නේ මඳ අවධානයකි. ඒවාගේම මෙම සෞඛ්‍ය අංශය සම්බන්ධයෙන් පුහුණුව ලබා ඇති අය සිටින්නේද මඳ වශයෙනි. එබැවින් ප්‍රාථමික සෞඛ්‍ය සේවකයින් මනෝසමාජ සෞඛ්‍ය වැඩපිලිවෙල වෙනුවෙන් සූදනම් කිරීමවත් පශ්චාත් - ආපද මනෝසමාජ වාදවිෂයන් වෙනුවෙන් ප්‍රතිචාර දැක්වීමත් අවශ්‍යය.

සුනාමි ආපදාවට ගොදුරු වී දිවි ගලවාගත්තවුන් දැක්වූ උපෙක්ෂාභාවයට මූලික වී ඇත්තේ ආගමික භක්තියයි. ආගමික නායකයෝ ආපදාවට පත්වූවන්ගේ සිත්වලට සැනසීම පමණක් නොව ප්‍රායෝගික තොරතුරුද ප්‍රජා මෙහෙයුම් පිලිබඳ අවධානයද ලබා දුන්හ. මේ අනුව ආගමික නායකයින්ගේ භූමිකාව සම්බන්ධයෙන් සහනාධාර සපයන්නන්ගේ අවධානය මීට වඩා යොමු විය යුතුය. අනෙක් අතට, බාහිර සහනාධාර ඒජන්සි ඔවුන්ගේම ආගමික න්‍යාය පත්‍ර ඉදිරියට දමාගෙන වැඩකරන බවද වාර්තා වන්නට පටන්ගෙන තිබේ. මේ තත්ත්වය නිසා රටවල් ගණනාවක්ම සෑහෙන වියවුලක් හා සංකාවක් හටගෙන ඇත. ඒ අනුව ආගමික නොවන ඒජන්සිවලට පමණක් මානවදයාවාදී වැඩකටයුතු කිරීමට ඉඩදිය යුතු යැයි යෝජනාවන්නට පටන්ගෙන තිබේ.

## නිර්දේශ

සාකච්ජා මණ්ඩපයට සහභාගීවූවන් ඉස්මතුකොට පෙන්වාදුන් ප්‍රධාන ආපදා සැලසුම් වාදවිෂයන් මෙසේය:

- විදේශ ආයතන දේශීය හැකියා ශක්තිය සහ මුහුණදීමේ ශක්තිය තව තවත් බලවත්ත කරනු විනා ඒවා නිෂේධ නොකළ යුතුය.
- ස්ත්‍රීන් මුහුණ දෙන අවදානම් තත්ත්වයන් ගැන ආණ්ඩුවේ බලධාරිනුත් ප්‍රාදේශීය ප්‍රජාවනුත් මීට වඩා දැනුවත් විය යුතුය.
- හදිසි ආපදා විශේෂඥ කණ්ඩායම් ක්ෂේත්‍රයට යවන විට ඒ කණ්ඩායම් මීට වඩා අදාල නිපුණත්වයෙන් සමන්විත කිරීමටත් එම කණ්ඩායම් ජාතික අධිකාරිවලින් උපදෙස්ලා ලබාගැනීම සඳහා සූදානම් කිරීමටත් අරමුදල් දායකයින් වග බලා ගත යුතුය. මේ කාරණය සෑමතැනකම සෑමවිමට අදාල නොවන බවත් ඒ සමගම කිවයුතුය.
- මීට පෙර සිටම ගැටුමට භාවිතය වෙමින් තිබූ, පසුව ආපදාවට ලක්වූ ප්‍රදේශවලට සහන කටයුතු සඳහා හමුදා කණ්ඩායම් යෙදවීමේ ක්‍රියාමාර්ගය එම ප්‍රදේශවල වාසය කරන සියළුදෙනාම අනුමත කරන්නේ නැත. හමුදාවේ ආධිපත්‍යවාදී ක්‍රියාකාරිත්වය විසින් අන්‍යොන්‍ය රැඳියාව ඇති කරන අතරම තම ගැටළුවලට පිළිතුරු තමන්ම සොයාගනීමේ කාර්යයෙන් ප්‍රජාවන් වලක්වනු ඇත.
- එක්සත් ජාතීන්ගේ ක්ෂණික අභියාචනා අරමුදල් සැපයුම හදිසි ව්‍යාපෘතීන් සඳහා වෙන් කිරීමට හා වියදම් කිරීමට පමණක් සීමා නොවිය යුතුය. මහජන සේවාවන් නඟා සිටුවන දිගුකාලීන සංවර්ධන

ව්‍යාපෘතීන් අරඹයා වියදම් කිරීම පහසු කරවන නව ක්‍රියාවලින්ද සොයාගත යුතුය.

- අරමුදල් දායකයින් අවශ්‍යතා හඳුනාගැනීම්වලට අදාලව ඖෂධ සැපයීම සහතික කළ යුතු අතර ඒවා ලඟා වන්නේ කෙසේද යන්න සොයා බලා ආධාර ලබන රටවල්වල ආණ්ඩුවලට එම විස්තර සැපයිය යුතුය.
- සමහර අරමුදල් දායකයින් සහනාධාර වඩා සාර්ථක ලෙස බෙදාහරින බහුජාතික ක්‍රම තිබෙන බවක් දන්නේ නැති බව පෙනී යයි.
- අරමුදල් එක්රැස් කිරීමේ ක්‍රියාවලිය තුල පවතින දුෂ්කරතා ගැන අරමුදල් දායකයින් සහනාධාර ලබන රටවල ආණ්ඩුවට පහදා දිය යුතුය. බොහෝ ආණ්ඩු හිතන්නේ අරමුදල් පොරොන්දු වූ සැනින් කිසිදු ප්‍රමාදයකින් තොරව ඒවා ලඟා වන බවයි.
- වෙරළේ ගස් සිටුවීම සහ හරිත වගාවන් ඇති කිරීම, කඩොලාන ආරක්‍ෂා කිරීම, වැනි කටයුතු දිරි ගැන්විය යුත්තේ එම ක්‍රියාකාරකම් අනාගතයේදී ඇතිවිය හැකි සුනාමි රළ පහරින් ආරක්‍ෂාවීම සඳහා බාධක පවුරු ලෙස ක්‍රියා කරන නිසාය.
- SPHERE ප්‍රමිතීන් වැදගත්වන නමුත් ඉතාමත් දුප්පත් ප්‍රජාවන්ට ඒවා හඳුන්වා දුන් විට ප්‍රාදේශිය හා ජාතික ධාරිතාවන් අබිබවා යන යථාර්ථවාදී නොවන බලාපොරොත්තු ඔවුන් තුල මතුවන බවත් අප පිළිගත යුතුය.
- මවුවරුන් මවුකිරි දීම, පවුල් සැලසුම, ලිංගික සෞඛ්‍යය පිළිබඳ කාරණා ගැන නව යොවුන් පිරිස් දැනුවත් කිරීම සඳහා ඔවුනට තොරතුරු සපයාදීම, ප්‍රජනන සෞඛ්‍ය ආරක්‍ෂණ මෙවලම් කට්ටල සැපයීම වැනි පියවර සංවිධානය කිරීමෙහිලා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.
- මහජන පරිහරණය සඳහා ආරක්‍ෂා සහිත ස්ථානවල විවිධ සේවාවන් සපයන ප්‍රසිද්ධ ගොඩනැගිලි තනා ඒවා අවශ්‍ය ආම්පන්නවලින් සමන්විත කළ යුතුය.

සුනාමිය අපට මතක් කර දුන්නේ ජාත්‍යන්තර ප්‍රජාව මීට පෙර ඇතිවූ ආපදාවන් ගැන කිසිදු අවධානයක් යොමු කර නැතැයි යන කාරණය පමණක් නොවේ. ආපදාවලට ගොදුරු වූ රටවල ආණ්ඩු කිසියම් ආපදාවකට මුහුණදීම සඳහා ස්වකිය ප්‍රජාවන් සූදානම් කිරීම වෙනුවෙන් ඉතාමත් මඳ අවධානයක් වැය කර තිබීමේ කාරණයත් හෙළිදරව් විය. සැලසුම් සංවර්ධනය කිරීමේදී අනුගමනය කර ඇත්තේ ආපදාවක් ඇති වූ විට උදව් උපකාර කළ හැකි තත්ත්වයේ පසුවන ජන කොටස් සහභාගී නොකරගෙන ඔවුන් ඈත්කර තිබීමේ වැඩ පිළිවෙලකි. අනාගතයේදී ආපදාවලට මුහුණ දෙන්නට සූදානම්වීමේ වැඩපිළිවෙලවල් වලක්වාගැනීමේ ආරම්භක ක්‍රියා ව්‍යුහගත කරගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය. ඒවාගේම එම ව්‍යුහයන් ප්‍රාදේශිය සෞඛ්‍ය හා සමාජ පද්ධතිවල අත්‍යවශ්‍ය අංගයක් බවට පත් කළ යුතු අතර එම පද්ධති ක්‍රියාත්මක කරවීමේ වගකීම දරන සියළුදෙනාම ඒ පිළිබඳව අවබෝධයක් ලබා දිය යුතුය.

සුනාමිය අමතක වී යාමට පෙරාතුව එයින් අප උගත් පාඩම් මනා ඇගැයුමකට ලක් කළ යුතුය. විශේෂයෙන් සංක්‍රමණික රෝග පාලනය, ප්‍රජනන සෞඛ්‍යය, මනෝ සමාජ සහාය, භාණ්ඩ ප්‍රවාහණ පහසුකම්, පසුවිපරම යන ක්‍ෂෙත්‍රවලදී ඉගෙනගත් පාඩම් ඇගැයුම් කළ යුතුය. මහජන සෞඛ්‍යය සහ ආපදා අවම කිරීම පිළිබඳ සැලසුම් වැඩදායක ඒවා ලෙස ගැනෙන්නේ ඒ ගැන අවබෝධයක් තිබෙන උදවිය එකී සැලසුම් සකස් කිරීම සඳහා විශාල වශයෙන් සහභාගී වූ විටය. මධ්‍යම ආණ්ඩුවේ සහ ප්‍රාදේශිය ආණ්ඩුවේ සිටින සියළු අදාල සහභාගිකයන් අනෙකුත් සියළු අදාල සහභාගිකයින්ද සමග එක් වී සැලසුම් සමාලෝචනය කිරීමේ සහ ප්‍රතිචාර අත්හදා බැලීමේ රැස්වීම් නිතිපතා පැවැත්විය යුතුය.

*මැනුවෙල් කර්බල්ලෝ ස්විට්සර්ලන්තයේ පිහිටි සංක්‍රමණය සහ සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ අධ්‍යක්‍ෂකවරයා (ICMH, 11 Route du Nant d'Avril, CH-1214, Geneva, Switzerland) වන අතර බ්‍රයන් හීල් එහි ප්‍රවෘත්ති නිලධාරියාය. විද්‍යුත් තැපෑල: mcarballo@icmh.ch; bheal@icmh.ch මාලදිවයින පිළිබඳ රැස්වීමේ වාර්තාව www.icmh.ch යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. මාලදිවයින නිරීක්‍ෂණ චාරිකාවට අරමුදල් සපයන ලද්දේ Taiwan International Health Operations Center විසින්ය.*

*YAKKUM හදිසි ප්‍රථමාධාර ඒකකයේ වෛද්‍ය සාරි මුතියා ටිමූර් රෝගින් සමග, ඉන්දුනීසියාව*



Emily Will/MCC/ACT International

# මහා ඉඩම් කොල්ලය

ස්කොට් ලෙකී

*සුනාමිය අපට පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ සඳහා අයිතීන් පදනම් කර ගත් ප්‍රවේශයක අවශ්‍යතාව සිහි කරවයි. පශ්චාත් සුනාමි සැලසුම්වලදී නිවාස, ඉඩම් හා දේපල අයිතිවාසිකම් පිළිබඳ කාරණා බොහෝ සංකීර්ණ හා වියදම් අධික ලෙස සලකා බැහැර කරනු වෙනුවට දැඩි සැලකිල්ලට යොමු කරන්නේ නම් ඒ සැලැසුම් සාර්ථක වනු ඇත. මේ අයිතිවාසිකම් නොසලකා හරින්නේ නම් හෝ හිතාමතාම උල්ලංඝණය කරන්නේ නම් හෝ ඒ මඟින් අයිතිවාසිකම් උල්ලංඝනය කෙරෙනු පමණක් නොව ප්‍රතිසංස්කරණ ද අසාර්ථක වනු ඇත.*

පශ්චාත් සුනාමි ආධාර ගලා එන විට නැවත වරක් අපට පරණ සිංදුවම ඇසෙන්නට විය: "මේ වතාවේ වෙනස්, මේ වතාවේ විපතට පත්වූවනට අසාධාරණයක් වෙන්නේ නෑ". හය මාසයක් ගිය තැන ඇසිය යුතු වන්නේ දැවැන්ත ප්‍රතිසංස්කරණ හා යළි ගොඩනැගීම් පෙර ව්‍යවසනයන්ගෙන් වෙනස් වන්නේ කෙසේද යන්නයි. පශ්චාත් ව්‍යසන ඉදිකිරීම් අවශ්‍යතා ඉටු කර තිබේද? නිවාස අහිමිවූවනට දැනටම නිවාස සපයා ඔවුන් ඔවුන්ගේ ජීවිත සුපුරුදු පරිදි ගෙවීම ආරම්භ කර තිබේද? දිවි බේරාගත්තවුනට ඔවුන්ගේ අයිතිවාසිකම්වලට අනුව සැලකිලි හා ප්‍රතිකාර කර තිබේද? අචේ පලාතේ, මාලදිවයිනේ, ශ්‍රී ලංකාවේ, ඉන්දියාවේ දිවි බේරාගත්තවුන් භූමිකම්පාවලින් දිවි බේරා ගත් බාම් හෝ ගුජරාටි හෝ කෝබේ හෝ වැසියන්ටත්, මධ්‍යම ඇමරිකාවේ හෝ කැරිබියන් දූපත්වල හෝ සුළි සුළංවලින් බේරුණු අයටත් වඩා හොඳින් සිටින්නේද? එසේ නැත්නම් දේශපාලන ක්‍රියාකාරීන් අන් ආකාරයකින් ඉටුකර ගත නොහැකි අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා ව්‍යසනය දඩමීමා කර ගත් නිසා ඒ ජනතාවගේ අයිතිවාසිකම් අප්‍රධාන කිරීමකට අසාධාරණයකට ලක්වීද?

## අහිමි වූ හා අත්පත් කරගත් ඉඩම්

හැම ආපදාවකදීම ජීවිත හා ජීවනෝපාය අහිමිවීම, ආර්ථික අපහසුතා සහ සාමාන්‍ය ජීවිතය දරුණු ලෙස කඩා වැටීම හැම තැනකදීම සහතික වේ. එහෙත් සියලු ව්‍යසනයන් ඇතුළතින් ඇදී යන, සාර්ථක ප්‍රතිසංස්කරණයකට, යළි ගොඩනැගීමකට හා ප්‍රතිඋත්පාදනයකට ප්‍රධාන සාධකය වන පොදු රැහැනක් වේ. එය නම් ඉඩම්, නිවාස හා දේපලයි.

ජීවිත අහිමිවීම ඉක්මවා යමින් සුනාමිය ඉඩම් කොල්ලකා ගැනීමට, මිනිසුන් එළවා දැමීමට, අසාධාරණ ඉඩම් අත්පත් කරගැනීම් සැලැසුම් කිරීමට හා නිවාස අහිමිවූවන් ඔවුන්ගේ කලින් නිවාස හා ඉඩම් වෙත ආපසු ඒම වැළැක්වීමට හොඳ දඩමීමකු සපයා දුන්නේය. තායිලන්තය, ඉන්දියාව හා සුනාමියට ගොදුරුවූ අනෙක් රටවල් ආපසු තම නිවාස වෙත පැමිණීමට ජනයාට සීමා බන්ධන පනවා ඇති නමුත් ශ්‍රී ලංකාව තම ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය ඔස්සේ සිය ජනාවාස භූමි දර්ශනය නව හැඩතලයකට සැකසීමට පුදුම උපදවන ආකාරයෙන් අපේක්ෂා කළ රට ලෙස පෙනී සිටී.

රාජ්‍ය ප්‍රතිපත්ති මගින් දැන් වෙරළ සීමාවේ සිට මීටර 100ක් (සමහර පෙදෙස්වල මීටර 200) ඇතුළත නව ඉදිකිරීම් තහනම් කර තිබේ. සුනාමියෙන් අවතැන්වූ 500,000 ක ජනතාව අතුරෙන් අති බහුතරය ජීවත් වූයේ මීටර 100 ක් ඇතුළතය. එසේ විපතට පත් වූ අයට ඉදිකිරීම් රෙගුලාසි මගින් නිවාස ලබාදීමට පොරොන්දු වී ඇති අතර නිවාස අහිමි වූ හැම කෙනකුටම නිවාසයක් ඉදිකරදීමට භාරගෙන ඇත. මීටර 100 ඇතුළත පිහිටි පෞද්ගලික දේපලවල හිමිකම ඒවායේ මුල් අයිතිකරුවන් සතුව පවතින අතර ඒ ඉඩම් රජය සතු කර නොගන්නා බව රජය කියයි. මීටර සියයේ නීතිය මුහුදු රස්සාවේ නියැලී දහස් සංඛ්‍යාත ධීවර ප්‍රජාවට හා වෙරළ තීරයේ හෝ ඒ ආසන්නයේ හෝ රස්සාව කළ හා ජීවත් වූ අන් අයට ද යළි තම ඉඩකඩම් වෙත පැමිණීම ස්ථිරවම තහනම් කරන්නේය. තේරුම් ගැනීමට හැකි ලෙසම මෙයින් පීඩාවට පත් වන අය සතුටු නැත.

වෙරළ තීරය හා එහි කලින් සිටි නිවැසියන් යළි සුනාමියකින් ආරක්ෂා කිරීමට ඇති මේ කැමැත්ත මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුව අර්ථවත් හා යෝග්‍ය සේ පෙනෙනු ඇත. කෙසේවෙතත් ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ ජන සංයුතිය වෙනස් කැරෙන මේ උපාය විවිධ අංශවලින් විවේචනයට ලක් කළ හැකිය. පළමුවෙන්ම, මේ ජනතාව අන් තැනකට යාමට කැමැති නැති අතර ඔවුන්ගේ ආශාව තමන් කලින් සිටි ස්ථානවලටම යාමටය. දෙවැන්න, මීටර් 100 නීතිය ගැන සාර්ථක ලෙස අදහස් විමසා නැත. තුන්වැන්න, මීටර් 100 නීතිය දැන් සමහර ඉදිකිරීම්වලට අදාළ නොකිරීම – හෝටල්, ධනවත් දේපල වෙළෙඳුන් හා වෙනත් බලපුළුවන්කාර කණ්ඩායම් සඳහා – අනිසි පක්ෂපාතීත්වය පිළිබඳ ප්‍රබල උද්වේගයන් මතු කරයි.

## නිවාස පිළිබඳ අවිනිශ්චිතභාවය

ස්ථිරවම වෙනත් ස්ථානයක පදිංචියට යනවා වෙනුවට ජනතාවට තම නිවෙස් වෙත ආපසු යාමට ඉඩදීමට අචේ බලධාරීන් ස්ව කැමැත්තෙන් ආපසු සීමා පිළිබඳ නීති සැලැකිය යුතු ලෙස වෙනස්කර ඇති අතර දිවි බේරාගත් අචේ ජාතිකයෝ අලුත් ගැටළුවලට මුහුණ දෙති. යළි ඉදිකිරීම් කටයුතු වේදනාකාරී ලෙස මන්දගාමී වී ඇති අතර සුනාමිය තදබල ලෙස බලපෑ ප්‍රදේශවල තවම එකදු නිවසක් හෝ ඉදිකර නැති තරම්ය. ප්‍රජා සිතියම් සැකැසීමේ වැදගත් ක්‍රියාමාර්ගයක් අචේ ප්‍රාන්තයේ රාජ්‍ය නොවන සංවිධානවල නායකත්වයෙන් ආරම්භ කර ඇති නමුත් එයාකාරයෙන් පහලින් ඇති කළ ආරම් ක්‍රියාවන් පිළිගැනීමට ප්‍රාදේශීය බලධාරීන් මැලි වෙති. මෙය සමහර විට ලෝක බැංකු ආධාර ලබන අචේ ප්‍රාන්තයේ "ඉඩම් ලියාපදිංචි කිරීමේ සීඝ්‍ර වැඩසටහන" යටතේ සිදුවන්නක් විය හැකි අතර ඒ සඳහා මුදල් ප්‍රතිපාදන හොඳින් ලැබී ඇතත් පුළුල් ප්‍රතිනිර්මාණ ක්‍රියාවලියට සහාය වීමේදී ඒ ක්‍රියාමාර්ගය ඉතාමත්ම මන්දගාමී හා අර්බුදවලට නැඹුරුවන අන්දම පෙනේ.

ශ්‍රී ලංකාවේ ආපදාවෙන් මාස හයකට පසුත් ඉන් දිවි බේරාගත් සිය ලක්ෂ ගණන් දෙනාට තවමත් තාවකාලික නිවහන්වල හෝ කුඩාරම්වල හෝ රැඳී සිටීමට සිදුව තිබේ. වාර්තා පෙන්වා දෙන්නේ තම නිවාස කි.මී. හතර හෝ පහ හෝ – සමහර ස්ථානවල ක.මී. 14 – තරම් සාම්ප්‍රදායික මුදුකරයේ ගම්මානවලින් ඈත් කර ඉදිකිරීමට රජය සැලැසුම් කර ඇති බවයි. මෙය මුහුදට ඉතා සමීපව වාසය කරන මුහුදින් යැපෙන ධීවර පවුල්වල ජීවනෝපාය කෙරෙහි බරපතල ප්‍රතිවිපාක ඇති කරනු ඇත. යම් අයෙකු ශ්‍රී ලංකාවේ තාවකාලිකව නැවත පදිංචිකරවූවන් සිටින ස්ථාන වෙත ගිය විට සුනාමියෙන් දිවිගලවා ගත් මේ පිරිසට අවශ්‍ය සියලු නිවාස ලැබීමට පෙර තවත් වසර ගණනාවක් මෙලෙස ගත කිරීමට සිදු වනු ඇති බවට හැඟීම් ඇති කර ගැනීමට අපහසු නැත.

යළි ගොඩනැගීමේ කාර්යයන් සඳහා මේ ප්‍රජාවන් ක්‍රියාකාරීවම සහභාගී කර ගන්නට අසමත්ව තිබීමද අතිරේක කලකිරීමකට හේතු වී තිබේ. සුනාමිය බලපෑ සියලුම රටවල යළි ගොඩනැගීමේ වැඩකටයුතු සුනාමියේ බලපෑමට හසුවූ බොහෝ ප්‍රජාවන් තීරණ ගැනීමෙන් බැහැර කරවමින් සාමාන්‍යයෙන්ම උඩින් පහළට සැලැසුම් කළ ඒවායි. නිවාස ඉදිකිරීම පමාවී ඇති තරම සැලැකිල්ලට ගත් විට සුනාමියේ බලපෑමට ලක්වූ සියලු පුද්ගලයන්ට, පවුල්වලට හා ප්‍රජාවන්ට පිළිගත හැකි හා ඉක්මණින් ප්‍රතිඵල අත් කර ගත හැකි විසඳුම් සොයා ගැනීමට ආණ්ඩු, ජනතාව හා රාජ්‍ය නොවන සංවිධාන එකට එක්ව කටයුතු කළ යුතුය. 2001 භූමි කම්පාවෙන් පසු ප්‍රදේශය යළි ගොඩනැගීමේ ක්‍රියාවලියෙහි නායකත්වය ගැනීමට දේශීය රාජ්‍ය නොවන සංවිධානවලට හා විදේශීය නියෝජිත ආයතනවලට ඉඩදුන් ගුජරාටි ආණ්ඩුව ආදර්ශයට ගැනීමට කල්පනා කළ යුතුවේ. රාජ්‍ය හා පෞද්ගලික අංශය විසින් කරන ලද්දේ නම් ගත විය හැකි කාලයට වඩා බොහෝ ඉක්මණින් අවතැන්වූවනට සාමාන්‍ය නිවාසවලට යාමට හැකි වනු ඇත.

## අයිතිය පදනම් කරගත යළි ඉදිකිරීම්

දිවි ගලවා ගත්තවුන් සිය නිවාස, ජීවනෝපාය හා ප්‍රජාවන් සමඟ යළි ස්ථාපිත වීමට අපේක්ෂා කරද්දී ඔවුන්ගේ මානව




කලින් මෙහි තිබුනේ ගෙවල් දොරවල්ය, ශ්‍රී ලංකාව

අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම මගින් මේ ස්වභාවික ආපදාවෙන් උරුම වූ මානව ඛේදවාචකය යළි ඇවිස්සීම නො කළ යුතුය. නිවාස, ඉඩම් හා දේපල හිමිකම් කුමන හෝ පශ්චාත් ව්‍යසන කාර්යයක දී ප්‍රධාන මූලධර්ම වන අතර අනාගත ඕනෑම යළි ගොඩනැගීමේ කටයුත්තකදී වෙන් කළ හැකි කොටස් විය යුතුය. සහන හා යළි ගොඩනැගීම් පිළිබඳ මෙහෙවරේදී නිවාස, ඉඩම් හා දේපල පිළිබඳ සැලසුම් සුනාමියට ප්‍රතිචාර වශයෙන් සැකසෙන බොහෝ කර්කශ පිළිවෙත් අනාගත ව්‍යසනයකදී වළක්වාලනු පිණිස සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ඇත. හිමිකම් පදනම් කර ගත් එළැඹුම් ප්‍රධාන ක්ෂේත්‍ර හතක් වෙත එල්ල විය යුතුය:

1. **කැමැත්තෙන් ආපසු පැමිණීමේ අයිතිය:** තමන් කලින් ජීවත් වූ ඉඩම වෙත වෙනස්කමකින් තොරව ස්වකැමැත්තෙන් ආපසු පැමිණීමේ අයිතිය ව්‍යසනයෙන් බේරී සිටින සියලු දෙනාටම සහතික කළ යුතුය. ඔවුන්ගේ නිවාස තවදුරටත් හොඳින් තිබේ නම්, අලුත්වැඩියා කිරීමට හැකි නම්, යළි ගොඩනැගීමට සන්තකයේ තබා ගැනීමට හා යළි පදිංචිවීමට ඇති අයිතියට ගරු කළ යුතුය. ආපසු පැමිණීම පිළිබඳව කෙරෙන කුමන හෝ අසාධාරණ තහනමක් ගැනෙන්නේ බලහත්කාරයෙන් ඉවත් කිරීමක් හැටියට වන අතර එය අන්තර්ජාතික නීතිය යටතේ වැරැද්දකි.

2. **ප්‍රමාණවත් නිවාස හා සුරක්ෂිත භුක්තිය සඳහා අයිතිය:** සියළු ව්‍යසනයන්ට පසු, ඒ ව්‍යසන බලපෑ පවුල්වලට හා පුද්ගලයනට ප්‍රමාණවත් හා දැරිය හැකි නිවාස පහසුකම් අන්තර්ජාතික මානව අයිතීන්ට අනුකූලව හැකිතාක් අප්‍රමාදව ලබා දිය යුතුය. නිවාස දේපල වෙත ආපසු පැමිණි පසු හෝ අන් තැනක පදිංචියට ආපසු හෝ එහි භුක්තිය අදාළ පුද්ගලයාට හෝ ප්‍රජාවට හෝ සහතික කර භාරදිය යුතු අතර ඒවා නිවාස දෙපාර්තමේන්තුවේ සහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය. යළි ගොඩනැගීමේ ක්‍රියාවලිය හේතු කොට ගෙන කිසිවකුත් නිවාස නැත්තකු නොවිය යුතුය.

3. **සහභාගිත්වයට, අදහස් දැක්වීමට සහ වෙනස්කමට භාජනය නොවීමට තිබෙන අයිතිය:** ආපදාව බල පෑ පුද්ගලයන් ආපසු පැමිණීමේදී නැවත නිවාස ලබාදීමේදී හා නැවත පදිංචි කරවීමේදී කෙරෙන සැලසුම් හා කළමණාකරණයේ දී ඔවුන්ගේ පූර්ණ සහභාගිත්වය ලබා ගැනීම සඳහා විශේෂ උත්සාහයක් දැරිය යුතුය. කුමන හෝ නිවාස සැලසුමක් පිළිබඳව ආපදාව බල පෑ සියළු ප්‍රජාවන්ගේ අදහස් විමසිය යුතු අතර තම වුවමනා හා අපේක්ෂාවන් නියෝජනය කරනු පිණිස ප්‍රජා මූලික සංවිධාන ගොඩනැගීමට ඔවුන් උනන්දු කළ යුතුය. නිවාස හා දේපල යටිතල පහසුකම් යළි ඉදිකිරීමේදී ඒවායේ ප්‍රතිලාභ කලින් නිවැසියනටම විශේෂයෙන් දුප්පත් නිවැසියනටම ලැබෙන බවට සහතික වනු වස් පූර්ණ සහභාගිත්වය ඇති, විනිවිදභාවයෙන් යුත් හා වගකිවහැකි ක්‍රමයක් සකස් කළ යුතුය. සියලු යළි ඉදිකිරීම් හා පුනරුත්ථාපන මෙහෙයන්හිදී විශේෂයෙන්ම දුර්වල හා කොන්වුණු කණ්ඩායම් සැලකිල්ලට ගත යුතුය.

4. **තාවකාලික නිවාස පිළිවෙල කිරීම් තුළ ආරක්ෂාව සඳහා අයිතිය:** සුනාමියෙන් පසු තාවකාලික නිවාස පද්ධතීන් පිහිටුවා පවත්වා ගෙන යාම අන්තර්ජාතික මානව අයිතීන් පිළිබඳ ප්‍රමිතීන්ට පූර්ණ අනුකූලතාවයෙන් යුතුව විය යුතුය. නිවාස, ජලය, ආහාර, වෛද්‍යාධාර, අධ්‍යාපනය සහ කඳවුරුවාසීන්ගේ අවම අයිතීන් ඉටු කරදීමට අතිරේකව ඒ කඳවුරු කළමනාකරණය කළ යුත්තේ කඳවුරුවාසීන්ගේම පූර්ණ අදහස් හා සහයෝගය ලබා ගනිමිනි. සහනාධාර ලබාදීම හෝ වැළැක්වීම හෝ ඔවුන් පාලනය කිරීමත් යටපත් කිරීමටත් මාර්ගයක් කර නොගත යුතුය. සියලු තාවකාලික කඳවුරු ඇතුළත කායික හා මානසික ආරක්ෂාවන් මානසික සෞඛ්‍යයන් – විශේෂයෙන් කාන්තාවන්ගේ හා ළමයින්ගේ – රැක ගෙන පවත්වා ගෙන යා යුතුය.

5. **ජීවනෝපායට සමාජ ආරක්ෂණයට ජලයට සෞඛ්‍යට හා අධ්‍යාපනයට තිබෙන අයිතිය:** පශ්චාත් ආපදා ආධාර, හදිසි ආධාර සැපයීම් හා තාවකාලික කඳවුරු පිහිටුවීම යන කාරණා වෙත අන්‍යොන්‍ය වශයෙන් නොගැලපෙන ප්‍රමාණයන්ගෙන් යොමු නොකළ යුතුය. යළි ගොඩනැගීම හා පුනරුත්ථාපනය සඳහා ඇති සම්පත්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් සුදුසු නිවාස ඉදිකිරීම, අහිමි වූ ජීවනෝපාය, සමාජ ආරක්ෂණය, සෞඛ්‍ය, අධ්‍යාපන, හා ප්‍රජා පහසුකම් යළි ඇති කිරීම සඳහා කැප කළ යුතුය.

6. **ප්‍රවේණියට සම අයිතිය:** සුනාමියෙන් දිවි ගලවාගත් අයට (විශේෂයෙන් කාන්තාවනට හා ළමයිනට) දේපල සමාන ලෙස පැවරීම වළකන, වෙනස් ආකාරයට සැලකීමට හේතු වන, විධිමත් හෝ අවිධිමත් සියලු ප්‍රතිපත්ති හෝ දේපල අයිතිය හා උරුමයන් පිළිබඳ සියලු නීති ඉවත දැමිය යුතුය. වැන්දඹුවනට ඉඩම් හා නිවාස පිළිබඳ නීත්‍යනුකූල ඔප්පු ඔවුන්ගේ නම්වලින්ම දිය යුතු අතර විවාහක කාන්තාවන්ගේ නම් ඔප්පුවේ සිය සැමියාගේ නම සමගම සහ දරුවන් සිටිත් නම් ඔවුන්ගේ ද නම් සමග ඇතුළත් කළ යුතුය.

7. **කාන්තා අයිතිය:** තම ප්‍රජාවගේ පැවැත්ම සහ සුබසාධනය සහතික කිරීමෙහිලා සාම්ප්‍රදායිකවම ප්‍රමුඛත්වය ගෙන සිට ඇත්තේ කාන්තාවන්ටය. එමනිසා ඉහත විශේෂයෙන් සඳහන් කළ කාන්තා අයිතීන් සුරක්ෂිත කරනවාට අතිරේකව සහන, ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන කටයුතුවලදී කාන්තාවනට සහායවීම විශේෂයෙන් වැදගත්වන අතර සහභාගිවන්නට ඔවුනට ඇති අයිතියට ගරු කළ යුතුය.

මීළඟ ස්වභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරෙන ආපදාවකට හෝ ප්‍රතිචාර දැක්වීමේ වගකීම භාරදී ඇති ප්‍රතිපත්ති සම්පාදකයන් හට ඉන්දියන් සාගර සුනාමිය පාඩම් රැසක්ම සපයයි. යළි ගොඩනැගීමේ ක්‍රියාවලියට කලාපයේ ආණ්ඩු විසින් කරනු ලැබූ අප දුටු ඇඟිලි ගැසීම් ඊළඟ සුනාමියේදී නොකරනු ඇතැයි අපේක්ෂා කළ යුතුවේ.

*නිවාස අයිතිය හා ඉවත් කිරීම පිළිබඳ මධ්‍යස්ථානයේ (COHRE www.cohre.org) විධායක අධ්‍යක්ෂ ස්කොට් ලෙකී සුනාමිය හටගත් වහාම මාලදිවයිනේ හා ශ්‍රී ලංකාවේ නිවාස, ඉඩම් හා දේපල අයිතිය පිළිබඳ ප්‍රශ්න ගැන කටයුතු කළේය. සුනාමියට මුහුණ දුන් සියලු රටවල යළි ගොඩනැගීමේ වැඩසටහන්වලදී මානව හිමිකම් උල්ලංඝණයවීම් ගැන අවධානයෙන් සිටීම සඳහා ළඟදී කොළඹ කාර්යාලයක් (bret@cohre.org) ද ආරම්භ කැරිණි. විද්‍යුත් තැපැල: scott@cohre.org*

# සුනාමිය නිසා වෙනත් අර්බුද සඳහා වෙන්කරන ලද අරමුදල්වලට බලපෑමක් ඇතිවූයේද?

ටෝබි ලැන්සර්

වෙනත් හදිසි අවස්ථාවන් සඳහා වෙන්කොට තිබූ අරමුදල්ද සුනාමියට ප්‍රතිකාර කිරීම සඳහා යොදවාගෙන තිබීම ගැන ආධාර ක්‍ෂෙත්‍රයේ නියැලී සිටින ක්‍රියාකාරීන් තම අසතුට ප්‍රකාශ කර ඇත. ඕනෑම බලවත් හදිසි තත්ත්වයක් උදාවූ විට එවැනි බිය සැක පහළවීම අරුමයක් නොවේ. එහෙත් එවැන්නක් යුක්තිසහගතද?

මේ ලිපිය ලියන 2005 ජුනි 3 වනදා වනවිට එක්සත් ජාතීන්ගේ මුදල් ගවේෂණ සේවාව (FTS)[1] වාර්තා කළේ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පෙළේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙහෙයවන වැඩසටහන්වලට අරමුදල් සපයන එක්සත් ජාතීන්ගේ ක්‍ෂණික අභියාචනා සහ ඒකාබද්ධ අභියාචනා යන ආයතන දෙකට 41% ක ප්‍රමාණයක අරමුදලක් ස්ථිර වශයෙන්ම ලැබී ඇති බවයි. කෙසේවෙතත් ඉන්දිය සාගර වැඩසටහන මේ සමීකරණයෙන් පිටතට ගත් විට අරමුදල 25% දක්වා පහත වැටෙන බවත් පෙනී යයි. ගිය අවුරුද්දේ මේ කාලය වන විට ක්‍ෂණික අභියාචනා සහ ඒකාබද්ධ අභියාචනා යන ආයතන දෙකම ඩාර්පූර් සිදුවීම්වලට ලෝකයේ අවධානය යොමු කරවූ විට 23% අරමුදලක් ඊට එකතු විය. තත්ත්වය ගිය අවුරුද්දට වඩා සුළුවශයෙන් වෙනස් වී ඇති බව බැලූ බැල්මට පෙනේ. එහෙත් තත්ත්වය තවමත් හොඳය. අරමුදලට ආධාර කරන ප්‍රධාන පෙළේ රටවල් අතුරෙන් ජර්මනිය, ජපානය, නෝර්වේ සහ එක්සත් ජනපදය වැනි රටවල් ගිය අවුරුද්දට වඩා වැඩි ප්‍රමාණයක් අරමුදල් වෙනත් අර්බුද සඳහාද සපයා තිබේ. ඇත්තවශයෙන්ම වෙනත් අර්බුද මතුවූ අවස්ථාවලදී ඒවා වෙනුවෙන් ද ආධාර කිරීම යහපත් ප්‍රවෘත්තියක් වශයෙන් පෙනී යයි. ඇත්තෙන්ම, එය යහපත් ප්‍රවෘත්තියක්ද?

අනෙකුත් අර්බුද සඳහා වෙන් කර තිබෙන අරමුදල්වලට සුනාමිය විසින් බලපෑමක් කර ඇත්තේය යන නිගමණයට එළැඹෙන්නට පෙරාතුව අප මානවදයාවාදී කටයුතු වෙනුවෙන් මේ අවුරුද්ද සඳහා වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය 2004 අවුරුද්ද හා සසඳමින් සලකා බැලීම අවශ්‍යය. කෙසේවෙතත් සුනාමියට පින්සිදුවන්නට 2005 අවුරුද්ද සඳහා සහනාධාර ආයතන වෙනුවෙන් සෑහෙන තරම් මුදල් ප්‍රමාණයක් වෙන් කොට ඇත්තේය. සුනාමි අරමුදලට අමතරව මේ අවුරුද්ද සඳහා ඩොලර් මිලියන 847 ක් වෙන් කොට තිබෙන අතර එය 2004 අවුරුද්ද සඳහා වෙන් කර තිබූ මුදලට වඩා වැඩිය. 2004 අවුරුද්ද සඳහා වෙන් කර තිබූ මුදල ඩොලර් මිලියන 697 කි. මේ මුදලින් බාගයක්ම සුඩානය සඳහා වෙන් කර තිබෙන අතර අනෙකුත් නොසලකා හරින ලද හදිසි අවස්ථාවන් සඳහා ඉතිරිව තිබෙන්නේ ඩොලර් මිලියන 417 ක් පමණි. මේ හේතුවෙන් මධ්‍යම අප්‍රිකානු ජනරජය, ඩැඩ්, චෙච්නියාව, එරිත්‍රියාව, ගීනියාව, සොමාලියාව සහ බටහිර අප්‍රිකානු යන රටවලට 2005 අවුරුද්දේ පළමු මාස පහ ඇතුළත ලැබුනේ ගිය අවුරුද්දේ එම කාල පරිච්ඡේදය ලැබුනාට වඩා අඩුවෙනි. එබැවින් එම රටවල වාසය කරන ජනයාගේ ජීවන තත්ත්වය අවුරුද්දට පෙර පැවති තත්ත්වයට වඩා පහතට ඇද වැටී ඇතැ'යි කෙනෙකුට තර්ක කළ හැකිය. 2005 අවුරුද්දේ ඉදිරිපත් කොට තිබූ ආධාර අභියාචනා 21 න් සාමාන්‍ය වශයෙන් අරමුදල් සැපයුනේ ඒවායෙන් 25% ට පමණි. අභියාචනා 11 ට සපයන ලද්දේ 20% ටත් අඩු අරමුදල් ප්‍රමාණයකි. 1992 සිටම එවැනි අභියාචනාවලින් 67% ටම අරමුදල් සපයා දී තිබෙන බැව් කියතහැකි වුවත් පොදුවේ ගත්කල සුනාමිය හේතුකොටගෙන අරමුදල් ප්‍රදානය කිරීමේ කාල වකවාණු සම්බන්ධයෙන් බරපතල අර්බුදයක් පැන නැගී තිබෙන බව කිවයුතුමය.

මේ අවුරුද්ද වූකලි ප්‍රධාන පෙළේ ආණ්ඩු කීපයක් යහපත් භාවිතාවන් යහපත් ප්‍රතිපත්තීන් රැකීම සඳහා එකට එකතුවී පිහිටුවාගත් "යහපත් මානවදයාවාදී දායකත්වය"[2] නම් ආරම්භක ක්‍රියාව දියත් කෙරෙන දෙවන අවුරුද්ද වේ. මේ ආරම්භක ක්‍රියාව ඉදිරිපත් කොට ඇති යෝජනාවලින් එකක් නම් අභියාචනා ඉදිරිපත් කිරීමෙන් පසුව ඒවා වෙනුවෙන් ඉතා ඉක්මණින්ම අරමුදල් ලබාදීමය. සුනාමිය වෙනුවෙන් පළවූ මූල්‍ය ප්‍රතිචාරය ඉතාමත් වේගවත් එකක් වුවද මෙවැනි වෙනත් අර්බුද කෙරේ දැක්වුණු ප්‍රතිචාරය සුපුරුදු පරිදි මන්දගාමී සාමාන්‍ය එකක් විය. අරමුදල් දායකයින් සියළුදෙනාම පාහේ සුනාමිය වෙත ස්වකීය අවධානය යොමු කළ හෙයින් වෙනත් අර්බුදවලට යොමුකරවීම සඳහා ඔවුන් වෙත කාර්‍යමණ්ඩල සම්පත් ප්‍රමාණවත් පරිදි තිබුනේද නැත. එබැවින් අත්වූ එක් ප්‍රතිඵලයක් වූයේ, සුනාමියෙන් බාහිරව අර්බුද මතුවූ අවස්ථාවලදී. යෝජිත කොන්ත්‍රාත්තුවලට අරමුදල් ලබාදීම, සාමාන්‍ය කාලවලදී සිද්ධවනවාට වඩා බොහෝ කාලයක් ගත වී සිද්ධවීමය.

සමහර අවස්ථාවලදී සමහර ආයතන විසින් ලබා දෙන බවට අටතෙන් පොරොන්දු වූ අතිරේක සුනාමි මුදල් නිකුත් කරන්නට එම ආයතනවලට නොහැකි විය. ඊට හේතුව සමහර ප්‍රදාන කරුවන්ට ඒ සඳහා වෙනත් ආයතනවලින් මුදල් නොලැබීමය. එවිට එම ආයතන කළේ වෙනත් හදිසි අවස්ථාවක් සඳහා වෙන් කර තිබූ මුදල් සුනාමි මුදල් බවට කෙටි මාර්ග ඔස්සේ නැවත දිසාගත කිරීමය. අරමුදල් ලබාදෙන බවට බොහෝ අමාත්‍යාංශ බොහෝ අවස්ථාවල පොරොන්දු වුවත් ඒ සඳහා ව්‍යවස්ථාදායකයේ අවසර අවශ්‍යවන හෙයින් ඒ සඳහා කාලයක්ද ගත වන්නේය. ඉදින් සුනාමිය විසින් සමහර අරමුදල් නැවත දිසාගත කරනු ලැබූ අතර ඒ හේතුව නිසාම අර්බුද කලාපවල පවත්වාගෙන ගිය වෙනත් වැඩසටහන්වලටද මුදල් ලඟාවීම ප්‍රමාද විය. සමහර ආණ්ඩුවලට නිකුත් කළ හැක්කේ අවුරුද්දක් සඳහා කලින්ම අනුමත කළ ස්ථාවර සහනාධාර අරමුදල් පමණි, අතුරු වියදම් සඳහා වැය ශීර්ෂ ඊට එකතු කිරීමට කොහෙත්ම බැරිය. ෆින්ලන්තය එවැනි රටකි. සුනාමියට මුදල් නිකුත් කිරීම යන්නේ තේරුම අනෙකුත් අර්බුද වෙනුවෙන් වියදම් කරන්නට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණවල අඩුවීමයි.

සුනාමියෙන් පසුව වහාම කඩිනමින් නොමසුරුව ක්‍රියාත්මක වන්නැ'යි ඉල්ලා කෙරෙන දැඩි බලපෑම් ආධාර ආයතනවලට අභ්‍යන්තරිකවත් බාහිරවත් එල්ල විය. කෙසේවෙතත් පුහුණුව ලද කාර්ය මණ්ඩල සිටියේ සීමිත ප්‍රමාණයකි. සමහර එක්සත් ජාතීන්ගේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන මෙතෙක් තමන් නිරත වී සිටින ප්‍රධාන ක්‍ෂෙත්‍ර ක්‍රියාන්විතවලින් ඉවත් වී, එපමණක් නොව මූලස්ථානය වශයෙන්ද වෙනස්කම් ඇතිකොට, සුනාමි ආපදාව ආමන්ත්‍රණය කරන්නට පටන් ගත්හ. එම ක්‍රියාදාමයේ අවසාන ප්‍රතිඵලය වූයේ සමහර සංවිධාන ඒ ඒ කලාප වෙනුවෙන් පසුගිය අවුරුද්දේ ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා, "අංක එකේ අර්බුද" හැටියට හඳුන්වාදෙන ලද යෝජනා, පසුගිය අවුරුද්දට වඩා මෙවර අඩු වී තිබීමයි. එක් ප්‍රධාන අරමුදල් ප්‍රදානකරුවෙක් කියා සිටියේ ගතවූ අවුරුද්ද හා සසඳා බලන කල මේ අවුරුද්දේ අප්‍රිකානු රටවල් සඳහා ඉදිරිපත් කර තිබෙන ව්‍යාපෘති යෝජනා ප්‍රමාණය අඩු බවයි.

## නිගමණ

ඉන්දියානු සාගරය ආපදාව විසින් වෙනත් අර්බුද සඳහා වෙන් කොට තිබූ අරමුදල් තමා වෙතට ඇද ගනු ලැබිනැ'යි කියැවෙන මතයෙන් ඇත්තෙන්ම යෝජනා වන්නේ බින්දුවෙන් පටන් ගන්නා තරඟ සෙල්ලමකි. එහදී සුනාමියට පොරොන්දු වන මුදල් ප්‍රමාණයෙන් තේරුම්වන්නේ අනෙකුත් අර්බුද සඳහා අඩු මුදල් ප්‍රමාණයක් ලැබෙන බවයි. ඇත්තෙන්ම පවතින තත්ත්වය ඊටත් වඩා සංකීර්ණය. උදාහරණයක් වශයෙන් කියතොත්, සුනාමි අරමුදල වෙනුවෙන් තමන් නිකුත් කරන්නේ අමතර මුදල් ප්‍රමාණයක් බවත් වෙනත් අර්බුද සඳහා වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය ගතවූ අවුරුද්ද හා සසඳන කල බෙහෙවින් වැඩි බවත් අරමුදල් ප්‍රදානය කරන බොහෝ රටවල් කියා සිටීමය.

සමස්ථයක් වශයෙන් කරුණු සලකා බලනවිට, ඉන්දිය සාගර ආපදාව හමුවේ අරමුදල් දායකයින් හා ආධාර ආයතන දැක්වූ ප්‍රතිචාරය, යටත්පිරිසෙයින් තාවකාලික වශයෙන් වුවත්, වෙනත් අර්බුදවලට ඔවුන් දක්වන ප්‍රතිචාරයට බලපා තිබෙන බව කියත හැකිය. සැබැවින්ම, මේ තත්ත්වය වෙනස් කළ හැක්කේ ආධාර ප්‍රජාව විසින් දැනුවත්ව යම් යම් ක්‍රියාකාරකම්වල නිරතවීම තුලිනි. අපෙක්‍ෂිත, නියමිත සහ අවශ්‍යතා - පාදක ආදී වශයෙන් අරමුදල් සඳහා ඉල්ලීම් හැමවිටම ඉදිරිපත් කෙරෙන අතර එම ඉල්ලීම් වලංගු ඒවා ලෙසද සැලකිය යුත්තේය. අඩුවෙන් ආධාර කිරීමත් කල්ගතවී ආධාර කිරීමත් නිසා මතුවන ගැටළු වෙතට අරමුදල් දායකයන්ගේ අවධානය ආධාර ආයතන විසින් යොමු කරවිය යුතුය. කල්ගතවූ හෝ අතහැරදමන ලද හෝ වැඩසටහන් නිසා ජනයාට මුහුණ දෙන්නට සිදුවී තිබෙන විපාක විස්තර කැරෙන සාධක හා සංඛ්‍යාලේඛන අවශ්‍යය. සුනාමි මුදල් අටතින් එක් රැස් කළ ඒවා බවත් එබැවින් අනෙකුත් වැඩසටහන්වලට එයින් හානියක් සිද්ධවන්නේ නැති බවත් ඒ ඒ ආණ්ඩු පවසන විට එය ඔප්පු කර පෙන්වන ලෙස ඉල්ලා සිටිය යුතුය. මානවදයාවාදී ගිණුම් හොඳහැටි තර කොට තබාගැනීම සඳහා ව්‍යවස්ථාදායක සභා සහ මුදල් අමාත්‍යාංශ සීඝ්‍රයෙන් වැඩකටයුතු කළ යුතුය.

හදිසි සහනසේවා සැලසීමේදී සියල්ලට වඩා වැදගත්වන්නේ නිවැරදිව කාලය නිර්ණය කිරීමයි. 2005 අවුරුද්දේ ජුනි මස අගදී එක්සත් ජාතීන්ගේ සංවිධානය ජිනීවා නුවරදී රැස්වීමක් කැඳවන ලද්දේ තමන් ඉදිරිපත් කළ අභියාචනාවල වර්තමාන තත්ත්වය සාකච්ඡා කිරීම සඳහාය. ලෝකයේ වඩාත් අවාසිදායක තැන්වල ජීවත්වන, එමෙන්ම ආපදාවට හා ගැටුමට ලක්වූ, ජනකොටස් සඳහා මේ වනවිට කටයුතු සංවිධානය වී තිබෙන අන්දම සලකා බැලීම එම රැස්වීමේ අරමුණ වී තිබිණ. එමෙන්ම එම ජනකොටස්වල අවශ්‍යතා මානවදයාවාදී ප්‍රජාවේ අවධානයට වහාම ලක්විය යුතුව තිබේ.

*ටෝබි ලැන්සර් සරණාගත අධ්‍යාපන ක්‍ෂෙත්‍රයේ හිටපු බාහිර කථිකාචාර්යවරයෙකි. දැනට ජිනීවා හි පිහිටි එක්සත් ජාතීන්ගේ මානවදයාවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය (OCHA) ට අනුබද්ධ ඒකාබද්ධ අභියාචන ක්‍රියාවලියේ (CAP) ප්‍රධානියාය. මේ ලිපිය ඔහු ලියන ලද්දේ පුද්ගලික මට්ටමින්ය. විද්‍යුත් තැපැල: lanzer@un.org*

1.www.reliefweb.int/fts
2.www.reliefweb.int/ghd

# DFID සංවිධානය සුනාමි ප්‍රතිචාර සමාලෝචනය කරයි

ඩේවිඩ් හොරොබින්

එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධන අංශය සුනාමි ආපදුවත් සමගම ක්ෂණිකව පොරොන්දු වූ පවුම් මිලියන 68කට ආසන්න ප්‍රමාණයක් සහනාධාර වශයෙන් ලබාදීම ආරම්භ කර ඇත. මෙම ආයතනය විසින් සිදුකරන ලද මානවදයාවාදී ප්‍රතිචාර සමාලෝචනය තවමත් සම්පූර්ණ වී නැතත් ඊට අදල මූලික අධ්‍යයනයන් සිදු කොට අවසානය.

අග්නිදිග ආසියානු කලාපයට දෙසැම්බර් 26 ද පහර දුන් සුනාමිය වෙනුවෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව දැක්වූ ප්‍රතිචාරයට නායකත්වය දුන්නේ ජාත්‍යන්තර සංවර්ධන අංශය (DFID) යි. එම අංශයට අනුබද්ධ ගැටුම් සහ මානවදයාවාදී කටයුතු පිලිබඳ අංශයේ මෙහෙයුම් කණ්ඩායම (CHAD OT) මෙහෙයවන ප්‍රධාන මාණ්ඩලික නිලධාරිවරයා දෙසැම්බර් 26 වන දින සවස් භාගයේදී ලන්ඩනයේ සිට කොළඹ බලා පිටත් විය. බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ සේවයේ නිරත DFID නිලධාරියා සහ, එක්සත් ජාතීන්ගේ සංවිධාන නියෝජිතයන්ද හමුවීමෙන් පසු, දරුණුතම විනාශයකට මුහුණ දී ඇතැ’යි වාර්තා වූ නැගෙනහිර පලාතේ අම්පාර දිස්ත්‍රික්කය වෙත හැකි ඉක්මණින්ම යෑමට තීරණය කරන ලද අතර මෙම කාර්යය ඇගැයීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සහාය පිණිස එක්සත් ජාතික සංවිධානය සහ පුළුල් මානුෂවාදී සංගම් කටයුතු කළෝය. ඒ අනුව ඒකාබද්ධ UN-USAID-DFID ඇගයීම් කණ්ඩායමක් විසින් ආපදවට මුහුණ දී දින කීපයක් ඇතුලත බලපෑම හා අවශ්‍යතා පිලිබඳව සීග්‍ර එහෙත් පරිපූර්ණ ඇගයීමක් සිදුකොට අවසන් කෙරිණ. ඉක්බිත්තෙන්, අපගේ කාර්යමණ්ඩලය සහනාධාර සේවා කටයුතුවල නිරතව සිටි එක්සත් රාජධානියේ හමුද කණ්ඩායමට මාර්ගෝපදේශකත්වය සැපයීම, UNHCR සහ ආණ්ඩුවේ නිලධාරීන් සමග එකතු වී තාවකාලික නිවාස ඉදිකිරීමේ කටයුතු සංවිධානය කිරීම, නිවාස/ආරක්ෂාව/මනෝසමාජයීය සහාය/අධ්‍යාපනය/ජීවනෝපායන් නැවත පණගැන්වීම වැනි කාරණාවලට ප්‍රමුඛත්වය දෙමින් CHAD කළමනාකාරිත්වයට සහායවීම වැනි කටයුතුවල නිරත විය.

සහනාධාර රැගත් ප්‍රථම ගුවන් යානය සංවිධානය කොට එක්සත් රාජධානියෙන් පිටත් කොට එවන ලද්දේ DFID ආයතනයයි. එක්සත් ජාතීන්ගේ මානවදයාවාදී කටයුතු පිලිබඳ සම්බන්ධීකරණ කාර්යාලය (OCHA) දියත් කළ ඉන්දිය සාගර ක්ෂණික අභියාචන ආයතනයට පවුම් මිලියන 10 ක් DFID පරිත්‍යාග කළාය. ඒ හැරෙන්නට එක්සත් ජාතීන් විසින් දියත් කරන ලද සහනාධාර සහ ප්‍රත්‍යාකාරක ක්‍රියාකාරකම්වලටද DFID තවත් පවුම් මිලියන 40 ක් ලබා දී තිබේ. එක්සත් ජාතීන්ගේ විවිධ ආයතනවලට ලබාදුන් ප්‍රතිපාදන සහ භාණ්ඩ ද ඊට ඇතුලත්ය. DFID විසින් ගාස්තු ගෙවා ලබා ගත් හෙලිකොප්ටර පහක් එක්සත් ජාතීන් සහ අනෙකුත් ඒජන්සි සැපයූ භාණ්ඩ සුනාමියෙන් විනාශ වී ගිය බටහිර වෙරළබඩ සුමාත්‍රාවේ ජීවත් වූ හුදෙකලා ජන කණ්ඩායම් වෙත බෙදහැරීමෙහිලා වැදගත් වැඩ කොටසක් ඉටු කළේය. ඒ හැරෙන්නට අප, එක්සත් රාජධානියට අයත් නොවූ සංවිධාන 5 ද ඇතුළුව, රාජ්‍ය නොවන සංවිධාන 25 ට ප්‍රතිපාදනද ලබා දී තිබේ. පවුම් මිලියන 3.5 රතු කුරුස සංවිධානයටත් ක්‍රෙසන්ට් ව්‍යාපාරයටත් ලබාදෙන ලදී. එක්සත් රාජධානිය තුල පිහිටා තිබෙන මුල්පෙලේ ආධාර ආයතන 13 ඇතුලත් ඒකාබද්ධ සංවිධානයක් වන එක්සත් රාජධානියේ හදිසි ආපද කමිටුව විසින් සංවිධානය කරන ලද සහනාධාර සැපයුම් රැගත් ගුවන් ගමන්වාර 26 ක් සඳහා අපි ගාස්තු ගෙව්වෙමු.[1]

උද්‍ුවූ හදිසි තත්ත්වය තුළ පැන නැගි ගැටළු ගණනාවක් DFID ආයතනය හඳුනාගත්තාය. විශේෂයෙන්ම බටහිර වෙරළබඩ සුමාත්‍රාවේ ආපදවට ලක් වූ ජන කොටස් සම්බන්ධයෙන් දත්ත හා තොරතුරු ලැබුනේ සීමාසහිතවය. එහි තිබූ දේශීය හදිසි අවස්ථා කළමණාකරණ ව්‍යුහය ඉතා දුර්වල අඩියක පැවති අතර සමහර අංශවලදී නායකත්වය ගන්නේ කුමන බාහිර ආයතනයක්ද යන අවුලද එහි ඉස්මතු වී තිබිණ. එක්සත් ජාතීන්ගේ හදිසි අභියාචනය සූදානම් කරගන්නට කල්ගත වූ අතර එය එතරම් ව්‍යුහගත වී නැති බවත් පෙනී ගියේය. සුදුසුකම් තිබෙන අත්දැකීම් සහිත කාර්යමණ්ඩලවල හිඟතාවයෙන් බොහෝ ඒජන්සි පසු විය. DFID ආයතනයේ සහාය ලබා දී බන්ඩා අචේ ප්‍රදේශයේදී සහ කොළඹදී පිහිටුවන ලද මානවදයාවාදී තොරතුරු මධ්‍යස්ථානද අවශ්‍ය තරම් ඉක්මණින්ම කටයුතු කිරීමත් සිදුනොවීය.

ආපදවෙන් සයමසකට පසු එය විසින් අරමුදල් සපයන ලද වැඩසටහන් පසුවිපරම් කිරීමටත් සෝදිසි කිරීමටත් DFID පටන් ගත්තාය. අප දැන් නිරත වී සිටින්නේ ඉන්දුනීසියාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව, මාලදිවයින ආදි රටවල් ලබා ඇති ප්‍රගතිය අධීක්ෂණය කරන මෙහෙවරකය. ඇත්තෙන්ම, තවත් බොහෝ දේවල් කළ යුතුව තිබේ. ජනයාට ස්ථිර වාසස්ථාන ලබා දිය යුතුය, මේ වාසස්ථානවලට නියමාකාරයෙන් ජලය සහ සනීපාරක්ෂක කටයුතු සලසා දිය යුතුය, සෞඛ්‍ය ආරක්ෂාව සහ අධ්‍යාපන කටයුතු සැලැස්විය යුතුය, ජීවිත හා ජීවනෝපාය නැවත ගොඩනැගීම සඳහා අවශ්‍ය මෙවලම් ආම්පන්න සපයා දිය යුතුය, අනාගත කම්පනවලට මුහුණදීම සඳහා ඔවුන්ගේ හැකියා ශක්තිය වැඩිදියුණු කළ යුතුය.

යහපත් මානවදයාවාදී පරිත්‍යාගශීලි ආරම්භක ක්‍රියා හමුවේ තමන් සතු යුතුකම් සමුදය මොනවාදැ’යි DFID ආයතනයට හොඳ අවබෝධයක් තිබේ. ඒවාගේම ඉගෙනීම සහ සම්බන්ධීකරණය පිලිබඳ කාරණා ගැනත් එම ආයතනයට හොඳ අවබෝධයක් තිබේ. සුනාමි ආපදවට අප ආයතනය ප්‍රතිචාර දැක්වූ ආකාරය ගැන පරිපූර්ණ මානවදයාවාදී ප්‍රතිචාර සමාලෝචනයක් කිරීමට මේ වනවිටත් අප සූදනම් වෙමින් සිටින්නෙමු. ඒ සඳහා අරමුදල් දයක ආයතනවල කළමනාකරුවන්ගේ රැස්වීමක් පැවැත්වීමටද සැලසුම් කොට තිබේ.

එම රැස්වීමේදී විස්තරාත්මක නිර්දේශ ඉදිරිපත් කෙරෙනු ඇති අතර, මාගේ පුද්ගලික අත්දැකීම්වලට අනුව නම්, පහත සඳහන් අවශ්‍යතා අත්පත් කරගන්නා ලෙස සුනාමිය විසින් අපට උගන්වා ඇතැ’යි මම විශ්වාස කරමි:

- එක්සත් ජාතීන්ගේ සංවිධාන හරහා සිදු කෙරෙන පොදු භාණ්ඩ ප්‍රවාහන සේවා
- ඉහළ සවිබලගැන්වීමකින් සමන්විත, අත්දැකීම් බහුල, එක්සත් ජාතීන්ගේ මානවදයාවාදී සම්බන්ධීකාරකවරු
- එක්සත් ජාතීන්ගේ සහ යුරෝපා කොමිසමේ ස්ථාවර ආපද ප්‍රතිචාර මීට වඩා දියුණු කළ යුතුය
- එක්සත් ජාතීන්ගේ සංවිධානය ඔස්සේ අතිපුළුල් සම්බන්ධීකරණයවක් ගොඩනගනු සඳහා යුරෝපා කොමිසම විසින් යාන්ත්‍රණ නිර්මාණය කළ යුතුය
- මිලිටරි හා සිවිල් මානවදයාවාදී ශ්‍රමිකයන් අතර සහයෝගීතාවය ගොඩනැගීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ හඳුන්වා දිය යුතුය
- මානවදයාවාදී කාර්ය මණ්ඩල සඳහා දියුණු වෘත්තීය ප්‍රමිතීන් සහ යෝග්‍යතා ව්‍යුහ හඳුන්වා දිය යුතුය
- අරමුදල්දයකයින් පොදු මෙහෙයුම් අරමුණු උදෙසා එකඟත්වයකට පැමිණිය යුතුය

***ඩේවිඩ් හොරොබින් DFID සංවිධානයේ ගැටුම් හා මානවදයාවාදී කටයුතු පිලිබඳ අංශයේ මෙහෙයුම් කණ්ඩායමේ අධ්‍යක්ෂකවරයාය. විද්‍යුත් තැපෑල: D-Horobin@dfid.gov.uk මෙම ලිපිය ලියන ලද්දේ පුද්ගලික අත්දැකීම් ආශ්‍රයෙනි. එම ලිපියෙන් DFID ආයතනයේ හෝ එක්සත් රාජධානි ආණ්ඩුවේ හෝ අදහස් අවශ්‍යයෙන්ම නියෝජනය නොකෙරේ.***

1.www.dec.org.uk




*සහනාධාර සැපයුම් ගොඩබෑම, බන්ඩා අචේ, ඉන්දුනීසියාව*

# සුනාමියෙන් පසු අචේ ප්‍රාන්තයේ අභ්‍යන්තරිකව අවතැන්වූවන් වෙත පිවිසීම

ක්ලෝඩියා හඩ්ස්පෙත්

*සුනාමි ව්‍යසනයේ විපාක වශයෙන් අචේ ප්‍රාන්තයේ පදිංචි මිලියන භාගයක් හෙවත් ලක්ෂ 5ක් පළාතේ ජනගහනයෙන් සියයට 12ක්- තම රට තුළ ම අවතැන්වූවන් බවට පත් වූහ. ඔවුන් වෙත පිවිසීම මානවදයාවාදී ක්‍රියාකාරීන්ට විශාල අභියෝගයක් විය. අනාගත හදිසි අවස්ථාවන්හිදී එවැනි ජනතාවන් වෙත පිවිසුම් මාර්ග දියුණු කර ගැනීම සඳහා අචේ පලාතේ දී ලත් අත්දැකීම්වලින් වැදගත් පාඩම් උගත හැකිය.*

අවතැන්වූවන්ගෙන් බොහෝ දෙනෙක් එක්කෝ පළාත හැර ගියහ. නොඑසේ නම් සත්කාර පවුල් විසින් භාර ගනු ලැබූහ. එහෙත් සැලැකිය යුතු ප්‍රතිශතයක්, බොහෝ විට ඉතාම දිළිඳු කොටස්, තාවකාලික කඳවුරුවල ජීවත් වූහ. ඉඩක් තිබුණු මුස්ලිම් පල්ලිවලද පාසල්වල ද ක්‍රීඩාංගණවලද එළිමහන් භූමිවලද විනාශ වූ ගම්මාන අයිනේද පමණක් නොව ඉන්දුනීසියානු බලධරයන් සහ GAM බෙදුම්වාදීන් අතර ආරවුලකට පාත්‍රව තිබෙන ප්‍රදේශයෙහි උස් භූමිවලද පිහිටා ඇති කවර හෝ තැනෙක මේ තාවකාලික කඳවුරු පිහිටුවා තිබේ. ඉක්මණින්ම ප්‍රතිචාර දක්වා වැළැක්විය හැකි මරණ වැළැක්වීමට අන්තර්ජාතික ප්‍රජාව සමත් වූ අතර අචේ ප්‍රදේශයට පිවිසීමේදී මුහුණ පෑ ප්‍රධාන බාධක තුනක් විය. භෞතික බාධක, තොරතුරුමය බාධක හා “සමාජමය” බාධක ඒ තුන් වැදෑරුම් බාධකයි. වඩාත් පහසුවෙන් ළඟා වීමට හැකි ස්ථානවල සිටි අවතැන්වූවනට අවශ්‍ය හදිසි සහනාධාර සපයන අතරම මේ බාධක ජය ගැනීම අතිශයෙන්ම දුෂ්කර විය.

## පිවිසීමට තිබූ භෞතික බාධක

අවතැන්වූවන් බොහෝ දෙනකු වෙත ළඟාවීම ගැටළුසහගත බව ආරම්භයේදීම පැහැදිලි විය. පළමු කොටම සුනාමියේ දරුණුම ප්‍රචණ්ඩත්වයට ලක් වූ ප්‍රදේශය - බණ්ඩා අචේ සිට මෙවුලබෝවේ දකුණු කෙළවර දක්වා කි.මී. 200ක වෙරළබඩ භූමි ප්‍රදේශයට පිවිසීම කිසිසේත්ම නොහැකි තත්ත්වයෙක තිබිණ. එහි මාර්ගද පාලම් සිය ගණනක්ද සුනාමි සැඩපහරට ගසාගෙන ගොස් තිබිණ. ක.මී. 26ක පාලම් ධාරිතාවක් අවශ්‍යව තිබිණ. වෙරළාසන්න මුහුදෙහි අලුත් වැලි කඳු නිර්මාණයවීම හා සුන්බුන් එකතුවීම නිසා ලොකු යාත්‍රා ගොඩබෑමට නොහැකි විය. එබැවින් එහි පිවිසීමට හැකි වූයේ කුඩා බෝට්ටුවලින් සහ හෙලිකොප්ටර්වලින් පමණි. එකී තත්ත්වය යටතේ ඒ වෙරළබඩ ප්‍රදේශයේ අවතැන්වූවන් වෙත ළඟා වීමට මිල අධික සැපයුම් ආධාර සහ සැලැසුම් සකස් කිරීම සඳහා ක්ෂේත්‍ර කාර්යයන්හි මනා නිපුණත්වයක් ඇති කාර්ය මණ්ඩලයක් අවශ්‍ය විය.

අචේහි සුනාමි ව්‍යසනයට ප්‍රතිචාර දැක්වීම එක්සත් ජාතීන්, රාජ්‍ය නොවන සංවිධාන සහ යුධ හමුදා අතර මින් පෙර නොවූ විරූ මට්ටමෙක අන්තර් ක්‍රියාකාරීත්වයකට තුඩු දුන්නේය - යුධහමුදා ආධාර - හෙලිකොප්ටර් යානා, තාවකාලික වරායවල් සහ ගොඩබෑම සඳහා විශේෂයෙන් නිෂ්පාදිත මුහුදු යාත්‍රා - අතිශයෙන් ප්‍රයෝජනවත් විය. කෙසේවෙතත් යුධ හමුදා සහ මානවදයාවදී ප්‍රජාව අතර මෙන්ම යුධ හමුදා අතරම - සහන කටයුතුවල උච්ජම අවස්ථාවේදී රටවල් 15කින් පැමිණි හමුදා ඒකක එහි විය - සම්බන්ධීකරණය සඳහා වඩා දියුණු යාන්ත්‍රණ තිබුණා නම් හමුදා ආධාර වඩාත් ඵලදායක වීමටත් ඒ ආධාර ප්‍රමාණය වැඩි වීමටත් තිබිණ. සුනාමි ව්‍යසනයට ගොදුරු වූ රටවල් පුරා යුධ හමුදා ආධාර සම්බන්ධීකරණය කිරීම පිණිස ඒකාබද්ධ හමුදා කාර්ය සාධක බලකායයක් තායිලන්තයෙහි ස්ථාපනය කරනු ලැබුවද ඊට ඌන පූරණයක් වශයෙන් දේශීය හමුදා ඒකාබද්ධ කාර්ය සාධක බලකායයක් හෝ හමුදා-සිවිල් ඒකාබද්ධ ඒකකයක් (CIMIC) හෝ පිහිටුවන්නට තිබිණ.

යුධ හමුදා සම්පත් සියල්ල සම්බන්ධීකරණය කළ ඉන්දුනීසියානු හමුදාවත් තොරතුරු බෙදාහදා ගැනීමේ හා සිතියම් සැකැසීමේ කටයුතු සම්බන්ධයෙන් අන්තර්ජාතික ප්‍රජාවත් අතර සබඳතාද වර්ධනය කළ යුතුව තිබිණ. පෞද්ගලික අංශයෙන් පිරිනැමුණු ද්‍රව්‍යමය ආධාර මුල් සති කීපය තුළ ඈත ප්‍රදේශවලට ගුවනින් ප්‍රවාහණය කිරීමට යුධ හමුදා සම්පත් විශාල වශයෙන් පාවිච්චි කරනු ලැබීය. මේ කටයුතු ඉන්දියානු යුධ හමුදව විසින් සම්බන්ධීකරණය කරනු ලැබුවද වහාම දැක්වුණු මේ ප්‍රතිචාරය සහ මූලෝපායික තොරතුරු රැස් කළ හා සැලසුම් සකස් කළ මානවදයාවාදී අංශයේ සම්බන්ධීකරණ කණ්ඩායම් සමග ඔවුන්ට පැහැදිලි සබඳතාවක් තිබුණේ නැත.

තවද මුදල් ගෙවීමෙකින් තොරව ගුවන් මඟින් ප්‍රවාහණ කටයුතු කිරීමට හැකියාව තිබුණු හෙයින් සෙසු විකල්ප ප්‍රවහණ මාධ්‍ය දියුණු කිරීමක් සිදු නොවීය. දේශීය කුඩා යාත්‍රා ප්‍රයෝජනයට යොදා ගැනීමේ ක්‍රමයක් වර්ධනය කෙළේ නම් සුනාමියෙන් බරපතල ලෙසම විනාශයට පත් ජන කොටසක් වූ දේශීය ධීවර ජනතාවගේ ජීවානෝපායට විශාල පිටුවහලක් වන්නට තිබිණ. සුනාමියට පෙර අචේහි වෙරළබඩ ප්‍රදේශයෙහි මිනිසුන් හා භාණ්ඩ ප්‍රවාහණය සඳහා දේශීය බෝට්ටු සේවා ක්‍රමයක් තිබිණ. එහෙත් අන්තර්ජාතික යුධ හමුදා ඉවත් වී යාමට ආසන්න වීමත් සමඟ විකල්ප ප්‍රවාහණ ක්‍රම සෙවීමට බල කෙරෙන තෙක්ම ඒ දේශීය බෝට්ටු සේවා ක්‍රමය සොයා බැලීමට මානවදයාවාදී ප්‍රජාව උත්සුක නොවීය. දේශීය ප්‍රවාහණ පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කළා නම් දේශීය ආර්ථිකයට සහ විපතකට පත් ජනතාවන්ගේ ජීවනෝපායට පිටුවහලක් වීමටත් දේශීය ප්‍රවාහණ අංශයට නව පණක් දීමටත් සුනාමියෙන් පීඩාවට පත් ජන කොටස්වලට අතිශයෙන්ම අවශ්‍යව තිබෙන ප්‍රවාහණ පහසුකම් සැලැසීමටත් එය පිහිට වන්නට තිබිණ. ගැටුම් කලාපවල මානවදයාවාදී කටයුතු ඉටු කිරීමේදී හමුදා යාත්‍රා සහ ගුවන් යානා පාවිච්චිය සෑම කල්හිම අවසාන උපකරණය විය යුතුය.

හෙලිකොප්ටර් යානා පාවිච්චියෙන් වුවද අවතැන්වූවන් වෙත සාධාරණ ප්‍රවිෂ්ඨ වීමක් සහතික නොවීය. හෙලිකොප්ටර් ගොඩබෑම, ගැටුම් විමුක්ත කලාප ලෙසින් එකඟත්වයට පැමිණ තිබූ කලාපවලට සීමා විය. මෙහි ප්‍රතිඵලය වූයේ උස් භූමි කරා (ඒවා බොහෝ විට අනාරක්ෂිත ප්‍රදේශ විය.) ගොස් සිටි අවතැන්වූවන් වෙත ළඟා වීමට නොහැකි වීමයි. ඊටද අමතරව ආරක්ෂක නීති රීති අනුව හෙලිකොප්ටර් යානා නියමිත කාලය ඉක්මවා නතර කැර තැබීමද තහනම් විය. භාණ්ඩ සාධාරණ ලෙස බෙදා හැරීම එබැවින් ගැටලුසහගත විය. බොහෝ අවස්ථාවන්හිදී සහනාධාර හෙලිකොප්ටර් යානාවලින් බෑම සහ අවතැන්වූවන් අතර බෙදා දීම සිදු කරනු ලැබුවේ ඉන්දුනීසියානු යුධ හමුදාව විසිනි. සහනාධාර බෙදා හැරීමේ විධිමත් විධික්‍රමයක් නොතිබුණු හෙයින් හෙලිකොප්ටර් යානා ගොඩබෑමේ කලාපවලට මීටර් සියයක් හෝ දෙකක් හෝ තරම් නොදුරු ස්ථානවල නවාතැන් ගෙන සිටි අවතැන්වූවනට පවා සාධාරණ ලෙස සහනාධාර ලැබුණේ නැත. ආරක්ෂක නීති රීති කෙතරම් දැඩි වූයේද යත් එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයට බටහිර වෙරළාසන්නයේ සීමා කරන ලද ප්‍රදේශ කීපයෙක හැර අන් ස්ථානවල රැයක් ගත කිරීම පවා තහනම් විය. අචේහි මානවදයාවාදී කටයුතු අධීක්ෂණය කිරීමේ ඔවුන් සතු ධාරිතාව ඒ ආරක්ෂක තහංචි නිසා සීමා වී තිබිණි.

බටහිර වෙරළේ විනාශයත් හමුදා ප්‍රවාහණ පහසුකම් තිබීමත් අවතැන්වූවන් විශාල වශයෙන් ජීවත්වන සහ පහසුවෙන් පිවිසීමට හැකි ප්‍රදේශ වෙසෙසින්ම ඊශාන දිග වෙරළබඩ ප්‍රදේශ වෙත අවධානයට යොමු නොවූයේය. සමානුපාතික නොවන කාලයකුත් සම්පතුත් බටහිර වෙරළබඩ අවතැන්වූවන් සාපේක්ෂක වශයෙන් අඩු සංඛ්‍යාවක් වෙත ළඟා වීමට වැය වූයේය.

## පිවිසීමට තිබූ තොරතුරු බාධක

අචේහි අවතැන්වූවන් සිටින්නේ කොහේද කීදෙනකු සිටිනවාද යන්න සොයා ගැනීම පවා දුෂ්කර විය. බණ්ඩා අචේ සහ මෙවිලබෝ යන ප්‍රධාන නගරවල සහ කිලෝ මීටර සිය ගණනක් වෙරළ දිගේ ද කැලෑවලද කූඩාරම් ඉදි කරනු ලැබීය. එසේ ඉදි කැරුණු කූඩාරම් සංඛ්‍යාව 500කට අධික විය. ඒවායෙහි ජීවත්වූ පවුල් සංඛ්‍යාව ඇතැම් තැනෙක කීපයෙකි. තවත් තැනෙක සිය ගණනෙකි. සමහර පවුල් තාවකාලික මඩුවල ජීවත් වූ අතර සමහර පවුල් ඒ වන විටත් පැවැති ප්‍රජා ශාලාවල ලැගුම් ගෙන සිටියහ.

මානවදයාවාදී අවශ්‍යතා පිළිබඳ පරිපූර්ණ එකම තක්සේරුවක් හෝ මුල් දිනවලදී සිදු කැරුණේ නැත. අවතැන් වූවන් වෙසෙන ප්‍රදේශවලදී, ඒවායෙහි පිහිටීම, සංඛ්‍යාව, සාමාන්‍ය තත්ත්වය සහ සමහර පොදු

ආංශික මූලික තොරතුරු එක් රැස් කැර ගැනීම පිණිස මූලික තොරතුරු පිළිබඳ සරල පත්‍රිකාවක් සකස් කිරීමට ආරම්භක ප්‍රයත්නයක් දරනු ලැබීය. කෙසේ වෙතත්, තොරතුරු රැස් කිරීමේ, මේ උදාසීන ආකාරයෙහි අනපේක්ෂිත අනතුරු බෝහෝ විය. තොරතුරු එක් රැස් කිරීමේ, ප්‍රමුකත්වය අතින් තුන්වෙනි හෝ හතරවෙනි හෝ කාර්යයන් ලෙසින් බෝහෝවිට සැලකුපුද්ගලයන් විසින් සැපැයුණු තොරතුරු කෙරෙහි විශ්වාසය තබා ක්‍රියා කරන්නට සිදු වුවත්, ඒ තොරතුරුවලින් නියම තත්වය අනාවරණය වූයේ නැත.

ආංශික තක්සේරුකිරීම් කීපයක් ආරම්භ කරනු ලැබී ය. බටහිර වෙරළේ තත්ත්වය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම පිණිස ඇමෙරිකානු නාවික හමුදාවට අයත් *USS Lincoln* නමැති යුධ නැවේ සිට මෙහෙයැවුණු මහා පරිමාණයේ තක්සේරු කිරීමක්ද ආරම්භ කරනු ලැබී ය. එහෙත් බහු ආංශික තක්සේරුවක් සිදු වූයේ නැත. ඊටද අමතරව තොරතුරු සම්බන්ධයෙන් ද සංවේදිතා පැවැතිණ. වෙසෙසින්ම දේශපාලනමය වශයෙන් සංවේදී නැගෙනහිර වෙරළට අදාළ තොරතුරු සහ යුධ හමුදා ආධාර ඇතිව ක්‍රියාත්මක කළ ආරම්භක මෙහෙවරයන්හිදී ප්‍රවේශය අතිශයෙන් දුෂ්කරවූ බටහිර වෙරළබඩ ප්‍රදේශවලට සහනාධාර ගුවනින් හෙළීම සඳහා යොදාගත් හෙලිකොප්ටර් යානාවල සිට ඒ කටයුතු මෙහෙයැවූ මානවදයාවාදී බොහෝ ක්‍රියාකාරීන් විසින් රැස් කර ගන්නා ලද තොරතුරු තක්සේරු කිරීම සංවේදී කාර්යයෙක් විය.

තුවාල ලද කාන්තාවක් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ගෙන එයි, බන්ඩා අචේ, ඉන්දුනීසියාව

ඒ නිසා ප්‍රශ්නය වන්නේ තොරතුරු හිඟතාව නොව පලාත පුරා ජනයා මුහුණ දුන් තත්ත්වයන් පිළිබඳ සවිස්තරාත්මක, විවිධ අංශවලට අදාළ තොරතුරුවල හිඟකමය. විවිධ තරාතිරමේ තක්සේරු වාර්තා මානවදයාවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයේ මානවදයාවාදී තොරතුරු මධ්‍යස්ථානය[1] වෙත කාන්නු වූ අතර පාවිච්චියට සුදුසු ආකාරයකට ගොනුකොට ඒවා විවිධ සංවිධාන වෙත නිකුත් කිරීමට ඒ කාර්යාලය හැකි ඉහලම අයුරින් කටයුතු කළේය. එහෙත් අර්බුදය ඇතිවී සති කිහිපයක් යනතුරුත් තම රට තුළම අවතැන්වූවන් සිටින ස්ථාන, ඔවුන්ගේ තත්ත්වය හා ඔවුන්ගේ අවශ්‍යතා ආදී වශයෙන් සම්පූර්ණ චිත්‍රයක් ආධාර ආයතන වෙත ලැබෙන්නට පටන් ගත්තේ නැත. කෙසේවුවද, හරියාකාර තොරතුරු නැතිකම පසෙක දමා පැවැති තොරතුරු අනුව ක්ෂණික ප්‍රතිචාර දක්වමින් සරම්ප හා කොලරා ආදියෙන් ඇති විය හැකි හදිසි මරණ වළක්වාගන්නට යුනිසෙෆ් හා අනෙකුත් නියෝජිතායතන කටයුතු කළේය.

## පිවිසීමට තිබූ සමාජ බාධක

අවතැන්වූවන්ගෙන් විශාල පිරිසක් සත්කාරක පවුල්වල සරණ පැතූ අතර ඔවුන් දර්ශකය නොවීම ඔවුන් වෙත ළඟාවීම සඳහා අභියෝග යක් විය. මේ අයගෙන් බහුතර කොටසකට ඍජු හදිසි ආධාර අවශ්‍ය නුවුවද ළමයින් යළි පාසල් යැවීම, මානසික සහාය, සහ අවතැන්වූ ළමයින් හා නෑදෑයින් නැවත එකතු කිරීම සඳහා එකිනෙකා සොයාගැනීමේ වැඩසටහන් ආදි උදවි ඔවුනට අවශ්‍ය විය. ඒ පමණක් නොව කල්යාමේදී සත්කාරක පවුල් බොහොමයකටම සරණාගතයන් අතිරේක බරක් බවට පත්විය.


UNICEF/HQ050143/Jim Holmes

අන්තර්ජාතික ප්‍රජාව මේ ජනතාව වෙත ළඟාවීමේ යම් ප්‍රගතියක් අත්කර ගත් නමුදු ඉන්දුනීසියානු ආණ්ඩුව අවතැන්වූවන් රැඳී සිටින සත්කාරක පවුල්වලට මුදල් ආධාර සැපයීම මගින් අලුත් විසැඳුමක් සපයමින් ප්‍රධානත්වය ගත්තේය. මුදල් ආධාර සපයන ලද්දේ පුද්ගල සංඛ්‍යාව පාදක කර ගෙන වන අතර අවතැන්වූවන් ප්‍රාදේශීය මානවදයාවාදී ප්‍රජා මධ්‍යස්ථානයේ ලියාපදිංචි විය යුතු විය. මෙසේ මේ සඳහා ලියාපදිංචි වීමෙන් ඔවුනට අනිත් ආධාර වැඩසටහන්වල උදවි ලැබීම සඳහා ද එය උපයෝගී විය. එය ප්‍රශ්නයේ මට්ටම පිළිබඳ තොරතුරු එකතුකර ගැනීමටද හැකි මඟක් වූ අතර අවතැන්වූ දහස් සංඛ්‍යාත පුද්ගලයන් හා පවුල් වෙත සහන සැලැසීම සඳහා ප්‍රජා දායකත්වය දිරිගැන්වීමට ද එය ප්‍රයෝජනවත් විය. අන්තිමේදී ඍජුව ම ආධාරදීමේ ප්‍රයෝජනවත් යාන්ත්‍රණයක් ද පලාතේ ආර්ථිකයට ඉතා වැදගත් මුදල් ගලා ඒම ද යන කාරණා දෙකම මේ වැඩසටහනින් සැපැයින.

හුදකලා වුණු හා දෙමාපියන්ගෙන් වෙන්වූ දරුවන් වෙත ළඟා වන්නේ කෙසේද යන සුවිශේෂී ප්‍රශ්නය යුනිසෙෆ් ආයතනයට ඇති විය. අචේ ප්‍රාන්තයේ යුනිසෙෆ් ආයතනය කළයුතු වූ මෙහෙවර අතර ප්‍රධාන එකක් වූයේ හුදෙකලා වූ හා දෙමාපියන්ගෙන් වෙන් වුණු ළමයින් ලියාපදිංචි කිරීම, ඔවුන්ගේ දෙමාපියන් සොයා ගැනීම හා හැකි හැම විටම පවුල් යළි එකට එකතු කිරීමය. එහෙත් මේ කාණ්ඩායම ළඟාවීමට සුවිශේෂී වශයෙන් අපහසු පිරිසක් වූයේ දෙමාපියන්ගෙන් වෙන් වුණු දරුවන්ගෙන් බහුතරයක් වෙනත් පවුල් විසින් හදාවඩා ගැනීමට ගෙන තුබුණු හෙයිනි. අනෙකුත් හදිසි කරුණු සමග සසඳන විට අවතැන්වූ දරුවන් දක්නට නැති තරම් විය. අන් කුමන වයස්වල අයටත් වඩා ඛේදජනක සංඛ්‍යාවක් සුනාමියෙන් මිය ගියේ දරුවන් වන අතර ඉතිරිව ඇති කුමන හෝ ළමයින් තම පවුල්වලට එකතු කර ගැනීමට තිබුණේ බලවත් වුවමනාවකි. ඥාතීන් තුළ නොසනුසුන් බවත් තුබූ අතර දරුවන් හඳුන්වාදීමට ද මැලිකමක් දැක්වූයේ ඔවුන් තමන් වෙතින් ඉවත් කර ගෙන යනු ඇතැ'යි බිය වූ හෙයිනි. දරුකමට හදා වඩා ගැනීම වැදගත් ආධාර යාන්ත්‍රණයක් ලෙස යුනිසෙෆ් සංවිධානය විසින් සලකනු ලබන අතරම පවුල් යළි එකට එකතු කිරීමට ඇති අවස්ථා ඉහල නැංවීම සඳහාත්, කැපකරු හෙවත් සත්කාරක පවුල්වලට මේ දරුවන් නිසා දැරීමට සිදුව ඇති අතිරේක බර සැහැල්ලු කැරෙන වැඩ සටහන්වලට සම්බන්ධවීම සඳහාත් ඔවුන් ලියාපදිංචි කිරීම අතිශයින් වැදගත්ය.

දේශීය රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් ඇති කරමින් යුනිසෙෆ් සංවිධානය ප්‍රදේශයේ ජනතාව සමග සම්බන්ධතා හා උපදේශන සඳහා වන ප්‍රබල ව්‍යාපාරයක් ගෙන ගියේය. ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් යටතේ ළමයින්ගේ සතුට ඇති කරන ඉඩකඩ සහිත ස්ථාන හා ලියාපදිංචි කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩසටහන් සඳහා ප්‍රාදේශීය නියෝජිතායතනවලට යුනිසෙෆ් සහාය දුන්නේය. දේශීය රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජාව විසින් වඩාත් පිලිගනු ලැබෙන හා විශ්වාස කැරෙන අතර ප්‍රජා ආකෘතියට හා ප්‍රාදේශීය දැනීම වෙත සමීපවීම වෙනුවෙන් ඔවුන් සමග කඳවුරු තුළ ඒකාබද්ධ වීමටද ඒ සංවිධාන කැමැතිය. මේ සාර්ථකත්වය එසේවුවද, කඳවුරු තුළ ඒකාබද්ධවීමට ද ඒ සංවිධාන කැමැතිය. මේ සාර්ථකත්වය එසේවවුවද, කඳවුරු තුළ යළි අලුත් වූ ප්‍රජා ආකෘතීන් සමඟ ඍජුව වැඩ කිරීමෙන් හා හඳුනාගැනීම් ඇති කර ගැනීම මගින් හා ප්‍රාදේශීය මුස්ලිම් පල්ලි ද ඇතුළුව ආගමික ආයතන ජාලයන් සමග සහයෝගීතාව ගොඩනඟා ගැනීම මගින් ද වේලාසනින්ම ළමයින් වැඩි පිරිසක් වෙත ළඟා වන්නට ඉඩ තිබිණි.

## ඉගෙනගත් පාඩම්

අනාගත හදිසි අවස්ථාවක ක්‍රියා කිරීමට ඇති බාධක ජය ගත හැකි මාර්ග අචේ ප්‍රාන්ත අත්දැකීම් මගින් යෝජනා කැරේ. භෞතිකමය බාධක සම්බන්ධයෙන් ප්‍රධාන පාඩම් හතරක් පෙනේ.

1. ඵලදායි ප්‍රතිචාරයක් සඳහා හමුදා දේපළ යොදා ගැනීම තීරණාත්මක වන අතරම ප්‍රාදේශීය ප්‍රවාහන සම්පත් උපයෝගීකර ගැනීමට හා ඒවා ශක්තිමත් කිරීමට

ප්‍රයත්න දැරිය යුතුය. මේ මගින් ප්‍රදේශයේ ජනතාවගේ දැනුම මත යන්ත්‍රෝපකරණ සහාය වර්ධනය කිරීමටත්, හමුදා සීමාබන්ධන ඉක්මවා යමින් ජනාවාස නැවත ගොඩනැගීමටත් හැකි වේ.

2. හැකි හැමවිටම රතු කුරුස / රතු සඳ හෝ අන් හෝ පවත්නා ප්‍රජා ආකෘතීන් යොදා ගනිමින් හැකි ඉක්මණින් බෙදාහැරීම් පද්ධතියක් ප්‍රාදේශියව ස්ථාපිත කළ යුතුය. සහනාධාර අන් මගකට යාමට ඇති ඉඩකඩ සීමා කරන අතරම පිළිගත් මානවදයාවාදී ප්‍රතිපත්ති අනුව ඒවා සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කිරීමට මෙය උදව් වනු ඇත.

3. උපායික තොරතුරු සහ මානවදයාවාදී අවශ්‍යතා මත පදනම්වෙමින් සියළුම අභ්‍යන්තරිකව අවතැන්වූවන් හට සැළකිලි හා ආධාර එක හා සමානව ලබාදිය යුතුය.

4. විනාශ වූ යටිතල පහසුකම් නැවත ඉදිකිරීමේදී තීරණාත්මක ඉදිකිරීම් ස්වාභාවික බලවේගවල ප්‍රහාර අවම විය හැකි ප්‍රදේශවල සිදුකිරීමට උත්සාහ කළ යුතුය.

තොරතුරු ලබා ගැනීමට ඇති බාධා පිළිබඳ අත්දැකීම් ද පාඩම් ගණනාවක් ඉදිරිපත් කරයි:

- පෙර නුවූවිරූ තරමේ දේශීය හා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාවක් (යුනිසෙෆ් සමග සම්බන්ධ ආයතන 400ක් පමණ තිබිණ) පැවැති හදිසි අවස්ථාවේ එක්සත් ජාතීන්ගේ මානුෂික තොරතුරු මධ්‍යස්ථානය තොරතුරු ගොනු කිරීම, විශ්ලේෂණය කිරීම හා බෙදා හැරීම පිළිබඳව තීරණාත්මක විය: මානවදයාවාදී තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම හදිසි අවස්ථාවකදී හැම විටම ප්‍රමුඛතාවන්ගෙන් එකක් විය යුතුය.
- සමහර අඩුපාඩු තිබුණද විවිධ අංශවල ක්‍රියාකාරී කණ්ඩායම් ඔස්සේ තොරතුරු හුවමාරු කර ගැනීම සාමාන්‍යයෙන් යහපත් විය.
- මානවදයාවාදී කටයුතු සම්බන්ධීකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය මගින් ලබාදී තිබුණු "ග්ලෝබල් පොසිෂනින් සිස්ටම්" හෙවත් තමන් සිටින තැන දැක ගත හැකි අතේ ගෙන යන උපකරණය ඈත පෙදෙස්වල පහසුවෙන් දැක ගත නොහැකි අවතැන්වූවන් සිටින ස්ථාන සලකුණුකර ගැනීමටත් පසුව ඔවුන් වෙත අවතීර්ණ වීමටත් බෙහෙවින් තීරණාත්මක විය. මේ උපකරණ අනාගත හදිසි  අවස්ථාවලදිත් ලබාදීමට මානවදයාවාදී කටයුතු සම්බන්ධකරණ කාර්යාලය සහතික විය යුතුය.
- අචේ වෙත ඇදී ආ බොහෝ ස්වෙච්ඡා සේවකයෝ තොරතුරු එක් රැස්කිරිමට සිය ඇස් හා කණ් ඉතා තීරණාත්මක ලෙස භාවිතා කළහ. මේ සාම්ප්‍රදායි නොවන ප්‍රවෘත්ති ලබා ගැනීමේ ක්‍රමය හැකිතාත් ප්‍රයෝජනයට ගන්නා අතරම ඒ සඳහා ආධාර අනුබන ද දිය යුතුය.
- තක්සේරු කිරීම් සඳහා නියමානුකුල ක්‍රම යොදා ගැනීමෙන් වැළැකිය යුතුය: ප්‍රතිචාර දැක්වීම සඳහා මූලික පදනමක් ගොඩනගා ගනු පිණිස මුල් දින කිහිපය ඇතුළත හැකි හැම විටම විවිධ නියෝජිතායතන හා විවිධ අංශවල එකාබද්ධ මානවදයාවාදී තක්සේරුකිරීම්වලට ප්‍රමුඛත්වය දිය යුතුය.
- මානවදයාවාදී අරමුණු වෙනුවෙන් හමුදා සම්පත් පාවිච්චි කරන විට, මානවදයාවාදී තත්ත්වන් පිළිබඳ හමුදාව සතු වැදගත් තොරතුරු බලා ගැනීම සහතික කිරීම පිණිසත්, තක්සේරු කටයුතු වෙනුවෙන් හමුදාවේ සම්පත් උපයෝගි කර ගැනීමට හැකි වනු පිණිසත් මුල් දින කිහිපය ඇතුළතදීම සිවිල්-හමුදා සම්බන්ධීකරණ මධ්‍යස්ථානයන් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍යය.

කෙසේවෙතත්, සමහර විට වඩා වැදගත් ලෙස අචේ ප්‍රතිචාරයන් පැහැදිලි කළේ ආධාර කණ්ඩායම් එහි සිටීම අන් කිසිවකින් පිරිමැසිය නොහැකි බවයි. හැකි ඉක්මණින් ක්ෂේත්‍ර කාර්යාල වඩාත් තිර බැහැර පෙදෙස්වල පිහිටුවා පළපුරුදු කාර්ය මණ්ඩල පත් කිරීමෙන් ප්‍රතිචාරවල දැවැන්ත ගුණාත්මක වෙනසක් ඇති කළ හැකිය.

නිසි වේලාවට සාධාරණ ලෙස මානවදයාවාදී ආධාර ලබාදීම සහතික කිරීමේ මානුෂිය ප්‍රජාවේ උත්සාහයේ දී අවතැන්වූවන් සම්බන්ධ හදිසි අවස්ථා වැඩි වැඩියෙන් ඇති වන විට සහ හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම් වඩාත් වෘත්තිමය වන විට අපගේ සාමුහික අත්දැකීම් වර්ධනය වේ. මේ අත්දැකීම් ඔස්සේ යමින් ඉගෙන ගත් පාඩම්ද සම්බන්ධකර ගනිමින් අනාගත අර්බුදවලට අපගේ ප්‍රතිචාර වඩාත් ශක්තිමත් කර ගත හැකිය.

***ක්ලෝඩියා හඩ්ස්පෙත් (වෛද්‍ය වෘත්තිකයකු මෙන්ම සරණාගත අධ්‍යයන මධ්‍යස්ථානයේ උපාධිධාරී) යුනිසෙෆ් හදිසි මෙහෙයුම් ආයතනයේ හදිසි අවස්ථා පිළිබඳ ප්‍රතිචාර කණ්ඩායමේ සම්බන්ධීකරණ නිලධාරිනියකි. ව්‍යසනයෙන් පසු තුන් මසක කාලයක් ඇය නියෝජිතායතනයේ අචේ උප කාර්යාලයේ ප්‍රධානියා වූවාය. විද්‍යුත් තැපෑල: chudspeth@unicef.org මේ ලිපිය ඇය පෞද්ගලික මට්ටමෙන් ලියන ලද්දක් මිස යුනිසෙෆ් අදහස් පිළිබිඹු කරන්නක් නොවේ.***

1. www.humanitarianinfo.org/sumatra

*UNICEF සංවිධානයේ සහාය ලබන ළමා මධ්‍යස්ථානයක් අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ කඳවුරකි බන්ඩා අචේ, ඉන්දුනීසියාව*



# බැරැක්කතුලට සීමාවූ අචේ ප්‍රාන්තයේ අභ්‍යන්තරික අවතැන්වූවෝ

ලූක්මන් අගේ

*සුනාමියෙන් පසු අචේ ප්‍රාන්තය ජාත්‍යන්තර ප්‍රජාවට විවෘත වීමත් සමගම අචේ ජාතිකයන් හට ජීවිතය පිළිබඳ යම්කිසි බලාපොරොත්තුවක් තබා ගැනීමට පුළුවන් විය. එසේවුවත් පුනරුත්ථාපන සහ නැවත ඉදිකිරීම් පිළිබඳ සැලසුම් ක්‍රියාත්මකවත් ම දේශීය අවශ්‍යතා සම්බන්ධයෙන් රජය විසින් දක්වන අසංවේදීතාවය නිසා සාමය සහ සංවර්ධනය පිළිබඳ බලාපොරොත්තු බිඳ වැටෙමින් පවතී.*

ව්‍යසනයට පෙර නිදහස් අචේ ව්‍යාපාරයට (GAM) එරෙහිව ඉන්දුනීසියානු හමුදාව විසින් දියත් කර තිබූ ගරිල්ලා විරෝධී මෙහෙයුම් නිසා බොහෝ අචේවාසීන් ජීවත්වූයේ අසීරු තත්ත්වයන් මධ්‍යයේය. සරණාගතයින් නැවත පදිංචිකිරීමේ *(relokasi pengungsi)* රජයේ වැඩසටහන විසින් ද සාමාන්‍ය තත්ත්වයකට නැවත පරිවර්තනය වීමට සහ ධරණීය ජීවනෝපායයන් ගොඩනගා ගැනීමට ඔවුන් තිබූ බලාපොරොත්තු සුන් කර ඇත. මේ ඉහල සිට පහලට ක්‍රියාත්මක වන සැලසුමෙන් අභ්‍යන්තරිකව අවතැන්වූවන් ක්ෂණික කඳවුරුවලින් පිටතට ගෙන තාවකාලික බැරැක්ක වෙත යොමු කෙරේ. නමුත් කළ යුතුව තිබුනේ සුනාමියෙන් අවතැන්වූවන් ඉල්ලා සිටි පරිදි පුනරුත්ථාපනය සහ ස්ථිර නිවාස ඉදිකිරීම සඳහා අවධානය යොමු කිරීමයි.

ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව සාදා ඇතැ'යි කියන මෙම මීටර් 30 දිගැති බැරැක්ක විදුලිය සහ ජල සැපයුමෙන් සමන්විතය. මෙම සෑම බැරැක්කයක්ම පවුල් සඳහා වර්ග මීටර් 10 බැගින් සැපයිය ඇති කාමර දොළහකින්ද පොදු කුස්සියකින්ද නානකාමර දෙකකින්ද රැස්වීම් පැවැත්වීමට වැදුම් පිදුම් කිරීමට පාඨමාලා පැවැත්වීමට සදුසු ශාලාවකින්ද සමන්විතය. රජය විසින් අභ්‍යන්තරික අවතැන්වූවන් 140,000ක් මෙම බැරැක්කවලින් ඉවත් කිරීමටත් ඔවුන් සැමකෙනෙකුටම රුපියා 90,000 (ඩොලර් 9) ප්‍රධානයක් දීමටත් කටයුතු සැලසුම් කර ඇත. මෙම බැරැක්කවල ජීවත්වන පුද්ගලයන්හට ආහාර සඳහා වැඩකිරීමේ ව්‍යාපෘතිවල වැඩකිරීම හැරුණු විට වෙනත් ජීවත්වීමේ ක්‍රමයක් නැති නිසා මොවුන් රජය මත මුළුමනින්ම යැපෙන්නට පටන් ගෙන ඇත.

අභ්‍යන්තරික අවතැන්වූවන්ට ස්වොත්සාහයෙන් නැවත තම ගෙවල් දොරවල් ගොඩනගා ගැනීමට හෝ බද්දට ලබාගැනීමට ශක්තියක් නොමැතිවීම නිසා ඔවුනට මෙම රජයෙන් ක්‍රියාත්මක කරන නැවත පදිංචිකිරීමේ සැලැස්මවලට *(relokasi pengungsi)* අවනතවන්නට සිදුවිය. මෙම නැවත පදිංචිකිරීමේ සැලැස්මට ජාත්‍යන්තර මානව සුභසාධන සංවිධානවල සහයෝගය ලැබුනද එයින් අවතැන්වූවන් හට සහනයක් වන්නේ නැත. ඉන්දුනීසියානු ආණ්ඩුවත් එක්සත් ජාතීන්ගේ සංගමයත් රාජ්‍ය නොවන සංවිධාන රාශියකුත් මෙම නැවත පදිංචිකිරීමේ ප්‍රදේශ පිළිබඳ සීග්‍ර තක්සේරු කිරීමට එකරාශි වූ අතර ආණ්ඩුවේ ස්වභාවික ආපදා සහ සහනාධාර සඳහා වන ජාතික සම්බන්ධීකරණ ඒජන්සියත් (Bakornas) මානවදයාවාදී කටයුතු සම්බන්ධීකරණය කිරීමේ එක්සත් ජාතීන්ගේ කාර්යාලයත් (OCHA) ඒකාබද්ධ වෙමින් නැවත පදිංචිකරවීමේ සම්බන්ධීකරණ ඒකකය[1] සම්බන්ධීකරණය කරන ලදි.

විචාරකයන් පවසන්නේ අචේ ප්‍රාන්තය තුල සිදුකරන මෙම නැවත පදිංචිකිරීම් 1980 දී දියත් කල පාර සංක්‍රමණික ව්‍යාපෘති සහ යුද නීතිය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව 2003 මැයිවල අචේ ගම්වැසියන් බලහත්කාරයෙන් නැවත පදිංචිකිරීම් වැනි ව්‍යාපාරවල ලක්ෂණ බොහෝදුරට දක්නට ලැබෙන බවයි. අචේවල ගැටුම් නිසා අවතැන්වූ වැසියන් කඳවුරු තුළ තබාගැනීමත් සමහර අවස්ථාවලදී ඔවුන්ගේ ගමන් බිමන් යෑමේ අයිතිය සීමාකිරීමත් එලෙසම ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීමත් සම්බන්ධයෙන් පළවූ ඉන්දුනීසියානු හමුදා වාර්තා කෙරෙහි Human Rights Watch නම් මානව අයිතිය පිළිබඳ කටයුතු කරන සංවිධානය විසින් යොමු කර ඇත. සමාජ සුබසාධනය පිළිබඳ අමාත්‍යවරයා පවසන්නේ හමුදා අනුමැතිය ලැබුණු පසු මෙම බැරැක්ක තෝරාගෙන ඇති බවයි. මෙම බැරැක්ක තුළ හා පිටත ගමන් බිමන් යෑමේ අයිතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව අන් අයට කිසි දැනුමක් නැත. බැරැක්ක වටේට කටුකම්බි වැටවල් නැතිවූවත් නිදහස් අචේ ව්‍යාපාරය සමග සරණාගතයින් සම්බන්ධකම් පැවැත්වීම නැවත්වීම සඳහා මුර සංචාර කිරීමට ඉඩ ඇත.

## බැරැක්කවල සිටින්නන්ගේ අස්ථිර අනාගතය

අවුරුදු දෙකක් වැනි දීර්ඝ කාලයක් තුළ මෙම බැරැක්කවල බලහත්කාරයෙන් පුද්ගලයන් ජීවත් කරවීමෙන් වන මානසික බලපෑම පිළිබඳ ඇගැයීමක් කිරීමට කිසි උත්සාහයක් ගෙන නොමැත. විශාල කණ්ඩායමක් ලෙස ජීවත්වීම අචේවල දුර්ලභ දර්ශනයකි. කුඩා මුස්ලිම් පල්ලියක් කේන්ද්‍රකොට කුඩා කණ්ඩායම් ලෙස ජීවත්වීමට ඔවුන් කැමතිය. ග්‍රාමීය ප්‍රදේශවල මෙම කුඩා මුස්ලිම් පල්ලි *(meunasah)* ප්‍රජාව පිළිබඳ එහි සාමාජිකත්වය පිළිබඳ හැඟීම් ඇති කරන අතර එය යාඥා කිරීමට රැස්වීම් පැවැත්වීමට සහ සුහද සාකච්ජා පැවැත්වීමට කේන්ද්‍රීය ස්ථානයක් වේ. අචේවල තිබෙන බොහෝ ගම්මාන මේ කුඩා මුස්ලිම් පල්ලිවල නම්වලින්ම හැඳින්වේ. උදාහරණයක් ලෙස Meunasah Jiem, Meunasah Tuha සහ Meunasah Blang දැක්විය හැක. කෙනෙකු යම් කුඩා මුස්ලිම් පල්ලියක සාමාජිකයෙකු වන්නේ නම් ඔහු එකිනෙකා රැකබලා ගැනීම සහ පිටස්තරින් එන උවදුරුවල දී ආරක්ෂා සැපයීම වගකීමක් ලෙස බාරගත යුතුවේ. මේනිසා බොහෝ ග්‍රාමීය අචේ පදිංචිකරුවන්ට අමුත්තන් සමග බැරැක්කවල ජීවත්වීම ඉතා අභියෝගකාරී කටයුත්තක් වී තිබේ. මෙම බැරැක්ක තුළ පෞද්ගලිකත්වයකට අවස්ථාවක් නැති නිසා වාදවිවාද සහ ලිංගික අතවර ඇතිවීමට බොහෝදුරට ඉඩ ඇත.

සුනාමියනේ ජීවිතලවාගත් පුද්ගලයෝ තම ගම්වලින් ඉවත්වී නැවත පදිංචිය සඳහා වෙනත් ස්ථානයකට යෑමෙන් තමන්ගේ ඉඩම් කඩම් අහිමි වේය යන බියෙන් පෙළෙති. බොහෝ දෙනාගේ ඉඩම්වල මායිම් පිළිබඳ විස්තර ඇති නෛතික සහතික මුහුදට ගසාගෙන යෑමෙන් නැතිවී ඇත. විටින් විට තම ඉඩම්වලට නොගියහොත් වෙනත් අය විසින් එවා බලහත්කාරයෙන් අයිතිකර ගනී යන බියෙන් බොහෝ ගම්වැසියෝ පෙළෙති.

ඉන්දුනීසියාව තුළ දූෂණ සහ අක්‍රමිකතා මුල් බැසගෙන ඇත. ආහාර සහ භෞතික ආධාර දෙන බවට පොරොන්දු වී තිබුනද ඒවා එලෙස සිදුනොවන හෙයින් අභ්‍යන්තරිකව අවතැන්වූවෝ කනස්සල්ලට පත් වී සිටිති. රුපියා 150,000 මාසික දීමනාවක් දෙන බවට පොරොන්දු වූවත් දැන් ඒ වෙනුවට එම අගයටම වටිනා භාණ්ඩ ලබාගන්නා මෙන් අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට බල කරන බවට වාර්තා ඇත. බැරැක්ක කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී විවෘත ටෙන්ඩර් ප්‍රතිපත්තියක් අනුගමනය කර නොමැති අතර සමහර අවස්ථාවලදී නොපැවති බැරැක්ක සඳහා මූල්‍ය ප්‍රතිපාදන ද ලබාගෙන තිබේ. දූෂණ විරෝධී රාජ්‍ය නොවන සංවිධාන සහ අචේ සඳහා දූෂණයෙන් තොර සාමය (Aceh Damai Tanpa Korupsi – ADTK) නම් සංවිධානය පෙන්වා දෙන්නේ බැරැක්ක කීපයක්ම සැලසුම් කළ ද ඒවා ප්‍රමාණයට වඩා කුඩා බවත් ඒවා අවකාශය පිළිබඳ අවම ප්‍රමිතියකට වඩා අඩු බවත්ය.

අභ්‍යන්තරිකව අවතැන්වූ ප්‍රජාවන් සුනාමියෙන් දිවි ගලවාගත් අය ලෙස නොව අසරණවූවන් ලෙස සිතා දිගින් දිගටම ආධාර බලාපොරොත්තු වුවහොත් ඔවුන් බැරැක්කවලම දිගටම නැවත පදිංචි කරවනු ඇත. මෙය සුනාමි ව්‍යසනයට පසුව අචේ පලාත ප්‍රතිසංවර්ධනය කිරීමට බොහෝ අචේවරුන්ට ඇති අපේක්ෂාවට පටහැනි වන අතර එය අවාසනාවකි. මානවදයාවාදී සහ නැවත ගොඩනැගීම ක්‍රියාවලිය වෙත දක්වන ආකල්ප ගැන පුළුල් සමීක්ෂණයක් සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය සහ USAID ආයතනය ආරම්භ කර තිබේ.[3] එම සමීක්ෂණය මගින් අනාවරණය වූ ප්‍රධාන කරුණ නම් සුනාමි ව්‍යසනයෙන් බලපෑම් ලැබූ වැඩිදෙනෙකුගේ ප්‍රධාන කැමැත්ත වන්නේ තමන්ගේ නිවාසවලට ආපසු පදිංචියට යෑමටත් නැවතත් තමන් කලින් කල රැකියාව පටන් ගැනීමටත් ඔවුන්ගේ ප්‍රජාවන් ප්‍රතිස්ථාපනය කිරීමටත්ය. ඉඩම් සහ දේපල පිළිබඳ නඩු හබ සම්බන්ධයෙන් හොඳ දැනීමක් පෙන්නුම් කරමින් අභ්‍යන්තරික අවතැන්වූවන් පවසන්නේ ඔවුන් ස්ථිර නැවත පදිංචියකට කැමැති වන්නේ තමන් පදිංචි වන ඉඩමේ සහ

නිවාසයේ නෛතික අයිතියක් තමන්හට ලබා දෙනවානම් පමණි යන්නයි. බොහෝ අවතැන්වූවන් තමන් කලින් විසූ ගම්වලට සමීප ස්ථානවල නැවත ස්ථිර හෝ තාවකාලිකව නව පදිංචියට කැමත්ත පළ කළෝය. ඔවුහු බැරැක්කවල ජීවත්වීමට තදින්ම අකමැත්ත පළ කළහ. ස්වශක්තියෙන් කටයුතු කරන අය වශයෙන් අචේවරුන් බොහෝ සුප්‍රසිද්ධය. ප්‍රතිචාරකයන් වැඩි දෙනෙකු පැවසුවේ තමන් හට ලබාගැනීමට අවශ්‍ය වන්නේ සිමෙන්ති සහ ලී වැනි ගොඩනැගීමට සුදුසු ද්‍රව්‍ය බවයි. මොවුන් වැඩි වශයෙන් තම ජීවනෝපාය සඳහා උදව් ඉල්ලූම් කළ අතර සම්මුඛ සාකච්ඡාවලට සහභාගීවුවන්ගෙන් 4% ක්ම පැවසුවේ ඔවුන් හට කිසිම ආකාරයක ආධාරයක් තම

*නැවත වෙනත් ස්ථානවල පදිංචිකිරීමේ සැලසුම් වලට පවුල් තදබල විරෝධය පෑහ.*

ජීවනෝපාය නැවත කරගෙන යාම සඳහා නොලැබුණු බවයි.

පාරම්පරිකව ධීවර කර්මාන්තයේ නියැලී සිටි පවුල් මෙම නව පදිංචිකිරීමේ වැඩපිළිවෙලට තදින් විරුද්ධත්වය දැක්වූ අතර ඔවුන් තම ගම්වලින් ඉවත් වීමට අකමැති විය. ධීවර ප්‍රජාවේ නියොජිතයෝ අනෙක් අයත් සමග එකතුවී ප්‍රසිද්ධ රැස්වීම්වලදී තම ඉඩම්වලින් ඉවත් වීමට කිසිසේත් අකමැති බව ප්‍රකාශ කලහ. රාජ්‍ය නියෝග මෙතෙක් ඉතා යටහත් පහත්ව පිලිගත් සමාජයක මෙවැනි විරෝධතා මීට පෙර නොවූ විරූ විය. නමුත් මෙතෙක් තම ගම්වලින් ඉවත් නොවන අයට කිසිම ආධාරයක් නොදෙන බවට තදින් ප්‍රකාශ කර සිටින රජය සහ යුද හමුදාව ඉදිරියේ මෙලෙස දිගින් දිගටම විරෝධය දැක්වීමත් එතරම් ලෙහෙසි වන්නේ නැත.

ආණ්ඩුවේ ප්‍රතිපත්තිය උඩ සිට පහලට ක්‍රියාත්මක වන සහ ඉලක්ක කේන්ද්‍ර කරගත් එමෙන් සහභාගිත්වයක් නොමැති එකකි. මෙම නැවත පදිංචිකිරීමේ වැඩසටහන් භාරව සිටින අය පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය:

- බැරැක්ක ස්ථාපිත කිරීමේදී ඒවා බොහෝදුරට මුල් ගම්මානවලට සමීපව සහ රැකියා අවස්ථාවලට පහසු වන පරිදි කිරීම
- බරැක්ක ගොඩනැගීමේදී සහ කලමනාකරණයේදී වඩා විවෘත ක්‍රියා පිළිවෙත් අනුගමනය කිරීම
- හැකිතාත් ඉක්මණින් අවතැන්වූවන් තම මුල් ගම්මානවලට යෑමට තිබෙන කැමැත්ත සාධාරණ අවශ්‍යතාවක් ලෙස සැලකීම.
- අභ්‍යන්තරිකව අවතැන්වූවන් නැවත පදිංචිකිරීමෙහිලා නියාමක ප්‍රතිපත්තිය වන්නේ අවතැන්වූවන් පූර්ණ ලෙස අවබෝධයකින් යුතුව නැවත පදිංචිය සඳහා කැමැත්ත පළ කිරීමෙන් අනතුරුව එය පිළිගැනීම.
- පවතින සමාජ ඒකකවල ඒකාග්‍රතාවය සුරැකීමට වැඩි වැඩියෙන් කටයුතු කිරීම.
- මූලික සේවාවන් සහ යටිතල සාමාන්‍ය තත්ත්වයට පත්කිරීමේදී සහ නැවත තම ගෙවල් දොරවල් කරා යෑමට පහසුකම් සැපයීමේදීත් ප්‍රසිද්ධ කරන ලද යම් කිසි සැලැස්මකට අනුව එය කිරීම.
- සුනාමියෙන් පවුල් ව්‍යුහ තුළ ඇති කර තිබෙන වෙනස්කම් සැලකිල්ලට ගන්නාවූ පුළුල් ජීවනෝපාය ආධාර කටයුතුවලට සහයෝගය දැක්වීම.
- අනාගත ස්වභාවික ආපදා පිළිබඳ දැනගැනීමට පුද්ගලයින් තුළ ඇති උනන්දුව සඳහා පුළුල් තොරතුරු සහ අධ්‍යාපන සේවා ලබාදීම, ප්‍රදේශයට සුවිශෙෂී ව්‍යසන සඳහා සූදානම් වීමේදී සහ කලමනාකරණය සඳහා ක්‍රමෝපායික සැලසුම් සම්පාදනය කිරීමේදී නැවත පදිංචිකරන ලද ප්‍රජාවන් සහභාගි කර ගත යුතුය.

***ලුක්මන් අගේ පෙනැන්ග් හි පිහිටි සේන්ස් මැලේසියා සරසවියේ (www.seacsn.net/regional) පර්යේෂණ සහ අධ්‍යාපන ඒකකයේ අචේ වැඩසටහනේ සම්බන්ධීකාරකවරයාය. ඔහු බන්ඩා අචේ ප්‍රදේශයේ පිහිටි අචේ ආයතනයේ පර්යේෂකයෙකුද වේ: www.acehinstitute.org විද්‍යුත් තැපැල: zitkalasa2000@yahoo.com***

1.www.humanitarianinfo.org/sumatra/assessments/doc/GoI_UN-joint_assessment_report_on_relocation_sites.doc
2.http://hrw.org/english/docs/2005/02/07/indone10134.htm
3 .www.iom.int/tsunami/documents/indonesia_needs_assessment.pdf

බන්ඩා අචේ



Fritz Institute

# ප්‍රජනන සෞඛ්‍ය ආරක්ෂණය තුල අවම ප්‍රමිතීන් සහතික කිරීම

සැන්ඩ්‍රා ක්‍රවුස්

*හදිසි අවස්ථාවක් පැන නැඟුණු විට එහි මුල් අවස්ථාවලදීම ප්‍රජනන සෞඛ්‍ය ආරක්ෂණ විධිවිධාන යෙදීම ජීවිත රැකගැනීමෙහිලා මූලික අවශ්‍යතාවයක් බව දැන් හොඳින්ම අවබෝධ වී තිබේ. අචේ පලාතේ කරන ලද ඇගැයුමකදී එම ක්‍රියාදාමයේ දැනට පවතින දුර්වලතාවයන්ද ඒ සම්බන්ධයෙන් උසස් පුහුණුවක් උසස් දැනුවත්කමක් ලබාගැනීමේ අවශ්‍යතාවයද අවධාරණය වී තිබේ.*

අවතැන්වූ කාන්තාවෝ සහ ගැහැණු ළමයි දරුණු ගණයේ සෞඛ්‍ය තර්ජනවලට මුහුණ දෙන්නාහ. ලිංගික ප්‍රචණ්ඩත්වය, HIV/AID ඇතුළුව වෙනත් ලිංගික වශයෙන් බෝවන ආසාදන, අනවශ්‍ය සහ බොහෝ සෙයින් අනතුරුදායක දරුගැබ්, අනාරක්ෂිත ගබ්සා ආදිය එකී සෞඛ්‍ය තර්ජන ලෙස සැලකේ. ගර්භනී ස්ත්‍රීන් 150,000ට වඩා වැඩි ප්‍රමාණයක් සුනාමි ආපදාවට ලක්වූ බවට ගණන් බලා තිබේ. ඔවුන්ගෙන් සියයට පහලොවකට ගර්භනීභාවය සහ ප්‍රසූතිය සම්බන්ධයෙන් මෙතෙක් අත් නොවින්ද සංකීර්ණතාවලට මුහුණ දෙන්නට සිදුවනු ඇතැ'යි බලාපොරොත්තුවනු ලැබේ. එබැවින් මෙම ගැබිණි මවුවරුන්ට හදිසි ජීවිතාරක්ෂක මෙන්ම ළමා රෝග පිළිබඳ සෞඛ්‍ය ආරක්ෂාවක් ලබාදීම අත්‍යවශ්‍යය. ඒ සඳහා සුනාමියට ගොදුරු නොවී ක්‍රියාත්මක මට්ටමේ පසුවන සෞඛ්‍ය සේවකයින් සතු දැනුම ප්‍රමාණවත් නොවන අතර ඔවුන් සතු මූලික උපකරණ හා වෙනත් සැපයුම් ද කොහෙත්ම ප්‍රමාණවත් නැත.

මීට දශකයකට පමණ පෙර එක්සත් ජාතීන්ගේ ආයතනවලින් සමන්විත අන්තර්-ආයතන කාර්යසාධක කණ්ඩායමක් වෙනත් ජාත්‍යන්තර සංවිධාන සමඟ එකතුවී අවම ආරම්භක සේවා පැකේජයක් (MISP)[1] වර්ධනය කළහ. ලිංගික ප්‍රචණ්ඩත්වයේ දරුණු ප්‍රතිඵල වැළැක්වීමේ ඒවා කළමානකරණය කිරීමේ නිරතවන ප්‍රජනන සෞඛ්‍ය ක්‍රියාකාරිත්ව හා සේවා කුලකයක් පිහිටුවීම, HIV ආසාදනය පැතිරයාම අඩු කිරීම, නවසුති හා මාතෘ රෝග මෙන්ම මරණ සංඛ්‍යාව හැකිතාක් අඩු කිරීම, හදිසි තත්ත්වය පහව ගිය විට පරිපූර්ණ ප්‍රජනන සෞඛ්‍ය සේවාවක් ලබාදීමට සැලසුම් කිරීම ඒ පැකේජයට ඇතුලත් විය.[2]

MISP ක්‍රියාකාරකම්වලදී ප්‍රමුඛත්වය ලැබුනේ පහත සඳහන් ඒවාටය:

- MISP ක්‍රියාත්මක කිරීමේදී එහි සම්බන්ධීකරණය පවත්වාගෙන යාමට සමත් ප්‍රධාන ආයතන සහ පුද්ගලයන් හඳුනාගැනීම.
- හදිසි සහනාධාර බෙදාහැරීම, ජලය/ ආහාර/ ඉන්ධන/ සෞඛ්‍ය ආරක්ෂණය සඳහා කටයුතු සූදානම් කිරීම වැනි සැපයීමේ හා බෙදාහැරීමේ ක්‍රියාකාරකම් වලදී සරණාගත ස්ත්‍රීන්ගේ සහ ගැහැණු ළමයින්ගේ සහභාගිත්වය සහතික කරන යාන්ත්‍රණයක් තුළින් ලිංගික ප්‍රචණ්ඩත්වය වැලැක්වීම.
- ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන් සඳහා සෞඛ්‍ය ආරක්ෂණය
- ආසාදන පැතිරයාම වැළැක්වීම, පිරිසිදු ලේ සැපයුම් ලබාදීම, කොන්ඩම් පහසුවෙන් ලබාගැනීම ආදිය පිළිබඳව දැනුම වර්ධනය කිරීම තුළින් HIV ආසාදනය පැතිරයාම වලක්වා ගැනීම.
- නවසුති මෙන්ම මාතෘ මරණ හා ගිලාන අනුපාතිකය හැකිතාක්දුරට අඩුකර ගැනීම. මවුවරුන්ට සහ ප්‍රසව සහායිකාවන්ට පිරිසිදු ප්‍රසව ආම්පන්න කට්ටල ලබාදීම, සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවය කරන වින්නඹු මාතාවන් සඳහා එවැනිම ප්‍රසව ආම්පන්න කට්ටල ලබාදීම, ළදරු රෝග වලට හදිසියේම ප්‍රතිකාර කිරීමට සිදුවන අවස්ථාවලදී ආධාරක සේවා ක්‍රමයක් පිහිටුවීම.
- පූර්ණ ප්‍රජනන සෞඛ්‍ය සේවාව ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ සේවාව සමග බද්ධ කිරීම සඳහා අවශ්‍ය කරන්නාවූ පරිසරය සැලැසුම් කිරීම, ඒ සඳහා පාරිසරික ප්‍රජනන සෞඛ්‍ය දත්ත එකතු කිරීම, සැපයුම් ඇනවුම් කිරීම, සේවා අඩවි හඳුනාගැනීම, පුහුණු වැඩ සටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම ආදී ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතුය.

2005 අවුරුද්දේ පෙබරවාරි මාසයෙදී කාන්තා කොමිසම මගින් අචේ ප්‍රාන්තයේ ප්‍රජනන සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳ තක්සේරුවක් සිදුකරන ලද්දේය. සුනාමිය ගලා සති දෙකක් ඇතුළත එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල (UNFPA) තාක්ෂණික කාර්යමණ්ඩලයක් පෙළ ගස්වා ඔවුනට සැපයුම් ලබාදී ඔවුන් ප්‍රජනන සෞඛ්‍ය කටයුතු අත්‍යවශ්‍ය වන ස්ථානවල ක්ෂෙත්‍රවැඩ සඳහා නිරත කරවූයේය. එම ස්ථානවලට ප්‍රජනන සෞඛ්‍ය ආම්පන්න සහ සැපැයුම් ලබා දුන්නේය. පෙබරවාරි මාසයේ අවසානය වන විට ජාත්‍යන්තර, ප්‍රාදේශීය, ජාතික සංවිධානවලට අයත් සාමාජිකයන් 35 දෙනෙකුට වඩා වැඩි පිරිසක් UNFPA මගින් සංවිධානය කළ ප්‍රජනන සෞඛ්‍ය ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්වලට සහභාගීවෙමින් සිටියහ.

හදිසි තත්ත්වයක් උදාවීමෙන් පසු එලැඹෙන මුල් දවස් සහ සති කීපය තුල අවධානය යොමු විය යුත්තේ ප්‍රජා සාමාජිකයන් සහ වින්නඹු අම්මාවරුන්, සම්ප්‍රදායික ප්‍රසව සහායිකාවන් ස්ත්‍රී හා පුරුෂ ප්‍රජා නායකයින් වැනි කණ්ඩායම් එකට එකතු වී තොරතුරු හුවමාරු කරගැනීමය. මේ වනවිට UNFPA සහ WHO සංවිධාන විසින් ඒ වන විට ප්‍රජනනීය වයසේ පසුවන ස්ත්‍රීන් ප්‍රමාණය, ගැබිණී ස්ත්‍රීන් ප්‍රමාණය, මාසයක් තුල බලාපොරොත්තුවන දරු උපත් ප්‍රමාණය, ළදරු සහ මාතෘ ගිලන් මෙන්ම මරණ ප්‍රමාණය පිළිබඳ දත්ත එකතුකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කොට තිබිණ. ස්ත්‍රී කණ්ඩායම් සමග පවත්වන ලද උපදේශන රැස්වීම්වලදී අවතැන් වු ස්ත්‍රීන් උපත්පාලන උපකරණ ඉල්ලා සිටින බවද අනාවරණය විය. UNFPA ආයතනය ජාතික පවුල් සංවිධාන සංගමය සහ වෙනත් ආයතන සමඟ එකතුවී උපත්පාලන උපකරණ ඉක්මණින්ම ගෙන්වා ගෙන බෙදා හරින්නට සමත් විය.

කෙසේවෙතත්, අචේ පලාතේ ක්‍රියාත්මක වූ UNFPA ආයතනයේ සහකාර කණ්ඩායම්වලට ආපදාවට ලක්වූ ජනතාවට ප්‍රජනන සෞඛ්‍ය සේවා සැපයීමෙහිලා මොනතරම් ඕනෑකමක් තිබුනත් ඔවුනට MISP වැඩසටහනේ ප්‍රධාන අරමුණ සහ ප්‍රමුඛ කාර්යයන් පිළිබඳ අවබෝධයක් නොවීය. මානවදයාවාදී කටයුතුවල යෙදී සිටි කාර්යමණ්ඩලයෙන් අඩකටත් වඩා MISP වැඩසටහන ගැන අසා තිබුනත් එහි අරමුණ සහ ප්‍රමුඛ කාර්යයන් නිවැරදිව විස්තර කළ හැකිවූයේ අතලොස්සකට පමණි.

## MISP ප්‍රතිපාදනවල අඩුපාඩුකම්

ලිංගික ප්‍රචණ්ඩත්වය ඉඳහිට වාර්තා වුවද එය පුළුල් ලෙස පැතිර ගිය ගැටළුවක් හැටියට ගණන් ගැනුනේ නැත. ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූ අයට සෞඛ්‍ය ආරක්ෂාව සපයා දෙන්නට තරම් ප්‍රමාණවත් දැනුමක් මානවදයාවාදී ක්‍රියාකාරකයින්ට හා ආණ්ඩුවේ සේවකයින්ට තිබූ බවක්ද නොපෙනේ. සෑම ජාත්‍යන්තර ඒජන්සියකටම පාහේ චර්යා


Emily Will/MCC/ACT International

කාන්තාවක් තම මාස හයක් වයසැ'ති සිඟිති දියණිය වෙනුවෙන් මෙට්ටයක් හා ඇඳුම් ලබාගනී. ඉන්දුනීසියාව

පද්ධතියක් තිබුනද එය උල්ලංඝණය වූ විට ඒ පිළිබඳව වාර්තා කළ යුතු යාන්ත්‍රණයක් ද තිබෙන බව කිසිම ඒජන්සියක් දැන සිටියේ නැත. එපමණක් නොව කිසිම ඒජන්සියක් එම චර්යා පද්ධතිය දේශීය හවුල්කාරයින් සමග බෙදාහදාගෙන තිබුනේ ද නැත. නොදන්නා ආගන්තුකයන් සහ පිරිමින් සමග නිවාස, වැසිකිළි, නාන තැන් ආදිය හවුලේ භුක්ති විඳින්නට සිදුවීම ගැන කාන්තාවෝ සහ ගැහැණු ළමයි ස්වකීය දැඩි නොසතුට පළ කොට තිබුනහ. ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වාර්තා වී තිබෙන්නේ මඳ වශයෙන් බව ඇත්තය. එහෙත් ලිංගික අතවරවලට භාජනයවූවන් සඳහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් අනුමත වී තිබෙන සායනික චාරිත්‍ර ගැන සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යමණ්ඩලයත් අනෙකුත් මානවදයාවාදී ක්‍රියාකාරීනුත් කිසිවක් දැන නොසිටීම බරපතල ලෙස අවධානය යොමු කළ යුතු කාරණයකි.

අචේ පලාතේ සේවයේ යෙදී සිටි 5500 ක් තරම් වින්නඹුවන් අතුරින් සියයට දහය ප්‍රමාණයක් සුනාමියට හසුව මිය ගොස් ඇත. මේ අඩුපාඩුව පිරිමැසීම සඳහා ජකාර්තාවේ සිටි වින්නඹුවන් 120 පමණ අචේ පලාතේ සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවය සඳහා සති දෙකේ සිට තුන දක්වා නිවාඩු කාල සහිතව නතර කරවන ලදහ. MISP වැඩසටහනට සහාය දැක්වීම සඳහා, ආපදාව ඇතිවී සති කීපයක් ඇතුළත, පිරිසිදු ප්‍රසව ආම්පන්න කට්ටල වින්නඹු කට්ටල යනාදිය සෞඛ්‍ය ම්‍යධස්ථානවලට ලබාදීම සඳහා ජාත්‍යන්තර ආයතනවලට එවනු ලැබිණ. කෙසේවෙතත්, සාම්ප්‍රදායික ප්‍රසව සහායක (TBA) කට්කල වල හිඟයක් තිබුණි. සමහර අවස්ථාවලදී සාම්ප්‍රදායික ප්‍රසව සහායක කට්ටල ගැබිණි කාන්තාවන්ට හෝ ප්‍රසව සහායිකාවන්ට හෝ ඒජන්සි මගින් බිම් මට්ටමින් බෙදා නොදුන් බවද වාර්තා වී තිබේ. සුනාමියට පෙරාතුව වුවද වැඩිදුර ආරක්‍ෂාව සඳහා නිර්දේශ කරන ලද රෝහලට මවුවරුන් ගෙනයාමේදී හදිසි ළමා රෝග වැළැක්වීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් තිබුනේ ඉතාමත් අල්ප වශයෙන් බව ප්‍රජාපාදක වින්නඹුවෝ වාර්තා කොට තිබුනහ.

තොග ගණනින් සෞඛ්‍ය මධ්‍යස්ථානවල එක්රැස් කර තැබීමේ අත්‍යවශ්‍යභාවය ගැන අවධාරණය කර තිබුනද අවශ්‍ය කරන අයට ලබා ගැනීම සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථානවල කොන්ඩම් ප්‍රදර්ශනය කොට තිබුනේද නැත. හරි වේවා වැරදි වේවා බොහෝ ආයතන කොන්ඩම් සුලබ කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක නොකරන ලද්දේ එවැන්නක් ඉස්ලාමීය සංස්කෘතියත් ඉන්දුනීසියානු සෞඛ්‍ය බලධාරීනුත් නොයිවසනු ඇතැයි කල්පනා කළ හෙයිනි. ඒ හැරෙන්නට සමහර ආයතනවලට කොන්ඩම් බෙදාදීමේ වැදගත්කම ගැන අවබෝධයක්ද තිබුනේ නැත. එහෙත් සමහර ආයතන එකී යෝජනාවට කැමැත්ත දැක්වූ අතර පළමු පියවර වශයෙන් තම කාර්යමණ්ඩලවලට ඒවා ලබා දෙන්නට කැමති විය.

සුනාමියට පෙරාතුව, සෞඛ්‍ය සේවකයන්ගේ භාවිතාව තුල මූලික සෞඛ්‍ය ප්‍රවේශම සම්බන්ධයෙන් මතු වී තිබූ බරපතල අඩුපාඩුකම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිතයන් වරින්වර වාර්තා කොට තිබිණ. විශේෂයෙන් එම අඩුපාඩුකම් දක්නට ලැබුනේ පිරිසිදු කිරීම, HIV ඇතුළුව ආසාදන පැතිරයාම වැලැක්වීම සඳහා සිදු කරන විෂබීජානුහරණය සහ රෝගාහරණය යනාදිය තුලය. ආරක්‍ෂක රුධිර පාරවිලයනය ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් අනුගමනය කළ යුතු වුවද සියළු රුධිරය තියුණු පරීක්‍ෂාවකට ලක් කරන්නේද යන සැකය පුද්ගලයින් ගණනාවක්ම මේ වන විට පළ කොට ඇත්තේය.

## නිගමණ

මෙම සොයාගැනීම්වලින් කියැවෙන්නේ එක් ප්‍රධාන ආයතනයක නායකත්වය ලබන බලය ලත් ප්‍රජනන සෞඛ්‍ය මධ්‍යස්ථාන ගණනාවක් තිබීමෙන් ඒකාබද්ධ ප්‍රජනන සෞධ්‍ය වැඩසටහන් පැවැත්වීමටත් සැපයුම් කටයුතු එකදිගටම කරගෙන යාමටත් පහසුවන බවයි. අචේ පලාතේ ක්‍රියාත්මකවන මානවදයාවාදී ක්‍රියාකාරකයෝ MISP ප්‍රතිපත්ති ගැනත් සැපයුම් කට්ටල ගැනත් දැඩි උනන්දුවක් දක්වතත් හදිසි තත්ත්වයක් උදා වූ විට ඉහළ යන රෝගීන් හා මරණ සංඛ්‍යාව වළක්වාගනු සඳහා ප්‍රජනන සෞඛ්‍ය සේවාවට ප්‍රමුඛත්වය දිය යුතු යැයි දැනුම් තේරුම් ඇත්තේ කීපදෙනෙකුට පමණි. කෙසේවෙතත් සොයාගැනීම්වලින් අවධාරණය වන්නේ හදිසි තත්ත්වයන් උදාවන්නට පෙරාතුව MISP ගැන මානවදයාවාදී ක්‍රියාකාරකයින් පුහුණුවක් ලබා තිබීමේ අවශ්‍යතාවයයි. මේ වනවිටත් ස්ත්‍රී කොමිසම දුරස්ථ අධ්‍යාපනික මොඩියුලයක් වර්ධනය කිරීම අරඹා ඇති අතර එය ලෝකයේ බහුල වශයෙන් භාවිතා වන භාෂාවලට පරිවර්තනය කිරීමටත් කටයුතු යොදා ඇත. එය 2005 සැප්තැම්බර් මාසයේ මුල් කාලයේදී ලබාගත හැක. (විද්‍යුත් තැපෑල: info@womenscommission.org)

අළුතෙන් උදාවන හදිසි තත්ත්වයන් තුලදී උපකාර අවශ්‍ය උදවියට MISP උපකාර ලබා දෙන මෙන් ස්ත්‍රී කොමිසම ආණ්ඩුවලින් අරමුදල් ප්‍රදානවලින් මානවදායවාදී ක්‍රියාකාරකයින්ගෙන් ඉල්ලා සිටී. ස්ත්‍රීන් පිළිබඳ කොමිසමේ වෙබ් අඩවිය තුලින් "හදිසි අවස්ථාවක් මතුවූ විට ප්‍රජනන සෞඛ්‍යය සම්බන්ධයෙන් දැක්විය යුතු ප්‍රමුඛතා: ඉන්දුනීසියාවේ සුනාමි ආපදවට භාජනය වූ ප්‍රදේශවල ක්‍රියාත්මක කළ අවම ආරම්භක සේවා පැකේජය තක්සේරු කිරීම" නම් වාර්තාව ලබාගත හැකිය.[3]

***සැන්ඩ්‍රා ක්‍රවුස් ස්ත්‍රී සහ ළමා සරණාගතයින් පිළිබඳ කොමිසමේ ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන භාර අධ්‍යක්‍ෂවරියයි. විද්‍යුත් තැපෑල: sandra@womenscommission.org***

1.www.womenscommission.org/projects/rh/misp%20index.shtml
2. MISP වැඩසටහන දැන් මේවාටද ඇතුලත් කොට ඇත: Sphere Project Humanitarian Charter සහ Minimum Standards in Disaster Response : www.sphereproject.org
3.www.womenscommission.org/pdf/id_misp_eng.pdf



Emily Will/MCC/ACT International

# ඉන්දුනීසියාවේ මානවදයාවාදී සම්බන්ධීකරණය: රාජ්‍ය නොවන සංවිධානයක මතය

කාස්ටන් වෝල්ස්

*සම්බන්ධීකරණයේ අගය පිළිබඳ කාරණා මානවදයාවාදී ප්‍රජාව දැන සිටියත් සුනාමියෙන් පසු මාස කිහිපයක් තුළ ලද ක්ෂේත්‍ර අත්දැකීම් ඔස්සේ තවත් වැඩදායක පාඩම් කිහිපයක්ම එම ප්‍රජාව ඉදිරිපත් කරයි.*

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නොයෙකුත් ක්‍රියාවලින් සම්බන්ධීකරණය කිරීමට බෙහෙවින් උත්සාහ කරන ලදී. නමුත් මේ ප්‍රවේශය පදනම් වී තිබුණේ අවශ්‍ය ප්‍රමාණයෙන් සම්පත් ක්ෂේත්‍රයට සැපයුවහොත් සම්බන්ධීකරණය ඉබේම සිදුවේය යන උපකල්පනය මතය. මේ තත්ත්වය සූක්ෂම සම්බන්ධීකරණයකට මග පෑදුවේ නැත. ඇතැම් මට්ටම්වලදී අවශ්‍ය ප්‍රමාණයට වඩා සම්බන්ධීකරණ තිබුණි. බන්ඩා ආචේ ප්‍රදේශයේ මානවදයාවාදී සැපයීම් සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධාණ ආයතන 12 ට වැඩි ප්‍රමාණයක් තරඟ වැදී තිබුණු බැවින් සම්බන්ධීකරණය අති උච්ච තත්ත්වයනට පත්වූ අතර බන්ඩා අචේහි පමණක් සතියකට සම්බන්ධීකරණ රැස්වීම් 72 ක් පවත්වනු ලැබීය. බොහෝ රාජ්‍ය නොවන සංවිධානවලට මේ රැස්වීම්වලින් අතලොස්සක් සඳහාවත් සහභාගිවීමට සම්පත් සතුව නොතිබුණි. මේ නිසා මේවාට සහභාගීවූයේ ආයතන 10-40 ත් අතර ප්‍රමාණයක් පමණි. මෙයින් නියෝජනය වූයේ ඒ වන විට ක්‍රියාත්මක වී තිබුණු ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන 400 න් ඉතා සුළු නියැදියකි. බොහෝ සම්බන්ධීකරණ රැස්වීම් සඳහා පැහැදිලි අරමුණු නොතිබුණු අතර සහභාගීවූවන්ගේ භූමිකා වගකීම් හා තීරණ ගැනීමේ ප්‍රයෝජන පැහැදිලි කර ගැනිමට එම රැස්වීම් අසමත් විය. මේ රැස්වීම්වල පරමාර්ථය වූයේ තොරතුරු බෙදා ගැනීම ද එකඟතා ඇති කර ගැනීමද නැතිනම් මෙහෙයුම් හෝ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමද යන්න පැහැදිලි නොවීය. බොහෝ විට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වැඩි කාලයක් ගත කලේ සම්බන්ධීකරණය සඳහා මිස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නොවේ.

මේ අතිවිශාල රැස්වීම් ප්‍රමාණය මගින් පෙන්නුම් වන්නේ මානවදයාවාදී ක්ෂේත්‍රය තුළ සුහසාධනයේ ඇතිවෙමින් පවතින විශේෂඥතා ප්‍රවනතාව සහ අපගේ කේන්ද්‍රීය රාජකාරී වෙත අවධානය යොමු කිරීමට ඇති නොහැකියාවයි. නැවත ගොඩනැගීම සහ මුදල් ඉපයීමේ මාර්ග සඳහා ප්‍රතිපත්ති හා ප්‍රවේශයන් පිළිබඳව සාකච්ඡා කිරීමට විශාල කාලයක් වැය කල නමුත් ආපදාවෙන් මාස දෙකකට පසුවත් අචේ පලාතේ පීඩා විඳි ජනපද ගණනාවකටම මූලික සනීපාරක්ෂක පහසුකම් නොතිබුණි. මානවදයාවාදී ප්‍රජාව බෙහෙවින් බන්ධනය වී තිබුණු අතර ඇතැම් වැදගත් වාදවිෂයයන් බොහෝ කාලයක් මුළුල්ලේ ආමන්ත්‍රණය කොට නොතිබුණි.

සම්බන්ධීකරණ මට්ටම් විශාල ප්‍රමාණයක් තිබිණ. එක්සත් ජාතීන්ගේ නායකත්වය යටතේ ක්‍රියාත්මකවූ සම්බන්ධීකරණ කණ්ඩායම් එකම වාදවිෂයයන් පිළිබඳව ජකර්තා, මෙදාන්, බන්ඩා අචේ හා මෙයිලබෝ යන ප්‍රදේශවලද ක්‍රියාත්මක වූ අතර ඒවා එකිනෙක අතර සන්නිවේදනය සිදුවූයේ අවම වශයෙනි. මෙහි ප්‍රතිඵලය වූයේ හුදෙකලාව ගොඩනගාගත් බහුවිධ උපදේශන නිර්නායක සහ ප්‍රමිතීන් භාවිතයට ගැනීමය. ඇතැම් එක්සත් ජාතීන්ගේ ආයතන සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් දෙකේම නියැලී සිටි අතර එහිදී පෙනී ගියේ ඉන්දුනීසියානු රජය සමග පැවැත්වූ රැස්වීම්වලදී මානවදයාවාදී ප්‍රජාවේ සාමුහික අවශ්‍යතා නියෝජනය කරනු වෙනුවට තම තමන්ගේ සංවිධානවල අවශ්‍යතාවන් පිළිබඳව අවධානය යොමු කළ බවය. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මානවදයාවාදී තොරතුරු මධ්‍යස්ථානයක් (HIC)[1] ස්ථාපනය කළ අතර එහි කාර්යභාරය වූයේ මානව සුභසාධන ආයතනවලට වැඩසටහන් පිළිබඳ නිසි තීරණ ගැනීම පහසු කිරීම සඳහා තොරතුරු එකතු කිරීම හා බෙදා හැරීමය. නමුත් සති කිහිපයකට පසුවද මේ මධ්‍යස්ථානය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවීය. එමෙන්ම, ප්‍රථම අසීරු සති කීපයෙන් පසුව එය ප්‍රයෝජනවත් තොරතුරු සැපයුවද සියළුම අවශ්‍යතා සැපිරීම සඳහා ඊට අවශ්‍ය සම්පත් නොතිබුණි. මානවදයාවාදී පොදු සේවාවන් වන ඒකාබද්ධ ප්‍රවාහන සේවා මධ්‍යස්ථානය (Joint Logistics Centre) හා මානව සුභසාධන ගුවන් සේවය (Humanitarian Air Service) යන ආයතන සම්බන්ධයෙන් පැවති තත්ත්වයද මීට සමානය.

## හමුදාවේ භූමිකාව

විදේශ රාජ්‍යයන් විසින් සපයන ලද යුද සම්පත් සම්බන්ධීකරණය ඉන්දුනීසියානු හමුදා විසින්ම සිදු කිරීම තුලින් දැනට පිලිගෙන තිබෙන මානවදයාවාදී නිසි භාවිතාවන් උල්ලංඝනය වී ඇත. එවැනි නිසි භාවිතාවන් මගින් පිළිගෙන ඇත්තේ මානවදයාවාදය සඳහා යොදවන හමුදා ආධාර සාමාන්‍ය රටවැසියන්ගේ සම්බන්ධීකරණය යටතේ පැවතිය යුතු බවය. බොහෝවිට තක්සේරු කටයුතු හා ප්‍රතිචාර මෙහෙයුම් ඇරඹීම සඳහා මෙකී සම්පත් භාවිතයට ගැනීමට රාජ්‍ය නොවන සංවිධානවලට අවකාශ ලබා දී නොතිබුණි. රාජ්‍ය නොවන සංවිධානවලට ගුවන් මගින් ඉන්දුනීසියාවේ අන් ප්‍රදේශවල සිට බන්ඩා අචේ සහ මෙයිලබෝ ප්‍රදේශවලට භාණ්ඩ ප්‍රවාහනය කළ හැකි විය. නමුත් සුමාත්‍රාවේ බටහිර ඉවුරේ සිටි ආපදාවෙන් පීඩා විඳි සහ ළඟාවන්නට අපහසු ප්‍රජාවන් වෙත සේවා හා භාණ්ඩ ගෙන යෑමට නෞකා හා හෙලිකොප්ටර් යානා යොදා ගැනීම බෙහෙවින් සීමා කර තිබුණි. අපහසුම මුල් සති දෙක තුළ රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන්ට වඩා මාධ්‍යවේදීන්ට හෙලිකොප්ටර් යානාවලින් ගමන් කිරීම පහසු විය. මේ ප්‍රදේශවල ක්‍රියාත්මක වූ හමුදා විසින් ආපදාවෙන් පීඩා විඳි ජනගහනය පිළිබඳ තොරතුරු ක්‍රමිකව එක් රැස් කළේ නැත. එකතු කරන ලද සුළු තොරතුරු ප්‍රමාණයද රාජ්‍ය නොවන සංවිධාන වෙත ලබා දුන්නේ නැත. මේ තත්ත්වය මදක් හෝ වෙනස් වූයේ නිරන්තර පැමිණිලිවලින් පසුවය. මානවදයාවාදී කටයුතු අචේ ප්‍රදේශයේ ගැටුමේ එක් පාර්ශවකරුවකුගේ පාලනය යටතේ පැවතියේය යන කරුණ කිසි ලෙසකින් හෝ වෙනස් කිරීමට නොහැකි විය. එනිසා මානවදයාවාදී ප්‍රජාවේ මධ්‍යස්ථභාවය පිළිබඳ බරපතල ගැටළු පැන නැඟුණි. නමුත් මානවදයාවාදී ක්‍රියාකාරීන් සහ ඉන්දුනීසියානු හමුදා භූමිකා අතර ඇති වෙනස පැහැදිලි කිරීම සඳහා මීට වඩා වැඩි කාර්යභාරයක් කිරීමට උසස්ම මට්ටමේ බලධාරීන්ට හැකියාව තිබුණි.

## විශාල ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන අතර අභ්‍යන්තරික සම්බන්ධීකරණය

අන්තර් ආයතනික සම්බන්ධීකරණයෙ හා සහයෝගිතාවය වූකලී මිශ්‍ර ගුණාත්මකභාවයකින් යුක්ත වූ එකකි. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මුල්කාලයේදී ඇති වූ අමනාපකම් අප්‍රසන්න වවුද ඒවා කෙටිකාලීන වීය. මුලින්ම ඇතැම් සංවිධාන මගින් තමන්ට ආධාර කිරීමට හැකියාව නොතිබූ තරම් විශාල ප්‍රදේශ තම ව්‍යාපෘතිවලට සම්බන්ධ කර ගැනීමට උත්සාහගත් අතර අන් ආයතන තමන්ව කොන් කරන ලදැයි සිතන්නට විය. මෙවන් තත්ත්වයන් ඇතිවීම වළක්වා සහ සහයෝගීතාවය වැඩිදියුණුකිරීම සඳහා වඩාත් විශාල සංවිධානවල ප්‍රධානීන් සතිපතා අවිධිමත් රැස්වීම් පවත්වන්නට තීරණය කළහ. මේ තුලින් තත්ත්වය සීඝ්‍රයෙන් දියුණු විය. මන්දයත්, ප්‍රධාන ක්‍රියාකාරීන් තමන් කරන්නේ කුමක්ද යන්න තීරණය කළ පසු තොරතුරු බෙදාගැනීම හා සේවා සහයෝගය යන කරුණුවලට අවධානය යොමු කිරීමට හැකි විය.

අචේ ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ CARE නියෝජිතයින්ට අනුව මේ අවිධිමත් සම්බන්ධීකරණ ක්‍රමය ප්‍රමාණවත් නොවූ අතර ඔවුහු වඩාත් විධිමත් සම්බන්ධීකරණ ව්‍යුහයක් ඒ වෙනුවට යෝජනා කළහ. CARE ආයතනය සහ නෝර්වීජියානු සරණාගත මණ්ඩලය එක්ව විධිමත් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනැගීම සඳහා උපකාර කරන ලෙස ජාත්‍යන්තර ස්වෙච්ඡා ආයතන මණ්ඩලයට (International Council of Voluntary Agencies)[2] ආරාධනා කරනු ලැබීය. එමෙන්ම, CARE, වර්ල්ඩ් විෂන් ජාත්‍යන්තරය, OXFAM GB සහ කතෝලික සහන සේවා යන ආයතන දින දෙකක රැස්වීමක් තුලින් ශ්‍රී ලංකාවෙන් ඉන්දුනීසියාවෙන් ඉන්දියාවෙන් හා තායිලන්තයෙන් ඉගෙනගත් පාඩම් විමර්ෂණය කිරීමට උත්සාහ ගත්තෝය.[3]

## විශාල ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට එරෙහිව කුඩා ජාත්‍යන්තර නොවන සංවිධාන

අචේ ප්‍රාන්තය තුල ක්‍රියාත්මක වූ මානවදයාවාදී ප්‍රජාවේ අති විශාලත්වය පෙන්නුම් කරන කරුණක් නම් මානවදයාවාදී මධ්‍යස්ථානය විසින් ගොනු කරන ලද සම්බන්ධතා නාමාවලිය පිටු 203 න් සමන්විතවීමය.[4] ලියාපදිංචි වූ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට




*ඉන්දුනීසියානු හමුදාව සහනාධාර සැපයුම් සමග, බන්ඩා අචේ, ඉන්දුනීසියාව*

අමතරව (සේවා ප්‍රතිචාරයේ උච්චතම අවස්ථාවේදී ජාත්‍යන්තර නිලධාරීන් 5,000 ට මේ සංවිධාන රැකියා සපයා ඇත.) ලියාපදිංචි ක්‍රියාවලියට හසු නොවූ අන් ජාත්‍යන්තර ආයතන විශාල ප්‍රමාණයක්ද මීට පෙර ලියාපදිංචි වූ අචේ රාජ්‍ය නොවන සංවිධාන 120 ක්ද, ඉන්දුනීසියාවේ අන් ප්‍රදේශවලින් පැමිණි නොයෙකුත් කුඩා ස්වෙච්ඡා කණ්ඩායම්ද පලාත තුල ක්‍රියාත්මක වූහ.

ජාත්‍යන්තර ප්‍රජාව විසින් පිහිටුවන ලද සම්බන්ධීකරණ යාන්ත්‍රණය දේශීය ආයතන හා සම්බන්ධ නොවීය. මෙය විශේෂයෙන් බලපෑවේ හුදෙකලා ප්‍රදේශවල ක්‍රියාත්මක වූ කණ්ඩායම් සම්බන්ධයෙනි. සියළුම රැස්වීම් පවත්වන ලද්දේ ඉංග්‍රීසියෙන් වූ අතර, ඒවා එම රටේ දේශීය භාෂාවට පරිවර්තනය කරනු ලැබුවේ නැත. සිදුවන්නේ කුමක්දැයි නොතේරුණු බැවින් දේශීය රාජ්‍ය නොවන සංවිධාන මේ රැස්වීම්වලට පැමිණීම සුළු කාලයක් තුළදී අත්හැර දැමූහ. ඉංග්‍රිසි භාෂාවේ ප්‍රමුඛත්වය CARE සංවිධානයේ දේශීය නිලධාරීන්ගේ අත්දැකීම් තුලින් වටහගත හැකිය. ඔවුහු මානව සුභසාධන තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා අභ්‍යන්තරිකව අවතැන්වූවන් සිටින ස්ථාන පිළිබඳ තොරතුරු පද්ධතියක් සම්පාදනය කලහ. නමුත් එහි අන්තර්ගතය සැකසී තිබුණේ ඉන්තිනීසියානු භාෂාවෙන් නිසා එම තොරතුරු අවශ්‍ය පරිදි සකසා ගැනීමට එකී මධ්‍යස්ථානයට සති දෙකක කාලයක් ගත විය. ඒ කාලය තුළදී කාලය සහ සම්පත් විනාශ විය. මන්දයත්, ඒ අතර අන් ආයතන ඒවන විටත් තිබූ තොරතුරු නැවත ලබා ගැනීම සඳහා අභ්‍යන්තරිකව අවතැන්වූවන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට තම නිලධාරීන් යවා තිබු බැවිනි.

ඉන්දුනීසියානු රජයද ඇතැම් එක්සත් ජාතීන්ගේ ආයතන සහ විශාල ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් ද කුඩා සංවිධාන සහ ඔවුන්ගේ වැඩසටහන්වල අදාලත්වය ගැන ප්‍රශ්න කලහ. ඔවුන් එකී කුඩා සංවිධාන නම් කළේ සුදුසුකම් විරහිත සම්පත් හිඟ ආයතන වශයෙනි. මෙවැනි පරිමානයක ආපදාවකදී ඇතැම් ගැටළුකාරී ක්‍රියාකාරීත්වයන් එම ප්‍රදේශවලින් මතුවීම සත්‍යයකි. උදාහරණ වශයෙන් මානවහිතවාදී මධ්‍යස්ථාන නාමාවලියේ සඳහන් ඇතැම් ආගම් ප්‍රචාරක සංවිධාන දැක්විය හැකිය. එනමුත් බොහෝ කුඩා සංවිධාන සමස්ත අවශ්‍යතාවයට ප්‍රතිචාර දැක්වූයේ ප්‍රයෝජනවත් අයුරිනි. විශේෂයෙන් විශාල සංවිධානවලට ආමන්ත්‍රණය කළ නොහැකි වූ අවකාශ ඔවුන් විසින් පුරවුනු ලැබීය. ඔවුන් සුක්ෂම සම්බන්ධීකරණ යාන්ත්‍රණයක පාර්ශවකරුවන් වූයේ නම් ඔවුන්ට මීටත් වඩා අගනා සේවයක් සැපයීමට අවකාශ තිබුණ. CARE සහ වෙනත් විශාල ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන මෙවන් කුඩා සංවිධාන සමග ප්‍රාදේශීය මට්ටම්වලදී ක්‍රියාකාරී එකඟතාවන් ඇතිකර ගන්නට උත්සාහ ගන්නා ලදී. හැකි අවස්ථාවලදී මේ උත්සාහයන් වැඩසටහන් අනුරූපණයෙන් වැළකීම, ගැටළුකාරී වැඩසටහන් ප්‍රවේශයන් නව්‍යකරණය කිරිම වැනි කරුණු සම්බන්ධයෙන් සාපේක්ෂ වශයෙන් සාර්ථකව ක්‍රියාත්මක විය. අතීත උදාහරණ (කොසෝවෝ වැනි) පෙන්වා දෙමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රධාන ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල වගකීම යටතට යම් යම් ප්‍රදේශ අනුයුක්ත කරන ලදී. අන් ආයතන සම්බන්ධීකරණය කිරීමේ බලයද ඔවුනට හිමිව තිබුනි. මේ සාර්ථක ප්‍රවේශය අචේ ප්‍රදේශයේ ද යොදා ගත යුතුව තිබුණි.

## විසඳිය යුතු සම්බන්ධීකරණ වාදවිෂයයෝ

බොහෝදෙනා සම්බන්ධීකරණය වැදගත් යැයි පිළිගත්තද, එයින් අදහස් වන්නේ කුමක්ද යන්න පිළිබඳ එකිනෙකට වෙනස් මත පවතී. අවම මට්ටමකින් අනුරූපනයෙන් වැළකීමට අවශ්‍ය ස්වෙච්ඡා කටයුතු ඇතුළත් විය හැක. නොඑසේනම්, ප්‍රතිචාර සුසංගත කිරීමේ සංවේදී උත්සාහයන් විය හැකිය. මේ දෙවන අර්ථයෙන් ගත් කළ එය CARE වැනි රාජ්‍ය නොවන සංවිධානයකට බරපතල ගැටළු මතු කළ හැකිය. මෙය සිදුවන්නේ සම්බන්ධීකරණ ආයතනය (එක්සත් ජාතීන්ගේ සංවිධානයවල, හෝ “කැමැත්ත ඇති සංවිධාන” සභායක් හෝ විය හැක) මධ්‍යස්ථ නොවේය යන අදහස බලවත් වී තිබෙන විටත් සුසංගත කිරීමේ ක්‍රියාවලිය මඟින් රාජ්‍ය නොවන සංවිධානයකට මධ්‍යස්ථව කටයුතු කිරීමට තිබෙන අවශ්‍යතාවයට බාධා පමුණුවන විටය. තවත් බරපතල ගැටළු මතුවන අවස්ථාවක් නම් සම්බන්ධීකරණ වගකීම් පැවරී තිබෙන තිබෙන අවස්ථාවය. මෙවන් අවස්ථාවලදී තම තමන්ගේ අවශ්‍යතාවන්ට අඩු හෝ වැඩි හෝ අවධානය යොමු වීමට ඉඩ තිබේ.

සම්බන්ධීකරණ ව්‍යුහයන් ප්‍රබල යැයි පෙනී ගියද, ඒවාට නිසි සම්පත් හා සේවකියන් නොමැති නම්, ප්‍රායෝගික මට්ටමේදී ඒවා බිඳවැටිය හැකිය. එමෙන්ම, සම්බන්ධීකරණ නිලධාරීන් ප්‍රදේශයට ආගන්තුකවේ නම් හෝ අත්දැකීම් අඩුනම් හෝ තොරතුරු බෙදාහැරීමේ ව්‍යුහයන් අසම්පූර්ණ නම් හෝ එවන් තත්ත්ව තුළදී සහභාගීත්වයට හා සහයෝගීත්වයට සුදුසු වාතාවරණයක් ගොඩනැගීම අපහුසු වනු ඇත.

## ඉදිරි සැලසුම්

ජාත්‍යන්තර මානවදයාවාදී ප්‍රජාව ඉදිරි සැලසුම් සම්පාදනයේදී වඩාත් අන්තර් ක්‍රියාකාරී විය යුතුය. මෙය වඩාත් වැදගත් වන්නේ පහත සඳහන් කටයුතු සම්බන්ධයෙනි.

- තොරතුරු අවශ්‍යතා පිළිබඳ තීරණය කිරීමේදී
- ප්‍රමිතිගත කරන ලද කාර්යාල පෝරම තුළින් සන්නිවේදනය කිරීමේදී
- SPHERE ව්‍යාපෘතිය මගින් පිළිගෙන ඇති ආකාරයට අනුකූලව ආපදාවලට ප්‍රතිචාර දැක්වීමේදී අවශ්‍ය අවම ප්‍රමිතීන් සන්දර්භගත කිරීමේදී[5]
- ජාතික, ප්‍රාන්තීය, ප්‍රාදේශීය හා අංශයීය මට්ටම්වල සම්බන්ධීකරණ ව්‍යුහ අතර ඇති පැහැදිළි සම්බන්ධතා හඳුනා ගැනීමේදී
- ශ්‍රම විභජනය හා සම්පත් යෙදීම යන කරුණුවලදී වඩාත් සහයෝගී ලෙස පූර්ව සැලසුම්කරණයේදී පවතින හැකියාවන් හඳුනාගැනීමේදී
- ජාතික ආණ්ඩු සහ හමුදාවල කේන්ද්‍රීය භූමිකාවන් හඳුනාගැනීමේදී සහ එම ආයතනවල භූමිකා සහ වගකීම් පැහැදිළි කිරීමේදී
- මීට කලින් පිහිටුවා තිබෙන ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල සම්බන්ධීකරණ ව්‍යුහයන් සහයෝගිතා පද්ධති, නියෝජයන්වන හා ක්‍රියාකාරීත්වය සමග සම්බන්ධ වීමේදී
- ප්‍රාදේශීය හා ජාතික සිවිල් සමාජ සංවිධාන සමග සම්බන්ධවීමේදී
- අනතුරු වැඩි ප්‍රදේශවල හැකියාවන් සිතියම්ගත කිරීමේදී

ඉදිපත් වී ඇති විවේචන මධ්‍යයේ වුවද, සමස්ත සුනාමි ප්‍රතිචාරය සාර්ථක බව කිව හැකිය. එමෙන්ම, එතුලින් ආයතනික පාඩම් ඉගෙනීමට තිබෙන උනන්දුව අගය කළ යුතුය. වඩාත් මැනවින් ඉදිරි සැලසුම් සම්පාදනය කිරීමෙන් සහ පශ්චාත් සුනාමි අත්දැකීමෙන් පාඩම් ඉගෙන ගැනීමට ඇති ආත්මශක්තිය වැඩි කරලීමෙන්, මීලග ආපදාවේදී ප්‍රතිචාර දැක්වීම සඳහා තමන් වඩාත් මැනැවින් සූදානම් වී සිටින බවත් සම්බන්ධීකරණය වඩාත් සූක්ෂම කළ හැකි බවත් ජාත්‍යන්තර ප්‍රජාවට වැටහෙනු ඇත.

***කාස්ටන් වෝල්ස් කෙයාර් සංවිධානයේ තාක්ෂණික මෙහෙයුම් කණ්ඩායමේ (CARE Emergency Group) ක්ෂණික මෙහෙයුම් පිළිබඳ සම්බන්ධිකාරකවරයයි. මේ ලිපියේ ඇති අදහස් ඇයගේ පෞද්ගලික අදහස් වන අතර ඒවා CARE ආයතනයේ හෝ එහි පාර්ශවකරුවන්ගේ හෝ අදහස් නියෝජනය කරන්නේ නැත. විද්‍යුත් තැපෑල: voelz@careinternational.org***

1 www.humanitarianinfo.org/sumatra
2 www.icva.ch
3 www.humanitarianinfo.org/srilanka/infocentre/reference/docs/Care_Evaluation.pdf. Save the children, the International Rescue Committee and Mercy Corps යන ආයතන සමග එක් වී මෙම රාජ්‍ය නොවන ජාත්‍යන්තර සංවිධානය ක්ෂනික හැකියා ගොඩනැංවීමේ ව්‍යාපෘතිය ගොඩනගයි. මේ ව්‍යාපෘතියේ අරමුණු නම්: මූලාශ්‍රවල සූක්ෂ්මභාවය දියුණු කිරිම, සේවකයින්ට වැඩි ගුණාත්මක පුහුණුවක් ලබාදිම, ඔවුන් සේවයේ රඳවාගැනිම, ආයතන වගකීම වැඩිදියුණු කිරීම, බලපෑම් ඇස්තමේන්තු දියුණු කිරීම, අනතුරු අඩුකර ගැනිමේ හැකියාව දියුණු කිරිම, හදිසි අවස්ථා සඳහා තිබෙන සුදානම වැඩිදියුණු කිරිම, තොරතුරු හා තාක්ෂණීක හැකියාවන් දියුණු කිරීම.
4 www.humanitarianinfo.org/sumatra/products/contacts/index.asp
5. www.sphereproject.org.

# අචේ ප්‍රාන්තයේ පශ්චාත්-සුනාමි ආරක්ෂණ විධිවිධාන

මැරියන් කෝල්ඩ්‍රෙ සහ ටිම් මොරිස්

*ස්වාභාවික ආපදාවලට ගොදුරු වී පලායන්නවුන්ද අභ්‍යන්තරිකව අවතැන්වූවන් (IDP) හැටියට සලකන්නැ'යි අභ්‍යන්තරිකව අවතැන්වීම පිලිබඳ මාර්ගෝපදේශ ප්‍රතිපත්තිවල පැහැදිලිව සඳහන් කර තිබේ. කෙසේවෙතත් සුනාමියෙන් පසුව අචේ ප්‍රාන්තය තුල ක්‍රියාත්මක වූ සමහර ආයතන එම පදය භාවිතා කිරීමටත් ආරක්ෂණ විෂය ආමන්ත්‍රණය කිරීමටත් මැලි වී තිබේ.*

ගතවූ අවුරුදු කීපය තුළ අභ්‍යන්තරිකව අවතැන්වීම පිලිබඳ ප්‍රතිපත්ති ඉන්දුනීසියානු බහාෂා භාෂාවට පරිවර්තනය කරන ලදුව ආණ්ඩුවේ නිලධාරීන් හා ගැටුම් නිසා හානියට ලක් වූ ජන කොටස් අතරේ පුළුල්ව බෙදා හරිනු ලැබ තිබේ. මෙම මාර්ගෝපදේශ ප්‍රතිපත්තිමාලාව ඉන්දුනීසියානු දූපත් සමූහය පුරාම බෙද හැරීම නෝර්වීජියානු සරණාගත මණ්ඩලය ගෝලීය මට්ටමින් මෙහෙයවන අභ්‍යන්තරිකව අවතැන් වූ ජනයා පිලිබඳ ව්‍යාපෘතියත් අභ්‍යන්තරිකව අවතැන්වීම පිලිබඳව බෲකින්ග්ස්-බර්න් ව්‍යාපෘතියත් එක්සත් ජාතීන්ගේ මානවදයාවාදී කටයුතු පිලිබඳ සම්බන්ධීකරණ කාර්යාලයත් (OCHA) ඉන්දුනීසියානු ආණ්ඩුව හා සෙසු සිවිල් සමාජ සංවිධාන සමග එකතු වී නොකඩවා කටයුතු කර තිබේ.[1]

එබැවින් සුනාමියෙන් පසු බන්ඩා අචේ ප්‍රාන්තයේ OCHA කාර්යාලය විසින් කැඳවන ලද සම්බන්ධීකරණ රැස්වීම්වලදී නියෝජිතයන් අභ්‍යන්තරිකව අවතැන් වූ ජනයා යන පදය භාවිතා නොකොට ඒ වෙනුවට "නිවාස අහිමිවූවන්" සහ "සුනාමිය නිසා නිවාස අහිමි වූ ජනයා" ආදි පද පාවිච්චි කිරීම ඇත්තෙන්ම පුදුමසහගත කාරණයක් ලෙස පෙනී ගියේය.

කෙසේවෙතත් සුනාමිය සිද්ධවූයේ දැඩි ලෙස දේශපාලනීකරණයට ලක්වූ සන්දර්භයක් තුලය යන කාරණය ඉක්මණින්ම නෝර්වීජියානු සරණාගත මණ්ඩලය (NRC) පිළිගත්තාය. ඉන්දුනීසියානු ආණ්ඩුව සහ බෙදුම්වාදී ව්‍යාපාරයක් වන GAM සංවිධාන අතර හටගෙන තිබෙන ගැටුම් හේතුවෙන් අචේ ප්‍රාන්තයේ ජාත්‍යන්තර ප්‍රජාව වෙනුවෙන් විවෘත නොකර තිබුණි. ජාත්‍යන්තර ආයතනවලට එහි ගොඩබැසීමට අවසර ලැබුනේ සුනාමිය හා සම්බන්ධ මානවදයාවාදී අවශ්‍යතාවන්වලට පමණක් ප්‍රතිචාර දක්වන ප්‍රතිඥාව පිටය. ඉන්දුනීසියාව නම් රටේ අභ්‍යන්තරිකව අවතැන්වන ජනයා පිලිබඳ ඉතිහාසීය කථාව පුරාම මානවදයාවාදී මෙහෙයුම් සමග පැවැත්වූ කිසිදු සම්බන්ධතාවයක් දක්නට නොලැබෙන නිසාම ඉන්දුනීසියාව තුල සිදුවන අවතැන්වීම් කෙරෙහි ජාත්‍යන්තර ප්‍රජාව හෝ දේශීය බලාධිකාරය හෝ එතරම් උනන්දුවක් දක්වා නැත.

NRC සංවිධානය ඉන්දුනීසියාව සංවර්ධනය කිරීමෙහිලා ආධාර සහ ප්‍රතිකාර ලබාදීමේ සන්ධානය (CARDI) නම් පුළුල් සංවිධානයේ හවුල්කරුවෙකි. එම සන්ධානය සෑදී ඇත්තේ ඩෙන්මාර්ක සරණාගත මණ්ඩලය (DRC), නොර්විජියානු සරණාගත මණ්ඩලය (NRC), ජාත්‍යන්තර ගලවාගැනීමේ කමිටුව (IRC) සහ Stichting Vluchteling යන සංවිධාන එකතුවීමේන්ය. අභ්‍යන්තරිකව අවතැන් වූ ජනයා නොතකා හැරීම තුලින් මතුවන ප්‍රතිඵල ගැන සිය බලවත් අවධානය යොමුකරන NRC-CARDI සංවිධානය ගැටුම හා සුනාමිය විසින් අවතැන් කරනු ලැබ සිටින අචේ ජනතාවගේ අවශ්‍යතාවන් සහ අභ්‍යන්තරිකව අවතැන්වීම නිසා ඔවුන් මුහුණදෙන තත්ත්වයන් වෙන් වශයෙන් ගෙන සැලකීම අනතුරුදායක බැව් අවධාරණය කරයි. සුනාමිය නිසා අභ්‍යන්තරිකව අවතැන් වූ ජනයා සම්බන්ධයෙන් NRC සංවිධානය මීට වඩා දැනුවත්වීමේ අවශ්‍යතාවය පිළිගැණින. ඒ වාගේම අවතැන්වීම, නැවත පැමිණීම, නැවත ඒකාබද්ධවීම, නැවත ස්ථාන තෝරාගැනීම, නැවත පදිංචිවීම වැනි කාරණා සාකච්ඡා කරමින් අභ්‍යන්තරිකව අවතැන්වූවන් රැකගැනීම පිලිබඳ අදහස් හුවමාරු කරගැනීම සඳහා අවතැන්වූවන් ද ඇතුළුව මානවදයාවාදී කාරකයින්ට වේදිකාවක් අවශ්‍යය.

NRC සංවිධානයත් අභ්‍යන්තරිකව අවතැන්වූවන් පිලිබඳ ගෝලීය ව්‍යාපෘතිය (GIDPP) එකතු වී මාර්ගෝපදේශ ප්‍රතිපත්ති පිලිබඳ වැඩමුළු දෙකක් සැලසුම් කිරීමට පටන්ගෙන තිබේ. එයින් එකක් බන්ඩා අචේ ප්‍රාන්තයේ පැවැත්වෙන අතර අනෙක බටහිර සුමාත්‍රා වෙරළේ පිහිටි මියුලාබෝහිදී පැවැත්වෙනවා ඇත. මේ යෝජනාව ජාතික හා ජාත්‍යන්තර ප්‍රජාවන් එකහෙළා අනුමත කර ඇත්තේ එය කාලෝචිත සුදුසු ක්‍රියාවක් හැටියට හඳුන්වමිනි. ඉන්දුනීසියානු ආණ්ඩුව අචේ ප්‍රාන්තය තුල පනවා තිබූ හදිසි නීතිය මාර්තු අවසානයේදී අවසාන කළ හෙයින් ප්‍රාන්තයේ ප්‍රතිසංවර්ධනයට කෙලින්ම සහභාගීවන උදවියගේ සහභාගීත්වය NRC දැඩිව අපේක්ෂා කරයි. සහභාගිකයන් හඳුනාගැනීම සහ ඔවුනට ආරාධනා කිරීම, සම්පත්දායකයින් සොයාගැනීම, අචේ ප්‍රාන්තයේ සන්දර්භයට අනුකූලවන පරිදි පුහුණුකිරීමේ ද්‍රව්‍ය සහ මෙවලම්වල හැඩතල හා ගුණරුව වෙනස්කිරීම ආදි සෑහෙන කාලයක් අවශ්‍ය කරන කටයුතු දැනටමත් අරඹා තිබේ. ජාතික හා ප්‍රාදේශීය බලධාරීන්ගේ මිශ්‍රණයකින්, එක්සත් ජාතීන්ගේ නිලධාරීන්, අරමුදල් දායකයින්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, දේශීය රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ නායකයින්, අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ නායකයින් ඇතුලත් කොට සහභාගිකයන්ගේ ලැයිස්තුවක් මෙ වනවිට සම්පාදනය කොට තිබේ. වැඩමුළු සඳහා සමාජ සුබසාධනය පිලිබඳ ඉන්දුනීසියානු අමාත්‍යාංශය සාධනීය ප්‍රතිචාරයක් දක්වා ඇති අතර එහිදී නිබන්ධන ඉදිරිපත් කරන්නටත් එකඟ වී ඇත. එසේම දත්ත එක්රැස් කිරීමෙහිලා උදව් වන්නටත් ඒවා ස්ත්‍රීපුරුෂ සමාජභාවය, වයස, ස්ථානය අනුව වර්ගීකරණය කරන්නටත් එක්සත් ජාතීන්ගේ මානවදයාවාදී කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ කාර්යාලය (OCHA) කැමති වී ඇත.

අවාසනාවකට වැඩමුළු දෙක පැවත්වීමට අවසර නොදුන් වග NRC කාර්යාලයට පසුව දැනගන්නට ලැබිණ. ඊට හේතුව සියළුම විදේශීය මානවදයාවාදී ආධාරකරුවන් ස්වකීය ක්‍රියාකාරකම් සංවිධානයව කිරීම සඳහා ආණ්ඩුවේ ආයතන සමග බද්ධ විය යුතුය යන නව රෙගුලාසිය ආණ්ඩුව පැණවීමයි. එබැවින්, මෙම යෝජිත වැඩමුළු ඉදිරි කාලයේදී ආණ්ඩුවේ අදාල ආයතන සමග බද්ධව අදාල නීති හා රෙගුලාසිවලට අනුකූලවෙමින් පැවැත්වෙනු ඇත. එකී අවස්ථාව මතු වි තිබෙන වැදගත් ප්‍රශ්න සාකච්ඡා කිරීමේ මණ්ඩපයක් වනු ඇතැ'යි බලාපොරොත්තු වනු ලැබේ. අචේ ප්‍රාන්තයේ අභ්‍යන්තරිකව අවතැන්වූවන් ආරක්ෂා කිරීම සඳහාත් ඔවුනට උදව් උපකාර කිරීම සඳහාත් දේශීය බලධාරීන් සමග ජාත්‍යන්තර ප්‍රජාව එකට එකතු කිරීම වැදගත්ය.

***බන්ඩා අචේ ප්‍රාන්තයේ අවතැන්වූවන් ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය භාරව සිටි එහි ව්‍යාපෘති කළමනාකාර ඇස්ට්‍රිඩ් සොෆි ආර්නේ ට FMR කතුවරු කෘතඥතාවය පළ කරති. විද්‍යුත් තැපෑල :astrid.arne@freewave.cc***

1.www.db.idpproject.org/Sites/IdpProjectDb/idpSurvey.nsf/wViewCountries/



UNHCR/J Austin

*බන්ඩා අචේහි අභ්‍යන්තරිකව අවතැන්වූවන්ගේ කඳවුරක් තුල පවත්වාගෙන යන තාවකාලික පාසැලක්, ඉන්දුනීසියාව*

# බලරහිත ගොදුරුද බලවන්ත දිවිගලවාගත් අයද?

ඉන්ග්විල්ඩ් සොල්වැන්ග්

ස්වයං ලෙස ආධාර උපකාර කරගන්නට, තැනට ඔබින සහාය ලබාගන්නට, ජනයා සතු හැකියාව පිලිගනිමින් සමතුලනයක් පවත්වා ගැනීමට මානවදයාවාදී සංවිධාන ක්‍රියා කළ යුතුය.

සුනාමියෙන් සතියකට පසු යුරෝපීය සහන සේවකයෙක් බන්ඩා අචේ ප්‍රාන්තයේ පිහිටි ජෙසුයිට් සරණාගත සේවා කාර්යාලයට පැමිණියේය. අභ්‍යන්තරිකව අවතැන්වූ ජනයා ප්‍රථම වරට තක්සේරු කිරීමේ මෙහෙවරයක යෙදුනු ඔහුට තම සංචාරයෙන් එලැඹුණු නිගමන අප සමඟ බෙදා හදා ගැනීමට අවශ්‍ය වී තිබිණ. තමන්ට අයිති බඩුබාහිරාදිය, මිතුරන්, පවුලේ සාමාජිකයන් අහිමිව සිටි ජන කොටස් මුණගැසීම නිසා ඔහු දැඩි චිත්ත පීඩාවකට හසුව සිටියේය. ඔහු "අනේ දුප්පත් අසරණයින්" යනුවෙන් ඔවුන් හඳුන්වන්නට පුරුදු වී සිටියේය. කඳවුරේ මුථතැන්ගෙය සඳහා තබන ලිප් අටවාගත් අන්දම ඔවුන් විස්තර කරද්දී ඒ කථාව ඔහුට අදහාගත නොහැකිවිය.

තාවකාලිකව අටවාගත් මඩුකුඩාරම්වල ජීවත්වන අවතැන්වූ ජනයා දුප්පත් අසරණයින් ලෙස පෙනුනත් මානවදයාවාදී සේවාදායකයින් ඔවුන් සම්පත්වලින් තොර කිසිවක් කරකියාගත නොහැකි පිරිසක් ලෙස සලකා ඔවුනට නිසි පරිදි ගරුනම්බු නොදෙනවානම් එය බලවත් වරදකි. සුනාමියෙන් දින ගණනකට පසු ජනකොටස් ලැගුම් ගෙන සිටි පාසැල් ගොඩනැගිල්ලක් වෙත ගිය මට පහත කියැවෙන සිද්ධියට මුහුණ දෙන්නට සිදුවිය. ගොඩනැගිල්ලට ඇතුථවන තැන රෙදි ගොන්නක් ගොඩ ගසා තිබුණි. කෙනෙකු රෙද්දක් දෙකක් ගොඩෙන් ගෙන මට පෙන්වූයේය: "මේ රෙදි අඳින්ඩ අපිට ලැජ්ජයි", ඔහු කීවේය. පැල්ලම් වැටුණු, තැන තැන ඉරුණු, රෙදි ගොන්න වෙත මම සමීප බැල්මක් හෙථවෙමි. "මේ තත්ත්වයේ දැන් හිටියට අපි හොඳ නම්බුකාර මිනිස්සු" ඔහු දිගටම කියාගෙන ගියේය. මීට වගකිවයුත්තේ සියථම සහනසේවා ඒජන්සි නොවේ. ගුණාත්මකභාවයට වඩා ප්‍රමාණාත්මකභාවයට මුල් තැන දෙමින්, අචේ ප්‍රදේශයට මේ කඩමාලු පිටත් කොට එවූ ඒජන්සියයි. බොහෝ සරණාගත පිරිස් ආණ්ඩුව සහ මානවදයාවාදී ආයතන බෙදා දෙන ක්ෂණික නූඩ්ල්ස් පැකට් කෑම වෙනුවට වඩා තමන්ට පුරුදු ආහාර වෙළඳපොලෙන් මිලදී ගෙන ඒවා පිසීම සඳහා උඳුන් මිලදී ගන්නට වුවත් සූදානම්වීමේ කාරණය මේ ආයතනවලට ග්‍රහණය කරගන්නට බැරි වී තිබේ.

ආපදාව හමුවේ ලෝකයේ සෙසු ජනකොටස් දැක්වූ ප්‍රතිචාරය ගැන අචේවාසී ජනකොටස් තුළ උණුසුම් හැඟීම් ජනිත වී තිබේ. මේ සමග තවත් සමහරු සුන්දර පලාතක් වශයෙන් ප්‍රසිද්ධව තිබූ අචේ පලාත සුනාමිය විසින් ගිලගැනීම ගැන දුක්වෙති. දළ රළ පෙල ගලාවිත් ඊට හමුවන සෑම දෙයක්ම රැ ගෙන යන අන්දම දැක්වෙන ඇඟ කිලිපොලා යන පැය ගණන් දිග වීඩියෝ දර්ශන පෙළ ඉන්දුනීසියාවේත් වෙනයම් තැන්වලත් අරමුදල් එකතු කරන්නට මහත්සේ දායක විය. තමා සන්තකයේ තිබූ සියල්ල අහිමිවූ නිවැසියන්, දෙමාපිය අහිමි වූ ළමයින්, රැල්ල විසින් තුරුලේ සිටි ළමුන් උදුරාගත් අන්දම කියැවෙන මව්වරුන්ගේ කතන්දර, අහිමි වූ දූවරු සහ පුතුන්ගේ ඡායාරූප පෙන්වමින් ඉබාගාතේ ඇවිදින පියවරුන් ආදී සියල්ලන්ගෙන් සමන්විත දර්ශන හේතුකොටගෙන අරමුදල් රැස්කිරීම පහසු විය. කෙසේවෙතත්, ගොදුරු බවට පත්ව සිටින්නේ අචේවාසී ජනතාවය, වීරයින් බවට පත්ව සිටින්නේ විදේශීය ඡායාරූප ශිල්පීන් සහ මානවදයාවාදී සහන සේවකයින්ය. දේශීය ප්‍රකාශකයින් පසුපස හඹායනවාට වඩා සේවයේ නියැලී සිටින විදේශිකයනට කථා කිරීම විදේශීය ජනමාධ්‍යකරුවන්ට පහසු විය. බටහිර රටවල වැඩි අවධානය තායිලන්තය වෙත යොමුවූයේ මේ හේතුව නිසා වන්නට ඇත. තමන්ගේ කථාව පුන පුනා කියන්නට තරම් සමත් විදේශික සංචාරකයන් පිරිසක් ඒ අවස්ථාවේ තායිලන්තයේ සිටියහ. ඒ මාධ්‍ය කාලය ඔවුන් ලබාගත්තේ දේශීය අවශ්‍යතාවන් ගැන කියන්නට දේශීය හඬට විවෘතව තිබූ කාලවේලා භාවිතා කරමිනි.

තනියෙන්ම දේවල් සංජානනය කරගන්නට ජන කොටස්වලට පුථවන්කමක් නැතැ'යි කෙනෙකු සිතුවොතින් බාහිර උදව් අනිවාර්යෙන්ම අවශ්‍ය බවත් සිතන්නට ඒ තැනැත්තාට සිදුවේ. එහෙත් විදේශීය ආධාර සැබෑ අවශ්‍යතාවන් පිරිමසාලන ඒවා නොවන්නට පුථවන. උදාහරණයක් වශයෙන්, අචේ ප්‍රාන්තයත් බැහැරව ජීවත්වන බොහෝදෙනා සිතන්නේ ස්වකීය දෙමාපියන් හෝ බාරකාරයින් හෝ අහිමිවූ ලමයින් එක්කෝ අනාථ ළමා නිවාසවලට යැවිය යුතුය කියාය, නැත්නම් දරුකමට හදාගැනීම සඳහා ජාවා දූපත්වලම තබා ගැනීමට හෝ පිටරට යැවීම වඩා සුදුසු බවය.

අචේ ප්‍රදේශවාසීන් ස්වශක්තිය හා නම්බුකාරකම සහිත මිනිසුන් පිරිසක් බව ප්‍රකටය. පොදුවේ ගත්කල පිටතින් උදව්උපකාර ගන්නට ඔවුන් මැළිය. මානවදයාවාදී ආයතනවලට වුවත් ඔවුන් විවෘත නැත. ආණ්ඩුවේ හමුදා සහ GAM බෙදුම්වාදී සංවිධානත් අතර දැනට දශක දෙකක් තිස්සේ කෙරීගෙන යන යුද්ධය හේතුකොටගෙන බාහිරෙන් පැමිණෙන පුද්ගලයන් සමග ගණුදෙනු කිරීමට අචේවාසීන් සැකමුසුවන අතර එනිසාම ස්වශක්තිය මත වැඩිපුර විශ්වාසය තබන්නට ඔවුහු පුරුදු පුහුණු වී සිටින්නාහ. කෙසේවෙතත් සුනාමියෙන් පසු අචේ පලාතේ පවතින අවශ්‍යතා සුවිශාලය. එහෙත් කිසිදු වැඩිදියුණුවීමක් එහි මේ තාක් දක්නට නැත. ප්‍රතිසංවර්ධන කටයුතු කවදා පටන්ගනීදැයි අචේ පලාත්වාසීහු නොයිවසිල්ලෙන් පසුවන්නාහ.

මේ අතරතුරේ බොහෝදෙනා ස්වකීය ගම්පලාත්වලට පැමිණ සුන්බුන් ඉවත් කරගන්නට පටන්ගෙන ඇත්තේ ආණ්ඩුවෙන් හෝ මානවදයාවාදී ප්‍රජාවන්ගෙන් හෝ කිසිදු ආධාරයක් නැතිවය. කඳවුරුවල ලැගුම්ගෙන සිටින අභ්‍යන්තරිකව අවතැන්වූ ජනකොටස් නැවත පැමිණ තම ගෙවල් දොරවල් ඉදිකර ගැනීමට අධිෂ්ඨාන කරගෙන සිටිති. පුලෝ අචේ ප්‍රාන්තයේ ලෝ සහ ලම්පුයන්ග් ගම්වල ඉන්න පිරිමින් ස්වකීය දූපත්වල ප්‍රතිසංස්කරණ කටයුතු කරමින් සිටින්නේ තම ප්‍රජාවන්ට නැවත ඒම සඳහා පහසුකම් සැලසීමටය.

සුනාමියෙන් පසු මාසයක් ගතවෙද්දී කඳවුරු භූමිය තුළ යාඥාකිරීම සඳහාත් ප්‍රජා රැස්වීම් පැවැත්වීම සඳහාත් පොදු ශාලාවක් ඉදිකිරීමට වැඩ ආරම්භ කර තිබුණි. ගමක් තනන්නට පුථවන් වන්නේ මෙවැනි කේන්ද්‍රීය ගොඩනැගිල්ලක් තැනුවායින් පසුවය. "අපි ආණ්ඩුව උදව් කරන කල් බලාගෙන ඉන්නේ නෑ. අපි අපේ ගම්වල පදිංචිවෙන්ට ඕනෑ. ඒ හන්දා අපි ආපහු එනවා," ඉදින් මෙවැනි ආරම්භක ක්‍රියා සඳහා ආයතන ආධාර කළයුතුය. දේශීය ජනකොටස්වලින් දැනුවත් වීම තුලින් එසේ කළ යුතුය.



Petteri Kokkonen/FinnChurchAid/ACT International

*සුනාමියෙන් පසු බටහිර වෙරළේ පිහිටි මියුලාබෝ නගරයේ මාළු වෙළඳපොලේ ව්‍යාපාරික කටයුතු ක්‍රමයෙන් යහපත් තත්ත්වයට හැරෙමින් පවති*

*ඉන්ග්විල්ඩ් සොල්වැන්ග් ඉන්දුනීසියාවේ තිබෙන ජෙසුයිට් සරණාගත සේවාවේ උපදේශක සේවා කළමනාකාරවරයාය. විද්‍යුත් තැපැල: solvang@jrs.or.id ඉන්දුනීසියාවේ ජෙසුයිට් සරණාගත සේවාවේ වෙබ් අඩවිය: www.jrs.or.id*

# ජනවාර්ගික ගැටුම, ශ්‍රී ලංකාවේ රාජ්‍යය සහ සුනාමිය

ජයදේව උයන්ගොඩ

*තත්ත්වාකර ද්විත්ව රාජ්‍ය ව්‍යුහයක් පවතින රටක ගැටුම්-සංවේදී සහ සාම-සංවේදී ප්‍රතිකාරක රාමුවක් ගොඩනගා ගැනීමේ හැකියාවක් තිබේද?*

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර යන පලාත්වල දෙමල ජනවාර්ගික රාජ්‍යයක් පිහිටුවීම සඳහා එල්ටීටීඊ සංවිධානය ගෙන යන දිගුකාලීන අරගලය 2002 පෙබරවාරයේ අත්සන් කළ සටන් විරාම ගිවිසුම නිසා අසීරු සාම මාවතකට අවතීර්ණ වී තිබේ. යුද පෙරමුණේ පෙරමුණු බැඳගෙන සිටින ආණ්ඩුවේ සෙබළුන් හා එල්ටීටීඊ සාමාජිකයන් අතර ඕනෑම මොහොතක ඇවිලෙන්නට නියමිතව තිබූ යුද ගිණිපුපුරු නිවාලන්නට සුනාමියේ අතිදැවැන්ත විනාශකාරී බලපෑමට පුළුවන් වූ සෙයකි. විනාඩි විස්සක් තරම් කාලයක් ඇතුලත සිද්ධ වූ 35,000 තරම් මරණ සංඛ්‍යාව ඇත්තෙන්ම අවුරුදු විස්සක් තිස්සේ දියත් වූ සිවිල් යුද්ධයෙන් මිය ගියවුන්ගේ සංඛ්‍යාවට සම විය. සුනාමිය නගර, ගම් හා ප්‍රජාවන් සෝදා හැරී අතර මිලියනයක තරම් ජනතාවකට, බහුතරය දුප්පතුන්ගෙන් සමන්විත ජනතාවකට, ගෙවල් දෙරවල් අහිමි කළේය.

ශ්‍රී ලංකාවේ ජාතික රාජ්‍යයේ අවිවාදිත නියෝජිතයා ද පශ්චාත් සුනාමි තත්ත්වයෙන් රට ගොඩනගන්නා ප්‍රධාන නියමුවා ද තමන් යැයි ආණ්ඩුව කියා සිටින අතරතුරේදී දෙමළ ජාතියේ "එකම නියෝජිතයා" තමන් යැයි එල්ටීටීඊ සංවිධානය ද කියා සිටී. එල්ටීටීඊ පාලනයට නතු ප්‍රදේශවල ජීවත්වන ජනයා හා සමානවම සුනාමියෙන් බැට කා ඇතැ'යි යන සිද්ධිවාචක සත්‍යය විසින් ප්‍රතිසංවිධාන ක්‍රියාවලියෙහිලා තමන්ද සමපාර්ශ්වකරුවෙකු හැටියට සැලකිය යුත්තේය යන එල්ටීටීඊ ඉල්ලීම තහවුරු වී ඇත්තේය. සටන් විරාම ගිවිසුම හා සාම සාකච්ඡාවල පහසුකාරකයා මෙන් කටයුතු කරන නෝර්වීජියානු ආණ්ඩුව ප්‍රතිසංවර්ධන කටයුතු පරීක්ෂා කිරීම සඳහා ගොඩනගන යෝජිත ඒකාබද්ධ යාන්ත්‍රණයේ ස්වභාවය, බලතල හා ක්‍රියාකාරිත්වය ගැන එකඟතාවයක් ඇති කරගැනීම සඳහා එල්ටීටීඊ සංවිධානයත් ආණ්ඩුවත් සමග දිගටම කටයුතු කරමින් සිටී.

මෙවන් පසුබිමක් යටතේ, සුනාමිය ඇති වූ වහාම පොරොන්දු වූ දැවැන්ත ජාත්‍යන්තර ආධාර රට තුලට ගලා ඒම සිදුවෙමින් තිබුනේ සෙමින්ය. මාර්තු අවසානයේ ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග කියා සිටියේ නිල වශයෙන් පොරොන්දුවූ මුදල්වලින් "ශත පහක්" හෝ භාණ්ඩාගාරයට නොලැබුණු බවයි. ස්වකීය පොරොන්දු වහාම චෙක්පත් හා නෝට්ටු බවට පෙරළන ලෙස ශ්‍රී ලංකාවේ විදේශ හා මුදල් අමාත්‍යාංශ නිලධාරීහු ජාත්‍යන්තර ප්‍රජාවට ආයාචනා කරන්නට පටන් ගත්හ. කෙසේවෙතත්, බොහෝ සම්පත් දායකයින් කල්පනා කළේ ආණ්ඩුවත් එල්ටීටීඊ සංවිධානයත් හවුලේ කටයුතු කිරීම සඳහා ගොඩනගන ඒකාබද්ධ යාන්ත්‍රණය මූල්‍ය සම්පත් නිකුත්කිරීම සඳහා නැතුවම බැරි ආයතනයක් බවය. ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාවේ පශ්චාත් සුනාමි ප්‍රතිකාරක ක්‍රියාවලිය දකින්නේ සාම සම්මුති සාකච්ඡා නැවත ආරම්භ කිරීම සහ සාම ක්‍රියාවලිය නැවත දියත් කිරීම සමග අනිවාර්යයෙන්ම බද්ධ වී තිබෙන්නක් හැටියටය.

ලංකාවේ තිබෙන පලාත්වලින් දැනට බරපතල ලෙස විනාශ වී ඇත්තේ උතුරු හා නැගෙනහිර යන පලාත් දෙකය. එහි දශක තුනක් තිස්සේ යුද්ධය කෙරී ගෙන ගිය අතර අභ්‍යන්තරිකව අවතැන් වූ ජනයා ඉතා විශාල ප්‍රමාණයක් නැවත සිය නිවෙස්වල පදිංචිවීමේ හෝ වෙනත් තැන්වල පදිංචිවීමේ අටියෙන් කඳවුරුවල වාසය කරමින් සිටින්නාහ. සිංහල, දෙමළ, මුස්ලිම් යන ජන කොට්ඨාශ තුනම වාසය කරන හෙයින් නැගෙනහිර පලාත සුවිශේෂය. මෙම මිශ්‍ර ජනවාර්ගික සංයුතිය ගැන කිසිදු තැකීමක් නොකොට එල්ටීටීඊ සංවිධානය මෙම පලාත ද ස්වකීය "පාරම්පරික දෙමල නිජබිම" ලෙස දක්වයි. එල්ටීටීඊ සංවිධානයේ බලයට නතු වී තිබෙන ප්‍රදේශවල වෙරළ තීරයත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට ළඟා විය නොහැකි "මුද නොගත් ප්‍රදේශ" ලෙස හඳුන්වන ප්‍රදේශයත් සුනාමියෙන් දරුණු ලෙස විනාශ වී ඇත.

සුනාමියට පෙරාතුව යුද්ධයෙන් වැනසී ගිය මේ පලාත් දෙක නැවත ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුවත් එල්ටීටීඊ සංවිධානයත් ජාත්‍යන්තර ප්‍රජාවත් අතරේ කිසියම් සහයෝගිතා රාමුවක් ගොඩනගා ගන්නට උත්සාහයක් දරනු ලැබීය. ආණ්ඩුවේත් එල්ටීටීඊ සංවිධානයේත් නොහැකියාවන්වලට පිළිසිඳුවන්නට එවැනි ආයතනික රාමුවක් බිහි කරන්නට දැරූ උත්සාහයන් කෙළවර වූයේ මඳ ජයග්‍රහණයකින්ය. එල්ටීටීඊ සංවිධානය යෝජනා කළේ විදේශ ආණ්ඩුවලින් හා ජාත්‍යන්තර ආධාර සංවිධානවලින් කෙළින්ම ආධාර ලබාගන්නා අන්දමේ යාන්ත්‍රණයක් ගොඩනැගිය යුතු බවයි. කෙසේවෙතත්, මේ යෝජනාව ආණ්ඩුව දුටුවේ මධ්‍යම ආණ්ඩුවේ බලාධිකාරය පිළිනොගෙන බෙදුම්වාදය ආයතනගත කිරීම සඳහා ක්‍රියාවට නංවන රැවටිල්ලක් ලෙසය.

දැනට පවත්නා යුධෝපායික තුලනය සුනාමි ආපදාව විසින් රාජ්‍යයේ වාසිය සඳහා නැවත සකස් කොට ඇතැ'යි යන ආරංචිය සුනාමියෙන් සති ගණනාවකට පසුව බරපතල ලෙස පැතිර යන්නට පටන් ගති. එල්ටීටීඊ සංවිධානයේ උත්තරීතර නායකයා වන වේළුපිල්ලෙයි ප්‍රභාකරන් මිය ගොස් ඇති බවත් එල්ටීටීඊ සංවිධානයේ නාවික අංශයට බරපතල හානි පැමිණ වී ඇති බවත් ඒවායෙන් කියැවිණ. ආණ්ඩුව සහ එල්ටීටීඊය අතර ඇතිවන්නට නියමිත සහයෝගිතා රාමුව හැඩගන්වන්නට මේ ආරංචි උපකාර විය. ඒ සමගම උතුර නැගෙනහිර පලාත්වලදී හානියට ලක්වූවන් බේරා ගැනීමේදී හා සහනාධාර බෙදදීමේදී ශ්‍රී ලංකා හමුද සෙබළුන් සහ එල්ටීටීඊ සාමාජිකයන් යන දෙගොල්ලන්ම ස්වෙච්ඡාවෙන් හා නිරායාසයෙන් එකිනෙකාට උදව් කරන්නට පටන් ගත්තේ යැයි කියැවෙන වාර්තා මේ සහයෝගිතා රාමු ගොඩනගන්නට තවත් ආධාර වූයේය. දෙපාර්ශවයම මුහුණ දුන් අභියෝගය වූයේ බිම් මට්ටමින් ගොඩනැගුණු එකිනෙකට උදව් කිරීමේ ක්‍රියාවලිය විධිමත් සහයොගිතා රාමුවක් ලෙස විපරිවර්තනය කිරීමය.

පශ්චාත් සුනාමි ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සඳහා මධ්‍යගත ව්‍යුහයක් ගොඩනැගීමෙන් ආණ්ඩුව පලාත්පාලන ආයතන නොතකා හැරියේය. සුනාමිය එක් අතකින් රටේ දේශපාලන-නිලධාරීවාදී ප්‍රභූන් අතරේ අත්‍යවශ්‍ය මධ්‍යගතභාවයක් පිලිබඳ හැඟීම තීව්‍ර කළ අතර අනෙක් අතට හානියට ලක්වන ප්‍රජාවන්ට ක්ෂණික වශයෙන් සහනාධාර සැපයීමෙහිලා මධ්‍යගත ව්‍යුහයක පවතින නොහැකියාවද ඉස්මතු කොට පෙන්වාලූයේය. පලාත්සභාවලට බලතල බෙදහැරීම කෙලවර වන්නේ ස්වකීය බලය හා අධිකාරය බාදනයට ලක් කිරීමෙන් බව දකින කොළඹ නිලධාරි පැලින්තිය පලාත් සභාවල බලය ශක්තිමත් කිරීම කඩාකප්පල් කරන්නට උපරිම අන්දමින් කටයුතු කරමින් සිටින්නාහ.

ප්‍රතිමත්තිමය වශයෙන් ඉස්මතු වූ තවත් අඩුපාඩුකමක් හේතුවෙන් මුස්ලිම් ජන කොටස් අතර නුරුස්නාවක් වර්ධනය විය. නැගෙනහිර පලාතේ මුස්ලිම් ප්‍රජාව සුනාමියත් දරුණු ලෙස විපතට පත්වූ නමුත් ඔවුනට ලැබුණු රජයේ උපකාරය අල්ප විය. මීට හේතුව රාජ්‍ය යන්ත්‍රයේ අකාර්යක්ෂමභාවය හා ඉතාමත් දැඩිව බෙදී සිටින මුස්ලිම් දේශපාලන නායකත්වයත් නිසාය. රාජ්‍යයේ ආකාර්යක්ෂමභාවය මුස්ලිම්වරුන් අර්ථ නිරූපණය කිරීමට පටන්ගත්තේ හිතාමතාම මුස්ලිම් ප්‍රජාවට එරෙහිව කරන අසාධාරණයක් ලෙසය. අනෙක් අතට රාජ්‍ය ආයතන විසින් සිංහල ප්‍රජාවත් එල්ටීටීඊ සහන සේවා ආයතනවලටත් ආධාර බාරදුන්විට එල්ටීටීඊ සංවිධානය ප්‍රථමයෙන් ඒවා බෙද හරින්නේ හානියට පත් දෙමළ ප්‍රජාව වෙතටය. ඊට අමතරව ආණ්ඩුව සහ එල්ටීටීඊ සංවිධානය අතර ඒකාබද්ධ යාන්ත්‍රණයක් ගොඩනැගීමේදී ඊට මුස්ලිම් දේශපාලන නායකයින්ගේ එනම් මුස්ලිම් ජනතාව සාකච්ඡා සහභාගීත්වය ලබා නොගත් හෙයින් බැහැරකිරීම නිසා හටගන්නා උද්වේගකාරී හැඟීම්වලින් මුස්ලිම් ජනතාව කැළඹී ගියේය.

ආණ්ඩුවත් එල්ටීටීඊ සංවිධානයත් යන දෙගොල්ලන්ම මානවදයාවාදී කටයුතුවලට මැදිහත්වන්නටත් ඒ පිලිබඳව මධ්‍යගත ආකාරයෙන් තීරණ ගැනීමටත් එකට එකතු වූයේ ඉහළ මට්ටම්වලින්ය. මේ රාජ්‍ය කේන්ද්‍රිය එලැඹුම විසින් හානියට පත්වූ ජනකොටස් සලකන්නේ නිෂ්ක්‍රිය මානවදයාවාදී ආධාරලාභීන් ලෙසය. මේ කාරණා වඩා තහවුරු වූයේ ආණ්ඩුවත් එල්ටීටීඊ සංවිධානයත් තහනම් වෙරළ කලාපයක් තුල නැවත ගොඩනැගිලි තැනීම සම්බන්ධයෙන් හානියට ලක්වූ ජනතාව නොවිමසා තීරණ ගත්




Paul Jeffrey/ACT International

යුද්ධයෙන් එකදිගට පීඩා විඳින ශ්‍රී ලංකාවේ වෙරළබඩ හමුදා කඳවුරු සහ වෙනත් ප්‍රදේශ අවට වළලා තිබූ බිම් බෝම්බ සුනාමියෙන් ගසාගෙන ගොස් සෑමතැනම විසිරී ඇත

අවස්ථාවේදිය. ආණ්ඩුව මේ තහනම් වෙරළ කලාපය මීටර 100ක තීරයක් වශයෙන් දැක්වූ අතර එල්ටීටීඊ සංවිධානය ඊටත් ඇතට ගොස් එම තහනම් කලාපය මීටර 300ක තීරයක් වශයෙන් දීර්ඝ කළේය. යහපත් අධිෂ්ඨානයෙන් සිදුකලත් මේ නිසා අසරණ වූ ජනයා මහත් බියට සහ අපහසුතාවයට ලක්විය. යහපත් ප්‍රතිඵල අපේක්ෂාවෙන් ගත් පියවරක් වුවද තහනම් වෙරළ කලාප ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් මහජනයාගේ අදහස් විමසා බැලීමේ යාන්ත්‍රණයක් හෝ ව්‍යුහයක් හෝ සංකල්පයක් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට මෙන්ම ප්‍රාදේශීය වශයෙන් දෙමළ ප්‍රජාව අතරින් මතුවෙනමින් එන දෙමළ දේශපාලන කොටස්වලටද නොමැති බවත් පැහැදිලි විය.

## සිවිල් සමාජ සංවිධානවල ප්‍රතිචාර හේතුකොටගෙන රාජ්‍යයේ නොහැකියාව පෙන්නුම් කෙරේ

මේ හදිසි තත්තවයට එල්ටීටීඊ සංවිධානය මුහුණ දුන්නේ මිලිටරි සූතථ්‍යභාවයෙන් යුතුව ඔවුන්ගේ මානවදයාවාදී කටයුතු මෙහෙයවන අංශය වන දෙමළ පුනරුත්ථාපන සංවිධානයේ (TRO) සහායට තම සාමාජිකයින් පෙළගස්වමිනි. එහෙත් ආණ්ඩුවේ ප්‍රතිචාරය නම් කල්වේලා ඉකුත් වූ අකාර්යක්‍ෂම එකක් විය. ආණ්ඩුවේ පරිපාලන යන්ත්‍රය මුළුමනින්ම වාගේ ක්‍රියාවිරහිත වී පවතිද්දී තනි පුරවැසියෝ, පුරවැසි කණ්ඩායම්, රාජ්‍ය නොවන සංවිධාන මෙම මහා විපත්තියෙන් පැය කීපයකට පසුව ක්‍රියාත්මක වන්නට පටන් ගත්හ. දිවි ගලවාගත් උදවියට ආහාර, ඇඳුම් පැලඳුම්, ඉඳුම් හිටුම් ලබාදීමෙහි නිරත වූ ඔවුහු ජීවත්ව සිටින්නන් ගලවා ගැනීමේ, සුන්බුන් ඉවත් කිරීමේ, ජීවත්ව සිටින්නන් හා මළකඳන් සෙවීමේ, ජාත්‍යන්තර වශයෙන් පුද්ගලික දනපතියන්ගේ සහාය ලබාගැනීමේ සියළු ක්‍රියාන්විත සංවිධාන කළහ. බස්නාහිර සහ දකුණු පලාත්වලදී හානියට ලක් වූ ජන කොටස්වල අවශ්‍යතා පිරිමැසීම සඳහා රාජ්‍යය කෙළින්ම වහාම මැදිහත්වීම් කළ යුතුව තිබුනත් බොහෝ අවස්ථාවල හානියට පත් ප්‍රජා කොටස් වෙත ළඟා වීම සඳහා ඊට දවස් පහේ සිට හත දක්වා කාලයක් ගත විය. සම්මුඛ සාකච්ඡාවලදී නිලධාරීන් හෙළිදරව් කර සිටියේ තම තනි තීරණවලට වැඩ ආරම්භ කිරීමට තමන් නොපෙළඹෙන්නේ මධ්‍යම ආණ්ඩුවේ චෝදනාවලට ලක් වේ යැයි යන බියෙනි.

සිවිල් සමාජ සංවිධානවල තීරණගැනීමේ ක්‍රියාවලිය තුල රාජ්‍ය අංශය තුල කොහෙත්ම දක්නට නොලැබෙන ශක්තිමත් නම්‍යශීලිතාවයක් තිබේ. රාජ්‍ය අංශයේ රජයන නිලධාරිවාදී රෙගුලාසිවලට කොටු නොවී ස්වේච්ඡා සේවකයින් පෙළගස්වන්නට රාජ්‍ය නොවන සංවිධානයකට පුළුවන. ඒ වාගේම ඔවුනට පහසුවෙන්ම ස්වෙච්ඡාවෙන්ම ඉදිරිපත් වන පුද්ගලයිනගේ හා පුද්ගලික දනපතියන්ගේ සහභාගීත්වය ලබාගන්නටත් පුළුවන. කෙසේවෙතත්, රාජ්‍ය නොවන සංවිධාන උසුලන මේ නම්‍යශීලිභාවය ආණ්ඩුවේ සහ ජනමාධ්‍යයේ සමහර කොටස්වල බලවත් දෝෂ දර්ශනයට මුහුණ දී සිටී. ඔවුන් තර්ක කරමින් ප්‍රකාශ කරන්නේ රාජ්‍ය නොවන සංවිධානවල හා ඒ සමග බැඳුණු පුද්ගල ක්‍රියාකාරීත්වය දූෂණයටත් අසම්බන්ධිත අසංවිධිත මැදිහත්වීම්වලටත් මග පෙන්වන බවයි. සිවිල් සමාජ සංවිධානවල වැඩසටහන් ඔස්සේ ජාතික ආරක්‍ෂාව අනතුරට පත්වන බැව් වැඩිදුරටත් ඔවුහු චෝදනා කරති. මන්ද කියනවානම්, එල්ටීටීඊ සංවිධානය සහනසේවා භාණ්ඩ සැපයීමේ මුවාවෙන් මිලිටරි හා වෙනත් යුද්ධමය ආම්පන්න ප්‍රවාහණය කරතැ'යි යන සැකය පවතින නිසාය.

සුනාමි ආපදාවට දක්වන ප්‍රතිචාරයත් ඇනහිට තිබෙන සාම ක්‍රියාවලිය ඉදිරියට ගමන් කරවීමත් ඉතාමත් සමීප ලෙස බැඳී පවතින්නකි. සුනාමි ආපදාව කෙරෙහි දක්වන සාධනීය කල්පවත්නා ප්‍රතිචාර තුළ ජනවාර්ගික හා දේශපාලන බෙදීම් අභිබවා යන පොදු එකඟතාවයක් තිබීම අවශ්‍යය. ඒ වාගේම එකී එකඟතාවය තුල ෆෙඩරල් ක්‍රමය විමධ්‍යගතකිරීම නම් යථාර්ථය වෙතට යොමු වූ ප්‍රතිසංස්කරණ තිබිය යුතුය.

ප්‍රතිසංවර්ධන ක්‍රියාවලිය තුල ප්‍රතිසංස්කරණ දක්නට නොමැත්තේනම් ඒ සඳහා ලැබෙන ජන සහභාගීත්වය ප්‍රශ්නකාරී වන්නට පුළුවන. "ඉහළින් පණවන ප්‍රතිසංවර්ධනය"ට එරෙහිව බලවත් විරෝධයක් මතු වී තිබෙන බව පෙනේ. සහනාධාර බෙදදීම තුළ දක්නට ලැබෙන රාජ්‍ය සහ නිලධාරීවාදී අකාර්යක්‍ෂමතාවන් ගැන මේ වනවිටත් බලවත් විරෝධතා මතු වී තිබේ. පශ්චාත් සුනාමි ප්‍රතිසංවර්ධනය යනු හුදෙක් ගොඩනැගිලි, මංමාවත් හා ආර්ථික යටිතල පහසුකම් ගොඩනැගීම නොවේ. හිටිහැටියේම වස්තු භංගත්වයට පත් වූ මිලියනයක් තරම් ජනකායකගේ ප්‍රජාව, ප්‍රජා ජීවිතය, ජීවනෝපාය යලි ගොඩනැගීමය. හානියට ලක්වූ ජන කොටස් ප්‍රතිනිර්මාණ ක්‍රියාවලිය තුල ක්‍රියාකාරී වැඩකොටසක් ඉටු නොකරන්නේ නම් එය දැඩි ලෙස ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලියක් වනවා ඇත.

ආණ්ඩුවත් එල්ටීටීඊ සංවිධානයත් අතර වැටී තිබෙන මෙම දුර්ග මාර්ගය තරණය කිරීම සඳහා "ගැටුමත් සමථයත් යන දෙකම ගැන සංවේදිවීම" නම් සංකල්පය විසින් මාර්ගෝපදේශකත්වය දෙනු ලැබූ සහයෝගිතා රාමුවක් එම ආයතන දෙකටම සිවිල් සමාජ සංවිධාන විසින් යෝජනා කොට තිබේ. ඒ වාගේම "පශ්චාත් සුනාමි" ප්‍රතිකාරය සහ ප්‍රතිනිර්මාණය "පශ්චාත් ගැටුම්" ප්‍රතිසංවර්ධනය සහ ප්‍රතිනිර්මාණය සමග බද්ධ කරවීමේ අවශ්‍යතාවය ද ඔවුහු ඉස්මතු කොට දක්වා තිබේ. එපමණක් නොව, පාර්ශ්ව දෙක අතර විධිමත් රාමුවක් ගොඩනගා ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා ආරම්භ කිරීමේ වැදගත්කමත් එම සංවිධාන විසින් පෙන්වා දී ඇත. මක්නිසාදයත්, මෙවැනි සහයෝගීතාවයන්ගේ ස්වභාවය සහ ගමන්මාර්ගය පාලනය කිරීමට සටන් විරාම ගිවිසුම වැනි දෙයක් අපොහොසත් බැව් මේ වනවිටත් පැහැදිලි වී ඇති නිසාය. සටන්විරාම ගිවිසුම වූකලි ආණ්ඩුවත් එල්ටීටීඊ සංවිධානයත් අතර තිබිය යුතු මිලිටරි සබඳතා නිර්වචනය කරන විධිමත් ගිවිසුමක් පමණි.

ප්‍රතිසංවර්ධන කටයුතු සහ පශ්චාත්-ගැටුම් සමථයන් පහත සඳහන් ප්‍රතිපත්ති මත පදනම් විය යුතු බවට සිවිල් සමාජ කණ්ඩායම් තර්ක කරති:

- සුනාමි හුදු ස්වභාවික විපතක් ලෙස නොදැකිය යුතුය. සහනසේවා සහ ප්‍රතිසංවර්ධන ප්‍රතිචාර දැක්වීමේදී ජනවාර්ගික ගැටුම සහ සාම ක්‍රියාවලිය සිහියේ තබාගත යුතුය.
- සිංහල, දෙමල සහ මුස්ලිම් යන සියළුම ප්‍රජාවන්ට එකසමාන ලෙස සැලකිය යුතු අතර සහභාගීත්වය සඳහා ඔවුන් වඩ වඩාත් දිරි ගැන්විය යුතුය.
- ජීවිත සහ දේපොල හානියේ තරම සලකා බලනවිට උතුරු හා නැගෙනහිර පලාත්වලට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.
- පශ්චාත්-සුනාමි ක්‍රියාවලියේදී ආණ්ඩුවත් ජාත්‍යන්තර ප්‍රජාවත් එල්ටීටීඊ සංවිධානයේ භූමිකාව නොසලකා නොහැර එම සංවිධානය සමග හවුලක් ගොඩනගා ගත යුතුය.

ආණ්ඩුවත් එල්ටීටීඊ සංවිධානයත් පශ්චාත්-සුනාමි අවකාශය නව දේශපාලන ක්‍රියාවලියක් ආරම්භ කිරීම සඳහා යොදගත යුතුය. සටන් විරාම ගිවිසුමට සමාන්තරව මානවදයාවාදී වැඩපිළිවෙලක් සඳහා විධිමත් එකඟතාවයකට එලැඹීම අනිවාර්යයෙන් කළ යුත්තකි.

*ජයදේව උයන්ගොඩ කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අංශයේ ප්‍රධානියාය. Polity සඟරාවේ කතුවරයාය. සමාජ විද්‍යා සංගමයේ සභාපතිවරයාය. විද්‍යුත් තැපැල: uyangoda@cmb.ac.lk මෙම ලිපිය www.fmreview.org/pdf/uyangoda.pdf නම් වෙබ් අඩවියේ පළවූ දිගු ලිපියක සාරාංශයකි.*

# පශ්චාත් සුනාමි මනෝ සාමාජීය ක්‍රියාකරකම් වල ආවර්ජනය

ආනන්ද ගලප්පත්ති

*ජාත්‍යන්තර මාධ්‍යයන්ගේ සහ ආධාර ආයතනයන්ගේ සැලකිලිමත් වීම් වල යොමු කරවීමක් වශයෙන් මනෝ සාමාජීය මැදිහත්වීම්, හදිසි අවස්ථාවන් වලදී ප්‍රතිචාරයන් සඳහා ප්‍රධාන තැනක් ගන්නා ලදී. මැදිහත්වීම් ඉක්මනින් දියත් කල නමුත් සම්බන්ධීකරණය දුර්වල වූ අතර වසර ගනනාවක පූර්ව-සුනාමි ගැටුම් ආශ්‍රිත මනෝ සාමාජීය වැඩසටහන් මගින් උගත් පාඩම් සැලකිල්ලට නොගන්නා ලදී.*

සුනාමි ව්‍යසනයෙන් පසු පළමු සති දෙක තුලදී මානව හිතවාදී ආයතන, ශ්‍රී ලංකා ආණ්ඩුව, ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (LTTE), දේශිය සහ ජාත්‍යන්තර හදිසි ප්‍රතිචාර කණ්ඩායම්, සහ මඩකලපුවේ, නැගෙනහිර නගර සීමාවේ සිටින පොදු ජනයා ආහාර, ඇඳුම්, නිවාස, සහ වෛද්‍ය සේවාවන් සපයා දීම ගැන අවධානය යොමු කරන ලදි. භයංකර අත්දැකීම් සහ ප්‍රබල පෞද්ගලික අභිමිවීම් වලට මුහුණ දුන් වැඩිහිටියන් සහ ළමයින් ගේ ක්ෂතිමය තත්වයන් ඇමතීමේ අවශ්‍යතාවය, ප්‍රාදේශිය මානසික සෞඛ්‍ය ක්‍රියාදරයන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වූ ජාත්‍යන්තර වාර්තාකරුවන් විසින් ඉතා ඉක්මනින් මතු කරන ලදී.

වඩාත් යෝග්‍ය මනෝ සාමාජීය මැදිහත්වීම පිළිබඳ අදහස් වෙනස් වූ මාර්ගයන් ගත්තේය. ප්‍රාදේශිය රාජ්‍ය නොවන සංවිධාන (විශේෂයෙන්ම මනෝ සාමාජීය වැඩසටහන් පිලිබඳ අවම වූ අවබෝධයන් ඇති) සහ ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශයන් වලින් පැමිණි සැලකිලිමත් වන කණ්ඩායම් සුනාමි විපතින් දිවි ගලවාගත්තන්ට උපදේශන සේවා සැපයීමට උත්සුක විය. දැනටමත් ප්‍රාදේශියව ක්‍රියා කරන උපදේශකයන් කිහිපදෙනෙක් හැරුනු කොට මෙම සේවාවන් සපයන් ලැබූයේ දින කිහිපයකින් පුහුණුව ලැබූ ස්වෙච්ජා සේවකයින් මගින් හෝ දිවයිනේ වෙනත් ප්‍රදේශයකින් පැමිණි කණ්ඩායම් මගිනි. “උපදේශකයන්” (ඉතා සුළුවෙන් පුහුණුව ලැබූ අය සමග පවා) සමග ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීම මගින් තම පවුලේ සාමාජිකයන්, නිවාස, හෝ ජීවනෝපායන් අභිමිවීමට මුහුණ දුන් සහ තාවකාලික කඳවුරු වල නේවාසිකව සිටින පුද්ගලයින්ට චිත්තවේගී සහනයක් ලැබෙන බවට පුළුල්ව පිළිගත් අනුමානයක් පැවතියේය.

මෙම මතයේ ප්‍රතිපලයක් වශයෙන් ව්‍යසනයෙන් පසු සති දෙකක් ඇතුලත කුඩා උපදේශණ කණ්ඩායම් අවතැන් වූ පුද්ගලයින් සමග කතා කිරීමට කඳවුරු වලට පිටත් කර හරින ලදී. කඳවුරු වල පැවති අස්ථාවර තත්වයන් නිසා (විසිරුණු ජනගහනය, පරිපාලනයේ සහ සහනාධාර බෙදා දීමේ දුර්වලතාවයන්, කඳවුරු වැසීමේ හා නිසි ප්‍රමාණයට වඩා ගාල් වීමේ තර්ජනයන්) මෙවැනි “උපදේශකයන්” නිරතුරුව ඔවුන්ගේ සැසි වාර සාමාන්‍යයෙන් තමාගේ කථාව කීම සඳහා කාංසාවෙන් යුතු වන විශාල ව්‍යාකුල පිරිසක් සමග බව වාර්තා කළේය. තවද, මෙම සැසි පුද්ගලයන්ට වඩාත් ගැඹුරු උපකාරයන් හෝ පසු-විපරම් අවස්ථාවන් කිහිපයක්ද ඉදිරිපත් කළේය. මෙවැනි අත්දැකීම් නිරන්තරයෙන්ම “උපදේශකයින්ව” යටපත් කර දැමූ සහ ඉච්ජාභංගවූ හැඟීම් සමග ඉතුරු කරවනු ලැබීය.

සුනාමි ව්‍යසනයට පෙර වසර ගනනාවක් තිස්සේ පැවති සන්නද්ධ ගැටුම් සන්දර්භය තුල මෙම දිස්ත්‍රික්කයේ මනෝ සාමාජීය මැදිහත්වීම් දියත් කල පුද්ගලයන් සහ සංවිධානයන් මගින් පැහැදිලිවම මීට ප්‍රතිවිරුද්ධ ප්‍රවේශයක් යෝජනා කළේය. මෙම පර්යාවලෝකය ව්‍යසනයෙන් පසු මෙම උග්‍ර අවදියේදී බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ සමාජ සහ භෞතික අවශ්‍යතා සොයා බැලීම උපකාර සැපයීමේ මූලික ආකෘතිය ලෙසට ප්‍රමුඛත්වය ලැබුනි. ඔවුන්ගේ අත්දැකීම් හෝ අපහසුතාවන් පිළිබඳ ඔවුන් විසින්ම සංවාදයක් ආරම්භ කලහොත් පමණක් දිවි ගලවාගත්තවුන්ට සහයෝගාත්මක සවන්දීම සහ “මිතුරන් සේ පෙනී සිටීම” උනන්දු කලද, ආරම්භක මැදිත්මක් වශයෙන් “උපදේශක” උත්සහයන් ඉතා තදින් අධෛර්යමත් කරන ලදී. මෙම මතය මෙම දිස්ත්‍රික්කයේ මින් පෙර සේවා සැපයීමේ අත්දැකීම් මගින් මෙන්ම පිලිගත් ජාතික සහ ජාත්‍යන්තර මගපෙන්වීම් මගින්ද මෙම මතය තහවුරු කර ඇත.

මෙම ප්‍රවේශය පැහැදිලිවම “චිකිත්සක” ලෙස පෙනෙන ක්‍රියාකරකම් අඩුවේ නිරූපනයක් විය. නිදසුනක් වශයෙන් වෙන් වුනු ළමයින් සමග ක්‍රියාකරන ආයතන විසින් ළමයින්ව පවුලේ සාමාජිකයෙකු හෝ පුරුදු රැකබලා ගන්නෙකු සමග නැවත එක් කිරීමට උත්සහ දරයි. සමහරෙක් කඳවුරු වල ලිංගික අතවරයන් පිලිබඳ කාන්තාවන් ගේ සැලකිලිමත් වීම් සඳහා කඳවුරු භූමිය තුලම කාන්තාවන්ට නිදාගැනීමට සහ නෑමට ආරක්ෂිත ස්ථාන සූදානම් කිරීම මගින් ප්‍රතිචාර දක්වයි. අනෙක් අය ආධාර ලබා ගැනීම, වන්දි, නිවාස සහ අවතැන් වූවන්ට බොහෝ කරදර සහ අවිනිශ්චිතතාවන්ට පත්කරනු ලබන වෙනත් කරුනු වලට අදාල ක්‍රියාමාර්ගයන් පිළිබඳව පැහැදිලි ලිඛිත තොරතුරු නිකුත් කරන ලෙසට රාජ්‍ය නිලධාරීන්ට බලකරයි. ළමයින් සමග කරන ලද බොහෝ මැදිහත්වීම් දිශානත වී පැවතියේ පාසැල් ආරම්භ කිරීමට භෞතික ආධාර දීම හෝ පහසුකම් සලස්වන ලද සෙල්ලම් ක්‍රියා යෝජනා කිරීම හරහා ඔවුන්ගේ දෛනික ජීවිතයට ව්‍යුහයක් සපයා දීම වෙනුවෙන්ය.

### සම්බන්ධීකරණයේ අවශ්‍යතාවය

මඩකලපුවේ මනෝ සාමාජීය අංශයේ මානව හිතවාදී ප්‍රතිචාරයන් සීග්‍ර ලෙස ව්‍යප්ත වීමත් සමග ආධාරක ආයතන මෙම ආයතනයන්ගේ මැදිහත්වීම් ප්‍රමාණය වැඩිකිරීමට බල කල සිටි අතර නව ක්‍රියාදරයන් ක්ෂෙත්‍රයට ඇතුලු විය. විවිධ ක්‍රියාත්මක ආයතන විශේෂිත වූ ජනගහනයන් සමග ක්‍රියා කිරීමට ඔවුන්ගේ ඇති කැමැත්ත නිසා එකිනෙකා මතට පෙරලීමට ගත් හෙයින් ගැටුම් සහ නො-එකඟතාවයන් මතුවිය. නිදසුනක් වශයෙන් දැනටමත් වෙනත් ආයතනයක් ඊට සමාන ක්‍රියාකරකම් අරඹා ඇති කඳවුරක ළමයින් සමග සෙල්ලම් ක්‍රියා කිරීම. කොළඹ හෝ වෙනත් රටකින් පැමිණෙන පුහුණුකරුවන්ට සහ උපකාරක ක්‍රියාදරයන්ට ප්‍රාදේශිය තත්වයන්, හැකියාවන් හෝ අවශ්‍යතාවයන් පිළිබඳව

*ශ්‍රී ලංකාව හාත්පසින් අපහසුවෙන්-උගත් පාඩම් නොසලකා හැර ඇත.*

ප්‍රමානවත් තොරතුරු නොලැබේ.

ගෝලීයව සහ ශ්‍රී ලාංකීයව මනෝ සාමාජීය ක්‍රියා සඳහා වූ විවිධ න්‍යායාත්මක සහ ප්‍රායෝගික ප්‍රවේශයන් මඩකලපුව තුල අනුකලක මනෝ සාමාජීය අංශයක් වර්ධනය සඳහා අභියෝගයන් ඉදිරිපත් කරයි. දේශියව සහ ගෝලීයව මෙම ක්ෂෙත්‍රයේ ඇති වාදයන්ගේ විවාදාත්මක ස්වරූපය විවිධ වූ පර්යාවලෝකයන් සහ ක්‍රමවේදයන් තනි රාමුවක් තුලට සකසා ගැනීම අපහසු කර ඇත. කෙසේ වෙතත් මඩකලපුව දිස්ත්‍රික්කය තුල මනෝ සාමාජීය ක්‍රියා කරන්නන්ගේ පුළුල් ඒකාබද්ධ වීම ශක්තිමත් කිරීමට නම් මෙවැනි ප්‍රවේශයක් ගොඩනැගීම වෙන්ව කටයුතු කිරීමට වඩා අත්‍යවශ්‍ය බව පෙන්නුම් කරයි.

මේ වන විට මනෝ සාමාජීය ක්‍රියාදරයන්ගේ කණ්ඩායම[1] විසින් ඉදිරිපත් කරන ලද සංකල්පීය රාමුව භාවිතා කරමින් පවතී. දේශියව මෙන්ම ගෝලීයව නිරතුරුව සිදුවන්නාවූ ප්‍රවනතාවයක් මෙන් - සේවා සැපයීමේදී ප්‍රජා සංවර්ධනය සහ මානසික සෞඛ්‍ය ප්‍රවේශයන් අතර ද්විධාකරණයක් ඉස්මතු කිරීම වැලැක්වීමට උත්සහ දරමින් ඇත. දේශිය සම්පත් ප්‍රමාණවත් නොවීම යන සන්දර්භය තුල - විශේෂයෙන්ම අතිශය ශෝකී හෝ උග්‍ර අවස්ථාවක සිටින


UNICEF/HQ05-0173/Shehzad Noorani

සුනාමියට හසුව මිය ගිය ස්වකීය මව/මිත්තණිය ගේ දියණිය/සොයුරිය ගේ සොහොන් මත ඉටිපන්දම් දල්වන මවක් සහ පුතුන් දෙදෙනෙක්, පියදිගම, හික්කඩුව, ශ්‍රී ලංකාව

පුද්ගලයන් විශේෂඥයක් වෙත යොමු කිරීමේදී ලබා ගත හැකි සියලුම සේවාවන් සජීවිකිරීමේ සහ ශක්තිමත් කිරීමේ ප්‍රායෝගික අවශ්‍යතාවයක් ඇත.

මේ වන විට දිස්ත්‍රික්කය තුල ලබා ගත හැකි මනෝ සාමාජීය මැදිහත්වීම් සඳහා නිදසුන් වශයෙන් ස්වේච්ඡා සේවකයන්ගේ අත්දැකීම් පිලිබඳ තොරතුරු අනාවරනය කර ගැනීම, පුද්ගලික සේවාදායකයන් සඳහා උපදේශන සැසි, මානසිකව රෝගීවූවන් සඳහා මනෝ චිකිත්සක මැදිහත්වීම්, වැඩිහිටියන් සඳහා තේ පැන් කණ්ඩායම් සැකසීම සහ පුද්ගලයින්ගේ නැතිවූ පවුල් වල නිවෙස් බැලීමට යාම. තවද, වෙන්වූ ළමයින්ව ඔවුන්ගේ කැමැත්තෙන් තෝරා ගන්නා ඥාතියෙකු සමග තාවකාලික පිලිදැඟුම්-රැකබලා ගැනීම සඳහා සැලසුම් කිරීම, කඳවුරු වල අවතැන් වූ ළමයින් වෙනුවෙන් ක්‍රමවත් සෙල්ලම් ක්‍රියා ඇති අතර ලිංගික අතවරය හෝ ප්‍රචණ්ඩත්වය පිලිබඳ අවධානම සහ බිය තුරන් කිරීම සඳහා ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ස්ථානගත කිරීමේදී කාන්තාවන් ගෙන් සහ ළමයින් ගෙන් තොරතුරු විමසීම සහතික කිරීමේ උත්සහයන්ද ඇත.

මීට අමතරව, මෙයින් ක්‍රමානුකූල හෝ තිරසාර වූයේ ස්වල්පයක් වුවද; ගුරුවරුන්ට, සෞඛ්‍ය සේවකයින්ට, ප්‍රජා-මූල ක්‍රියාදරයන්ට, සහ ස්වේච්ඡා සේවකයින් සඳහා විශාල වශයෙන් පුහුණුවීම් ලබා දෙන ලදී. කෙසේ වෙතත් ස්වයං-නියෝගයන්ට පමණක් යටත් වුණු බාහිරින් පොළඹවන ලද මනෝ සාමාජීය සේවාවන් සැපයීමේ යථාර්ථය ගත් කල දිස්ත්‍රික්කය තුල ක්‍රියා කිරීමට ආරම්භ කරන ලද්දවුන් සමග එලදායී ලෙස යොමුවීම මිස වෙනත් විකල්පයන් ඉතා අවම බව පෙන්නුම් කරයි.

සුව කිරීම සහ යහ පැවැත්ම සඳහා වන වෘතිමය සහ සාම්ප්‍රදායික ප්‍රවේශයන් සමහර අවස්ථාවලදී අසංගත වේ. සම්පූර්ණයෙන්ම වෙනස් වූ සාරධර්මයන් සහ ආකෘතීන් වෙනුවෙන් පෙනීසිටින ප්‍රවේශයන් සම්බන්ධ කිරීම පිලිබඳ සත්‍ය සැලකිලිමත්වීම් ඇත. වෘතිමය මැදිහත්වීම් වල පැහැර හැරිය නොහැකි බව සහ ගැමි/ප්‍රාදේශීය පර්යාවලෝකයන් වෙනුවෙන් ඇති කැපවීම අතර ආතතිය, සුනාමි ව්‍යසනය සිදුවීමේදී නැවත වරක් කලින් සඳහන් වූවට පක්ෂව විසදී ඇත.

ගුණාත්මක මනෝ සාමාජීය සේවාවන් පිහිටුවීම සහ පවත්වා ගෙන යාම පිළිබඳව වූ අභියෝගයන් ගැන ශ්‍රී ලංකාව හාත්පසින් අපහසුවෙන්-උගත් පාඩම් සහ තිරසාර සහ සමාජ සංස්කෘතිකව-උචිත මැදිහත්වීම් පිළිබඳ හොඳ නිදසුන් නොසලකා හැර ඇත. ආධාර කරන්නන්ගේ බලපෑම, ශ්‍රී ලංකාවේ මනෝ සාමාජීය වැඩසටහන් පිළිබඳ සුළු සෙර දැනුමක් ඇති සේවා මඩුල්ලක ගලා ඒම, දේශීය ආයතනයන්හි ප්‍රලේඛනයන්ගේ හිඟකම හෝ ආයතනයේ මතකය, සහ අන්තර්-සංස්කෘතික මනෝ සාමාජීය සේවාවන් පිහිටුවීමට ඇති කැපවීමේ අඩු බව යන සියල්ල මෙම නොසැලකිලිමත් බවට දායක වී ඇත. කෙසේ වෙතත් බලපෑමට ලක්වූ ජනගහනයේ බොහෝ අපහසුතාවයන් (බහු-වියෝව, පුනරාවර්තනය වන අවතැන් වීම, ජීවන මාර්ග අහිමි වීම, සමාජ භූමිකාවන් අවුල් වීම, හෝ ළමයින්ගේ වෙන්වීම) වසර ගනනාවක පැතිර පැවති ගැටුම්කාරී සමයේදී අත්දකින ලද අහිමිවීම් සහ අත්හදා බැලීම් වලට සමාන බව තේරුම් ගැනීම වලක්වන ලද්දේ සුනාමි ව්‍යසනයේ අසාමාන්‍ය ස්වභාවය විය හැක. සමහර විට පසුව සඳහන් කරන ලද්ද සමග ගනු දෙනු කිරීමට වැඩසටහන් කේන්ද්‍රිය ප්‍රතිචාරයන්ගේ සහ ගැමි පියවරයන්ගේ සාර්ථකත්වයන් පරීක්ෂාකිරීම මගින් කුමක් හෝ ප්‍රයෝජනවත් යමක් රැස්කර ගත හැක.

“බොහෝ ඉක්මන, වේගයේ අඩු බව යන ප්‍රත්‍යක්ෂය සුනාමි විපතට පත් ජනගහනයට ප්‍රවේශයක් සලසා දිය යුතු යෝග්‍ය සහ ගුණාත්මක සේවාවන් සැපයීමේදී පමණට වඩා උචිත බවක් පෙනෙන්නට තිබේ. සුනාමි විපතින් බලපෑමට ලක්වූ පුද්ගලයන් වෙනුවෙන් කරන්නාවූ සීඝ්‍ර මැදිහත්වීමට ඇති බාහිර කැපවීම, උපකාර අව්‍යවන්නන් සඳහා තර්කාන්විත සහ සංගත මැදිහත්වීම් ලබා දීම සඳහා ඇති සැලකිල්ල වෙනුවෙන් එකිනෙකා අතර සැලසුම් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ආයතනික අවශ්‍යතාවයක් ගැන වූ දැනුවත් බව මගින් පන්නරය සහ මග පෙන්වනු ලද වීම තීරණාත්මකය. ව්‍යසනයෙන් මාස කිහිපයකින් පසු වුවද, මැදිහත්වීම් වලට දිගු-කාලීන (සහ ඉවසිලිවන්ත) ප්‍රවේශයක් ගන්නා ලද ආරම්භකයන් ඔවුන්ගේ සේවාවල සාර්ථකත්වයේ සහ තිරසාරබවේ අර්ථයෙන් දැනටමත් ප්‍රථිඑලයන් නෙලා ගනිමින් පවතී.

***ආනන්ද ගලප්පත්ති Intervention (මැදිහත්වීම) සඟරාවේ කතෘ සහ Mangrove මනෝ සාමාජීය උපකාරක සහ සම්බන්ධීකරණ අංශයේ මනෝ සාමාජීය උපදේශක / සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරයි. (www.themangrove. blogspot.com). විද්‍යුත් තැපෑල: agalaps@eureka.lk***

*ආනන්ද ගලප්පත්ති විසින් 2005, වෙලුම 3, අංක 1, පිටුව 65-69, Intervention (මැදිහත්වීම) සඟරාවේ රචිත “සුනාමියෙන් පසු මනෝ සාමාජීය ක්‍රියාකාරකම්: නැගෙනහිර ශ්‍රී ලංකාවේ, මඩකලපුවෙහි සේවා සැපයීමේ අභියෝගයන් (Psychosocial work in the aftermath of the tsunami: challenges for service provision in Batticaloa, Eastern Sri Lanka) යන ලිපියෙන් උපුටා ගන්නා ලදී. Intervention (මැදිහත්වීම) යනු යුධමය ගැටුම් පවතින ප්‍රදේශයන් වල මානසික සෞඛ්‍ය, මනෝ සාමාජීය ක්‍රියාකාරකම් සහ උපදේශනය පිලිබද දැනුම බෙදා හැරීම වෙනුවන් කැපවූ සඟරාවකි. සම්බන්ධීකරු: Guus van der Veer, Editor-in-chief, Intervention, Tulpenburg 31, 1181 NK Amstelveen, The Netherlands. ෆැක්ස් +31 20 647 4580. විද්‍යුත් තැපෑල: intervention@wtfi.nl*

1.www.forcedmigration.org/psychosocial

# සුනාමියෙන් පසු ශ්‍රී ලංකාවේ ජීවනෝපායයන්

සයිමන් හැරිස්

*ශ්‍රී ලංකාවේ ජීවනෝපායන් සුනාමියේ මූලික විනාශයට හසුවූවා පමණක් නොව ඒවා රජයේ සහ මානවදයාවාදී සහන ප්‍රජාවේ පශ්චාත් ආපදා ප්‍රතිචාරාත්මක ප්‍රතිපත්ති සහ භාවිතාවල බලපෑමටද නතු විය.*

මෙහිදී ඉදිරිපත් කරන්නේ අවතැන් වූ පුද්ගලයින් සහ සහන සේවකයින් විසින් සුනාමියෙන් මාස 5කට පමණ පසු කතුවරයාට ඉදිරිපත්කල තම අත්දැකීම් පිළිබඳ කථාවල සාරාංශයයි. ඒවා තුළ පශ්චාත් සුනාමි ශ්‍රී ලංකාවේ මතුවී ඇති ජීවනෝපායන් පිළිබඳ කේන්ද්‍රිය වාද විෂයයන් කිපයක් මතු වී තිබේ. ඒවා අතර විශේෂ වන්නේ තරඟකාරී මානවදයාවාදී බහුආයතනික මැදිහත්වීම්වල බලපෑම, ප්‍රතිසංස්කරණ කර්මාන්තයේ බලපෑම, තහනම්කල වෙරළ තීරයේ බලපෑම් සහ රජයෙන් වන්දි ලබා ගැනීමේදී ඇතිවන පමාවීම් වැනි කාරණයන්ය.

## ධීවර කාර්මිකයා

තම බෝට්ටුව සුනාමියෙන් විනාශයට පත්වූ ධීවරයෙක් ගනිමු. එය සාමාන්‍ය මාළු ප්‍රමාණයක් අල්ලා ගැනීමට උදව් වූ බෝට්ටුවක් විය. එය ඔහු ධනවත් කිරීමට ප්‍රමාණවත් නොවුනද, ඔහුට යහපත් ජීවිතයක් ගතකිරීමට ප්‍රමාණවත් විය. තමන්ට වෙනත් බෝට්ටුවක් ලබාදීමට රජය ඉදිරිපත් වී සිටියත් මාස ගණනක් බලාගෙන සිටියද කිසිවක් සිදුවී නොමැත. කෙසේවුවද, සුනාමියෙන් පසු ජාත්‍යන්තර මානවහිතවාදී සංවිධාන මෙහි පැමිණියහ. ඉන් ඇතැමුන්ට ප්‍රජා සාකච්ඡා සහ සහභාගිත්ව ක්‍රම මගින් ධීවරයන්ගේ අවශ්‍යතාවලට පිළිතුරු ලබාදෙන්නේ කෙසේදැයි දැන ගැනීමට අවශ්‍ය වූයේ තමන් වෙත තිබූ මුදල් හැකි පමණ ඉක්මණින් වියදම් කිරීමටයි. ඔවුන්ට අවශ්‍යවූයේ ධීවරයාට ණයක්, ප්‍රදානයක් හෝ ඇතැම්විට සමුපකාර එකතුවක කොටසක් හෝ ලබාදීමටයි. එක් රාජ්‍ය නොවන සංවිධානයක් ධීවරයන්ට අළුත් දැල් ඔරු ලබාදීමට කැමැත්තෙන් සිටියේය. තවත් සංවිධානයක් එක් පුවරුයකින් සමන්විත විශාල බෝට්ටු ලබා දුන් අතර තවත් සංවිධාන පිටතින් සවිකරන මෝටර් සහිත බෝට්ටු ලබා දෙන්නට උනන්දුවක් දැක්විය. ඉදින් ධීවරයන්ට තිබුනේ තෝරාගැනීම පිළිබඳ ප්‍රශ්නය. ධීවරයෙකුට වඩු කාර්මිකයෙකු හෝ මේසන්වරයෙකු හෝ ලෙස ප්‍රතිපුහුණුවක් ලබාගැනීමට හැකි විය. නැතහොත් පරිඝනක භාවිතය පිළිබඳ පුහුණුවක් ලබා ගතහැකි විය. එසේත් නැතහොත් තවත් දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් පිහිටුවා ආධාර මුදල් ලැබෙන්නට පටන්ගත් දා සිට මතුවී ඇති සිය ගණනක් වූ එවන් සංවිධාන සමග තරඟ කල හැකි විය.

ධීවර ඔබ කුමක් කරන්නේද? ධීවරයෙකුගේ ඔරුව හානියට පත්වූවත් එය එතරම් බරපතල නොවේ. මන්දයත් ඔහුගේ මිතුරෝ මෝටර් සහිත විශාල බෝට්ටු ඉල්ලා සිටින නිසාය. ඔවුන්ට ගැඹුරු මුහුදට යන්නට හැකිවන අතර වැඩියෙන් මසුන් ඇල්ලීමට ද හැකිවේ. ඇතැමුන් කියන පරිදි, මුහුදෙන් මේවන විටත් අවශ්‍ය ප්‍රමාණයට වඩා මසුන් අල්ලාගෙන තිබෙන අතර මේ බෝට්ටු නිසා මේ ප්‍රශ්නය තවත් තිව්‍ර වනු ඇත. එනමුත් එය අනාගතයට බාර කටයුත්තකි. ධීවරයාට අද දවසේදී ජීවත්වීම අවශ්‍යයි, තරඟකාරීවීම අවශ්‍යයි.

## වෙළෙන්දා

සුනාමියට පෙර ඔබ සුළුප්‍රමාණයේ වෙළෙන්දෙකුව සිටියේය. දුප්පතෙකු නොවූ ඔහුගේ වෙළඳාම සරු විය. ඔහුගේ නිවස විනාශ වුවත් එය නැවත සදා ගැනීමට අවසර නොලැබේ. ඊට හේතුව ඔහුගේ ඉඩම ඛේදවාචකය සිදුවී දින කිපයක් තුල රජය විසින් ප්‍රකාශකල ගොඩනැගීම් තහංචි කලාපය තුළ පිහිටා තිබීමයි. ඔහුගේ වෙළඳාම බිඳ වැටී ඇත. එය අතේ ඇති මුදල්වලින් කරගෙන ගිය ව්‍යාපාරයක් වූ අතර ඒ සඳහා තම දේපල හිලව් කර විශාල ණයක් ලබාගෙන තිබුණි. දැන් නිවස නැතිවී තිබුණද ණය ගෙවන ලෙස බැංකුව ඉල්ලා සිටී. නමුත් ඔප්පු මුහුදට ගසාගෙන ගොස් ඇති නිසාත් අයිතිය නැවත තහවුරු කරගැනීම දීර්ඝ සහ සංකීර්ණ ක්‍රියාවලියක් නිසාත් වන්දි ලබා ගැනීම අපහසු වී ඇත. වෙනත් අයට මෙන්ම ඔහුටද රක්ෂණ ආවරණයක් තිබුනේ නැත. නැවත ගොඩනැගීමේ හැකියාව ඔහුට තිබුණද එය දැරීමට නොහැකිවන්නේ සුනාමියෙන් පසු අමුද්‍රව්‍යවල මිල ඉතා ඉහල ගොස් ඇති නිසාය. ගොඩනැගිලි කම්කරුවන්ගේ පඩි තෙගුණයකින් වැඩිවී ඇති නිසාත්ය. එහෙත් රජය පවසන්නේ ඉඩම කෙසේවුවත් නිවස ඔහුට අයිති නොවන බවයි. ඊට හේතුව වෙරළ ආරක්ෂණ පනත යටතේ 1981 සිට මේ ප්‍රදේශයේ ගොඩනැගීම් තහනම් කර තිබුනේ යැයි කියන නිසාය. නමුත් මේ රෙගුලාසි ඔවුන් වසර 20ක් මුලුල්ලේ ක්‍රියාත්මක කර නොමැත.

දැන් ඔහු පාසැල් ක්‍රීඩාංගනයක ඔහුගේ පවුලේ සාමාජිකයින් සමග කූඩාරමක් තුල ජීවත්වෙයි. එසේ සිටින්නේ ඊට කිලෝ මීටර් කිපයක් ඔබ්බෙන් මඩවගුරක් අද්දර පිහිටුවා ඇති සංක්‍රාන්ති කඳවුරකට යෑමේ බලාපොරොත්තු ඇතිවයි. ඒ කඳවුරේ ලිංවල ජලය ලුණු රස නිසා එයට දෛනිකව ජලය ගෙන එන්නට සිදු වී තිබේ. මේ කඳවුර පිහිටා තිබෙන්නේ පසුගිය අවුරුදු 15 තුල ගැටුම තුලින් අවතැන්වූ පුද්ගලයින් ජීවත්වන තාවකාලික නිවෙස් අසලය. පලාත් පාලන ආයතනයෙන් මාසිකව ආහාර සලාක සහ සුළු මුදලක් ඔහුට ලැබේයි. එය ජීවත්වන්නට පමණක් සෑහේ. ඔහු වෙනත් තැනකට ගියහොත් ඔහුගේ වෙළඳ හැකියාවන් යොදා ගෙන අළුතින් යමක් ඇරඹිය හැකිය. නමුත් එසේ ගියහොත් ඔහු තනිවේ. එනම් රජයේ ආධාර හෝ වෙනත් කිසිවක් හෝ නොලැබේ. දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් කියා සිටින්නේ මිනිස්සුන්ට කුඩා ව්‍යාපාර පටන් ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට සිට්ටු ක්‍රමය යටතේ ණය ක්‍රමයක් පටන් ගන්නා බවයි. ඔවුන් ප්‍රකාශ කරන්නේ එළුවන් සහ කුකුලන් ඇති කිරීමට දෙන සුළු මුදලක් පිළිබඳවයි. ඔහුට රුපියල් 50,000 ක දෛනික ආදායමක් තිබූ අතර සේවකයන් පස්දෙනෙක් රැකියාවේ නිරතව සිටියහ.

## අර්ධ පුහුණු කම්කරුවා

ඔහු අර්ධ පුහුණු ගොඩනැගිලි කර්මාන්තයේ නියැලී සිටින කම්කරුවෙකි. සුනාමියට පෙර ජීවිතය කටුක වූයේය. රැකියා සෙවීම සඳහා නිතර නගරයට ගමන් කිරීම සිදුවූ අතර එසේ වුවද බොහෝවිට හරි හැටි රැකියාවක් සොයාගැනීමට අසීරු විය. සුනාමියට පසු තාවකාලික නවාතැන්, සංක්‍රාන්ති කඳවුරු සහ ස්ථිර නිවාස තැනීම්වල අවශ්‍යතාව වැඩිවීම නිසා ගොඩනැගිලි කර්මාන්තයේ විශාල ව්‍යාප්තියක් ඇති විය. අළුත් පාසැල් ඉදිකිරීම්, ගමනාගමන මාර්ග අළුත්වැඩියාව කිරීම සහ පාලම් ඉදිකිරීමේ අවශ්‍යතාව සුනාමියෙන් පසු උග්‍ර විය. මේ නිසා ඉදිකිරීම් කර්මාන්තයේ වේතන සහ රැකියා ඇබෑර්තුවල ඉහල යෑමක් ඇති විය. මේ අනුව බලන කල ඔහු මුහුණ දුන් සුබදායක සිදුවීම වන්නේ සුනාමිය ඇතිවීමයි. නමුත් සමහරවිට ඔහු මෙම ගෙවල් හා අනෙක් ඉදිකිරීම්වලින් පසු කුමක් වේද යන්න ගැන සිතනවා විය හැක. ඔහු සුනාමියෙන් පසු ලබන දෛනික වේතනය වූ රුපියල් 750 නැවත සුනාමියට කලින් වේතනය වූ රුපියල් 250 වෙත යන්නේ කෙසේද? දැනට වෘත්තීය පුහුණු කටයුතුවල යෙදෙන රාජ්‍ය නොවන සංවිධානවලින් පිටවන වඩු කාර්මිකයන්ගෙන් සහ මේසන්වරුන්ගෙන් දේශීය රැකියා වෙළඳපොලට ඇතිවන බලපෑම කුමක්ද? මෙම පශ්චාත් ව්‍යසන ප්‍රතිසංස්කරණ කර්මාන්තය දීර්ඝකාලීන සංවර්ධනයට උත්තේජකයක් වෙයිද? නැතහොත් මානවහිතවාදී ආධාර දෙන සංවිධාන ඉවත්ව ගිය පසු මෙම සියළුම දේ ඇනහිටීවිද?

උඩ සිට පහතට එන ප්‍රතිචාරයක් ලෙස බොහෝ අය සලකන රජයේ 1981 වෙරළබඩ සංරක්ෂණ පනත නැවත ක්‍රියාත්මක කිරීමෙන් වෙරළේ සිට මීටර් 100 ක ප්‍රදේශය තුළ ගොඩනැගීම් කටයුතු තහනම් කරන ලදි. මෙම තහංචිය නිසා සුනාමියෙන් අවතැන් වූ දහස් ගනන් ජනයා හට තමන්ගේ ජීවිකාව කරගැනීමේ හා කලින් තිබුණු තම ගෙවල් දොරවල් සාදාගැනීමේ අයිතිය අහිමි විය. මෙම වෙරළබඩ සංරක්ෂණ ප්‍රතිපත්තිය ප්‍රබල




*ධීවරයෙක් ස්වකීය දැල පරීක්ෂා කරයි, පේදුරු තුඩුව, යාපනය, ශ්‍රී ලංකාව*

පාරිසරික තර්ක (කඩොලාන වගාව සහ වැලි කඳු නැවත ස්ථාපනය කිරීම) සහ හදිසි අවස්ථා සඳහා සූදානම්වීම පිළිබඳ තර්ක (අනාගත ආපදාවලින් සිදුවිය හැකි හානි අඩු කිරීම සඳහා භෞතික ආරක්‍ෂණ කලාපයක් ඉදිකිරීම) ගැන අවධානයක් යොමු කලද දේපල අයිතිය සහ ජීවනෝපායන් අතර තිබෙන අන්තර් සම්බන්ධතාව පිළිබඳව සැලකිලිමත් වී ඇත්තේ මද වශයෙනි. වෙරළබඩ ප්‍රදේශවල ඇති ඉඩම් භුක්තිය හා සම්බන්ධ ප්‍රශ්නකාරී නෛතික තත්ත්වය සහ ඉඩම් ඔප්පු නොමැතිව අයිතිය කියාපෑමද යන කරුණු නිසා නැතිවූ දේපල වෙනුවෙන් රාජ්‍ය වන්දි ලබාගැනීම දිර්ඝ සහ සංකර්ණ ක්‍රියාවලියක් වීමට බෙහෙවින් ඉඩ තිබේ. ඒ කාලය තුල ජීවනෝපායන් නවතා දමන්නටද සිදුවේ.

සුනාමියෙන් වඩා පීඩාවට පත් කොටසක් වන්නේ ධීවර ප්‍රජාවයි. රජය විසින් ධීවර ප්‍රජාවගේ නැතිවුණු ජීවනෝපායන් නැවත ප්‍රතිස්ථාපනය කිරීමට පොරොන්දු වී ඇත. එසේ වුවද මෙවැනි අයැදුම් විභාගකිරීම සඳහා රාජ්‍ය නිලබල තන්ත්‍රයට හැකියාවක් නොමැති නිසා ඒ තුලින් වන්දි ලබාදීම සම්බන්ධයෙන් අතිවිශාල ප්‍රමාදයක් ඇති වී තිබේ. මේ අවකාශය පිරවීම සඳහා මානවදයාවාදී ආධාර සංවිධාන ඉදිරිපත් වී තිබේ. එසේ වුවද මේ සඳහා දේශිය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන යොදාගන්නා අතිවිශාල මුදල් ප්‍රමාණය නිසා අතිශයින් තරඟකාරී වාතාවරණයක් ඇතිවී තිබේ. ධීවර බෝට්ටු පිළිබඳ උදාහරණය දක්වන පරිදි චිත්තාකර්ෂණීය ජීවනෝපාය සම්පත් ලබාදීම තුලින් නොයෙකුත් ආධාර සංවිධාන තම අවකාශය සඳහා තරඟ වැද සිටිති. ධීවරයින්ට තම වෘත්තිය තුල සීඝ්‍රයෙන් නැවත නියැලීමේ හැකියාව තිබෙන නිසා මෙවැනි භාවිතාන් විසින් ජීවනෝපායන් අරබයා කෙටිකාලීන වාසි අත්පත්කර දී ඇත. එනමුත් දීර්ඝකාලීනව ධරණීය ජීවනෝපායන් සම්බන්ධයෙන් විනාශකාරී තත්ත්වයන් ඇති කරලීමට ඉඩ තිබේ. ප්‍රාදේශිය සම්බන්ධතා මත ඇතිවී තිබෙන බලපෑම්, වෙළඳපොල ධාරිතාව සහ ස්වභාවධර්මය මත ඇතිවී ඇති බලපෑම්, විශ්ලේෂණය කිරීමේදී ප්‍රජාසහභාගිත්වයක් නොමැතිව සැලසුම් විරහිතව සපයා දෙන සම්පත් නිසා දැනට පවතින ධීවර සම්පත් සීඝ්‍රයෙන් විනාශවීමේ ඉඩ කඩ තිබේ. මෙතුලින් දීර්ඝකාලීනව ජීවනෝපායන්ට තර්ජනය එල්ල විය හැකි අතර දැනටමත් ජනවාර්ගික අර්බුදයක් පවතින ගැටුම් වාතාවරණයක් තුල අන්තර් ජනවාර්ගික ආතතිය වැඩිවීමටද ඉඩ තිබේ.

පශ්චාත් සුනාමි ශ්‍රී ලංකාවේ ජයග්‍රාහකයින් මෙන්ම පරාජිතයින් යන දෙකොටසම සිටිති. අර්ධ පුහුණු කම්කරුවාගේ උදාහරණ පෙන්වාදෙන පරිදි ගොඩනැගිලි ඉදිකිරීමේ කර්මාන්තය පෙර නොවූ විරූ දියුණුවක් අත්විඳිමින් සිටී. සිය ගනණින් බිහිවී ඇති නව ජාත්‍යන්තර මානවදයාවාදී ආධාර වැඩසටහන්වලට සේවා සැපයීම සඳහා ඉදුම් හිටුම් හා ප්‍රවාහන අංශයේ නව වෙළෙඳ පොලවල්ද බිහි වී තිබේ. අවාසනාවකට මෙන්, මේ නව අවස්ථා දෙපැත්ත කැපෙන අසිපතක් ලෙස ක්‍රියාත්මක වේ. එනම්, එමගින් ඇතැමුන්ට තාවකාලික සමෘධියක් ලබා දුන්නද අන් අයට භාණ්ඩ හා සේවා සපයා ගැනීමෙහිලා දැරිය නොහැකි තත්ත්වයක් උදා කරවයි.

පශ්චාත් සුනාමි ජීවනෝපායයන් රාජ්‍ය ප්‍රතිපත්ති සහ පරිපාලනය, කම්කරු අවශ්‍යතාවල ඇතිවෙන වෙනස්කම්, වෙළෙඳපොලේ ප්‍රමුඛතා හා ඉල්ලීම්, ව්‍යසන ප්‍රදේශවල ක්‍රියාත්මක වන අති විශාල සංඛ්‍යාවක් වූ දේශීය හා ජාත්‍යන්තර මානවදයාවාදී ආධාර සංවිධාන ආදිය සමීපව බැඳී පවතී. කාලීන, සංවිධානාත්මක, ක්‍රමෝපායින හා සමානාත්මතා පදනම් මත ජීවනෝපායයන් පිළිබඳ ප්‍රශ්නය ආමන්ත්‍රණය කිරීමට ක්‍ෂණික ක්‍රියාවන් අවශ්‍ය වේ. එසේ කිරීමේදී ප්‍රතිපත්ති හා භාවිතාවන් ප්‍රදේශයේ ජීවත්වන ජනයා සමඟ අනුකලනය කරන බවටත්, තීරණ ගැනීම හා පරිසර සුරැකීම හා ආපදාව නිසා සිදුවන හානිදායක තත්ත්වයන් අවම විම කෙරේ අවධානය යොමු කළ යුතුය. එසේ නොවූවහොත්, සුනාමියෙන් වඩාත්ම පීඩාවිඳි කොටස් සඳහා දීර්ඝකාලීන ධරණීය ජීවනෝපායන් සාක්ෂාත් කරගැනීමට ඇති හැකියාව බෙහෙවින් අඩුවනු ඇත.

*සයිමන් හැරිස් මෑතකදී ඔක්ස්ෆර්ඩ් සරසවියේ සරණාගත අධ්‍යන කේන්ද්‍රයේ පශ්චාත් උපාධි අධ්‍යයනය නිමකලේය. එමෙන්ම ඔහු ක්‍රිස්තියානි ආධාර සංවිධානයේ (Christian Aid) ශ්‍රී ලංකාවේ සුනාමි ක්‍ෂණික ආධාර සම්බන්ධීකාරකයාය. විද්‍යුත් තැපෑල: sharris@christian-aid.org.*

# සයමසකින් පසු: බියගැන්වීම්වලට මුහුණදෙමින්

ලින්ඩන් ජෙෆල්ස්

*UNHCR ආයතනය ශ්‍රී ලංකාව තුල විසි අවුරුද්දක් තිස්සේ කෙරීගෙන යන සිවිල් යුද්ධය නිසා අවතැන් වූ ජනයාට 1987 සිටම ආරක්‍ෂාව ලබාදීමේ සහ උදව් උපකාරකිරීමේ වැඩකටයුතුවල නිරත වී සිටී. එසේම පශ්චාත්-සුනාමි මානවදයාවාදී අර්බුදයට ශ්‍රී ලංකාව මුහුණ දී සිටින බැවින් UNHCR ආයතනය එය සමනය කිරීමේ අටියෙන් ස්වකීය ක්‍රියාකාරිත්වය පුළුල් කොට තිබේ.*

2004 අවුරුද්දේ 26 වනදා උදේ 9.30ට පමණ මේරි තෙරේසා රාජේස්වරන්ට, ඇසුණු ශබ්දය ලඟ එන ට්‍රක් රථයක හඬක් විය හැකි යැයි ඈ සිතුවාය. මුල්තැන්ගෙයි පිසිමින් සිටි මේරි ඒ ගැන දැඩි අවධානය යොමු කලේ කෑකෝ ගැසීම් හා විලාප හඬ මධ්‍යයේ නැගුණු වෙනත් ගෝසාවක්ද නිසාය. "නන්තනී" නම් වූ ඇගේ දියණිය අතින් අල්ලාගත් මේරි කලබැගැනියට හේතුව සොයන්නට ගෙයින් එළියට බැස්සාය.

ගමේ පිරිස් වේගයෙන් සංකෝචනය වන මුහුද දෙසට දුවනවා ඇයට දැකගන්නට ලැබිණ. මොහොතකින් අඩි 15ක් උසැති මාරක රැල්ල තමා දෙසට වේගයෙන් එන අන්දම මේරි දුටුවාය. ඉදිරියේ තිබුණු ගොඩනැගිල්ලේ වැදී රැල්ලේ සැර බාල වූ ඇසිල්ලේ නන්තනීවත් රැගෙන මේරි පිම්මේ දුවන්නට පටන් ගත්තාය. පාර කෙළවර වී ඇති බව තේරුම්ගත් මේරි ආපසු හැරී දුවන්නට සැරසෙත්ම වේගයෙන් ආ රැල්ල ඇයවත් නන්තනීවත් අසුරා සැණින් රැගෙන ගොස් කම්බි වැටක් උඩ රැඳෙව්වාය. කම්බි කණුවක් එක් අතකින් දියණිය අනික් අතිනුත් අල්ලාගත් මේරි මරු විකල්ලෙන් රැල්ල සමග පොර බැදුවාය. තමන් කළ කී දේ සියල්ල ඇයට පැහැදිලි මතකටය නගා ගත හැකි වූයේ රැල්ල බැසි ගියායින් පසුවය.

ඇහපත කැපී සීරී ගොස් හති දමමින් සිටි ඈ නන්තනීව ආරක්‍ෂා සහිත තැනක තබා භය හැවිරිදි තම පුතා සොයන්නට පටන් ගත්තාය. හතර අතට විසි වෙමින් පුතාව අන්තිම වතාවට දුටු තැනට ඇය පැමිණෙත්ම දෙවන මාරක රැල්ල පැමිණ නැවතත් ඇයව රැගෙන ගොස් කම්බි වැට උඩ පතිත කළාය. "මගේ ඇඟට එක පුංචි වේදනාවක්වත් දැනුනේ නෑ" ඇය පැවසුවාය. "අනෙක් සියල්ලටම වඩා මට දැනුනේ මගේ පුතා නැති වූ වේදනාව විතරයි" මාරක රැල්ලට හසුවී පැයකට ආසන්න කාලයක් එහේ මෙහේ ගසාගෙන යමින් සිටි මේරි මුහුදු වතුරේ අළු පැහැයත් උණුසුම් ගතියත් සිහිපත් කළාය. කළු වළාකුලින් බර වූ අඳුරු අහස ගැන විස්තර කළ මේරි නොකඩවා ඇද හැළුණු වැස්ස ගැනත් කීවාය.

පසුව මේරිගේ පවුලේ උදවියට ඇයව හමුවූ වේලේ රෝහලට යාම ඈ ප්‍රතික්ෂේප කළාය. "ඒ වෙලාවේ මට වැදගත් උනේ මගේ පුතාගේ ආරක්‍ෂාව. එයා හොඳින් ඉන්නවද කියලා දැනගන්නකල් මට යන්ඩ ඕනැ උනේ නෑ" ඇය ප්‍රකාශ කළාය. එදම සවස් යාමයේ මේරිගේ පුතා ගෙදර පැමිණියේය. සුනාමි රළ බැස යනතෙක්ම ඔහු තම පාසැලේ රැකවරණය ලබා තිබුණි. සැනසුම් සුසුමක් හෙළූ මේරිව, ඉක්බිත්තෙන්, ජේදුරු තුඩුව රෝහල වෙත ගෙන යනු ලැබිය. බරපතල ලෙස සීරී, අතපය ඇඹරී, කැපුම් තුවාල සහිතව සිටි මේරිට මැහුම් හතක් දමන්නට සිදු විය.

"අපේ එක්කෙනා මේ දවස්වල රස්සාව කරන්නේ නෑ බෝට්ටුව කැඩිලා හන්ද" මේරි පැවසුවාය. "සුනාමියෙන් පස්සේ මුහුද අයිනේ ජීවත්වෙන්ඩ අපි හැමෝම බයයි. දැන් අපි ඉන්නේ මීටර 750ක් රට අභ්‍යන්තරටය වෙන්ඩ. අනාගතේ ඇතිවන සුනාමිවලින් බේරෙන්ඩ". මේරිගේ පවුලත් ඇය වැනි අනෙක් පවුලුත් දැන් උභතෝකෝටියකට මැදිව සිටිති. එනම් මුහුද අයිනේ වාසයට නැවත එනවාද නැද්ද යන කාරණයයි. ඔවුන් එක්කෝ පරම්පරා ගණනාවක් තිස්සේ ජීවත් වූ වෙරළ පලාතේම පදිංචිවිය යුතුය. නැත්තම් එය අතැර ගම් මැද්දට යා යුතුය. මුහුදින් ඈත් වී ජීවත්වීම ආරක්‍ෂාවට යහපත් නමුත් මුහුදෙන් ඈත්වූ විට ස්ථිර ආදායමක් ලැබෙන්නේද නැත, ගෙදර යැයි ඔවුන් මෙතෙක් හැඳින්වූ වෙරළේ වාසය කරන්නට ලැබෙන්නේ ද නැත.

## UNHCR හි ප්‍රතිචාරය

සුනාමියෙන් පසු UNHCR සංවිධානය විසින් 160,000 පමණ ජනකායකට (අවතැන් වූ පිරිසකට) ආහාරමය-නොවන සහනාධාර භාණ්ඩ 500,000 පමණ බෙද දී ඇත. ඊට ප්ලාස්ටික් ඇතිරිලි, කුඩාරම්, මදුරු දැල්, මුළුතැන්ගෙයි උපකරණ හා භාජන, තුවා, සබන්, බාල්දි, ඇඳුම් සහ වෙනත් මූලික භාණ්ඩ ඇතුලත් විය. ඒ වාගේම සංක්‍රමණික නිවාස අංශය සම්බන්ධීකරණය කරන්නට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ප්‍රයත්න දැරූ අවස්ථාවේදී ඊට සහායවීම පිණිස අපි එහිලා නායකත්ව භූමිකාවක් ඉටුකර ඇත. මෝසම් වැසි ඇරඹෙන්නට පෙරාතුව හදිසි නිවාස ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ කටයුතු, තාවකාලික නිවාස ඉදිකිරීම් යන ක්‍රියාකාරකම් අතර නිර්මාණය වී තිබූ පරතර පියවීමට අප අනෙකුත් සම්බන්ධකරුවන් සමඟ එකතු වී කටයුතු කර ඇත.

ඒවාගේම ශ්‍රී ලංකාවේ බලාධිකාරීන්ගේ හා වෙනත් මානවදයාවාදී ආයතනවල ප්‍රයෝජනය පිණිස සංක්‍රමණික නිවාස පිහිටුවීමට අදාල නොයෙකුත් මාර්ගෝපදේශ ලේඛන සහ පුනරීක්‍ෂණ ලේඛන ද UNHCR සංවිධානය කර ඇත. UNHCR ආයතනයේ ප්‍රධානත්වයෙන් කැඳවන ලද නිවාස සහ ජනපද පිහිටුවීම පිලිබඳ සාකච්ඡා මණ්ඩපයේදී ගත් වැදගත් සහතික වීමක් වූයේ සුනාමියෙන් අවතැන්වූවන් සඳහා සංක්‍රමණික හා ස්ථිර නිවාස ඉදිකිරීමේදී ස්ත්‍රීපුරුෂ සමාජභාවී, පාරිසරික හා වෙනත් ගැටළු කල්පනාවට ගෙන කටයුතු කරන බවයි.

ඉහත අංශය සම්බන්ධීකරණයට කිරීමට අමතරව, මේ වනවිට UNHCR ආයතනය යාපනය සහ අම්පාර යන දිස්ත්‍රික්ක දෙකේ තාවකාලික නිවාස 3000 ඉදිකරමින් සිටී. සම්පත්වලට බලපාන දේශගුණික, සමාජ, ප්‍රාදේශීය වැනි සාධක සලකා බලනවිට එහි විවිධත්වය නිසා ඒ ඒ ස්ථානවලට අනුරූපව කරන ලද නිවාස සැලසුම් ද එකිනෙකට වෙනස්ය.

අම්පාර, ශ්‍රී ලංකාව



UNHCR Sri Lanka/Kara Waxman




UNHCR/M Sivanesan

*UNCHR සහනාධාර බෙදු දෙයි. පේදුරු තුඩුව, ශ්‍රී ලංකාව*

2005 ජුනි මාසයේදී යාපනයේ ඉදිවීමට නියමිත නිවාස 1408 සම්පූර්ණ වන අතර එමවසරේම (2005) සැප්තැම්බර් වන විට අම්පාර දිස්ත්‍රික්කයේ ඉදිවන සංක්‍රමණික නිවාස 2442 සාදා නිම කිරීමට නියමිතය. අම්පාරේ තනන සංක්‍රමණික නිවසක විශාලත්වය මීටර 3x4 වන අතර, එම එක් නිවසකට බෙදා වෙන් කරන ලද කාමර දෙකක් අයත්වන අතර නිමකිරීම් සිදුවන්නේ ගැල්වනයිස් යකඩ රාමුවක් තුලය. එම සංක්‍රමණික නිවාස ජාත්‍යන්තර වශයෙන් පිලිගත් "SPHERE ප්‍රමිතීන්ට" අනුකූලව ඉදිවන අතර එක් ඒකකයක පස් දෙනෙකුගෙන් යුත් පවුලකට ජීවත්විය හැකිය. එහිදී පොලවට යොදවන ගඩොල් අත්තිවාරම නිසා සවිමත් බිමක් ලැබෙන අතර ගේ බිත්ති සඳහා තුනී ලෑලි යොදගනී. අවශ්‍යතාවය පරිදි මේ නිවාස තිබූ තැනින් ගලවාගෙන ගොස් තවත් තැනක සවිකිරීමටද හැකිය. මෙම නිවාසයන්හි වහළවල් තනා ඇත්තේ ඇළුමිනියම් තහඩුවලින්ය. ඒවා ටින් තහඩුවලට වඩා මිල අධික වුවත් තාපයට ඔරොත්තු දෙන අතර ගෙතුල සිටින උදවියට සුවදායක තත්ත්වයක්ද උදා කර දෙනු ලබයි. ගෙතුල වාසය කරන්නන්ට වාතාශ්‍රය ලබාදෙනු සඳහා වහලයත් බිත්තියත් අතර ඉඩකඩ තබා ඇත.

යාපනය දිස්ත්‍රික්කය තුල නිමවන මෙකී නිවාස පද්ධතිය හේතුකොටගෙන පේදුරු තුඩුවේ කල්ලඩි ගමේ වාසය කරන මේරිට සහ ඇගේ අසල්වැසි ප්‍රජාවට මෙම ආරක්ෂාකාරීවුත්, උසස්වුත් කල්පවතින නිවාස ලැබෙනු ඇත. මෙම නිවසක හිමිකමක් ලබන තවත් පුද්ගලයෙකු නම් මේරිගේ සොහොයුරා වන තම්ලගන්ය. ඉතාමත් අවාසනාවන්ත ලෙස ඔහුගේ ද බිරිඳ, නිවුන් දරු දෙදෙනා, නැන්දම්මා, නෑනා, මස්සිනා සහ ඔවුන්ගේ දියණිය සුනාමි රළ විසින් ගිල ගනු ලැබීය.

ගැටුම් නිසා තුන්වතාවක්ම අවතැන්වූ 30 හැවිරිදි තම්ලගන් යාපනයේ මාදරන්කර්නි ගමේ උපත ලැබුවෙකි. වෙරළෙන් මීටර 50ක් පමණ ඔබ්බෙන් පිහිටි ඔහුගේ ගමේ ජීවත් වූ ගැමියන් 189 දෙනෙක් සුනාමියට ගොදුරු වී මිය ගියහ. සුනාමිය පැමිණි දින පිටත රතිඤ්ඤ පුපුරුන හා වෙඩි පුපුරන හඬක් ඇසෙන්නට පටන්ගත් බව තම්ලගන් විස්තර කළේය. ඔහුගේ ගෙදර ඉදිරිපස දොර ජනෙල් පසාරු කරගෙන ජලය ගලා එන්නට පටන් ගති. "වෙන්නේ මොනවද කියලා හිතාගන්නටත් කලින් බිත්ති දෙබෑ කරගෙන ආපු වතුර පාර ජේන මානයේ තිබෙන ඔක්කොම සෝදගෙන අරන් ගියා" ඔහු පැවසුවේය. "මාමණ්ඩියා පැනලා නිඹුල්ලු දෙන්නා බදා ගත්තට වතුර පාරට ඔක්කොම ගහගෙන ගියා".

නිවසින් කිලෝ මීටරයක් ඈතට තම්ලගන්වද ගසාගෙන ගොස් තිබූ අතර අවසානයේ ඉතා අසීරුවෙන් නිවස දෙසට එන්නට උත්සහ ගත්තද ගඩොල් කැට වල ගැටීමෙන් ඔහුගේ පාද දෙකම බලවත් ලෙස කැඩී තිබුණු බැවින් ඔහුට ඇවිදගන්නට පවා නොහැකි විය. දහවල් වන විට පොලීසිය විසින් ඔහුව සොයාගන්නා ලදී. තම පවුලේ උදවිය ගැන කිසිදු තොරතුරක් නොදැන, යාපනය ශික්ෂණ රෝහලේ දවස් තුනක් ගත කරන්නට ඔහුට සිදුවිය. පවුලේ උදවිය පිළිබඳ දරුණු ආරංචිය ඔහු වෙත ගෙන ආයේ වෙනත් ඥාතියකු විසින්ය. පවුලේ උදවිය සියළුදෙනාම පාහේ නැතිවීමේන් වාචාගත නොහැකි ශෝකයකින්ද මානසික පීඩනයකින්ද වරදකාරී හැඟීමකින්ද පෙළෙමින් නිරන්තරව කල්යවන තම්ලගන් සෑම වෙලේම අසන එක් ප්‍රශ්නයක් වෙයි. "ඔක්කොම මැරිලා මං විතරක් ඉතුරුවුනේ ඇයි?" ධීවරයෙකු හැටියට ජීවිකාව ගෙන ගිය තම්ලගන් හට ඉතිරිව බෝට්ටුවක්ද වේ. දැන් ධීවර වරාය අවුරාගෙන තිබූ සුන්බුන් ඉවත් කිරීමේ වැඩ කටයුතු සිද්ධවෙමින් පවතී. එහෙත් වේදනාකාරී මතකයෝ තම්ලගන්ට දැඩිසේ පහහරදෙමින් සිටින්නාහ. නැවතත් මුහුදු යෑම ගැන තම්ලගන් මෙසේ අර්ථ දක්වයි: "මගේ නැතිවෙච්ච එවුන් ආයෙත් කල්පනාවට එනවා".

මේ උභතෝකෝටිකය දිවයිනේ සුනාමියෙන් හානියට පත් වූ මුළුමහත් ප්‍රජාව අතරේම රාව ප්‍රතිරාව නංවමින් තිබේ. UNHCR වැනි ආයතනයකට අද කළ හැකිව තිබෙන්නේ මුහුද විසින් ජීවත් කරවූ බොහෝ දෙනකුගේ ජීවිත මුහුද විසින්ම නැතිභංග කර දැමූ අන්දම කියද්දී ඊට ඇහුම්කන්දෙමින් හානියට පත් අයට උදව් උපකාර කිරීම පමණී.

*ලින්ඩන් ජෙෆල්ස් කොළඹ පිහිටි UNHCR කාර්යාලයේ සහායක ප්‍රවෘත්ති නිලධාරියෙකි. විද්‍යුත් තැපෑල: jeffels@unhcr.ch*
*සංක්‍රමණික නිවාස සහ UNHCR ආයතනය ශ්‍රී ලංකාවේදී සංවිධානය කරන අනෙකුත් කටයුතු පිලිබඳව දැනගැනීම සඳහා www.unhcr.lk වෙබ් අඩවියට පිවිසෙන්න.*

# භාණ්ඩ ප්‍රවාහණයේදී මුහුණ දුන් අභියෝග

ස්ටීව් මැතිව්ස්

*සුනාමිය විසින් ආසියාවට කරන ලද බලපෑම මින් පෙර නොවූ විරූ එකක් වූ අතර එහි බලපෑමට ලක්වූවන්ගේ අවශ්‍යතා ඉටුකිරීමේදී සුවිශාල භාණ්ඩ ප්‍රවාහණ අභියෝගවලටද මුහුණ දෙන්නට සිදු විය. සුනාමි මීට අවුරුදු පහකට කලින් සිදුවුනා නම් මේ තරම් සාධනීය ලෙස ප්‍රතිචාර දක්වන්නට වර්ල්ඩ් විෂන් සංවිධානයට පුළුවන්කම ලැබෙන්නේ නැත.*

මානවදයාවාදී මෙහෙයුම් කටයුතුවල ක්ෂනිකයෙන් නිරතවන්නට සිදුවන හිදිසි තත්ත්වයන්ගේ පැන නැගීම කෙමෙන් ඉහළ යන්නට පටන්ගත් නිසාත් සහනාධාර බෙදීමේ කටයුතුවලදී සංකීර්ණ තත්ත්වයන් උදවන්නට පටන්ගත් නිසාත් වර්ල්ඩ් විෂන් සංවිධානය මහා ආපදවන් ඇති වූ අවස්ථාවලදී මෙතෙක් ඒවාට ප්‍රතිචාර දැක්වූ අන්දම වෙනස්කම්වලට භාජනය කළාය. ඒ වාගේම වර්ල්ඩ් විෂන් සංවිධානය හදිසි තත්ත්වයන් මතු වූ අවස්ථාවකදී පිටින් සංවර්ධන නිලධාරීන් බඳවාගැනීම වෙනුවට, එසේ කරමින් අපතේ යන කාලය ඉතිරි කරගැනීමේ පරමාර්ථයෙන්, පූර්ණකාලීන කාර්යාංශයක්ද පිහිටුවා ගත්තාය. ක්ෂණික ගෝලීය ප්‍රතිචාර බලකාය නමින් හැඳින්වෙන මේ අංශය හදිසි තත්ත්වයන් මහා පරිමාණ වශයෙන් උදවන බව කලින් දැන ගැනීම, ඊට සූදානම්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම යනාදි කටයුතු දියත් කිරීම සඳහා කැප වී සිටී.

සුනාමිය විසින් මේ අංශයේ ධාරිතාව එහි පතුල දක්වාම පරීක්ෂාවට ලක් කොට තිබිණ. “පළමු දවස් තිහ ඇතුලත අපි අවේ දූපතටත් ශ්‍රී ලංකාවටත් ගුවන් ගමන්වාර තිස්දෙකක් පිටත්කොට යැවුවා”යි වර්ල්ඩ් විෂන් සංවිධානයේ ගෝලීය පෙරසූදනම් අංශයේ අධ්‍යක්ෂක ජෝර්ජ් ෆෙන්ටන් කියා සිටියේය. “මීට කලින් අපි කවදකවත් එවැනි දැවැන්ත මෙහෙයුමක යෙදිලා නැහැ.” ඒවාගේම එය පහසු කටයුත්තක් ද නොවෙයි. සමහර අවස්ථාවලදී දැඩි දුෂ්කරතා ඇතිවූයේ නිලධාරින්ගේ බාධා කිරීම නිසාය. කෙසේවෙතත් බොහොමයක් භාණ්ඩ සීඝ්‍රයෙන් ගොඩ බා බෙද හරින්නට පුළුවන් වුවත් රථවාහන රේඩියෝ යන්ත්‍ර වැනි ආහාරමය-නොවන භාණ්ඩ, එනම් ගැටුම් පවතින ප්‍රදේශවලදී ආරක්ෂාවට බලපාන ඒවා වශයෙන් බොහෝ විට ගණන් ගැනෙන භාණ්ඩ, සැණෙකින්ම නිලධාරින්ගේ බාධාකිරීම්වලට ගොදුරු වූවාය. ඒවා නිදහස් කරගැනීම සඳහා බොහෝසෙයින් කාලය මිඩංගු කිරීමට කාර්ය මණ්ඩලයට සිදු විය.

ඉන්දියාවේ සහ තායිලන්තයේ සිටින වර්ල්ඩ් විෂන් කාර්ය මණ්ඩල සුවිශාල ඒවා බැවින්, ජාත්‍යන්තර ආධාර වැඩි හරියක් ශ්‍රී ලංකාවට සහ ඉන්දුනීසියාවට යොමු කොට, බාහිර ආධාර සුළු ප්‍රමාණයකින් සෑහීමකට පත්ව ස්වකීය කාර්යභාරය ඉහළ අන්දමකින් කරගෙන යෑමට ඔවුනට පුළුවන් විය. යෝධ රැල්ල රටට පහර දී පැය කීපයක් ඇතුලත ප්‍රතිචාර දක්වන්නට ශ්‍රී ලංකාවේ වර්ල්ඩ් විෂන් කාර්යමණ්ඩලය සමත් විය. කාර්ය මණ්ඩලයේ නිර්මාණාත්මකභාවයට හා කැපවීමට පින් සිදුවන්නට වහාම ආහාර, ජලය, ඇඳුම් පැළඳුම්, නිදන පැදුරු හා සෞඛ්‍යාරක්ෂක භාණ්ඩ විපතට පත්වූවනට සපයාදෙන්නට ඔවුනට හැකි විය. ඔවුන්ගේ ක්ෂණික ප්‍රතිචාරය නිසා වර්ල්ඩ් විෂන් සංවිධානයේ වසර පනස් පහක ඉතිහාසය තුල ඉතා කෙටිකාලීන දැනුම්දීමකදී සංවිධානය කළ විශාලතම ආධාර නැව පිටත් කොට එවන්නට ඊට හැකි විය.

භාණ්ඩ තොග එක්රැස් කොට පවත්වාගෙන යන වර්ල්ඩ් විෂන් සංවිධාන සතු ගබඩා ඩෙන්වර්, හැනෝවර්, බ්‍රින්ඩිසි, ඩුබායි යන නගරවල තිබේ. එම ගබඩාවල තිබූ ද්‍රව්‍ය සැණෙකින් ලබාගන්නා ලද අතර කීනියාවේ ඉන්දියාවේ පකිස්ථානයේ තායිලන්තයේ ඕස්ට්‍රේලියාවේ සැපයුම්කරුවන් හා ප්‍රවාහණ සමාගම් යොදවාගනිමින්, එයාකාරයෙන් ගබඩා පවත්වාගෙන යන වෙනත් සංවිධාන සතු සංචිතද ප්‍රයෝජනයට ගෙන, අඩුපාඩු වහාම සපුරාගන්නා ලද්දේය. මෙලෙස පූර්වයෙන් සූදනම් කරන සද සහනාධාර සැපයුම් සංචිත අවශ්‍ය වේලාවේදී නිකුත් කිරීමේ වැඩ පිළිවෙල ඉතාමත් ඵලදයි එකක් බව මෙයින් ඔප්පු විය.

අත්දැකීම් සහිත පලපුරුදු කාර්ය මණ්ඩලයක් සිටීමත් මෙවන් අවස්ථාවකදී ඉතාමත් වැදගත් සාධකයකි. ඉරාකයේ මොසුල් නගරයේදී වර්ල්ඩ් විෂන් සංවිධානයේ සාමාජිකයෙකු මිය යෑමත් රට තුල ආරක්ෂක තත්ත්වය පිරිහියෑමත් සමගම 2004 ඔක්තෝබරයේදී එම සංවිධානය ස්වකීය ඉරාක වැඩසටහන නවතා දැම්මාය. එයින් තේරුම්වන්නේ ඉතා උසස් පලපුරුද්දක් සහිත සහන සේවකයින් ගණනාවක්ම අළුත් කාර්යභාරවලට උරදීම සඳහා සූදනම්ව සිටින බවයි. අත්දැකීම් සහිත පළපුරුදු පිරිස් අප වෙත පැමිණෙන්නේ වෙනත් වෘත්තිකයන් සහ ආයතන සමග ඔවුන් පවත්වන සම්බන්ධකම් සමගය. එවිට උද වූ හදිසි ව්‍යාකුල මුල් දවස්වලදීම රාජ්‍ය නොවන සංවිධාන සමගත් එක්සත් ජාතීන්ගේ ඒජන්සි සමගත් ඉක්මනින්ම ක්‍රියාකාරී සබඳතා ගොඩනගන්නට ඔවුනට පුළුවන් වන අතර ඒනිසාම කාර්යසාධනීය ලෙස ආධාර බෙද හැරීම පහසු කිරීමටත් ඔවුනට පුළුවන්වනවා ඇත.

## අනාගතයේදී කිරීමට බලාපොරොත්තුවන්නේ මොනවාද?

තම සුනාමි වැඩසටහන් අවම මට්ටමින් අවුරුදු පහක්වත් පවත්වා ගෙන යන්නට වර්ල්ඩ් විෂන් සංවිධානය අපේක්ෂා කරයි. ඒ වැඩසටහන්වලට ඇතුලත් පුළුල් පරාසයකට අයත් ව්‍යාපෘති ප්‍රමාණය මෙසේය: කුඩා වෙළඳ ව්‍යාපාර සඳහා ක්ෂුද්‍ර ව්‍යාපාරික වර්ධනයක් ලබාදීම, නිවාස/වෙළඳ ව්‍යාපාර/මංමාවත්/පාලම් ප්‍රතිසංස්කරණය කිරීම, වෙරළබඩ පලාත්වල නව ජල හා සෞඛ්‍යාරක්ෂක පද්ධති ඇති කිරීම, පාසැල් හා ගම් මට්ටමින් ළමයින් ආරක්ෂා කිරීමේ කටයුතු පුළුල් කිරීම යනාදියයි.

මීට කලින් ආපදවලට මුහුණ දෙමින් ඉගෙනගත් සමහර පාඩම් සුනාමි ආපදවට මුහුණදීමෙහිලා ප්‍රයෝජනවත් විය.[1] ගතවූ අවුරුදු දෙක තුළ ළමා ආරක්ෂණ මූලපත්‍ර වර්ධනය කිරීම නිසා ශ්‍රී ලංකාව, අචේ ප්‍රාන්තය සහ ඉන්දියාව තුළ ළමයින්ට හිතකර අවකාශයක් නිර්මාණය කරගැනීමටද සංවිධානයට හැකි විය. තීරණ ගැනීම ජාතික කාර්යාල මට්ටම දක්වා විමධ්‍යගත කළ හෙයින් සීඝ්‍ර ප්‍රතිචාර දක්වන්නට, විශේෂයෙන් ශ්‍රී ලංකාවේදී සහ ඉන්දියාවේදී පුළුවන් විය. සහනාධාර බෙද හැරීමේ ක්‍රියාන්විතවලදී බොහෝ අංශවලින් පළවූ කාර්යක්ෂමභාවය මොනතරම් උසස් මට්ටමකින් පැවතුනත් අනාගතය පිලිබඳ අවිනිශ්චිතභාවයන්ද දැඩිව මතු වී ඇත. නුදුරු අනාගතයේදී තවත් මෙවැනි බිහිසුණු විපතක් ඇතිවුනොතින් තත්ත්වය කෙබඳුවේවිද? සුනාමියට ප්‍රතිචාර දැක්වීමේදී සියළු ආයතන ස්වකීය හැකියා ශක්තීන් අවසාන බිංදුව දක්වාම රැගෙන තිබේ. තවත් මහා පරිමාණ හදිසි තත්ත්වයක් සීඝ්‍රයෙන් මතු වුනොතින් බොහෝ ආයතනවලට - දැවැන්ත ආයතනවලට පවා - සුදුසු ප්‍රතිචාර දැක්වීම එතරම් ලෙහෙසි පහසුවන්නේ නැත.

*ස්ටීව් මැතිව්ස් වර්ල්ඩ් විෂන් ආයතනයේ ක්ෂණික ගෝලීය ප්‍රතිචාර බලකායේ හදිසි සන්නිවේදන අංශයේ කළමනාකාරවරයාය. විද්‍යුත් තැපෑල: stephen_matthews@worldvision.ca*

1. See After Action Review (involving World Vision International, CARE, OXFAM GB and Catholic Relief Services) at www.humanitarianinfo.org/srilanka/infocentre/reference/docs/Care_Evaluation.pdf



Steve Matthews

# පශ්චාත්-සුනාමි කලබැගෑනියේදී පැගුණු පුංචි මාළු

අයිරින් ෆ්‍රේසර්

*සුනාමියෙන් පසුව ශ්‍රී ලංකාවේ ඇති වූ හදිසි තත්ත්වය තුළ ජාත්‍යන්තර ආයතන බොහෝ ගණනක් සහභාගිත්වයේ හා විමධ්‍යගතකරණයේ වටිනාකම නොතකා හැරියෝය.*

හදිසි ආපදාව වූ පළමු දවසේ සිටම මඩකලපුවේ ස්ථානගත වී සිටි ජාත්‍යන්තර හා ජාතික ඒජන්සි එකට එකතු වූහ. ඒ වනවිටත් හොඳින් හැඳිනගෙන සිටි පිරිස් එක් රැස් වී සාර්ථක රැස්වීම් ගණනාවක් පවත්වා තිබිණ. සියළුදෙනාටම පුද්ගලිකවම අත්විඳින්නට සිදු වූ මේ අනතුර හමුවේ ශ්‍රී ලාංකිකයක් හා විදේශිකයන් අතර සහෝදරත්වය වර්ධනය වෙමින් තිබුණි. ක්ෂණික අවශ්‍යතාවන් පිරිමැසීම සඳහා රථ වාහන, සහනාධාර භාණ්ඩ, කාර්යමණ්ඩල ආදි සම්පත් ස්වකීය ආයතන හරහා බෙදා ගැනීමේ කැමැත්ත සියළු දෙනා තුලම තිබුණි.

ඉහළ ජල මට්ටම නිසා අම්පාරේ පිහිටි ඉඟිනියාගල වැව් සොරොව්ව දෙසැම්බර් 30 ද විවෘත කරන ලද්දෙන් වෙරළබඩ දිසාවට වේගයෙන් ගලා ආ ජලයෙන් තවත් ගැල්මක් ඇති වී ඒ වනවිටත් හානියට පත්වූ ජනයාට තව තවත් කඳවුරුවලට ගාල්වන්නට සිදුවිය. මා ඒ වේලාවේ සිටියේ කඳවුරක් බවට පත්ව තිබූ පාසලක් තුල අවතැන් වූ පවුල් සඳහා සහනාධාර ආහාර ද්‍රව්‍ය බෙදා දෙමින්ය. සතියක් තුල දෙවන වතාවටත් ජල පහර ගලා ආ විට ඉන් බියට පත් වූ ජනයා මේස මතට නැග ගත්හ. බත ඉදවමින් ලිප තුල දැල්වෙමින් තිබූ ගිනි දැල්ල නිවී යන අන්දම මා නරඹමින් සිටිද්දී අප හැමෝම අඳුරේ ගිලී ගියාහ. දුවන්නට කියා තැනක් අප වෙනුවෙන් ඉතිරිව තිබුනේ ද නැත. අප හැමදෙනාම දෙකලවා වනතෙක් ජලයෙන් යට වී සිටි අතර වේල්ල පුපුරා තව තවත් ජලය ගලා විත් අපව ගසාගෙන යනු ඇතැ'යි අපි බියපත් වීමු. රාත්‍රිය පුරාම වර්ෂාව ඇද හැලෙද්දී මගේ සිත පුපුරු ගසන්නට පටන් ගති. අපේ කාර්යාලය පිහිටා තිබුනේ රාජ්‍ය නොවන සංවිධානයකට අයත් ගොඩනැගිල්ලක උඩ තට්ටුවේ නිසා අපි වාසනාවන්තයෝ වීමු. බිම එළාගෙන නිදගන්නට අපට පැදුරු තිබුනත් එලිමහනේ සිටි බොහෝදෙනා එක්කෝ ගංවතුරේම නැත්තම් ගස් යට සිටියහ - එසේත් නැත්තම් ජනගහනය අධික වූ කඳවුරුවල ගාල් වී සිටියහ. දැන් අඩුවකට ඇත්තේ සුළි සුළඟක් පමණකැ'යි කියමින් කාර්ය මණ්ඩලයේ සමහරු සිනාසෙන්නට උත්සාහ කළහ.

කෙසේවෙතත් ඊළඟ හෙණය පාත් වූයේ අහසින් නොව අපගේ සේවාදායකයාගෙනි. හිටිහැටියේම මට දන්වන ලද්දේ අපගේ ක්ෂණික සහනසේවා කණ්ඩායමේ ශ්‍රී ලාංකික සම්බන්ධීකාරකවරිය කොළඹට කැඳවා ඇති බවත් ඇය වහාම තම සියළු කළමනා රැගෙන පිටත්ව ආ යුතු බවත්ය. විපතට පත් ජනතාව උස්බිම්වලට රැගෙන යාම සඳහා, බලපත්‍ර තිබුනද ආයතනයේ සේවකයින් නොවන පිටස්තර උදවියට, ආයතනය සතු වාහන ඉහළ කළමනාකාරිත්වයේ උපදෙස් නොගෙන ලබාදීම ඇයට නගා තිබූ චෝදනාවයි. එමෙන්ම අපේ කණ්ඩායමට (ජාත්‍යන්තර වශයෙන් ක්ෂණික සහනසේවා කණ්ඩායම්වල වැඩ කොට අත්දැකීම් සම්භාරයක් ලබා ඇති) ස්වේච්ඡා සේවකයෙකු එකතු කරගැනීමෙන් ආයතනයේ මානව සම්පත් ප්‍රතිපත්තිය අප උල්ලංඝණය කොට ඇතැයි ද අපට දන්වනු ලැබීය. ක්ෂණික සේවා සැපයුම් කටයුතු පිලිබඳ "ප්‍රවීණයින්" මග පැමිණෙන බවත් වැඩිදුරටත් දන්වනු ලැබීය. මෙතෙක් නොවූ විරූ හදිසි මෙහෙයුමක් පස් දවසක් තිස්සේ දියත් කොට දවසට පැය 20 බැගින් සේවය කරමින්

*ශ්‍රී ලංකාවේ පාලතඩිච්චෙනෙයි ගමට යාබදව පිහිටා තිබෙන සරණාගත කඳවුරක් අසල රැඳී සිටි ජනයා නැවත තම නිවෙස් බලා පිටත්ව යන අයුරු*



Paul Jeffrey/ACT International

30,000 පමණ ජනයාට ආහාර හා බෙහෙත් ද්‍රව්‍ය බෙදදීමෙන් පසුව, ලඟාවෙමින් සිටින ප්‍රවීණයන්ගේ උපදෙස් ලැබෙනතුරු, සියළු මෙහෙයුම් නවතා දමන ලෙස අපට දන්වනු ලැබීය.

### විශ්වාසය ප්‍රශ්න කිරීමක්

සිය ක්‍රියාකාරිත්වය හැඩගැන්වෙන්නේ සහභාගිත්වය සහ විමධ්‍යගතකරණ ඇගැයුම් පාදක කරගත් දැක්මක් තුලින් බව රාජ්‍ය නොවන සංවිධාන හැමවිටම හඬ ගා කියන්නෝය. එහෙත් එලෙස පුරාජේරු මොනතරම් කියුවත් දැවැන්ත මානවදයාවාදී ආයතන එහි දේශීය කාර්යමණ්ඩල, දේශීය දැනුම, දේශීය පුද්ගලයින්ගේ හැකියාවන් විශ්වාස කරන්නේ නැති බවට ඉහත සිද්ධිය හොඳ උදහරණයක් නොවේද? ක්ෂණික සහනසේවා ප්‍රවීණයින් ලඟා වූ පසු ඔවුන්ගෙන් ප්‍රශ්න ගණනාවක්ම අසන්නට මට උවමනා වීය. මේ ප්‍රදේශ තුල දශක දෙකක් තිස්සේ සන්නද්ධ ගැටුමක් කෙරීගෙන යන බව ඔබ දන්නවාද? ඔබ කවද හෝ අවතැන් වී තිබෙනවාද? ගැටුමක් නිසා ඔබේ ආදරණීයයන් ඔබට අහිමි වී තිබෙනවාද? ඔබේ ඉඩම හො ඔබට අයිති දේවල් හෝ උදුරාගෙන තිබෙනවාද? ශ්‍රී ලාංකාවත් එහි ජනතාවත් ගැන, එහි සමාජ සැකසුම ගැන, ගැටුමේ පසුබිම ගැන, එම ගැටුමට මැදි වී සිටින අය ඊට දක්වන නම්‍යශීලි ආකල්ප සහ එය සමග ගණුදෙනු කරන උපායමාර්ග ගැන, ඔවුන් දන්නේ ඉතා ස්වල්පයක් බව වැඩි කාලයක් යන්නට මත්තෙන් පැහැදිලි විය. ඒවාගේම ඔවුන් උපුටා දැක්වූ නිර්දේශ සුනාමියෙන් අසරණ වූ අයගේ අවබෝධතාවයන් මත පදනම් වු ඒවා ද නොවේ.

හදිසි සහන සේවා ප්‍රවීණයින් වැඩි වැඩියෙන් ප්‍රදේශය වෙත ලඟාවත්ම පශචාත්-සුනාමි ජන ජීවිතය සමායතන විසින් අත්අඩංගුවට ගත් සෙයක් පෙණින. පුංචි මාළුන් ලොකු මාළුන් විසින් ගිලදැමීම ආරම්භ විය. නව ආයතන තමන්ගේම මෙහෙයුම් ලහි ලහියේ ආරම්භ කළේ ප්‍රදේශයේ තිබෙන ප්‍රජා සහ සංවිධාන ව්‍යුහයන් අවතක්සේරු කරමිනි. දේශීය නිවාස වෙළඳපොලේ මිල ගණන් ඉතා ඉහළ නගින්නට පටන් ගත් අතර විදේශ මුදල් පොදි විසින් සේවා නියුක්ති වෙළඳපොල ද අවුලට පත් කළේය. දින කිහිපයක් ඇවෑමෙන්, මෙකී ආයතන කටා කළේ ඔවුන් මීට පෙරාතුව සිටම ලංකාවේ ක්‍රියාත්මක වී සිටියා වාගේය. සීග්‍රයෙන් සිදුකරන ආරම්භක තක්සේරුවකින් පසුව, අවශ්‍යවන්නේ කුමක්ද'යි කළයුත්තේ කුමක්ද'යි ඔවුනට ඉඳුරා පවසන්නට පුළුවන් වනු ඇතැ'යි ඔවුහු අපට සහතික වූහ. ඇත්තෙන්ම ඒ ආත්ම විශ්වාසය ඇඟ කිළිපොලායනසුළුය. එක්තරා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයකින් කියා සිටියේ දිස්ත්‍රික්කයේ තිබෙන සෑම දෙයක්ම තුන්මාසයක් ඇතුලත තමන් පුනරුත්ථාපනය කරන බවය.

සහනාධාර භාණ්ඩ කඩිමුඩියේම ඉතා ආවේග ශිලීව බෙද හරිනු ලැබිණ. සමහර අවස්ථාවලටදී භාණ්ඩ තොග පිටින් තැන තැන දමා යන ලද්දේ සහනාධාර ලබන ජනතාවගේ සංඛ්‍යාව කෘතිම අයුරින් වැඩිකරගැනීම සඳහාය. එවිට ඒ ගැන පුරාජේරු කියන්නට තම වෙබ් අඩවි සහ පුවත්පත් නිවේදන ඔස්සේ ඒජන්සිවලට පුළුවන්කම ලැබෙන්නේය. පාවිච්චි කරන ලද ඇඳුම්, සංස්කෘතික වශයෙන් නුසුදුසුද ගුණයෙන් බාලද කියා සොයා බලන්නට කිසිවෙකුටත් වුවමනා නොවීය. සමහර සහනාධාර තොගවල තිබූ කාන්තා අඩි උස සපත්තු සහ නාන ඇඳුම් භානියට පත් ප්‍රදේශවලට පිටත් කොට එවන ලද්දේ විමසා නොබලාය. නෑ හිතවතුන් ලඟ සිටි අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් නොසලකා හැරුණු අතර ආයතන කල්පනා කළේ කඳවුරු තුල ගාල් වී සිටි අයට පමණක් බහුවිධ උපකාර කළ යුතු බවය. ලැබෙන දෙයක් එපා කියන්නට කිසිවෙකු අකැමති හෙයින් සමහර පවුල්වලට ලැබී තිබුනේ ආහාරමය-නොවන සහනාධාර භාණ්ඩ පමණී. මෙවැනි අසංවිධානාත්මක බෙදහැරීම් නිසා පවුල් අතර හටගත් ගැටුම් ද ඉහළ ගියේය. සමහර ළමයින් තමන් ලද අළුත් බෑග් සහ පොත් ආඩම්බරයෙන් ප්‍රදර්ශනය කරද්දි කිසිවක් නොලද සමහර ළමයි දුකෙන් හරිත වූහ. නොයෙකුත් විදේශීය භාෂාවලින් ලේබල් කරන ලද බෙහෙත් තොග අතිවිශාල ප්‍රමාණවලින් කඳවුරු වෙත ළඟා විය. විවිධ ජන කණ්ඩායම්වලට අයත් විවිධ වෛද්‍යවරුන් නියම කරන විවිධ බෙහෙත් අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩියෙන් ප්‍රමාණයක් කඳවුරුවල ජිවත්වන අයට ලැබිණ.

කඩිමුඩියේම මුදල් වියදම් කරන්නටත් භාණ්ඩ බෙද හරින්නටත් සිදුව තිබූ නිසාම බැට කෑ ජනයා සමග වාඩිවී ඔවුනගේ දුකට සවන් දෙන්නට හෝ මුහුද විසින් ඇති කර තිබූ බිය පහකර දැමීම සඳහා උදව් වන්නට හෝ ළමයින් සැනසිලි බස් දෙඩවන්නට හෝ කාලවේලා තිබුනේ නැත. ඒ වෙනුවට, එක්කෝ තවත් සුනාමියක් නැත්තම් ආණ්ඩුවේ අළුත් සැලැස්මක් ආදී වශයෙන් පැතිරෙන බොරු ආරංචි නිසා ජනයා එකදිගටම බැට කමින් සිටියහ. ඒ හේතුකොටගෙන භීතිය වැඩි වී ඔවුනගේ මානසික පීඩනය තව තවත් ඉහළ ගියේය. පදිංචිවීම සඳහා කිසිවෙකුට අවසර නොදෙන වෙරළ ආරක්ෂක කලාපය මීටර 100 පළල තීරුවක්ද මීටර 300 පළල තිරුවක් ද කියා පැහැදිලි නොවීය. සෑමදමත් වෙරළබට ජිවත් වූ ධීවරයින් එක්කෝ රට අභ්‍යන්තරයේ සිට වෙරළට ඇවිදගෙන ආ යුතු සෙයකි-තම බෝට්ටු දැල් ආම්පන්න ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක නියාමකයින් සේවයේ යොදවාගන්නට ඔවුනට සිදුවන සෙයකි. පිටස්තරයින් පැමිණ වෙරළබඩ පලාත් පුරා විසිරී තිබූ සුන්බුන් ඉවත්කොට එම පලාත් පිරිසිදු කිරීමත් ජනයා පදිංචි වී සිටි කැඩී බිඳී ගිය ගෙවල් දෙරවල්වල ඉතිරි සුන්බුන්ද කලින් පදිංචිව සිටි අයගේ අවසරයක් නොමැතිව බිමට ඇද දැමීමත් හේතුකොට ගෙන ධීවර ජනයා අතර දැඩි බියක් පැතිර ගොස් තිබිණ. තමන් කලින් වාසය කළ, තම ගෙවල් දෙරවල් පිහිටා තිබෙන, ඉඩකඩම්වල සැලසුම්කරුවන් විසින් සුඛෝපභෝගී හෝටල ඉදි කරන්නට යතැ'යි යන අනියත බිය ඔවුන් අතර පැතිර ගොස් තිබිණ.

*අයිරින් ෆ්‍රේසර් ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන ප්‍රධාන ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක සේවය කළාය. විද්‍යුත් තැපෑල: irene_fraser@yahoo.co.uk*

---

# බුරුමයේ සංක්‍රමණික ශ්‍රමිකයන් වෙත මානවදයාවාදී ප්‍රතිචාරය

**පියා ඔබෙරෝයි**

*ඕනෑම මානවදයාවාදී ප්‍රතිචාරයක් පදනම් විය යුතු මූලික මානව අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන දකුණු සහ දකුණු අග්නිදිග ආසියාවේ විශාල ජන කොටසකට අහිමි කරන ලද්දේය.*

"අක්‍රමවත්" සහ "වාර්තා නොකරන" ලද සංක්‍රමණිකයෝ, ගෘහ සේවකයෝ, ගොවිපල කම්වරුවෝ, එසේත් නැත්නම් පවිත්‍රකරුවෝ ලෙස ලොව පුරා රැකියාව කරති. මෙම රැකියාවන් බොහෝ දුරට අපවිත්‍ර, අවමන්සහගත, අනතුරුදායක ඒවා වේ. සුනාමියට පෙර බුරුම ජාතික සංක්‍රමණික සේවකයන් තායිලන්තයේ මුහුදුබඩ ප්‍රදේශවල අඩු සුදුසුකම් පවතින අංශවල එනම් ගොඩනැගීම් අංශය, ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය ආදී විවිධ අංශවල සේවයෙහි නතර වූහ. ප්‍රායෝගිකත්වය සහ ප්‍රතිපත්තිය වශයෙන් තායි බලධාරීන් මෙම සුනාමියෙන් හානි වු බුරුම සංක්‍රමණික කම්කරුවන් වෙත දැක්වූ ප්‍රතිචාරය බොහෝදුරට විෂමසහගත සහ මානව හිමිකම් උල්ලංඝනය වීමක් වීය.

සුනාමි ඛේදවාචකයෙන් මිය ගිය බුරුම සංක්‍රමණික කම්කරුවන් ගණන ඇස්තමේන්තු කර ඇත්තේ 700 - 2500 ටත් අතර සංඛ්‍යාවක් ලෙස වන අතර මෙලෙස ඇස්තමේන්තු කර ඇත්තේ වැඩියෙන්ම සුනාමිය බලපෑ දකුණු තායිලන්ත ප්‍රාන්තවල පදිංචිව සිටි මුළු බුරුම සංක්‍රමණික කම්කරුවන් ගේ ජනගහනය වන 120,000 යන සංඛ්‍යාවෙනි. තුවාලවුණු සහ අතුරුදහන්වූ බුරුම ජාතිකයන්ගේ නිවැරදි සංඛ්‍යාව තවමත් හරිහැටි නිශ්චිත නොවන අතර සමහර වාර්තා මෙම අතුරුදහන් වූවන්ගේ සංඛ්‍යාව 4000 තරම් බව පවසයි. සංක්‍රමණ පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOM), ලෝක බැංකුව සහ එක්සත් ජාතීන්ගේ සංගම්වලින් සමන්විත වූ සුනාමියේ බලපෑම තක්සේරු කිරීමේ කමිටුව විසින් ප්‍රකාශ කරන ලද්දේ තායිලන්තය තුල බුරුම සංක්‍රමණික කම්කරුවන් අවම වශයෙන් 7000 හෝ සුනාමි ඛේදවාචකයෙන් පීඩාවට පත්වී ඇති බවයි. මෙම පීඩාවට පත් නිශ්චිත සංඛ්‍යාව පිළිබඳ අවුලක් පවතින්නේ තායිලන්තයේ රැකියාව කරන සහ ජිවත්වන දහස් ගණන් සංක්‍රමණිකයන් පිළිබඳව තොරතුරු ලියාපදිංචි කර නැති

හෙයින් ඒවා නිල සංඛ්‍යා ලේඛනවලට ඇතුළත් වී නැති නිසාය. ඒ හැරුණු විට මෙය තවත් දුෂ්කර වී ඇත්තේ බොහෝ දෙනාගේ නිල හැඳුනුම්පත් සහ රැකියා පිළිබඳ අවසර පත්‍රිකා මුහුදට ගසාගෙන ගොස් ඇති නිසාය.

## ආධාර දීමේදී ඇතිවූ අසාධාරණකම්

සුනාමියෙන් පසුව ඇතිවූ ව්‍යාකූල වාතාවරණය තුල බොහෝ බුරුම සංක්‍රමණික කම්කරුවන්ට මානවවාදී ආධාර ලබාගන්නට හැකිවූයේ අවසානයේදීය. එයද ලැබුනේ යම් ලෙසකින් එම ආධාර සඳහා නිල ලෙස අවසරයක් ලදහොත් පමණය. තායිලන්ත රජය විසින් නිවේදනයක් නිකුත් කරමින් පැවසුවේ මෙලෙස ආධාර ලබාගැනීමට සුදුසුකම් ඇත්තේ තායිලන්තය තුල නිත්‍යානුකූලව දීර්ඝ කාලීනව ජීවත්වූ බව සහතික කරන්නට හැකිවන සංක්‍රමණික කම්කරුවන්ට පමණක් බවය. රාජ්‍ය නොවන සංවිධාන මගින් 2005 ජනවාරි මාසයේදී වාර්තා කරන ලද්දේ සමහර අවස්ථාවලදී මෙම නිත්‍යානුකූල නොවූ සංක්‍රමණික ප්‍රජාවන් කඳුවල සැඟවී සිටින බවත් ඔවුන් බොහෝ විට තුවාලවලින් සහ සාගින්නෙන් ඔත්පලව සිටින බවත්ය. මෙම සංක්‍රමණිකයන්ට තායි රජයේ මහජන සෞඛ්‍ය සේවාවෙන් සපයන හදිසි සෞඛ්‍ය සේවය ලබා ගැනීමටද නොහැකි වූ අතර ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ ස්වේච්ඡා සංවිධානවලින් සපයන අහාරපාන සහ වෙනත් ආධාර මත යැපෙන්නට සිදුවිය.

*බලධාරීන් සිය ගණන් හෝ ඇතැම්විට දහස්ගණන් බුරුම සංක්‍රමණිකයන් බලහත්කාරයෙන්ම බුරුමයට පිටත් කොට යැව්වෝය.*

මානවදයාවාදී ප්‍රතිචාරය පදනම් වී ඇත්තේ මානව අවශ්‍යතා සහ මානව ගරුත්වය සාධාරණ රාමුවක් තුල ප්‍රතිෂ්ඨාපන කල යුතුය යන ප්‍රතිපත්තිය මතය. බුරුම සංක්‍රමණික කම්කරුවන් වෙත තායිලන්ත රජයේ ප්‍රතිචාරය මෙම ප්‍රතිපත්තියට සමගාමී නොවීය. ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට අනුව සියළුම මානවයින්, ඔවුන්ගේ නෛතික තත්ත්වය කුමක් වුවත්, තම ආර්ථික සහ සමාජ අයිතිවාසිකම් ඇතුළුව මූලික අයිතිවාසිකම් සමාජය මගින් ආරක්ෂා කල යුතුව ඇත. ආර්ථික සමාජ සහ සංස්කෘතික අයිතිය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 12 වැනි වගන්තිය[1] අනුව සියළුදෙනාටම ලබාගත හැකි උපරිම ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකට හිමිකම් කීමට අයිතියක් ඇත. තායිලන්ත රජය මෙම සම්මුතියේ පාර්ශවකරුවෙකි.

මෙම මානවදයාවාදී ආධාර නොලැබීමට අමතරව වෙනත් අසාධාරණයන්ට හා උල්ලංඝණයන්ට සුනාමියෙන් පසුව එලැඹුණු වාතාවරණයේදී බුරුම ජාතික සංක්‍රමණික කම්කරුවන්ට මුහුණ දෙන්නට සිදු විය. වෙරළබඩ තීරයේ කර්මාන්ත විනාශවීම හේතුවෙන් බොහෝ සේවාදායකයින් විසින් මෙම සංක්‍රමණික කම්කරුවන් අතහැර දමනු ලැබූහ. මෙම හේතුවෙන් නැතිවුණු රැකියා අවසර පත්‍ර යලි ලබා ගැනීමට මොවුන්ට අපහසු වූහ. සංක්‍රමණිකයන් විසින් සිදුකරන ලදැයි කියැවෙන අපරාධ පිළිබඳ ප්‍රවෘත්ති වාර්තා නිසා තායිලන්ත රජය විසින් විභාග යකින් තොරව සිය ගණන් බුරුම සංක්‍රමණිකයන් අත්අඩංගුවට ගන්නට යෙදුනි. සිය ගණන් හෝ ඇතැම්විට දහස්ගණන් බුරුම සංක්‍රමණිකයන් බලහත්කාරයෙන් බුරුම රජය වෙත භාර දෙන ලද අතර මෙලෙස භාරදුන් සමහර අයගේ මානව හිමිකම් උල්ලංඝණය වීමට බොහෝදුරට ඉඩ තිබුණි. ඔවුන්ගේ අවිධිමත් තත්ත්වය නිසා සිදුවන්නේ සේවාදායකයින් අතින් හෝ ආරක්ෂක නිලධාරීන් හෝ අතින් සංක්‍රමණික කම්කරුවන්ට මුහුණපාන්නට සිදුවන දුක්ගැහැට පිළිබඳ වාර්තාවීම් ඉතාමත් අඩු වශයෙන් හෝ කිසිසේත්ම හෝ වාර්තා නොවීමයි. තම රටේ දේශසීමා පාලනය කිරීම තායිලන්තයේ ස්වෛරිභාවයේ වරප්‍රසාදයක් වුවද රටතුල නීතිමය තත්ත්වයක් නොමැතිව සිටින සංක්‍රමණික කම්කරුවන්ට තමන්ගේ මූලික අයිතිවාසිකම්වලට ගෞරවයක් ලබා ගැනීමට අයිතියක් ඇත. හිතුමතේට අත්අඩංගුවට ගැනීම හා රඳවාගෙන සිටීම, නුසුදුසු තත්ත්වයන් යටතේ රඳවාගෙන සිටීම, සිවිල් සහ දේශපාලන අයිතිය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (International Covenant on Civil and Political Rights) 9 (1) සහ 10 වැනි වගන්ති[2] උල්ලංඝනය කිරීමක් වන අතර තායිලන්තය මෙම සම්මුතියේ පාර්ශවකරුවෙකු ද වන්නේය. එසේම මූලික වශයෙන් දැනට පවතින ජාත්‍යන්තර නීතියට අනුව වධහිංසාවට ලක්වීම ඇතුලුව යමෙකුගේ මූලික මානව අයිතිවාසිකම් උල්ලංඝනයවීමට ඉඩ කඩ ඇති නම් එවැනි පුද්ගලයෙකු මෙවැනි වාතාවරණයකට භාරදීමෙන් වැලකී සිටීම තායි රජයේ වගකීමකි.

## සියළුම සංක්‍රමණික කම්කරුවන්ගේ මානව අයිතිවාසිකම් රැකීම

සුනාමි ව්‍යසනය නිසා තායිලන්තයේ සිටින සංක්‍රමණික සේවකයන් විසින් නිරතුරුවම මුහුණ දෙන ප්‍රශ්න රාශියක් මහජන අවධානයට ලක් විය. ඉන් විශේෂ වන්නේ ප්‍රාදේශීය බලධාරීන්ගෙන් හා සේවාදායකයන් ගෙන් ඔවුන්ට අත්විඳින්නට සිදුවන වේදනාකාරී සැලකිලිය. මෙය මුළු ආසියාතික කලාපයේම මානවදයාවාදී ප්‍රතිචාර, ජාතික හා ප්‍රාදේශීය බලධාරීන් විසින්, ඒ ඒ රටවල ක්‍රියාත්මක කරන ආකාර පිළිබඳව ප්‍රශ්න මතුකරයි. අවධානයට ලක්විය යුතු කණ්ඩායමට මානවදයාවාදී ආධාර බෙදා දීමේදී සිදුවන අසාධාරණකම් පිළිබඳ වාර්තා ලංකාවෙන් ඉනදුනීසියාවෙන් තායිලන්තයෙන් සහ ඉන්දියාවෙන් ද ලැබී ඇත.[3]

සංක්‍රමණික සේවකයන්ගේ අසරණභාවය ඔවුන් සිටින "අක්‍රමවත්" තත්ත්වය නිසා වඩා තීව්‍ර වන අතර මෙය තවදුරටත් උග්‍රවන්නේ සංක්‍රමණික සේවකයන් ස්ත්‍රීන්, ළමයින් සහ වයස්ගත පුද්ගලයන් වන අවස්ථාවලදීය. එසේවුවද නිත්‍යානුකූල නොවූ සංක්‍රමණිකයන් සම්බන්ධයෙන් මෙවැනි අසාධාරණ ප්‍රතිපත්ති ලෝකය පුරා විවිධ රටවල් විසින් ක්‍රියාත්මක කෙරේ. තම රටතුල සිටින අක්‍රමවත් සංක්‍රමණික සේවකයන් ගේ ආරක්ෂාව තහවුරු කරන විධායක හා පරිපාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන රටවල් ඇත්තේ ඉතාමත් සුළු ප්‍රමාණයකි.

කුමන සංක්‍රමණික තත්ත්යක සිටියද සංක්‍රමණිකයන් ගේ මූලික මානව අයිතිවාසිකම් රැකීම විශේෂ කරගත් ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් විධික්‍රමයනට පාර්ශවකරුවන් වන්නේ රටවල් 29 බව විශේෂයෙන් කිවයුතු වේ. එනම් 2003 ජූලි මාසයේ ක්‍රියාත්මක වූ සියළුම සංක්‍රමණිකයන් සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ වන එක්සත් ජාතීන්ගේ සම්මුතිය (ICMW) වේ.[4]

මෙම ICMW සම්මුතිය සහ අනිත් කේන්ද්‍රිය මානව අයිතිවාසිකම් පනත් සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා වැදගත් වන උපකරණ වේ. එසේ වන්නේ දැනට සංක්‍රමණය පිළිබඳ පවතින විවාදවල ප්‍රධාන ලක්ෂණයක් වන සංක්‍රමණිකයන් පාලනය කර ඔවුන් සිර අඩස්සි කලයුතුය යන අදහසට එමගින් විකල්ප අදහස් ඉදිරිපත්වන නිසාය. මානවදයාවාදී ප්‍රතිචාර පිළිබඳ සන්දර්භය තුලදී සංක්‍රමණිකයන් නොසැලකා හැරීම, අසාධාරණයට ලක්කිරීම හෝ වදහිංසාවලට ලක්කිරීම වැනි දෑ සිදුවීම වැලැක්වීමේදී කේන්ද්‍රිය අවශ්‍යතාවක් වන්නේ සංක්‍රමණිකයන් ද මූලික මානව අයිතිවාසිකම්වලට හිමිකම් කියන මනුෂ්‍යයන් කොටසක් බව පිළිගැනීමයි.

*පියා ඔබෙරෝයි ජිනීවා නුවර ජාත්‍යන්තර ක්ෂමා ආයතනයේ සරණාගතයන් පිළිබඳ නිලධාරිනියක් වේ. මෙම ලිපියේ එන අදහස් ජාත්‍යන්තර ක්ෂමා ආයතනයේ අදහස් අවශ්‍යයෙන්ම නියෝජනය කරන්නේ නැත. විද්‍යුත් තැපෑල: POberoi@amnesty.org*

*සුනාමි ක්‍රියාකාරී කණ්ඩායම (TAG) වූකලි සුනාමියෙන් විපතට පත් බුරුම සංක්‍රමණික සේවකයින්ගේ තත්ත්වයන් සොයා බැලීම සඳහා සංවිධානය වූ රාජ්‍ය නොවන සංවිධානවලින් සහ ප්‍රජා-පාදක සංවිධානවලින් සමන්විත කණ්ඩායමකි. www.saydanatsunami.org විද්‍යුත් තැපෑල: tagmigrants@yahoo.com*

1. www.unhchr.ch/html/menu3/b/a_cescr.htm
2. www.ohchr.org/english/law/ccpr.htm
3. උදාහරණයක් වශයෙන් බලන්න, Human Rights Watch, 'End caste bias in tsunami Relief', 14 January 2005 http://hrw.org/english/docs/2005/01/14/india10019.htm; Amnesty International, 'Indonesia-Human Rights are paramount in the relief and reconstruction effort', 18 January 2005 http://news.amnesty.org/index/ENGASA210032005
4. www.ilo.org/public/english/employment/skills/recomm/instr/un_9.htm

# ඉන්දියානු සාකච්ඡා මණ්ඩපයක් සුනාමි ප්‍රතිචාර සමාලෝචනය කරයි

පෝලා බැනර්ජි සහ සබ්‍යසචි බාසු රේ චෞධරි

*ශාස්ත්‍රවේදීන් සහ මානව අයිතිවාසිකම් ක්‍රියාකාරයින් සහභාගි වූ, කල්කටාවේ පර්යේෂණ කණ්ඩායමක් විසින් සංවිධානය කරන ලද, සංවාද මණ්ඩපයක් තමිල්නාඩුව තුළ හා අන්දමන්/නිකොබාර් දූපත් තුල කෙතරම් දුරකට සහනාධාර සහ පුනරුත්ථාපන ආරම්භකක්‍රියා දියත් කොට ඇද්දැ’යි යන කාරණය තක්සේරු කළාය. කුලය, ආගම, ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම් වූ අසමානතාවයන්ගෙන් තොරව ආධාර ලබාගන්නට හානියට ලක්වූවනට තිබෙන අයිතිය එහිදි හඳුනාගනු ලැබීය.*

## තමිල්නාඩුව

යෝධ රළ පෙළින් හානියට පත් මිලියන 2.73 පමණ ජනතාවකගේ අවශ්‍යතා පිරිමසාලීම සම්බන්ධයෙන් තමිල්නාඩු ප්‍රාන්ත ආණ්ඩුවත් ඉන්දිය මධ්‍යම ආණ්ඩුවත් දැක්වූ ප්‍රථම ප්‍රතිචාරය දෙගිඩියාවෙන් පෙළුණු එකක් බව සංවාද මණ්ඩපයේදී අදහස් දැක්වූ කථිකයෝ කියා සිටියාහ.[1] කෙසේවෙතත්, සිවිල් සමාජ සංවිධාන විසින් නායකත්වය දෙනු ලැබූ ගලවාගැනීමේ සහ සහනාධාර ලබාදීමේ ආරම්භක ක්‍රියාන්විතයන් දියත්වද්දී ආණ්ඩුව විසින් මෙහෙයවන ලද සහනාධාර ප්‍රයත්නයන්ට සමහර ජන කණ්ඩායම් මුහුණ දී සිටි ත්ත්ත්වය අනෙකුත් අයට වඩා දරුණුය යන කාරණය පිළිගන්නට අපොහොසත් විය. රාජ්‍ය වැඩසටහන් හැඩගස්වා තිබුනේ සහනාධාර සහ පුනරුත්ථාපන අවශ්‍යතාවන් සම්බන්ධයෙන් මිට පෙර මුල්බැසගෙන තිබුණු අදහස්වලට අනුවය. වඩාත් ආපදාවට ලක්වූ ජන කොට්ඨාශවලට ආහාර ලබාදීමේ හදිසි අවශ්‍යතාවය රජයමින් තිබෙද්දී ආධාර දෙන ඒජන්සිවලට සිද්ධ වී තිබුනේ ආණ්ඩුවේ පරස්පර ප්‍රතිපත්තීන් විසින් ඇති කර තිබූ අවුල් ජාලා සමග පොර බදන්නටය. සුනාමියට ගොදුරු වූ බොහෝ ස්ත්‍රීන්ගේ ළමයින්ගේ මහළු උදවියගේ දලිත් සාමාජිකයන්ගේ (එනම් ඊණියා “කුලහීනයන්ගේ”) හා වෙනත් මදිපුංචිකම්වලට ලක් වූ සුළුතර ජනයාගේ අවශ්‍යතාවයන් තවමත් ආමන්ත්‍රණය කොට නැත.

සමානුපාතික වශයෙන් බලනකල, හානියට ලක් වූ අනෙකුත් අයට වඩා ධීවර ප්‍රජාව උදව් උපකාර ලබා තිබුණි. එහෙත් මේ වනවිට තමිල්නාඩු ධීවර ප්‍රජාවෙන් කර්මාන්තය ආරම්භ කොට ඇත්තේ තුනෙන් එකකටත් වඩා අඩු පිරිසකි. ධීවර ප්‍රජාවන් පුනරුත්ථාපනය කිරීමේ කාර්යය කෙටිකාලීන පෙර දැක්මක් තුලින් සිදු කළ යුත්තක් බවට තීරණය වී ඇත. ඒ අනුව ධීවර ප්‍රජාවන්ට ලැබෙන ආධාරවලින් පහෙන් හතරක්ම ඔවුනට දෙන්නේ ණය ආධාර හැටියටය. තමන් සන්තක සියල්ලම පාහේ අහිමිව ගොස් තිබෙන හෙයින් මේ ණය ගතහොත් එය නැවත පියවා ගන්නට ලැබෙන්නේ නැතැ’යි යන බියෙන් ධීවරයෝ පෙළෙමින් සිටින්නාහ. ඒ වාගේම පතල් සමාගම් වැලි ගොඩ දමමින් ඒවා එකතුකිරීමේ කාරියක නිරතව සිටින්නේ එම පලාත තුල කිසිදු අවතැන්වීමක් මෙතෙක් සිදු නොවූ පරිද්දෙනි. ඔවුන්ගේ වැඩකටයුතු නියාමනය කෙරෙන්නේ ඉතා අසතුටුදයක අන්දමින්ය. එහෙත් සමහර පවුල් පවසන්නේ වැලි එකතු කරන්නට සමාගම්වලට ඉඩ නොදුන්නා නම් තම ඉඩ කඩම් කෙසේවත් බේරාගත නොහැකිවන බවයි. කඩොලාන ශාඛා වලට සිදු වූ විනාශය හේතුකොටගෙන පස සෝදා යාම තව තවත් නරක අතට හැරී තිබේ.

අරමුදල් හිඟයක් නැතිවුවද ඒවා පරිහරණය කිරීමේදී තිබිය යුතු වගකීම්සහගතභාවය පවතින්නේ ඉතා දුප්පත් අඩියකය. ආසියානු සංවර්ධන බැංකුව තමිල්නාඩු ප්‍රාන්ත ආණ්ඩුවට සෑහෙන තරම් සම්පත් ප්‍රමාණයක් ලබා දී තිබෙන අතර අගමැති සහනාධාර අරමුදලත් මහඇමතිගේ සහනාධාර අරමුදලත් සෑහෙන තරම් ප්‍රදානයන්ද ලබා දී තිබේ. භාවිතය සඳහා නිකුත් කර තිබෙන අරමුදල් ආණ්ඩුවේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සුදුසු ලෙස පරිහරණය කරන්නේදැ’යි දැනගනු වස් විනිවිදභාවය ඉල්ලා කෙරෙන ඉල්ලීම්ද විශාල වශයෙන් වැඩිමෙවින් පවති.

කෙසේවෙතත් සහනාධාර ක්‍රියාන්විතයන් දියත් වී ඇත්තේ එතරම් සංවේදීත්වයකින් නොවන බැව් හෙළිදරව් වී ඇත:

- දුම්රිය පෙට්ටි පුරවා උතුරු ඉන්දියාවෙන් එවන ලද උණුසුම් පෝරෝණාවලින් අධික තාපයෙන් සහ තෙත් දේශගුණයකින් යුත් තමිල්නාඩු ප්‍රාන්තයේ වාසය කරන සුනාමියෙන් පීඩාවට පත් වූවන්ට ලැබෙන ප්‍රයෝජනයක් නැත.
- පරිත්‍යාග ලෙස ලැබුණු අඳින ලද පරණ ඇඳුම් පාවිච්චි කිරීම ධීවර ජනයා කෝපයෙන් ප්‍රතික්ෂේප කළහ.

*වෙරළබඩ ප්‍රදේශයේ ඉදිකල තාවකාලික නිවාස, ඉනින්දකරෙයි, ඉන්දියාව*


Peter Howring/DanChurchAid/ACT International

- දිස්ත්‍රික් පාලකයින් සහ ප්‍රාදේශීය පංචායත් සභා යන දෙගොල්ලන්ම ස්ත්‍රීන්ට සැලකීම ආන්තික කාරණයක් වශයෙන් සැලකූහ. සහනාධාර ක්‍රියාන්විත සඳහා ස්ත්‍රී පරිපාලකයින් සේවයේ නොයෙදූ අතර පුරුෂ නිලධාරීයෝ ස්ත්‍රීන්ගේ හා ළමුන්ගේ අවශ්‍යතා හමුවේ සංවේදී නොවූහ. උදහරණයක් වශයෙන්, ස්ත්‍රීන්ට සාරි ලබා දුන්නද ඔවුනට යටඇඳුම් ලබා නොදීමේ කාරණය දක්වත හැකිය.
- සහනාධාර මුදල් හැමවිටම ගෙවන ලද්දේ ගෘහමූලික පිරිමියාටය. නැතිවූ නෑයින් වෙනුවෙන් ගෙවන වන්දි ලබා දෙන ලද්දේද පිරිමින්ටය. එකී මුදල් යථා පරිද්දෙන් පරිහරණය වේදැ'යි කිසිදු සහතිකයක් ලබා නොගෙන එසේ කරන ලද්දේය.
- කිසිවක් කරකියාගත නොහැකි අසරණ ස්ත්‍රීන් කැමරා කෝණවලට හසුකරගැනීම සඳහා ඡායාරූප ශිල්පියෝ පොරකෑහ.
- එදිනෙද ආහාරය වශයෙන් බත් කන මිනිසුනට චපාති රොටී දෙන ලද්දේය.

ප්‍රමාණවත් අරමුදල් සංචිත සහිත බොහෝ දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට ඒවා වියදම් කිරීමට අවකාශ නොලැබුනේ සුනාමියට පෙරාතුව වෙරළබඩ වශයෙන් සැලකුණු ප්‍රදේශ සඳහා රෙගුලාසි පණවන්නට ඉන්දීය ආණ්ඩුව ලකලෑහැස්ති වූ නිසාය. එබැවින් සුනාමිය නිසා අයසට පත්වූවන් වෙනුවෙන් නිවාස ඉදි කරන්නට, අයසට පත්වූවන්ගේ ජීවිතය පවත්වාගෙනයෑම සඳහා අවශ්‍ය සම්පත් ඔවුනට සොයා දෙන්නට, එකී සංවිධානවලට නොහැකි විය. වෙරළ තීරයේ සිට මීටර 200 ඇතුලට වන්නට ජනයා පදිංචිකරවීමේ තීරණය ගැටළුවලට තුඩු දී තිබේ. වෙරළබඩ සංරක්‍ෂණ රෙගුලාසි ක්‍රියාත්මක කරවීමේදී දක්නට ඇත්තේ ද අඩු විනිවිදභාවයකි. මෙම තහනමේ නිත්‍යානුකූලභාවය ගැනත් බලහත්කාරයෙන් නැවත පදිංචි කරවීම නිසා වෙරළබඩ පලාත් බහුජාතික සමාගම්වල පාලනයට නතු වනු ඇතැ'යි යන බියත් බොහෝ දෙනා තුළ පවතී.

ආණ්ඩුවේ දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයක් නොපවතින අතර පරිපූර්ණ පුනරුත්ථාපන ප්‍රතිපත්තියක්ද ඒවාට නැත. උපකාර ලබාගැනීම සඳහා තමනට තිබෙන අයිතිය තහවුරු කරන සාක්‍ෂි සපයාදීමේ බර පැටවී ඇත්තේද අයසට පත්වූවන්ගේම කර මතය. සුනාමි සහන ක්‍රියාන්විතය සිදුවද්දී ස්ත්‍රීන්ට එරෙහිව සිදුකරන මදිපුංචිකම් ගැන මුනිවත රැකීමේ ප්‍රතිපත්තියක් දේශපාලන පක්‍ෂත් ස්ත්‍රී සංවිධානත් අනුගමනය කරන බව පෙනෙන්නට තිබේ. සහන ක්‍රියාන්විතවලදී මුස්ලිම් සංවිධාන රඟපාන භූමිකාව පිලිගැනීමද ප්‍රතික්‍ෂේප කොට තිබේ. ආණ්ඩුව සිවිල් සමාජ සංවිධානවලට ඇහුම්කන් දෙනමුත් ඔවුනගේ නිර්දේශ පිලිගන්නේ නැත.

පෙනෙන හැටියට, ආණ්ඩුවේ නිලධාරීන් මූලික වශයෙන් පෙළඹී සිටින්නේ ඔවුන්ගේ ප්‍රතිරූපය රැකගැනීමට හෙයින්, ඔවුහු විවේචනාත්මක ජනමාධ්‍ය ආවරණ මගහැර සිටින්නට පුළුවන් තරම් උත්සාහ ගන්නාහ. අනෙක් අතට, රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් මූලික වශයෙන්ම උනන්දුවන්නේ තමනට වාසිසහගතවන අන්දමේ ජනමාධ්‍ය ප්‍රතිචාර ලබාගන්නටය. එක් සහභාගිකයෙක් සුනාමි ඛේදවාචකය නිසා ප්‍රයෝජන ලබන පාර්ශ්ව තුනක් මෙසේ ලැයිස්තු කළේය: හෝටල් හිමියන්, රථ වාහන කුලියට දෙන සමාගම්, ආපද සංචාරක මාර්ගෝපදේශකයින් වශයෙන් කටයුතු කරන ප්‍රතිපත්තිගරුක නොවන දේශීය රාජ්‍ය නොවන සංවිධාන.

ආහාර බෙද දෙන්නේ නොදෙන්නේ කවුද කියා තවමත් තීරණය කරන්නේ ආණ්ඩුවය. සිවිල් සමාජ ආයතනවල භූමිකාව තව තවත් පුළුල් වූවත් ඉන්දීය මධ්‍යම පංතිය හා අනේවාසික ඉන්දියානුවන් සෑහෙන ප්‍රමාණයක් සම්පත් සපයා දුන්නත් තවමත් සිවිල් සමාජය සෝදිසියට ලක් කරන්නේ රජයයි. එහෙත් සිදුවිය යුත්තේ එහි අනෙක් පැත්තය.

## මහාද්වීපික මානසිකත්වය අන්දමන් සහ නිකෝබාර් දූපත්වල සහන සේවා කටයුතු හැඩගන්වයි

අන්දමන් සහ නිකෝබාර් වනාහි උතුරෙන් දකුණට මීටර 700ක වපසරියක් වසා පැතිරෙමින්, ඉන්දියානු ප්‍රධාන භූමියෙන් කිලෝ මීටර 1,200 නැගෙනහිරට වන්නට, බෙංගාල බොක්කේ පිහිටා තිබෙන හුදෙකලා දූපත් සමූහයකි. සුමාත්‍රාවට කිට්ටුවෙන් පිහිටා තිබෙන, ඉන්දීය බලධාරීන් විසින් දැඩි පාලනයකට යටත්කොට තිබෙන, නිකෝබාර් දූපත් සමූහය සුනාමියෙන් දරුණු ලෙස පීඩා වින්ද අතර මේවායේ වාසය කරන ආදිවාසී ගෝත්‍රික ජනයා 3,000 පමණ ඊට ගොදුරු වී මිය යන්නට ඇතැ'යි ගණන් බලා තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයකින් හෝ ව්‍යවස්ථාදයක ව්‍යුහයකින් හෝ තොර නිකෝබාරය දිගුකාලයක පටන් "ප්‍රධාන භූමිවාසීන් " ආරම්භ කරන ලද නුසුදුසු සංවර්ධන යෝජනා ක්‍රමවලට යටත් කරවා ඇත. මේ යෝජනාක්‍රම විසින් වෙරළබඩ පරිසරයට සිදුකරන ලද හානිය තවදුරටත් තීව්‍ර වී ඇත්තේ වෙරළබඩ කලාපය තුළ ගොඩනැගිලි ඉදිකිරීම තහනම් කරමින් පණවා තිබෙන රෙගුලාසි දේශීය ප්‍රභූන් හා ඉන්දීය ගුවන් හමුදව විසින් උල්ලංඝණ කරන නිසාය.

දේශපාලන සංවිධාන හා සිවිල් සමාජය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සහනාධාර අවශ්‍යතා සඳහා නිලධාරිවාදී ප්‍රතිචාරයක් ලැබීම අනිවාර්යය. සිදුවූ දේපොල හා ජීවිත හානිය තක්සේරු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ හෝ වෙනත් ජාත්‍යන්තර ආයතනවල හෝ ආධාරය ලබන්නට ඉන්දීය ආණ්ඩුව කැමති වූයේ නැත. සහනාධාර ක්‍රියාන්විතයන් සඳහා විදේශීය අරමුදල් පිළිගන්නට ඉන්දියාව ආයතනවලට දිරි දුන්නේය. දූපත් සමූහය තුල ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට අවසර ලබා දී තිබුනේ UNICEF සංවිධානයට පමණී. ස්වකීය සැපයුම් පෝට් බ්ලෙයාර්වලට ලඟාවූ වහාම ඒවා අත්අඩංගුවට ගන්නා ලදැ'යි ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය චෝදනා කළාය. විදේශීය මාධ්‍යවේදීන් සහ සහන සේවකයින් පෝට් බ්ලෙයාර් තුල සිර වී සිටි අතර නුදුරේ පිහිටි එකම දූපතක හෝ සංචාරය කිරීම සඳහා ඔවුනට අවසර නොලැබිණ.

සිවිල් පරිපාලන ක්‍රියාන්විතවලින් ඉතා සාර්ථක ලෙස ඈත් කර තබා, දේශීය ප්‍රජාවන්ගෙන් නොවිමසා, සහනාධාර සහ පුනරුත්ථාපන කටයුතු දියත් කරන විට ඒවාට අනිවාර්යයෙන්ම නායකත්වය දෙන්නේ ඉන්දීය හමුදවය. කෙසේවෙතත් දේශීය ජනයාගේ අදහස් සහ අවශ්‍යතා සලකා බැලීමත් ඔවුන්ගේ දේශජ දැනුමට ගරු කිරීමත් මෙහිලා අනිවාර්ය කාරණයකි. උදහරණයක් වශයෙන්, ස්වකීය අවශ්‍යතාවලට නොගැලපෙන නිසා නිකොබාර් ධීවරයින් ප්‍රධාන භූමියේ නිෂ්පාදනය කරන ලද ධීවර ආම්පන්න බාරගැනීම සුනාමියට පෙරාතු කාලවලදී පවා ප්‍රතික්‍ෂේප කර තිබීමේ කාරණය දක්වත හැකිය.

ආපදවේ ප්‍රතිඵලයක් හැටියට දූපත්වාසී ධීවර ජනතාව හානියට පත් වී සිටින අතර කඩොලාන වනය තැනින් තැන උදුරා වැටී කොරල් පර තැනින් තැන කැඩී බිඳී ගොස් ඇත. පිටින් පැමිණ පදිංචි වී සිටින උදවියත් ධීවර ජනතාවත් අතර අනාගතයේදී ප්‍රධාන පෙළේ ජනවාර්ගික ගැටුම් ඇතිවෙතැ'යි බියක් ද පවතී.

## ඉගෙනගත් පාඩම්

සහනසේවා සැපයීම නම් සන්දර්භය තුළ රාජ්‍යය සමග කරට කර ගැටෙමින් සිවිල් සමාජය හා ප්‍රජාවන් රඟපාන භූමිකාව ගැන නැවත සිතා බැලීම හදිසි අවශ්‍යතාවයකි යන කාරණය සුනාමි ආපදව විසින් දැඩිව මතුකොට තිබේ. ඒ අනුව සංවාද මණ්ඩපයේදී මතුවූ මූලික ප්‍රතිපත්තිමය නිර්දේශ පහත සඳහන් අයුරින් දක්වත හැකිය:

- සහනසේවා ආයතන අතරේ සුවිශාල සම්බන්ධතාවයක් තිබිය යුතු අතර ආපදවේ බලපෑම සහ ආපදවට ලක්වූවන්ගේ අවශ්‍යතා පිළිබඳ තොරතුරු හුවමාරුවක්ද තිබිය යුතුය.
- සහනාධාර සංවිධානය විය යුත්තේ ආපදවන්ට ලක් වූ ප්‍රජාවන්ගේ අවශ්‍යතා අනුව මිස සතුව තිබෙන සහනාධාරවලට අනුකූලව නොවේ.
- තමනට සුදුසු කුමන ආකාරයේ සහනාධාරදැ'යි තීරණය කළ යුත්තේ සුනාමියෙන් පීඩාවට පත් ප්‍රජාවන්ය. ආපදවට මුහුණ දෙන්නට ජනයා සූදනම් කිරිමෙහිලා ඊට ප්‍රතිචාර දැක්වීමෙහිලා පංචායත් සභා විශාල කාර්යභාරයක් ඉටු කළ යුතුය.
- සහනාධාර හා පුනරුත්ථාපන වැඩසටහන්වල සියළු පැතිකඩවලදී ස්ත්‍රීන්ගේ හඬට ප්‍රමුඛස්ථානයක් ලබා දිය යුතුය.
- සහනාධාර බෙදහැරීමේදී කුලය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය, ආර්ථික තත්තත්වයන් යනාදි කාරණා පදනම් කරගෙන සිදු කෙරෙන අසමානතාවයන් මැඩ පැවැත්විය යුතුය.
- අන්දමන් සහ නිකෝබාර් දූපත් සමූහය සතු සුවිශේෂත්වයන් කල්පනාවට ගත යුතුය.
- පශ්චාත් ආපද සම්පත් බෙදහරින සහ වියදම් කරන අකාරය ගැන ආණ්ඩුවේ ආයතන දැඩි විනිවිදභවයකින් කටයුතු කළ යුතුය.
- පුනරුත්ථාපන සැලසුම්කරුවන් ආණ්ඩුවේ ඉඩම් ප්‍රතිපත්ති සහ ග්‍රාමීය ආර්ථිකයන් මත්තේ එම ප්‍රතිපත්ති ඇති කරන බලපෑම් අධීක්‍ෂණය කළ යුතුය.

*පෝලා බැනර්ජි FMR කර්තෘ මණ්ඩල උපදේශක සභාවේ සාමාජිකාවකි. මහනිර්බන් කල්කටා පර්යේෂණ කණ්ඩායමේ (MCRG) (www.mcrg.ac.in) පර්යේෂණ සම්බන්ධීකාරකයාය. විදයුත් තැපැල: paula@mcrg.ac.in*

*සබ්‍යසචි බාසු රේ චෞධරි MCRG කණ්ඩායමේ සාමාජිකයෙකු වන අතර කොල්කතාවේ රබීන්ද්‍ර භාරති විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා අංශයේ උගන්වයි. විද්‍යුත් තැපැල: sabyasachi@mcrg.ac.in*

සම්පූර්ණ වාර්තාවක් www.mcrg.an.in/tsunami.htm නම් වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

1. සංවාද මණ්ඩපය ඇමතූ කථිකයන් මෙසේය: ආචාර්ව ලූවී (People's Watch, Tamil Nadu www.pwtn.org); බිම්ලා චන්ද්‍රසේඛර් (Ekta Resource Centre for Women, Tamil Nadu www.ektaonline.org), කේ. එම්. පරිවේලන් (මානවදයාවාදී ක්‍රියාකාරකයෙකි, තමිලනාඩුවේ චෙන්නායි පුරවරයේ UNHCR කාර්යාලයේ සේවයේ නියුතුව සිටී.), සමීර් ආචාර්ය (Society for Andaman and Nicobar Ecology www.andaman.org/book/Sane/sanetext.htm) සහ සුධීර් බෞමික් CRG සාමාජිකයෙකි, BBC සේවා නියුක්තිකයෙකි).

# තමිල්නාඩුවේ ආපදගිලි ජන කණ්ඩායම් වෙනුවෙන් හඬක්

මැක්ස් මාටින්

*සුනාමිය හේතුකොටගෙන තමිල්නාඩු නම් ඉන්දිය ප්‍රාන්ත රාජ්‍යය තුල ජීවත්වන ආපදගිලි ජන කොටස්වලට ගේදෙර, ජීවනෝපාය, දරුවන් පාසැල් යැවීම ආදී සියල්ලම අහිමි විය. දැනටමත් ආන්තික වී සිටින මේ සමාජ කණ්ඩායම්වලට උදව් උපකාර කිරීමේදී ඔවුන්ගේ සුවිශේෂ අවශ්‍යතා කෙරෙහි වඩාත් සංවේදී විය යුතුය.*

මරියම්මාල් වෙසෙන කුඩා ගම්මානය සුනාමියෙන් යට වූ අවස්ථාවේදී ඇගේ ඔරුවත් මාළු දැල් ටිකත් ඇයට අහිමි විය. ඉරුල ගෝත්‍රික ජනයා වැඩි වශයෙන් වෙසෙන ඇගේ ගම්මානය පිහිටා ඇත්තේ ප්‍රාන්ත රාජ්‍යයේ අගනුවර වන චෙන්නායි පුරවරය සහ ඊට කිලෝමීටර 60ක් උතුරින් පිහිටි පූලිකාට් කලපුව අතර පිහිටි කුඩා බිම් තීරුවකය. ආදිවාසී ගෝත්‍රික ප්‍රජාවේ හෝ දලිත් ප්‍රජාවේ හෝ අයට අසල පිහිටා ඇති මුහුදේ මසුන් මැරීමට ඉඩ දෙන්නේ නැත. එය ගෝත්‍රික නොවන ධීවරයින් ගේ සාම්ප්‍රදායික මුහුදු රක්ෂිතයයි. මීට අවුරුදු දෙකකට පෙරාතුව ඉරුල ගෝත්‍රිකයන් කීප දෙනෙකු මේ තහනමට අභියෝග කොට මසුන් මැරීමෙහි යෙදුනාහ. එහිදී හටගත් ගැටුම කෙළවර වූයේ ජීවිත දෙකක් පූජා කිරීමෙනි. “අපේ උදවියට සිද්ධ වුනා දිස්ත්‍රික්කයේ නිලදාරි මහත්තුරුනට සහතික වෙන්ඩ මූදේ මාළු මරන්නේ නැහැ කියලා”, මරියම්මාල් පැවසුවාය. ගමේ වෙසෙන ගෝත්‍රික කාන්තාවෝ සාම්ප්‍රදායිකව කලපුව තුල ඉස්සෝ, කලපු කකුළුවෝ ආදිය අල්ලති. ගමේ තිබෙන කොල්ලෑ ඔරු 40න් 28ක්ම අයිති කාන්තාවන්ටය. සුනාමිය නිසා ඔරු සියල්ලම පාහේ එක්කෝ ගසාගෙන ගොස් අතුරුදහන් වී, නැත්තම් කැඩී බිඳිලා ඇත.

ප්‍රදේශයේ පිහිටා තිබෙන පල්ලියකින් ලබාදෙන පුණ්‍යාධාරයකින් මරියම්මාල් ජීවිතය ගැට ගසා ගත්තද ඇ ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් සංවිධානය කරන ලද ඉතිරිකිරීමේ හා ණයදීමේ සමිතියක ලේකම්වරියයි. එවැනි ආරම්භක ක්‍රියා මගින් ගම්මුන්ගේ ජීවනෝපායයන්ද නැවත සංවිධානය කරගත හැකිවනු ඇතැ’යි ඇ ප්‍රාර්ථනා කරයි. ඒවාගේම ආධාර ලබාදෙන රාජ්‍ය නොවන සංවිධාන සහ එවැනි ආයතන කාන්තාවන්ගේ අවශ්‍යතා ආමන්ත්‍රණ කරනු ඇතැ’යි ද ඇ බලාපොරොත්තු තබයි. මේ වනතුරු සාමාන්‍යයෙන් මාළු ඔරු සහ දැල් ආම්පන්න ලබා දී ඇත්තේ පිරිමින්ට පමණය. කලපුවෙන් එහා ඉන්නා ධීවර ප්‍රජාවන්ට උදව් උපකාර කරන්නට රාජ්‍ය නොවන සංවිධාන පෙළ ගැසී සිටියත් කලපුව ආශ්‍රිතව පදිංචි ගෝත්‍රික ගම්මානයට හෝ ඒ අලස පිහිටි දලිත් ගම්මානයට හෝ මේ සංවිධාන මෙතෙක් පැමිණ නැත.

සමහර කුලවලට අයත් පිරිමින්ට හා ගැහැණුන්ට තමිල්නාඩුවේ මුහුදුබඩ පලාත්වලට ඇවිදින් මාළු මැරීම තහනම්ය. මාළු මරන ප්‍රජාවන් අතරේ ජීවත්වන දලිත් සහ ගෝත්‍රික ප්‍රජා සාමාජිකයන්ට ඉඩ දී ඇත්තේ සහාය භූමිකා රඟපාන්නට පමණී. ධීවර ආම්පන්න පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම, මාළු පැටවීම සහ බෑම, මාළු ප්‍රවාහණය කිරීම ආදිය ඒ සහායක වැඩකටයුතුවලට අයත්ය. ජීවනෝපාය නැවත ගොඩනගා ගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන විසින් මේ ප්‍රජාවන්ට දෙන ආධාර නිර්ණය කිරීමට යොදවාගන්නේද මේ ප්‍රජා කොටස් සඳහා සම්ප්‍රධායික වශයෙන් පවරා තිබෙන ඉහත කී පහත් පෙළේ ක්‍රියාකාරකම්ය. මාළු මැරීමේ යෙදී සිටින මරියම්මාල් වැනි කාන්තාවන් දෙයාකාරයෙන් මදිපුංචිකම්වලට ලක්වන්නාහ-එක් අතකින් ස්ත්‍රියක්වීම නිසාය. අනෙක් අතට ආන්තික ප්‍රජා කණ්ඩායමකට අයත්වීම නිසාය.

## වීදියේ ජීවත්වීම

චෙන්නායි පුරවරයේ දර්ශනීය මරීනා වෙරළ තීරය බලා දිවෙන පාරේ තිබෙන පදික වේදිකාව හිරු බැසයත්ම හැමදමත් කලබලකාරී වෙයි. තරුණ කොලු ගැටයෙකු වන ක්‍රිෂ්ණමූර්ති පදික වේදිකාවේ ලාම්පු කණු දෙකක් අතර තිබෙන ස්වකීය පවුලට අයත් එලිමහන් නිවස ඉදිරිපිට තම පාසැල් පොත් විසුරුවා දිගහැර ගෙන පාඩම් කරනුවා කෙනෙකුට හැමදම දැකගත හැකිය. මෙයාකාරයෙන් පට්ටනපක්කම් පෙදෙස් වාසය කළ, සුනාමියෙන් අවතැන් වූ, පවුල් 500 පමණ කිසිදු හවිහරණයක් නැතුව කලබැගෑනියෙන් ආලෝලනය වූ මෙවැනි පාරවල්වල ජීවත් වන්නාහ. ඔවුන්ගේ ගෙවල් දෙරවල් සුන්බුන් වෙරළේ විසිරී තිබෙනුවා දැකගත හැකිය. සිටුවා තිබෙන රිටිවලින් සහ ඇද තිබෙන ලණුවලින් පෙන්නුම් කෙරෙන්නේ යම් හෙයකින් සිදු වී තිබෙන හානිය තක්සේරු කිරීම සඳහා නිලධාරීන් පැමිණියොතින් ඔවුනට පෙන්නා දීමට තිබෙන වපසරියයි. පදික වේදිකාවේ ජීවත් වූ පිරිසකගෙන් අඩක්ම වාගේ කිලෝමීටර 12ක් පමණ ඈතින් ගොඩනගන ලද තාවකාලික නිවාසවල පදිංචි සඳහා පිටත්ව ගොස් තිබුනද ක්‍රිෂ්ණමූර්තිගේ පවුලේ උදවිය පදික වේදිකාවේම ලගින්නට කැමති වූහ. “හරි අමාරුයි, ඒත් අපි ළමයට ඉගෙනගන්ඩ කොහොමහරි ඉඩකඩ අරන් දෙනවා” යැයි ක්‍රිෂ්ණමූර්තිගේ ව හානු කීවාය. ලඟපාතකින් ඔවුනට තාවකාලික නිවාස ලැබෙනු ඇති බවත් ඊළඟට ස්ථිර නිවසක් ලැබෙනු ඇති බවත් ඔවුහු විශ්වාස කරති. පුනරුත්ථාපන වැඩ සටහන් අවතැන් වූ ළමයින්ගේ අධ්‍යාපන අවශ්‍යතා ආමන්ත්‍රණය කරන්නේ නැත. තාවකාලික රැඳවුම් ස්ථානවල රැඳී නොසිටින ළමුන්ගේ අධ්‍යාපනික කටයුතු ගොඩනගන ආකාරය ගැන සාකච්ඡා කිරීම පවා අරඹා ඇත්තේ මෑතකදීය.

*අවම ප්‍රමිතීන් සම්බන්ධයෙන් නගන ලද ප්‍රශ්න නොතකා හරිනු ලැබීය.*

වීදියේ ජීවත් වී මාස දෙකක් ගිය පසු තාවකාලික නිවාස ලබාදීම සඳහා සියළුම පවුල් ඈත ප්‍රදේශයක පිහිටි කඳවුරක් වෙත රැගෙන ගොස් ඇත. මේ ලිපිය ලියන ජූනි මුල් දවස්වල මෙම පවුල් මඳ ජල පහසුකම් සහ අයහපත් සනීපාරක්ෂක පහසුකම්වලින් යුත් කඳවුරක පිහිටි වියලි කුටි තුල අව්වේ කැකෑරෙමින් ජීවත්වෙමින් සිටියහ. මෝසම් වැස්ස ලැබීමත් සමගම කඳවුර වැසි වතුරෙන් යට වී ගියේය. ලබන මාසය වන විට මෝසම් වැස්ස තවත් ප්‍රබල වී මුළු කඳවුරම ගංවතුරෙන් යට වී යනු ඇත. වඩා හොඳ කඳවුරකට නැවතත් ඔවුන් රැගෙන යාමට ආණ්ඩුවත් රාජ්‍ය නොවන සංවිධානත් පිඹුරුපත් අඳිමින් සිටිති.

## සිසිල් සෙවනක් සොයමින්

ඉන්දියාවේ දකුණු අන්තයේ තුඩුවක පිහිටි කන්‍යාකුමාරි දිස්ත්‍රික්කයේ මුත්තම් ගමේ ජීවත්වන දරුවන් හතර දෙනෙකුගේ මවක් වන මේරි දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් තනවා දුන් තාවකාලික නිවාස 24න් එකක වාසය කරයි. ගිම්හානය තව තවත් රත් වෙවී වියළි දේශගුණය උදකරත්ම තාවකාලික නිවාස පෝරණු බවට පත්වන හෙයින් ඒවා තුල වාසය කිරීම බෙහෙවින් අසීරු විය. මේරි වැඩි වශයෙන් කල්ගත කරන්නේ නිවසින් බැහැරවය. “ගෑණු පිරිමි, ළමෝ අපි හැමෝම රෑට නිදගන්නේ එළමහනේ”, මේරි කීවාය. “මගේ අවුරුදු දෙකේ බාලම ළමයා ලඟපාත ගෙදරකට ඇරලෙව්වා. දවල්ට මේ කුඩාරමේ ඉන්නවා බොරු”.

විශේෂයෙන් රැකියාවන් නැති පිරිමි ගැවසෙන එළිමහනේ දවස ගත කරන්නට මේරි කැමති නැත. ඇය පැමිණිලි කිරීමෙන් වැලකී සිටියත් ස්ත්‍රීන්ට පුද්ගලික අවකාශ නොමැතිකම බරපතල ලෙස අවධානයට යොමුවිය යුතු කරුණකි. හැමදමත් ලඟපාත ගෙදරකට දරුවා රැගෙන යන්නට සිදුවීම ඇයට මහත් හිසරදයකි. සියල්ලටම වඩා දරුණු කාරණය නම් උණුසුම් වියළි රෑ කාලයේදී එළිමහනේ නිදගන්නට සිදුවීමයි. තාර ෂීට්වලින් සෙවිල්ලා ඇති වහල උණුසුම රඳවාගන්නා අතර සුළං කපොළුද තබා නැත. රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක්ම පංකා ලබාදීමට පොරොන්දු වූවත් ආවරණය කර තනා තිබෙන මෙවැනි නිවාසවලට ඒවා ලබාදීමෙන් සිදුවන්නේ නිවස තුළ රැඳී තිබෙන උණුසුම් වාතය එතුලම කරකැවීම පමණි.

ගොඩනැඟිලි ද්‍රව්‍ය තොරාගැනීමේ දී සමහර ආණ්ඩුවේ කොන්ත්‍රාත්කරුවන් ආදර්ශයට ගැනීමේ වරද දැන් දැන් රාජ්‍ය නොවන සංවිධාන අවබෝධ කර ගනිමින් සිටිති. රාජ්‍ය නොවන සංවිධානයක් වන Action Aid India ආයතනයේ වැඩසටහන් කළමනාකරු මෙසේ කීවේය: “අපි ඒ ගොල්ලෝ කිව් දේ කළා. දැන් අපට එය නිවැරදි කරන්න ඕනෑ”.

“සැහැල්ලු වහල සෙවිලි ලබාගන්ඩ අපට කේරළයේ එර්නාකුලම් දක්වා පැය හයක් තිස්සේ යන්ඩ සිද්ධ වුනා”, දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් වන සමාජ අධ්‍යයනය හා සංවර්ධනය (SED) ආයතනයේ අධ්‍යක්‍ෂ ක්ලීටස් උබෝල්ට් පැවසුවේය. “පොල් අතු තල් අතු වාගේ ගමේ තිබුණු දේවල්වලින් වහල සෙවිල්ලන්න තිබුනා. එහෙම කළා නම් ගමේ

කීප දෙනෙකුට රස්සාවල් දෙන්නත් තිබුනා.” රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් කියන්නේ සම්ප්‍රදායික වහල සෙවිලි කිරීම් ද්‍රව්‍ය පාවිච්චි කිරීම දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන් වැලැක් වූ බවය. මීට අවුරුදු කීපයකට පෙර වහල සෙවිලි කරන ලද පාසැල් මඩුවක ඉගෙනගත් ළමයින් බොහෝ ගණනක් මඩුව ගිනි ගත් වේලේ මැරුණු අන්දම පිලිබඳ මතකය තවමත් බොහෝ දෙනා කෙරෙන් පහව ගොස් නැත.

Indiadisasters.org[1] වෙබ් අඩවිය මෙම “පෝරණු හා සමාන” තාවකාලික නිවාස ගැන වාර්තා කොට තිබේ. Inter Press Service (IPS)[2] පුවත් සේවද තාවකාලික නිවාසවල ජීවත්වීම යනු “සවුනාබාත් එකක ජීවත්වනවා වැනි යැයි” වාර්තා කොට තිබේ. තාප රෝධක, හොඳ වාත කවුළු, වායු අවශෝෂක යනාදි තාක්‍ෂණික විසඳුම් සඳහා අවධානය යොමු වී තිබුනද තාවකාලික නිවාස තුල ස්ත්‍රීන් සඳහා ඇරුණු ඉඩකඩ වැනි වාදවිෂයන් නම් තවමත් ආමන්ත්‍රණය කල යුතුව තිබේ. ඉවීම, රෙදි සේදීම, නෑම වැනි කාර්යයන් සඳහා වෙන්කරන ලද ඉඩකඩ සපයා දෙන්නේ අත්දැකීම් සහිත ආයතන නිවාස ඉදි කරනවිට පමණි. Oxfam ආයතන කුඩ්ඩලෝර්හිදී එවැනි කාර්යවලට වෙන්වූ ඉඩකඩ සහිත සිසිලස සහිත අතු සෙවිළිකල නිවාස පන්තියක් තනා තිබේ. Cordaid ආයතනය ඉදි කළ සමහර තාවකාලික නිවාසවලට විශේෂයෙන් යොවුන් තරුණියන් සඳහා වෙන් කළ කාමරයක්ද ඇතුලත් කර තිබේ. ඉදි කෙරෙන්නාවූ තාවකාලික නිවාස පිලිගැනෙන සුදුසු මට්ටමකින් සමන්විතවීමට නම් ඒවා ගොඩනැගිය යුත්තේ යටත්පිරිසෙන් සුවපහසුව සහ පුද්ගලික අවකාශය ආරක්‍ෂා කරගැනීම යන කරුණු සැලකිල්ලට ගත් අවම මට්ටමේ සැලැස්මක් ඇතුවය.

## නිගමණ

ආපදවෙන් පසු උදවන කාල පරිච්ඡේදය තුල ස්ත්‍රීන් හා ළමයින්, විශේෂයෙන් ගැහැණු ළමයින්, පවතින සමාජ/සංස්කෘතික/ජීව විද්‍යාත්මක සාධක විසින් සෞඛ්‍යමය වශයෙන් දරුණු විලවිපාකවලට සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු කරගැනීමේ ඉඩකඩ බොහෝසෙයින් වැඩිය. ප්‍රධාන වශයෙන්ම, ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් හේතුකොටගෙන ඔවුහු පහසු ගොදුරු බවට පත්වන්නෝය. සාමාන්‍ය සාම්ප්‍රදයික දකුණු ආසියානු ප්‍රජාවන් තුල ජීවත්වන කාන්තාවන් පරෙස්සම්කාරී ලෙස උදව් උපකාර ලබාගැනීමෙහිලා තම උවමනාවන් අනුනට දැනගන්නට සැලැස්සවීමෙහිලා අපොහොසත්ය. ඊළඟ පරම්පරාවේ ළමයින්ට අධ්‍යයනය ලබා නොදීම තුලින, තත්ත්වය තවත් අයහපත් වී, ඔවුහුද පහසුවෙන්ම ගොදුරු බවට පත්වන්නාහ. මේ සියළු කාරණා ආමන්ත්‍රණය කිරීමට නම් ආපදවට දක්වන ඕනෑම ප්‍රතිචාරයක් ස්ත්‍රීපුරුෂ සමාජභාවය ගැන සංවේදි විය යුතුය, ස්ත්‍රීන්ගේ සහ ළමයින්ගේ විශේෂ අවශ්‍යතා ගැන සංවේදි විය යුතුය. උපකාර කිරීමට ඉදිරිපත් වන කවරෙකුට වේවා ප්‍රාදේශීය පරිසරය ගැන පැහැදිලි අවබෝධයක් තිබිය යුතු අතර ප්‍රජාවේ සියළුම අංශවල විශේෂ අවශ්‍යතා ගැන පැහැදීමක් ඇතුව සිටිය යුතුය.

***මැක්ස් මාටින් සරණාගත අධ්‍යයන කේන්ද්‍රයේ හිටපු ශිෂ්‍යයෙකි. ඔහු දැන www.indiadisasters.org යන වෙබ් අඩවිය සංස්කරණය කරයි. ඔහු නැවතී සිටින්නේ බැංගලෝරයේය. විද්‍යුත් තැපෑල: maxmartin@rediffmail.com***

1. www.indiadisasters.org
2. www.ips.org/

*ඉන්දියාවේ දකුණු අන්තයේ කන්‍යාකුමාරි දිස්ත්‍රික්කයේ තුඩුවක සාද තිබෙන තාවකාලික නිවාස*



Max Martin

# ප්‍රතිචාරවල කාර්යසාධනීයත්වය: ආපදාවට පත්වූ ජනතාවගේ අදහස්

අනිස්යා තෝමස් සහ විමලා රාමලිංගම්

*මේ වන විට සහන සංවිධාන තම පශ්චාත් සුනාමි ක්‍රියාන්විත විමර්ශනය කරමින් සිටියද, බහු ජන සංවිධාන ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක්වන්නේ අඩු වශයෙනි. වඩාත් අඩු අවධානය යොමු වී ඇත්තේ සහන සේවාවලින් ප්‍රයෝජනලත් "සහන ලාභීන්ගේ" අදහස් වෙතය.*

මෑත කාලයේදී බ්‍රිටිස් ආයතනය කළ සමීක්ෂණයකින් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ සුනාමි ඛේදවාචකයෙන් පීඩා විඳි ප්‍රදේශවල සිටින සහනලාභීන් විසින් ආධාරවල කාර්යක්ෂමතාව පිළිබඳ දරන අදහස් මොනවාදැයි සොයා බලනු ලැබීය. මූලික ප්‍රතිඵලවලින් පෙනීයන්නේ ශ්‍රී ලංකාවේ සහනලාභීන්ට වඩා ඉන්දීය සහනලාභීන් තමන් ලද ආධාර පිළිබඳ වඩාත් ධනාත්මක අදහස් දරන බවය.

ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ආධාර සම්බන්ධයෙන් බලපැවැත්වූයේ එකිනෙකට වෙනස් තත්ත්වයන්ය. ඒ වන විටත් තම රට තුල ක්‍රියාත්මක නොවූ හෝ රට තුල නොසිටි මානවදයාවාදී ආයතනවලට තම රටට ඇතුලුවීමට ඉඩ නොදෙන්නට ඉන්දියාව නිල වශයෙන් තීරණය කර තිබිණ. තවද මධ්‍යම ආණ්ඩුව, ප්‍රාන්ත ආණ්ඩු, රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර සංවිධාන, පුද්ගලික සමාගම් සහ ත්‍රිවිධ හමුදා විසින් ක්‍රියාත්මක කළ සහනාධාර සැපයීමේ ක්‍රියාවලීන් රජය විසින් සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකාව තුල ජාත්‍යන්තර, කලාපීය හා දේශීය රාජ්‍ය නොවන සංවිධානවලට අනතුරට පත්වූ ප්‍රදේශවල ජනතාව වෙත යාමට සාපේක්ෂ වශයෙන් වඩාත් නිදහස් අවකාශයන් සපයන ලදී. (මෙහදී වෙනසකට තිබුනේ දේශපාලනිකව වඩාත් සංවේදී වූ උතුරු හා නැගෙනහිර පලාත් සම්බන්ධයෙන් පමණි). එනමුදු අත්දැකීම් සහිත විශාල රාජ්‍ය නොවන සංවිධානවල සහභාගීත්වය මෙහිදී දැකගත හැකි වුවද බලපැවැත්වූ අදහස වූයේ ශ්‍රී ලංකාවේ ජනතාව වෙත සපයන ලද ආධාර එතරම් සතුටුදායක නොවූ බවය. මෙවැනි එකිනෙකට වෙනස් අදහස්වලට හේතු විමසීමේදී මේ ප්‍රදේශ දෙක තුළ සහනාධාරවල කාර්යක්ෂමතාවය පිළිබඳ ප්‍රශ්න මතු විය. එනම්, ඉන්දියාවේ මෙන්ම මධ්‍යම ආණ්ඩුවේ සම්බන්ධීකරණය තුල ක්‍රමයන් සහ ශ්‍රී ලංකාවේ මෙන් වඩාත් අවිධිමත් සහ නම්‍ය ක්‍රමයන් අතර ඇති වෙනසය.

සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ පුද්ගලයන් සුනාමියෙන් හානිවූ පවුල්වලට අයත් වැඩිහිටි අය වූහ. ඔවුන් තම පවුල්වල සාමාජිකයින් අහිමි වූ හෝ පශ්චාත් සුනාමි ආධාර ලැබූ අය හෝ වූහ. ඔවුන් ඛේදවාචකයෙන් හානි පැමිණි ජනතාව පිළිබඳ නියෝජනාත්මක නියැදියක් විය. උදාහරණයක් වශයෙන් ඉන්දියාවේ දිස්ත්‍රික්ක දොළහකට අයත් වූ ගම්මාන සියයක් නියෝජනය කල පුද්ගලයින් 800 එයට අයත් විය. ශ්‍රී ලංකාවේදී මේ නියැදියට ගම්මාන 97කින් පුද්ගලයින් 600ක් ඇතුළත් විය. මෙතුලින් නියෝජනය වූ බහුතරයේ රැකියාව වූයේ ධීවර කර්මාන්තයයි. ඉන්දියාවේදී එය 93% ක් වූ අතර ශ්‍රී ලංකාවේදී එය 58% ක් විය.

අනතුරට පත්වූ සෑම පවුලකින්ම තෝරාගත් වැඩිහිටියෙකු ප්‍රධාන තොරතුරු සම්පාදකයා ලෙස කටයුතු කල අතර අන් අයටද තොරතුරු සැපයීම සඳහා දිරි ගන්වන ලදී. ඉන්දියාවේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද ප්‍රධාන තොරතුරු සපයන්නන්ගෙන් බහුතරයක් කාන්තාවෝ වූහ. දත්ත එකතු කරන ලද්දේ දේශීය භාෂාවලින් කරන ලද සම්මුඛ සාකච්ජාවලින්ය. ඒ සඳහා පුහුණුවලත් පර්යේෂකයන් විසින් විවෘත ප්‍රශ්න අසන ලදී.

## පළමු පැය 48

පර්යේෂකයින් ප්‍රථමයෙන්ම තොරතුරු දායකයින්ගෙන් අසන ලද්දේ සුනාමියෙන් පසු පළමු පැය 48 පිළිබඳ ඔවුන්ගේ මතකයන් සහ සංජානනයන් පිළිබඳවයි. බේරීම සඳහා ආධාර ලැබුණු බව ඉන්දීය තොරතුරු දායකයන්ගෙන් ප්‍රකාශ කලේ 48% පමණි. ශ්‍රී ලංකාවේ දි මේ අනුපාතය පහත වැටී තිබුනි (31%). ඉන්දියාවේ ධීවර කාන්තාවක් මෙසේ ප්‍රකාශ කලේය: "කවුරුවත් මෙහෙ මිනිසුන් සොයන්නට ආවේ නැහැ... අපි සියඨදෙනාම ප්‍රතිචාර දැක්වීමට නොහැකි ලෙස කම්පනයට පත්වී සිටියා. එකිනෙකාට උදවු කිරීමත් අපහසු වුනා". බේරාගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවද ප්‍රශ්නකාරී විය. තවත් තොරතුරු දායකයෙකු ප්‍රකාශකලේ "පුද්ගලයින් වෙනත් ගම්මානවලින් දුවගෙන ආවත් ඔවුන්ට වැඩිදෙයක් කලහැකි වුනේ නෑ" යනුවෙනි. වාර්තා සහ ක්ෂේත්‍ර සම්මුඛ සාකච්ජාවලින් පෙනීයන්නේ බේරාගැනීමේ උත්සාහවලට සහ ක්ෂණික උපකාර සැපයීමේදී වැඩි දායකත්වයක් ලැබුනේ අසල්වාසීන්ගෙන් සහ නුපුහුණු ප්‍රාදේශීය ස්වේච්ජා සේවකයන්ගෙන් බවයි.

පලමු පැය 48 ඇතුළතදී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව දැක්වූ ප්‍රතිචාර සහ ලැබුණු ආධාර වර්ග අතර සුපැහැදිලි වෙනසක් පෙන්නුම් වෙයි. සමීක්ෂණයේ නම් කර තිබුණු ආධාර වර්ග (මේවා අතරට බේරාගැනීම, මලවුන් හඳුනාගැනීම / මිහිදන් කිරීම, සුන්බුන් ඉවත් කිරීම, වෛද්‍ය සේවා සහ නැවත පදිංචි කිරීම ඇතුළත් විය) එකොළහ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තොරතුරු දායකයින්ට වඩා ඉන්දියාවේ තොරතුරු දායකයින් වැඩි ප්‍රමාණයක් තමන්ට මේ ආධාර ලැබුණු බව පැහැදිලිවම ප්‍රකාශ කලහ. ඉන්දියාව තුල ආපදාවට පත්වූ ජනතාවගෙන් 49% ක් සඳහා නැවත පදිංචි වීමේ යම් විධිවිධාන පලමු දින දෙක තුළදී සපයන ලද අතර වඩාත් බරපතල ලෙස හානියට පත් රටක් වූ ශ්‍රී ලංකාවේදී මෙය 3% ක් පමණක් විය. ඉන්දියාවේ ජලය සපයාදීමේ ආධාරවලින් 85% ක් ලැබුනු අතර මෙය ශ්‍රී ලංකාවේ 15% ක් පමණ වීය. ඉන්දියාවේදී ආපදාවට පත්වූවන්ගෙන් 66% ට හදිසි වෛද්‍ය සේවා ලබා ගත හැකි වූ අතර, ශ්‍රී ලංකාවේදී එය 33% ක් වීය.

තවද එක් එක් ආකාරයේ ආධාර සැපයීම් වේගය පිළිබඳ අසමානතා තිබුණි. පලමු පැ 48 තුළදී සෝදිසි මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා සුන්බුන් ඉවත් කිරීම අරඹන ලදැ'යි කිව හැකි වූයේ ඉන්දියාවේ ප්‍රතිචාරකයින් ගෙන් 15% ක් හා ශ්‍රී ලංකාවේ පුද්ගලයින්නේ



Peter Howring/DanChurchAid/ACT International

8%කට පමණි. මීට සංසන්දනාත්මකව පලමු පැ 48 තුලදී ඉන්දියාවේ පුද්ගලයින්ගෙන් 90% කට සහ ශ්‍රී ලංකාවේ පුද්ගලයින්ගෙන් 78% කට ආහාර තිබුණි. ඇතැම් අවස්ථාවලදී අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ආහාර තිබුණි. එක් ඉන්දිය ප්‍රතිචාරකයෙකු පැවසුවේ “විවිධ ආකාරයේ පිසින ලද ආහාර අපට ලැබුණා එවා ඔනෑවටත් වැඩියෙන් තිබුණා” යනුවෙනි.

මුලින්ම ආධාර සැපයුවේ කවුරුන්ද යන්න පිළිබඳවද පැහැඳිලි වෙනස්කම් තිබුණි. ප්‍රතිචාරකයින්ට අනුව, ඉනදියාවේදී පලමු පැය 48 තුලදී 86% කට කුමන ආකාරයේ හෝ ආධාරයක් පලාත් පාලන ආයතන විසින් සපයන ලදී. ශ්‍රී ලංකාවේ මීට සමාන අගය වන්නේ 4% කි. ඉන්දිය වාර්තාවලට අනුව ප්‍රාදේශිය පරිපාලනයන් විශේෂයෙන්ම දකුණු ඉන්දිය ප්‍රාන්තයක් වන තමිල් නාඩුවේ අතිමහත් වේගයකින් ක්‍රියාත්මක වන්නට විය. අනතුරට ලක්වූ එක් අයෙකු ප්‍රකාශ කලේ මෙසේය: “අපි නිදාගත්තේ නැහැ. ඒ වාගේම දිස්ත්‍රික්ක පරිපාලන නිලධාරිනුත් නිදාගත්තේ නැහැ”. ඉන්දියාවේ ප්‍රතිචාරකයින්ගෙන් භාගයක් පමණ ප්‍රකාශ කලේ තමන්ට රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා සංවිධාන මගින් ආධාර ලබා දුන් බවයි. ඊට අමතරව 12% කට පමණ ප්‍රමාණයකට ත්‍රිවිධ හමුදා මගින් ආධාර ලබාදෙන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රතිචාරකයින්ගෙන් 39% කට ආධාර ලබා දුන්නේ ත්‍රිවිධ හමුදාව වන අතර රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන තමන්ට ආධාර ලබා දුන් බව ප්‍රතිචාරකයින්ගෙන් 37% ක් පවසන ලදී. ශ්‍රී ලංකා රජය තමන්ට ආධාර සැපයූ බව ප්‍රකාශ කරන ලද්දේ ප්‍රතිචාරකයින්ගෙන් 4% ක් පමණි. දිවි බේරාගත් අයගෙන් නිරතුරුවම ඇසුණු ප්‍රතිචාරයක් වූයේ: “මේවා සියල්ල සිද්ධවන විට ආණ්ඩුව සිටියේ කොහේද? හැමදෙයක්ම කණපිට පෙරලිලයි තිබුණි”.

## දීර්ඝකාලීන ආධාර

මීට අමතරව පලමු දින 60 ඇතුලතදී සැපයුම් ක්‍රියාන්විතයන් ක්‍රියාත්මකවූ ආකාරය පිළිබඳ අදහස් දැනගැනීම සඳහාද අපි ප්‍රශ්න කීපයක් ඇසුවෙමු. ඉනදියාවේ මෙන්ම ශ්‍රී ලංකාවේද සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වූවන්ගෙන් අඩකටත් වඩා ප්‍රකාශ කලේ ආහාර බෙදාහැරීමේ ගුණාත්මකභාවය සාමාන්‍යයෙන් සිදුවනවාට වඩා වැඩි බවයි. නමුත් 40% ක් ප්‍රකාශ කලේ ආහාර ලබාගැනීමට සහ ආහාර බෙදා හැරීමට යොදාගත් ක්‍රම නිසා තමන් අවමානයට පත් වූ බවයි. එක් ප්‍රතිචාරකයෙක් පැවසුවේ “මේවා බෙදා හැරිය විධියෙනුයි සම්බන්ධීකරණය කල ආකාරයෙනුයි අපිට දැනුනේ අපි හිඟන්නෝ කියලා”. ඉන්දියාවේදී සහනාධාර කටයුතුවල සියළු අංශවල නායකත්වය ගනු ලැබුවේ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයි. එමෙන්ම ඉන්දියාවේදී පුද්ගලික අංශයද අසාමාන්‍ය ලෙස ප්‍රධාන කාර්යභාරයක් සිදු කර ඇති බව පෙනෙන්නට තිබේ.

මෙහිදී අත්වූ මූලික ප්‍රතිඵලවලින් ප්‍රශ්නවලට පිළිතුරු සපයනවාට වඩා වැඩියෙන් ප්‍රශ්න මතු වන බව පෙනේ. එනමුත් ඒවා තුළින් ආධාර සැපැයීමේ කාර්යක්‍ෂමතාව මැනීමේදී සහ ඒ සඳහා ඉගෙන ගත් පාඩම් වඩාත් සංවර්ධනය කිරීමේදී මෙම බේදවාචකයට මුහුණ දුන් ජනතාවගේ අදහස් ඇතුලත් කරගැනීමේ වැදගත්කම පෙන්නුම් වේ.

*අනිස්යා තෝමස්, ෆ්‍රිට්ස් ආයතනයේ කළමණාකරන අධ්‍යක්‍ෂවරියයි. (www.fritzinstitute.org). විද්‍යුත් තැපෑල: anisya.thomas@fritzinstitute.org*

*විමලා රාමලිංගම්, ඉන්දිය රතු කුරුස සංවිධානයේ හිටපු මහලේකම්වරියයි. විද්‍යුත් තැපෑල: vimalaramalingam@yahoo.com*




*අතු සෙවිලි කළ සියළු නිවාස සෝද හැරි සුනාමිය ගඩොලින් හෝ කොන්ක්‍රීට් බදමයෙන් හෝ සෑදූ නිවාසවලටද බරපතල හානි සිදු කළේය. ඉනින්දකරෙයි, ඉන්දියාව*

# අහිමි වූ අහිංසකත්වය: මාලදිවයිනට ගැලූ සුනාමිය

හෙයිඩි බ්‍රවුන්

*සුනාමිය මාලදිවයින් ජනරජයට 2004 දෙසැම්බරයේදී කඩා වැදුනේ මධුසමය ගත කරන නිකේතනයක් ලෙසින් එම රට පිළිබඳව ගොඩනැඟී තිබූ චිත්තරූපය එක රැයින් විපත්ති කලාපයක් බවට පත් කරමිනි.*

කොරල් දූපත් 1200 කින් සමන්විත මේ දූපත් සමූහය තුළ සුනාමිය නිසා මරණයට පත් ජිවිත ගණන ඇදහිය නොහැකි තරම් අඩු වුවත් ඒ දළ රළ පෙළ ඊට කළ විනාශය නම් සුළුපටු නොවීය.

- රටවැසියන් 108 දෙනෙක් මියගොස් නැත්තම් අතුරුදහන් වී සිටියහ.
- ජනයා පදිංචිව සිටි දූපත් 199 න් 13 කම ජනයා මුළුමනින්ම ඉවත් කරනු ලැබූහ.
- මතුපිට පොළවේ අගනා සරු පස මුහුදට සේදී ගියේය.
- මිශ්‍ර අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම්, ප්‍රවාහණ, සන්නිවේදන, යටිතල පහසුකම් යනාදිය දූපත් 100ට වඩා වැඩි ප්‍රමාණයකට අහිමි විය.
- ගෙවල් දොරවල් 10%ක් විනාශ වූ අතර තවත් විශාල ප්‍රමාණයක් කැඩී බිඳී ඇත.
- ජනයා 15,000-30,000 අතර ප්‍රමාණයක් (මුළු ජනගහණයෙන් 5-10% අතර ප්‍රමාණයක්) ආරම්භයේදීම අවතැන් වූහ.
- සුනාමි ආපදව නිසා ජනගහණයෙන් තුනෙන් එකක ජිවිත හෝ පැවැත්ම හෝ දරුණු ලෙස අනතුරට ලක් විය.

මාර්තු මාසයේ මැද වන විට ආණ්ඩුවට අයත් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් පිලිබඳ කටයුතු කරන ඒකකය යටත්පිරිසෙයින් බොහෝකාලයක් තිස්සේ රට අභ්‍යන්තරයේ අවතැන් වූ පුද්ගලයින් 12,000 පමණ සිටිතැ'යි ගණන් බලා තිබිණි. කෙසේවෙතත්, සැබෑ සංඛ්‍යාව පිලිබඳ ඔවුන් සතුව ඇත්තේ ඉතා සීමිත තොරතුරු ප්‍රමාණයකි. ඊට හේතුව ලෙස දක්වා ඇත්තේ මේ ජන කොටස් නිතර එහා මෙහා යාමත් ඔවුන් තම විස්තීර්ණ පවුල්වල සරණ පැතීමත්ය.

සුනාමියට ගොදුරු වූ අනෙකුත් බොහෝ රටවල් මෙන් ස්වභාවික විපත්වලට හෝ සන්නද්ධ ගැටුම්වලට හෝ මෙතෙක් මාලදිවයින මුහුණ දී නොතිබූ නිසා මේ හා පරිමාණයකින් යුත් හදිසි තත්ත්වයකට මුහුණදීමේ සූදනමක් එරටේ තිබුනේ නැත. විපතට කලින් එක්සත් ජාතීන්ගේ සංවිධානය එරට තුළ ඉතාමත් අවම මට්ටමකින් ක්‍රියාත්මකවීම එම අභියෝගය වඩාත් බරපතල වී යැයි කිව හැකිය (UNDP, UNICEF, UNFPA, WHO යන සංවිධානවලට එහි තිබුනේ ඉතා කුඩා කාර්යාල පමණි). මාලදිවයින රට අභ්‍යන්තරයේ ක්‍රියාත්මක වූ එකම ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය එක්සත් රාජධානියේ තිබෙන පුණ්‍යායතනයක් වන පාරසාමුද්‍රික ස්වෙච්ඡා සේවාව (VSO) පමණි. ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වූ රාජ්‍ය නොවන සංවිධාන අංශය ඉතා කුඩා එකක් විය. ප්‍රජා සේවාවේ යෙදෙන ජාත්‍යන්තර රටවල් බොහෝ ගණනක් ඉල්ලූම් කළ හෙයින් ද රට අභ්‍යන්තරයේ අවතැන්වූවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ආණ්ඩුව ජාතික සැලසුමක් නොතිබූ හෙයින් ද සුනාමි ආපදවට මුහුණ දුන් මුල් දවස්වලදී මාලදිවයින් ආණ්ඩුවට බොහෝ පාඩම් ඉගෙනගැනීමට සිදුවිය.

හදිසි සහනාධාර සැපයුම් අවධියේදී ජලය/ආහාර/ඖෂධ වර්ග බෙදා හැරීම, විදුලි බලය පුනරුත්ථාපනය කිරිම, තොරතුරු එක්රැස් කිරීම යනාදි අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම්වලට සීමා පණවන සුවිශේෂ සාධකය වන්නේ ප්‍රවාහණ පහසුකම්ය. මාලදිවයින්වල භූගෝලීය පිහිටීම ඇත්තෙන්ම මෙවන් ක්‍රියාකාරකම්වලදී එල්ල කරන්නේ සුළුපටු අභියෝගයක් හෙම නොවේ. ජනයා වාසය කරන දූපත් 199 විසිරී ඇත්තේ උතුරේ සිට දකුණට වන්නට කිලෝමීටර 850ක් දිග පටියක් දිගේය. කෙසේවෙතත්, බොහෝ ප්‍රවාහණ යටිතල පහසුකම් සුනාමියට ගොදුරු වී තිබිණි ගුවන්තොටුපලවල්, වරායවල්,ජැටි හා බෝට්ටු විශාල වශයෙන් අනතුරට පත් වී තිබිණි. ලාමු අටොල් නම් දූපතේ දුරකථන පහසුකම් මුළුමනින්ම අඩාලව තිබූ අතර එය යථා තත්ත්වයට පත්කිරීම සඳහා දින ගණනාවක්ම ගත විය.

## අභියෝග සහ විසඳුම්

තත්ත්වය එසේවුවද සහන ඉල්ලා කරන ලද ආයාචනයට ලැබුණු ප්‍රතිචාර නම් ඉහළ විය. විශේෂයෙන්ම ජලය හා ආහාර සැපයුම් බෙදා හැරීම, සෞඛ්‍යාරක්ෂක පහසුකම් ගොඩනැගීම යනාදි ක්‍රියාකාරකම් හේතුකොටගෙන වසංගත රෝග පැතිරයෑම් හෝ මියයෑම් හෝ සිද්ධ වූයේ නැත. මරණ සංඛ්‍යාව සුනාමිය ඇති වූ මොහොතේ සිද්ධ වූ ඒවාට පමණක් සීමා විය. ඒ කෙසේවෙතත්, මාලදිවයින නම් රටට දිගුකාලීන වශයෙන් බලගතු අභියෝගවලට මුහුණ දෙන්නට සිදුව තිබේ. යෝධ රැල්ල ඇති කළාවූ කායිකමය, මානසිකමය හා ආර්ථිකමය හානිය පිළිසකර කිරීමට සහ සුනාමියට පෙර තිබූ ජිවන ප්‍රමිතීන් නැවත නගාසිටුවීමට අමතරව, මේ කුඩා දූපත් සමූහය මුහුණ දී සිටින ආපදශීලිභාවය අවම කරගැනීම සඳහා වැඩ කටයුතු සුවිශාල ප්‍රමාණයක් කළ යුතුව තිබේ. විශේෂයෙන්ම, ගෝලීය මට්ටමින් සිදුවන දේශගුණික විපර්යාස නිසා අනාගතයේදී එරටේ සිදුවෙතැ'යි අනාවැකි පළ කර තිබෙන මුහුදු මට්ටම ඉහළයෑම නම් භයානක ආපදවට එරෙහිව කටයුතු කළ යුතුව තිබේ. අභ්‍යන්තරිකව අවතැන් වූ ජනයා නැමැති වාදවිෂය අපට එක දෙයක් පැහැදිලිවම පෙන්නුම් කර දෙයි. එනම් සුනාමියෙන් ආපදවට පත්වූ පවුල් වල සහ ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලීමේදී ඉතාමත් ප්‍රවේශමෙන් සමතුලිත අයුරින් අප ක්‍රියාකල යුතු බවත් ඒවාගේම සමස්ථ වශයෙන් රටේ දීර්ඝ කාලීන සංවර්ධන කටයුතු වලටද ඒ සමගම අප ආමන්ත්‍රණය කළ යුතු බවත්ය.

එකිනෙකට වෙනස් අද්විතීය ගතිලක්ෂණ සහ දැඩි ප්‍රජා අනන්‍යතාවක් සහිතව ඒ ඒ දූපත්වල වාසය කරන ජන කොට්ඨාශවලින් මාලදිවයින නම් රටේ ජිවත්වන ජාතිය සමන්විත වෙයි.

එබැවින් තාවකාලික නිවාස ඉදිකිරීමේදී විවිධ සංස්කෘතික විභේදතාවලට සරිලන පරිද්දෙන් විවිධ විසඳුම් ලබා දෙන්නට සිදුවිය. පළමුව දූපත් කීපයක නේවාසිකාගාර ශෛලියේ ගොඩනැගිලි සාදන ලද අතර ඒවායේදී නිදන සහ වැසිකිලි පහසුකම් හවුලේ භුක්ති විඳින්නට සිදුවිය -සියළු ආහාරපාන ලබාදෙන ලද්දේ මධ්‍යම මුළුතැන්ගෙයක් මගිනි. කෙසේවෙතත්, ජාතික ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ[1] මවුරූෆ් ජමීල්ට අනුව, අභ්‍යන්තරිකව අවතැන් වූ බොහෝ දෙනෙක් වෙනත් පවුල් සමග පහසුකම් බෙදා හදාගන්නට අකැමති වූ අතර ආහාර තම තමන්ට පිලියෙළ කරගැනීමටත් කැමැත්ත දක්වන්නාහ. අවතැන් වූ මේ ජන කොටස් අතරේ මෙම රුචිඅරුචිකම් වඩාත් තීව්‍ර ලෙස ප්‍රකාශ වන්නේ ධීවර කර්මාන්ත, මාළු කල්තබා ගතහැකි පරිදි සකස් කිරීම, සංචාරක කර්මාන්තය වැනි ආදායම් උපදවන මාර්ග අහෝසි වී යෑමත් සමගය. එහි ප්‍රතිඵලයක් හැටියට, අවතැන්වූවන් සඳහා ඉදිවන තාවකාලික නිවාස කාමර ඒකක තුනක් සහිතව ඉදි විය. එකක් නිදන කාමරයයි, තවත් එකක් කුස්සියයි, අනෙක වැසිකිලියයි.

එහෙත් සමහර දූපත්වල සිටින පවුල් අයසට පත්වී අවතැන් වී සිටින පවුල් තම නිවෙස්වල කැමැත්තෙන්ම රඳවා ගත්හ. කෙසේවෙතත් මේ තත්ත්වය මාස ගණන් හෝ අවුරුදු ගණන් තිස්සේ, බලපවත්වන එකක් වන හෙයින් සත්කාරක පවුල්වලට දරාගත නොහැකි තරමේ බරක් උසුලන්නට සිදුවනු ඇත. ආණ්ඩුවට අයත් ළමා අයිතිවාසිකම් පිළිබඳ ඒකකයේ සේවය කරන VSO ළමා ආරක්ෂණ උපදේශිකාව වන ට්‍රේසි ලාර්මන් මෙසේ පවසයි: “පිරිස් තදබදය, පුද්ගලික නිදහසට පැමිණෙන බාධා, මානසික පීඩනය, කාංසාව යනාදිය නිසා සත්කාරක පවුල්වලටත් අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පවුල්වලටත් ගැටළුවලට මුහුණ දෙන්නට සිදුවන අතර ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් තදබල බලපෑම් ඇතිවන්නට පුළුවන”. පුද්ගලික නිදහස භුක්තිවිඳීමට අදලව සත්කාරක නිවෙස්වල හා තාවකාලික ලැගුම්පොලවල්වල පවතින තදබල අඩුපාඩුකම් නිසා ස්ත්‍රීන් සහ නවයොවුන් තරුණියන් ප්‍රචණ්ඩත්වයට සහ අපයෝජනයට ලක්වීමේ අවස්ථා වැඩිබවත් UNFPA මාලදිවයින් කාර්යාලය අනතුරු අඟවා තිබිණ. මාම්ජිලි දූපතේ නායකයා වන අලිෆ් ඩාල් අවතැන්වූවන් නැවතී සිටින සත්කාරක නිවෙස්වල මිදුලේ අතිරේක කාමර තනන්නට පටන්ගත් නිසා කෙටිකාලීන වශයෙන් නිවෙස් තුල පවතින තදබදය මගහැර ගන්නටත් අන්තිමේදී කළගුණ සැලකීමක් වශයෙන් එම කාමර සත්කාරක පවුලට පිලිග න්වන්නටත් පුළුවන් විය. ඒ හැරෙන්නට, ආණ්ඩුව සත්කාරක පවුල්වලටත් මූලික ආහාර සැපයුම් බෙදා දුන්නේය.

මාර්තු මාසයේ මුලදී එක්සත් ජාතීන්ගේ මානවදයාවාදී කටයුතු පිලිබඳ සම්බන්ධීකරණ කාර්යාලය (OCHA) අභ්‍යන්තරික වශයෙන් අවතැන්වූවන් මුහුණ දී සිටින තත්ත්වයන් තක්සේරු කිරීම සඳහා දූත මණ්ඩලයක් මාලදිවයිනට එවූවාය. ඔවුන්ගේ ආරම්භක

වාර්තාව නිගමණය කළේ සතුටුවිය හැකි ප්‍රමාණයක තාවකාලික නිවාස ඉදිකොට තිබෙන බවය. කෙසේවෙතත් ජාත්‍යන්තර මාර්ගෝපදේශ සම්බන්ධයෙන් ජාතික මට්ටමින්ම නොතිබූ අවබෝධය නිසා, ඉදිකිරීමේ ධාරිතාව ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව හැඩගස්වා ගන්නට අපොහොසත්ව තිබීම නිසා, එකී තාවකාලික නිවාස මේ අඩුපාඩු හරිගස්සාගැනීම් අටියෙන් නැවත සකස් කරන්නට සිදු විය.[2]

අනාගතය සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමහිලා පවතින අඩුපාඩු නිසා අවතැන්වූවන් අතරේ පවතින කාංසාවද OCHA වාර්තාව ඉස්මතු කොට දක්වා තිබේ. 2005 අවුරුද්දේ මාර්තු මාසයේදී ප්‍රකාශයට පත් කළ එහි ජාතික ප්‍රතිකාරක හා ප්‍රතිනිර්මාණක සැලසුමට අනුව[3] දිගුකාලීන සැලසුම් සකස් කිරීමේදී මාලදිවයින ආණ්ඩුව රටේ ජීවත්වන ප්‍රජාවෙන් උපදෙස් ලබාගැනීමට බැඳී සිටී. නැවත පදිංචිකරවීම නමැති දුෂ්කර කාරියේදී ඒ ඒ දූපත්වල වාසය කරන ඒ ඒ ප්‍රජාවන්ගේ සුවිශේෂ අවශ්‍යතාවයන් සොයාබලන බවට මටුරුෆ් ජමීල් කියා සිටියේය.

මාලදිවයින් ආණ්ඩුව 1998 දී ජනගහණය හා සංවර්ධනය තහවුරුකිරීමේ සැලැස්ම හඳුන්වා දී ඇත්තේ දූපත් ජනාවාසවීම අඩුකිරීම් සහ අභ්‍යන්තරික ස්වෙච්ජා සංක්‍රමණය දිරිගැන්වීමේ අරමුණ ඇතුවය. මෙම උපායට හේතු වූ කාරණා මෙසේ දැක්විය හැකිය:

- ධීවර සම්පත් අඩවිවලට සමීපයෙන් වාසය කිරීම ඇතුළුව විසිරී ජීවත්වීම නමැති ඓතිහාසික අව්‍යශතාවය ප්‍රවාහණ පහසුකම්, ශීතකරණ පහසුකම්, බෝට්ටුවේදිම මසුන් සකස්කිරීමේ පහසුකම් ආදිය නිසා තවදුරටත් වලංගු නොවීම.
- දූපත් 199න් 59%ම දූපත්වල ජනයා 1000ටත් අඩු ප්‍රමාණයක් බැගින් වාසය කරන හෙයින් එකම යටිතල පහසුකම් සහ මහජන සේවා නැවත නැවත ලබාදීමෙන් ආණ්ඩුව සතු සම්පත් සහ මිනිස්බල ඉතාමත් දරුණු ලෙස තුනී වී යෑම.
- තහවුරුකිරීමේ ක්‍රියාදාමය නිසා ජනතාවට උසස් මටටමේ විශේෂ සේවා ලබාගැනීම් ප්‍රස්ථවයන් වැඩිවීම.

බලගතු දූපත් අනන්‍යතාවන් නිසා ඒ ඒ දූපත් අතහැර යන ලෙස ජනයා පෙළඹවීම මොනතරම් දුෂ්කර කාරියක්ද යන්න මීට පෙරාතුව ඔප්පු වී තිබේ. එහෙත් බොහෝ දූපත්වල යටිතල පහසුකම් කඩා බිඳ විනාශ කොට දමමින් මුළුමහත් ප්‍රජාවම අවතැන් කරමින් ගැලූ සුනාමිය විසින් මේ ප්‍රශ්නය ප්‍රතිසංවර්ධන සැලසුම් විවාදයේ පෙරමුණටම රැගෙන විත් තිබේ. අවුරුදු සියගණන් තිස්සේ ජනයා ජීවත් වූ, එහෙත් ආපදාශිලිභාවයට ඉතාමත් ඉහළ මට්ටමින් මුහුණ දී සිටින, දූපත් නැවත ආණ්ඩුව විසින් ගොඩනැගිය යුතුද? නැත්තම් වඩා හොඳ සේවාවන් සහ වඩා හොඳ පරිසර ආරක්ෂණයන් සහිත දූපත්වල මෙම අවතැන් වූ ප්‍රජාවන් පදිංචිකරවීමේ ඉලක්කය ඇතුව ආණ්ඩුව ප්‍රතිසංවර්ධන අරමුදල් සහ ප්‍රයත්න යෙදවිය යුතුද?

ජාතික ප්‍රතිකාරක හා ප්‍රතිනිර්මාණක සැලසුමේ කොටසක් හැටියට ආණ්ඩුව මේ වනවිට නැවත පදිංචි කරවන ජනයා වෙනුවෙන් සංවර්ධනය කිරීම සඳහා සත්කාරක දූපත් පහක් තෝරාගෙන තිබේ. නැවත පදිංචිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන්නේ විශාල වශයෙන් නිවාස හානියට පත් වූ දූපත්වල පදිංචිව සිටි ප්‍රජාවන්ටය. එහෙත් අනෙකුත් ආපදාශීලි දූපත්වාසීන්ටද නැවත පදිංචිය සඳහා ඉල්ලුම් කළ හැකිය. නැවත පදිංචිවන්නට ජනයා උනන්දු කරවනු සඳහා මෙම සත්කාරක දූපත්වල පහත සඳහන් පහසුකම් සංවර්ධනය කරනු ඇත.

- පදිංචි සහ ප්‍රජා පහසුකම්
- පූර්ණ පරාසයක් පුරා විහිදුණු මහජන සේවා
- විවිධාගීකරණයට ලක්වූ ආර්ථික අංශ
- අනෙකුත් දූපත් බද්ධ කරවන යහපත් ප්‍රවාහණ පහසුකම්
- වැඩිදුර වර්ධනයට ඉඩකඩ ලබාදෙන පරිද්දෙන් ගොඩනැගුණු යටිතල පහසුකම්

එම දූපත් වුකලී අනාගතයේ ඇතිවන සුනාමි ආපද වල බලපෑම අවම කර ගැනීම සඳහා ආරක්ෂිත වැලි කඳු ඉදිකරණ ප්‍රථම දූපත් විය හැකිය. ඒවාගේම අනාගතයේදී ඇතිවන සුනාමි වලට සාර්ථකව මුහුණ දීම සඳහා උස තට්ටු ගොඩනැගිලි ඉදිකරන ප්‍රථම දූපත්ද විය හැකිය. අනතුරුව මෙම සුනාමි ආරක්ෂක උපායමාර්ග මුළු රටටම ගලපා ගනු ඇත.

ජාතික ප්‍රතිකාරක හා ප්‍රතිසංවර්ධන සැලසුම සඳහන් කරන්නේ "මුළුමනින්ම පාහේ ඉල්ලීම සහ ස්වේච්ජාව මත පදනම් වූ නැවත පදිංචි වීම හා වෙනත් ප්‍රදේශවල ඉඩම් ලබා දීම" ගැනය. එහෙත් පදිංචිව සිටි ප්‍රදේශවලින් ඉවත් කොට වෙනත් ප්‍රදේශවල රඳවා සිටින ජන කොටස් කල්පනා කරන්නේ වෙනත් ප්‍රදේශවලින් ඉඩම් ලබාදීම එක්කෝ සිදුවන නැත්නම් කොහෙත්ම සිදු නොවන සිදුධියක් කියාය. දූපතේ පදිංචිව සිටි ජනයාගෙන් බහුතරයට දූපත අතහැර යාමට අවශ්‍ය නම් ටික දෙනෙකුට නැවත දූපතට ගොස් කැඩී බිඳී ගිය ස්වකීය ගෙවල් දෙරවල් අළුත් වැඩියා කරගෙන පදිංචි වීමටත් ස්වකීය යටිතල පහසුකම් අළුත් වැඩියා කරගැනීමත් අපහසු වනු ඇත. කැමැත්තෙන් නැවත දූපතේ පදිංචියට යන කීපදෙනාට වුවද අළුත් තත්ත්වයන් වලට බරපතල අයුරින් හැඩ ගැහෙන්නට සිද්ධ වනවා ඇත. ආපදාව හේතු කොටගෙන තමන් අත්දුටු මානසික කැළැඹීම නොතකා මෙසේ හැඩගැසීමට ඔවුනට සිදුවනවා ඇත. එබැවින් පරිපූර්ණ මනෝසමාජ සහය දීමේ වැඩ සටහන් එකදිගටම දියත් කරන්නට ද සිදුවනවා ඇත.

අයිෂත් ෂහුලා අහමඩ් දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් වන සෞඛ්‍ය අධ්‍යාපන සංගමයේ


Scott Leckie

උපදේශන සම්බන්ධීකාරක වන අතර ජාතික ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ මනෝසමාජයීය සහාය ඒකකයේ වැඩබලන සම්බන්ධීකාරකවරියයි. පුහුණු උපදේශකවරුන් අතලොස්සක් හා එකම එක මනෝචිකිත්සකයෙකු සිටින රටක මානසික පීඩනයට ලක්වූ දහස්ගණන් ජනතාවට මනෝසමාජයීය සහාය සැපයීමේදී මුහුණ දෙන්නට සිදුව තිබෙන අද්විතීය අභියෝගය ඈ විස්තර කළාය. සිද්ධියෙන් පසු වහාම ස්වකීය කාලය වැය කිරීම සඳහා ස්වෙච්ඡාවෙන්ම ඉදිරිපත් වූ දේශීය උපදේශකයන්ගේ උදව්වෙන් ප්‍රතිචාර දැක්වීම ආරම්භ විය. එදා පටන් එක්සත් ජාතීන්ගේ UNFPA ආයතනයේ ආධාර ලබාදෙන ඉන්දීය රතුකුරුස සංගමය "මනෝ විද්‍යාත්මක ප්‍රථ මාධාර' පුහුණුවක් ලබා දුන් අතර පුහුණුව ලැබූ මෙම මාලදිවයින් ජාතික කණ්ඩායම් දූපත් 70ට වඩා සංචාරය කොට තිබේ. එහිදී ඔවුන් මූලික ක්‍රියාකාරී ඇහුම්කන්දීමේ රැස්වීම් වාර පවත්වා ඇත්තේ නිර්දේශ කරන්නට සුදුසු මනෝපීඩනයට හසු වූ පුද්ගලයින් හඳුනාගැනීම සඳහාය. ඒවාගේම ඔවුහු UNICEF ආධාර ඇතුව තරුණ ළමයින් සඳහා ඉතාමත් සාර්ථක ලෙස කලාව හා ක්‍රීඩාව පාදක කොටගත් චිකිත්සාවන් භාවිතා කළහ. දෙමාපියන් එදිනෙද ජීවිතය පවත්වාගෙන යෑම සඳහා අවධානය යොමු කරද්දී ළමුන් අපමණ දුෂ්කරතාවලට මුහුණපාන හෙයින් සම්පාතිතයේ අත්දැකීම් සමග එකඟත්වයකට පැමිණෙන්නට එම චිකිත්සාවන් ළමයින්ට මහෝපකාරී විය.

මනෝසමාජයීය සහන ඒකකය (PSU) ඉක්මණින්ම ආණ්ඩුවේ අමාත්‍යාංශයක විධිමත් අංශයක් බවට පත්වනු ඇත. මනෝ සමාජයීය සහාය නම් මෙම ක්‍රියාකාරකම, මීට පෙර භාවිතාවේ නොතිබූ ආපදාවලට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාමාර්ග සහිතව මින් පසු දෛනික ජීවිතයේ අංගයක් බවට මාලදිවයින්වාසී සිවිල් ජනතාවත් එහි ආණ්ඩුවත් පත්කරනු ඇත. නුදුරු අතීතයේ කලබලකාරී සිද්ධීන් සමග බද්ධ නොවී අනාගතය සඳහා සැලසුම් කිරීම මින්පසු උගහට වනු ඇත. ඉදිරියේ එළැඹෙන කාලවලදී ස්වභාවධර්මය කළමනාකාරයෙන් හැකිවනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

*හෙයිඩි බ්‍රවුන් මාලදිවයිනේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධව කටයුතු කරන පාරසමුද්‍රික ස්වෙච්ඡා සේවා සංවිධානයේ (VSO) (www.vso.org) සේවිකාවකි. මෙම ලිපිය ඇය ලියන ලද්දේ නිල මට්ටමින් නොවේ.[4] විද්‍යුත් තැපැල: **heids_on_tour@yahoo.com***

1. www.tsunamimaldives.mv
2. www.sphereproject.org
3. www.undp.org/bcpr/disred/documents/tsunami/maldives/md_nrrp.pdf
4. කතුවරු මාලදිවයින් UNFPA සංවිධානයේ එමා ෆුලූ, ළමා අයිතිවාසිකම් ඒකකයේ ට්‍රේසි ලාර්මන්, SHE සංවිධානයේ අයිෂත් ෂහුලා අහමඩ්, ජාතික ආපද කළමනාකරන මධ්‍යස්ථානයේ මවුරුෆ් ජමීල්, Oxfam GB සංවිධානයේ මාර්ක් එවන්ස්, VSO මාලදිවයින සංවිධානයේ ශිවා ආර්යල්, මාලදිවයින UNICEF සංවිධානයේ උන්නි සිල්කෝසෙත් හා මාලදිවයිනේ අභ්‍යන්තරිකව අවතැන්වූවන් පිලිබඳව කටයුතු කරන ඒකකයේ ආචාර්ය අයිෂත් ෂිහාම්ට ස්තුතිය පුද කරති.

# සුනාමිය පිලිබඳ අප්‍රිකානු පර්යාලෝකයක්

බහාමේ ටොම් න්යන්ඩුගා

*ලෝකය පොදු ආපදගිලිහාවයන් සහිත ගෝලීය ගම්මානයක් බවත් ඒ වාගේම අප්‍රිකාවේ අවශ්‍යතාවන් සපුරාලීමේදී ඊට සෑමවිටම ලැබෙන්නේ දෙවන ස්ථානය බවත් සුනාමිය අපට සිහිපත් කර දී ඇත.*

විපතට ගොදුරු වූ දකුණු ආසියානු රටවල් දෙස ජාත්‍යන්තර ප්‍රජාවේ අවධානය වැඩි වැඩියෙන් යොමුවද්දී, බටහිර ඉන්දියානු සාගරයේ කිලෝමීටර හයදහසක් පමණ ඈතින් පිහිටි සුනාමියට ගොදුරු වූ ප්‍රදේශයන් වෙත අවධානය යොමු කළේ මද වශයෙනි. ටැනිසානියාවෙන් මරණ 10 ද කෙන්යාවෙන් 2 ද වාර්තා වූ නමුත් වැඩිම හානිය වාර්තා වූයේ මධ්‍යම ආණ්ඩුවකින් තොර, අවුරුදු 14ක් තිස්සේ යුද්ධයෙන් හා නියඟයෙන් දිගමට බැට කන, සෝමාලියාවෙනි (51 පිටුවේ OCHA ලිපිය බලන්න). එහි මරණ 290 සිදු වූ අතර 54,000 අතරමං වූහ. වෙරළබඩ පදිංචි ජනයාගෙන් 75%ටම ආදයම් මාර්ග ගෙනදුන් ධීවර බෝට්ටු 600 විනාශ විය. ඊසානදිග සෝමාලියාවේ හෆුන් සහ ගරකද් නගර අතර කිලෝමීටර 650ක් තරම් දිග බිම් තීරුවක ජීවත්වන විවිධ ප්‍රජාවන්ගේ ජීවිත මේ හේතුවෙන් බොහෝ සෙයින් අඩාල විය. එපමණක් නොව, දකුණු කෙළවරේ පිහිටා තිබෙන පහළ ජුබා පලාතේ මොගාදිෂු නගරයට දකුණින් තිබෙන ප්‍රදේශත් එහි බලපෑමට නතු විය. ස්වයංපාලන කලාපයක් හැටියට ප්‍රකාශයට පත්කරගෙන තිබෙන පුන්ට්ලන්තයට සිදු වී තිබෙන හානිය අතිමහත්ය. හෆුන් නගරයේ යටිතල පහසුකම් පද්ධති සම්පූර්ණයෙන්ම විනාශවිය. ආධාර ලබාගැනීම සඳහා කටයුතු කරන ආණ්ඩුවක් සෝමාලියාවට නැති නිසා එම කාරිය සඳහා එක්සත් ජාතීන්ගේ මග පෙන්වීම අනුව කටයුතු කිරීමට ඔවුනට සිදු වී ඇත. UNICEF සහ FAO සංවිධාන දෙක තමන් සතු සීමිත සම්පත් ප්‍රමාණ යොදගෙන අසීමිත වැඩ කොටසක් කර තිබෙන නමුත් රටේ අවශ්‍යතාවලට සරිලන පරිද්දෙන් ආධාර සපයන රටවල ප්‍රතිචාරය සෝමාලියාවට ලැබී නැත. අප්‍රේල් මාසයේ මුලදී සෝමාලියාව වෙනුවෙන් එක්සත් ජාතීන් විසින් ඉදිරිපත් කරන ලද 205 ඒකාබද්ධ ආයාචනය සඳහා පොරොන්දු වූ අරමුදල්වලින් මේ වනවිට ලැබී ඇත්තේ 3% පමණි.

ඉන්දියානු නගරයේ පිහිටා තිබෙන සීෂෙල් දූපත්වල පදිංචි වැසියන් දෙදෙනෙකු මිය ගිය අතර පවුල් 900ට ඔවුන්ගේ නිවාස අහිමි විය. සුනාමි රැල පහර නිසා ඇති වූ මහා ජල ගැල්මෙන් මහේ සහ පුස්ලින් යන දූපත්වල වරාය, මහා මාර්ග ජාලය, පාලම්, පොදු පහසුකම් ස්ථාන, නිවාස වැනි ප්‍රවාහණ යටිතල පහසුකම්වලට ද පුද්ගලික දේපොලවලට ද බරපතල හානි පමුණුවනු ලැබීය. රජය විසින් තක්සේරු කර ඇති අන්දමට අළුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා ඩොලර් මිලියන 30 අවශ්‍ය වනු ඇත. කෙසේවෙතත් ප්‍රතිචාර දැක්වීමෙහිලා ජාත්‍යන්තර ප්‍රජාව මන්දගාමීත්වයක් පෙන්නුම් කරයි. මැයි මාසේ මුලදී සීෂෙල් රජය එක්සත්ජාතීන්ගේ ඉන්දියානු සාගර ක්ෂණික අවශ්‍යතා ආයාචන IOFA වැඩසටහ-නෙන් ලැබුනේ එක්සත් ජනපද ඩොලර් මිලියන 11.5 වශයෙන් ඇස්තමේන්තු කර තිබූ මුදලින් ඩොලර් මිලියන 4.4 ක මුදලක් පමණි. ඒ නිසාම සැලසුම් කොට තිබූ පුනරුත්ථාපන ව්‍යාපෘති ආරම්භ කිරීම ප්‍රමාද කරන්නට සිදු විය.

සුනාමියට ගොදුරු වූ අවසාන අප්‍රිකානු රටවල් දෙක වූයේ කෙන්යාව සහ ටැන්සානියාවයි. වෙරළබඩ සංචාරයක නිකේතනවල සිටි සංචාරකකයින් බොහෝ දෙනා ඉවත්කර ගනු ලැබුවද, එම ප්‍රවෘත්තිය කලට වේලාවට නොලැබුණු පිරිසක් මිය ගියාහ. සියළු දේ කඩා බිඳ සුන්බුන් කර දමමින් ඒ මරුකැදවූ රැල්ල ගෙනා මහා විපත්තිය පිලිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමේ යාන්ත්‍රණයක් අප්‍රිකානු බලධාරීන් සතුව නොතිබුණි. ඉඳින් මේ සුනාමියෙන් පැහැදිලි වන්නේ සිවිල් ආරක්ෂාව සූදනම් කරගැනීමේ සහ හානිය අවම කරගැනීමේ වැඩසටහන් අප්‍රිකාව තුල සංවිධානය කර ගැනීමේ අවශ්‍යතාවයයි. මේ අවශ්‍යතාවය අවබෝධකරගත් චීන ආණ්ඩුව සහ චීන රතු කුරුස සමාජය ටැන්සානියාවේ ආපදාවලට දක්වන ප්‍රතිචාරයේ ධාරිතාව ගොඩනැගීම සඳහා ආධාර කර ඇත.

සුනාමියේ බලපෑමට ඉතා බරපතල ලෙස හසු වූ අප්‍රිකානු ජනයාට, ප්‍රජාවන්ට,රාජ්‍යයන්ට මීට වඩා උපකාර කිරීමට ජාත්‍යන්තර ප්‍රජාවට හැකියාව තිබේ. මෙම ආපදාවටත් අනාගතයේදී අප්‍රිකාව මුහුණ දිය හැකි ස්වාභාවික ආපදාවලටත් දැක්වෙන සියළු ප්‍රතිචාර හැඩගස්වාගත යුත්තේ අභ්‍යන්තරික වශයෙන් අවතැන්වූවන් වෙනුවෙන් කටයුතු කිරීම සඳහා එක්සත් ජාතීන් විසින් හඳුන්වා දී තිබෙන මාර්ගෝපදේශක ප්‍රතිපත්තිවල අදලත්වය පිලිගනිමිනි.

*බහාමේ ටොම් න්යන්ඩුගා මානව හා ජනතා අයිතීන් පිලිබඳ අප්‍රිකානු කොමිසමේ සාමාජිකයෙකි. අප්‍රිකාවේ සරණාගතයින්, ආරක්ෂාව පතන්නවුන්, අභ්‍යන්තරික වශයෙන් අවතැන්වූවන් පිලිබඳව කටයුතු කරන විශේෂ සම්බන්ධීකාරකවරයාය. විද්‍යුත් තැපැල: **btomn@yahoo.com***

# සෝමාලියාවේ දැනට පවත්නා ආපදශීලිභාවය සුනාමියෙන් පසු තවත් තීව්‍ර වෙයි

**එක්සත් ජාතීන්ගේ මානවදයාවාදී කටයුතු පිලිබඳ සම්බන්ධීකරණ කාර්යාලය, සෝමාලියාව**

*දිගුකාලීන නියඟය, අනපේක්ෂිත සීතල වර්ෂාව, කුණාටු, ප්‍රචණ්ඩ ක්‍රියා, වරින්වර ඇතිවන ගංවතුර ආදිය හේතුකොටගෙන ඒවන විටත් මතුව තිබූ බරපතල මානව දයාවාදී තත්ත්වය සුනාමිය නිසා තව තවත් දරුණු විය.*

සුනාමි පහර වැදුනේ නියඟය අවසන් වී ජන ජීවිතය මුහුණ දෙමින් සිටි අතොරක් නැති කම්පාවලින් යාම්තමින් මිදී ගොඩ එන්නට පටන්ගෙන සිටි මොහොතකය. එයින් වෙරලබඩ තීරයේ විශාල කොටසකට දැඩි බලපෑමක් ඇති විය. විශේෂයෙන් පුන්ට්ලන්ත පලාතේ උතුරුකරයේ පිහිටි හෆුන් නගරයේ සිට දකුණුකරයේ කෙළවරම පිහිටි ගරකද් නගරය දක්වා කිලෝමීටර 650 ක තරම් තීරුවක් ඊට ගොදුරු විය. සුනාමියේ ප්‍රතිපලයක් හැටියට ජීවිත හානි සිද්ධ වූයේය; යටිතල පහසුකම් කැඩී බිඳී ගියේය; ජලාශ හා ජල පහසුකම්වලට අපද්‍රව්‍ය මිශ්‍ර විය; ජීවිතය පවත්වාගෙන යෑමට අවශ්‍ය කරන දෑ රාශි වශයෙන් නැති වී ගියේය. පවුල් 7300 තරම් ප්‍රමාණයක සාමාජිකයන්ව සිටි 44,000 තරම් ජනකායකට මානවදයාවාදී ආධාර වහාම අවශ්‍ය විය. පානීය ජලය, ආහාර, ඖෂධ වාගේම පදිංචිව සිටි නිවාස නැවත සම්පූර්ණයෙන් ගොඩනැගීම, නැත්තම් අළුත්වැඩියා කිරීම, වහාම අවශ්‍ය විය. වෙරළබඩ ගම්මානවල පදිංචිව සිටි බොහෝ ජනයාගේ ජීවනෝපායත් නැත්තටම නැති වී තිබිණ.

ඉහළම අස්වැන්න ලැබෙන සමයේදී (ඔක්තෝබර් සිට පෙබරවාරි දක්වා) ධීවර කර්මාන්තය සඳහා සෝමාලි ජනයාගෙන් සෑහෙන ප්‍රමාණයක් වෙරළබඩ ගම්මාන කරා ඇදෙන්නේ මසුන් මැරීමට, කරවල වේලීමට සහ වෙළඳපොලට මාළු පටවා යැවීමටය. එහෙයින් සුනාමි රළ පහර වැදෙනවිට වෙරළබඩ සිටි ජන ප්‍රමාණය සාමාන්‍ය ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩි වී තිබුණි. එහි ප්‍රතිපලය වූයේ ධීවරයින් 289 දෙනෙකු මිය යාමය/අතුරුදහන්වීමය. වෙරළබඩ පදිංචිව සිටින ප්‍රජාවන්ගේ ප්‍රධාන ආදයම් උපදවන මාර්ගය වන ධීවර කර්මාන්තයට මේ නිසා ඇති වූ හානිය ද සුළුපටු නොවේ.

සෝමාලියාවේ ජීවත්වන ගොපලු පවුල්වල සමහර සාමාජිකයන් ජලය සහ තණබිම් සොයමින් ස්වකීය සත්ත්ව රංචු දක්කාගෙන අවුරුද්දේ බොහෝ කාලයක් තිස්සේ තැනින් තැන යන අතරේදී පවුලේ ඉතිරි සාමාජිකයන් මූලික සේවාවන් ලබාගත හැකි පෙදෙස්වල නතර වී සිටිනවා දකිත හැකි විය. එක දිගටම අවුරුදු හතරක් තිස්සේ පැවැති දැඩි නියඟයෙන් තම සත්ත්ව රංචු අහිමිව, මහත් දුක්බිත තත්ත්වයකට මුහුණ දී සිටි, සමහර ගොපලු ජනයා රාශි වශයෙන් වෙරළබඩ පළාත්වලටද ඇවිත් සිටියේ විකල්ප ජීවන මාර්ග සොයා ගෙනය. එහිදී සුනාමිය නිසා ඔවුන් සතුව තිබූ ඉතිරි සේසතද නැත්තටම නැති වී ගියේය.

සුනාමිය යනු බොහෝ එඬේර ජනයාට සාම්ප්‍රධායික ඔරොත්තුදීමේ උපායමාර්ගවල අවසාන අදියරය විය.

සුනාමි ආපදවට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වූ ජාත්‍යන්තර ප්‍රජාව විපතට පත් ජනතාව වෙත ලඟාවන්නට තිබූ දුෂ්කරතා, පොදුවේ බලපැවැත්වූ අනාරක්ෂිතභාවය, හුදකලාව, දුර්වල මංමාවත් හා යටිතල පහසුකම් යනාදිය නොතකා හානියට පත් ප්‍රජාවන්ට සහන සලසන්නට වහා ඉදිරිපත් විය. 2005 පෙබරවාරියේදී අන්තර්-ඒජන්සියක්, හෙවත් බහු අංශයීය ඇගැයුමක යෙදෙමින් සිටි දූත මණ්ඩලයක්, ස්ථිර වශයෙන්ම පවසා සිටියේ ආපදවට ලක්වූ ජන කොටස්වලට අවශ්‍ය මානවදයාවාදී සහනාධාර විශාල වශයෙන් ලබා දුන් බවය. එසේ කළ හැකි වූයේ කලින් ගබඩා කර තිබූ සහනාධාර තොග සහ ඉන්දීය සාගර ක්ෂණික ආයාචන ආයතනයෙන් (IOFA) ලැබුණු අරමුදල් පාවිච්චි කොට මිල දී ගත් අතිරේක සහනාධාර යොදවා ගැනීමෙන් බව වැඩිදුරටත් එම දූත මණ්ඩලය කියා සිටියේය. 2005 අවුරුද්දේ ඔක්තෝබර් මාසයේදී එලැඹෙන ඊළඟ ධීවර අස්වනු මාසය තෙක් හානියට ලක් වූ ජනතාවගෙන් 40% තරම් ප්‍රමාණයකට නොකඩවා ජීවත්වීම සඳහා සහනාධාර ලබාදෙන ලෙස නිර්දේශ කළ එම දූත මණ්ඩලය ස්වකීය ප්‍රතිචාර සැලසුම් ක්ෂණික ගලවාගැනීම්වල සිට පුනරුත්ථාපන ක්‍රියාකාරකම් දක්වා වෙනස් කළේය.

මේ වනවිට එක්සත් ජාතීන්ගේ නිත්‍ය සොමාලියා කණ්ඩායම සුනාමි ආපදවට ලක් වූ ප්‍රදේශ සඳහා අවශ්‍ය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතියේ සැලැස්ම අවසන් කරමින් සිටී. මේ හේතුකොටගෙන අතිරේක වශයෙන් පැන නැගුණු මෙම සුනාමි ආපද ප්‍රතිචාර සොමාලියාව අද මුහුණ දී සිටින බරපතල මානවදයාවාදී තත්ත්වය නමැති පුළුල් සන්දර්භය සමග ඒකාබද්ධ කිරීමට පිළිවන් වනවා ඇත. ඒ වාගෙ 'ම එවැනි ඒකාබද්ධයක් හේතුවෙන් සුනාමි ප්‍රතිචාර අනෙකුත් මානවදයාවාදී අවශ්‍යතා කල්පනාවට ගනිමින් ඒවාට සමානුපාතික වන ලෙස සකසා ගන්නට පුළුවන්වනවා ඇත.

*"අපට කන්ඩ ඉතුරු වෙලා තියෙන්නේ එකම එක දෙයයි. ඔහේලගේ ට්‍රක්වලින් ඇවිස්සෙන දූවිල්ල"*

සුනාමි ආපදවට ලක්වූ ප්‍රදේශ පමණක් නොව සෝමාලියාවේ අනෙකුත් ප්‍රදේශ තුලද ආහාර හා ජීවිත සම්බන්ධයෙන් පවතින අනාරක්ෂාවත් උපද්‍රවශීලිභාවයත් මනාව රජ යන්නේය. ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ (FAO) ආහාර ආරක්ෂණ විශ්ලේෂණ ඒකකය විසින් 2005 අවුරුද්දේ මුල් දවස්වල නිකුත් කරනු ලැබූ පශ්චාත් කෙටිකාලීන වර්ෂාපතන තක්සේරුව අනුව 500,000 වඩා අධික ජනකායකට හදිසි මානවදයාවදී ආධාර දිගටම ලබාදීම අවශ්‍යය. ඊට හේතුන් නම් එම ජනතාව විසින්ම පරිසරය බාල්දු කිරීම නිසා මතු වී තිබෙන ගැටළුය. නියඟය/ගංවතුර/සිවිල් කෝලාහල/වෙළඳමට තිබෙන බාධා ආදිය නිසා මතු වී තිබෙන ගැටළුය. ඊට අමතරව 370,000ට ආසන්න තරම් රට අභ්‍යන්තරයේ අවතැන් වූ ජන කොටසක් ඉතාමත් දුෂ්කර ඉතාමත් දුප්පත් ජීවිත ගත කරමින් සිටින්නාහ. මූලික සේවාවන් හෝ ආදයම් උපදවන මාර්ග හෝ අත්පත් කරගැනීම සඳහා ඔවුනට ඇරී ඇත්තේ අවම ඉඩකඩය. ප්‍රාදේශීය ගැටුම් නිසා දුක් විඳින, නියඟයෙන් පසු යම්තමින් ඔළුව උස්සමින් සිටින, ප්‍රදේශවල වසන ජනයා අතරේ 20%ටත් වඩා ඉහළ ප්‍රමාණයකින් මන්දපෝෂණය පැතිරී තිබෙන බව වාර්තාවෙමින් පවතී. විශේෂයෙන්ම ජුබා සහ ගෙඩෝ පලාත්වල මේ තත්ත්වය දරුණුය.

*සුනාමිය යනු බොහෝ එඬේර ජනයාට සාම්ප්‍රධායික ඔරොත්තුදීමේ උපායමාර්ගවල අවසාන අදියරය විය.*

සුනාමියට ලක්වූ ජන කොටස්වල හදිසි අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා දක්වන ලද සුවිශාල ප්‍රතිචාරයෙන් පසු දැන් අවධානය යොමු වී පවතින්නේ වෙනත් ආපදවන්ට ලක්වී සිටින ජන කණ්ඩායම් වෙතය. සකල අවධානය සුනාමියෙන් විපතට පත් වූ ජන කොටස්වල යොමු කළ නිසාම වෙනත් ආපදවලට මුහුණදෙමින් අනතුරේ පසුවන ජීවිත බේරාග ැනීමේ ව්‍යාපෘති අඩාල විය. සම්පත් බෙදදීමේදී සමානාත්මතාවාදී ලෙසත් සමානුපාතික ලෙසත් ඒවා බෙදදීමේ අවශ්‍යතාවය ගැන සුනාමියෙන් හානියට පත් වෙරළබඩ ප්‍රදේශවලට ආධාර රැගෙන යන බව දුටු එක් එඬේරක් තම අදහස පළ කළේ මෙසේය: "අපට කන්ඩ ඉතුරු වෙලා තියෙන්නේ එකම එක දෙයයි. ඔහේලගේ ට්‍රක්වලින් ඇවිස්සෙන දූවිල්ල".

*මෙම ලිපිය ලියන ලද්දේ සෝමාලියාවේ පිහිටි එක්සත් ජාතීන්ගේ මානවදයාවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයේ (OCHA) නියුතු කාර්ය මණ්ඩලය විසිනි. වැඩිදුර තොරතුරු සඳහා මෙම විද්‍යුත් තැපැලට යොමුවන්න: dilorenzoa@un.org නැත්නම් nduta@un.org*

මේ සංකල්ප රූප ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ජීවත්වන ළමයින් විසින් සිත්තම් කරන ලද සිතුවම් 62 ක එකතුවකිනි. අවුරුදු 5 සිට 16 දක්වා වයස් සීමාවල සිටින ළමයින් විසින් චිත්‍ර නිර්මාණය කර ඇත්තේ රුදුරු සුනාමිය පිලිබඳ තම වේදනාකාරී මතකයන් මකා දැමීමට දරණ ලද උත්සාහයක් වශයෙනි. මේ චිත්‍ර 2005 අවුරුද්දේ දෙසැම්බර් මාසයේ වේල්ස් හී ජාතික කලාභවනයේදී ප්‍රදර්ශනය කිරීමට නියමිත අතර පසුව අන්තර්ජාල සන්නිවේදනය ඔස්සේ වෙන්දේසි කරනු ඇත්තේ ළමා අනාථාගාරයක් ගොඩනැගීම පිණිස අරමුදලක් සම්පාදනය කිරීම සඳහාය. එම අනාථාගාරය ඉදිවනු ඇත්තේ මේ ළමුන්ගෙන් වැඩිදෙනා ජීවත් වූ, ඒවාගේම දශක දෙකක් පුරා පවතින ගැටුම් හේතුවෙන් දැනටමත් අනාථ වූ ළමුන් සිටින, කදිරවේලි ගම්මානයෙන්ය. Living Heritage Trust නම් දේශීය සංවිධානය ලෝකය පුරා වාසය කරන ස්වෙච්ඡා සේවකයන්ගේ සහාය ඇතුව සුනාමි ආපදාවට ලක් වී දිවිගලවාගත් අයගේ ජීවිත නැවත ගොඩනැඟීමේ කාර්යයේ යෙදී සිටී.



*ඉදිරියේදී පැවැත්වෙන මේ වෙන්දේසියට සහභාගිවීමට FMR පාඨකයිනට හැකි වේ. තවද තම පරිත්‍යාග පහත සඳහන් ලිපිනයට එවීමටද පුළුවන:*

*Llanwrtyd Wells Tsunami Appeal, HSBC, 35 High Street, Builth Wells, Powys LD2 3DL, Wales, UK. Account number 41390856. Sort code 40-15-14*

***කලාකෘති සහ වෙන්දේසිය ගැන වැඩිදුර විස්තර දැනගැනීම සඳහා විමසන්න:***
***Gwyneth Keeble, tel + 44 (0)1591 610645; email Terry9254@aol.com***

***Living Heritage Trust සංවිධානය සහ ළමා සිත්තරුන් ගැන තොරතුරු දැනගැනීම සඳහා http://livingheritage.org සහ http://news.websfor.com/lankarelief/home/home.asp?A969 වෙබ් අඩවිවලට පිවිසෙන්න. නැත්තම් 46-C, Fisherman Road, Tiruchendur, Kallady, Batticaloa, Sri Lanka යන ලිපිනයට ලියන්න. දුරකථනය: +94 77 318 4484***



